# මව්බිම

ඉරිදා
2022 ජනවාරි 09
කාණ්ඩය 11
08 වැනි කලාපය
පිටු 64
රු. 80/-




දෙපැත්තෙම තක්කඩි ගෑස්වලින් කන කෑම ඕමාන් ඩීල් එකෙන් එළියට එන හැටි..!
▸ 08 පිටුවට

ටෝච් එළියෙන් සිසේරියන් සැත්කම කළ මුල්ලේරියාවේ වෙද දෙවිවරු
▸ 16 පිටුවට



# ඊළඟ ඡන්දෙට නව සන්ධානයකින් එන්න ශ්‍රීලනිපය සූදානම්

බිඟුන් මේනක ගමගේ,
ක්‍රිෂාන් පතිරත් ජයසූරිය

▸2 පිටුවට

## මෛත්‍රීට රිටර්න් එකක් දෙන්න පසුපෙළ පෝරයක්

▸2 පිටුවට

## දෙනවා කිව්වට දීලා නෑ

අමිල අබේරත්න ▸ 02 පිටුවට




රජයේ
පොලී රහිත
ණය ක්‍රමය ඔස්සේ ඔබටත්
IT සහ BUSINESS උපාධි
කටාණා : 076 6 550 550 දිනුණා : 076 4 770 096
ESOFT METRO CAMPUS


## ලබන සතියේ එන විදුලි කප්පාදුව

චාමර අමරසූරිය, තරිඳු නානායක්කාර ▸ 02 පිටුවට



## මෝදිගේ අතට යන ලංකාවේ ලේඛනය

එම්.එස්. ෆාරුක් ▸ 02 පිටුවට



## කොටදෙණියාවේ පැටව් දෙන්නා පොලිසියට හෙළි කළ අබිරහස

කීර්ති මෙන්ඩිස්, චාමර අමරසූරිය ▸ 02 පිටුවට

## ට්‍රින්කෝ ගිවිසුමට එරෙහිව සජබ හෙට සටනට

ක්‍රිෂාන් පතිරත් ජයසූරිය ▸2 පිටුවට



## චීන පොහොර වන්දිය ගැන අනුර කියන කතාව

අනුරාධා හේරත් ▸ 02 පිටුවට



## හකීම්-රිෂාඩ් තනි වෙලා

▸ 02 පිටුවට



## කුකුළු මස් බිත්තර කර්මාන්තය හාන්සියි

▸ 02 පිටුවට
තරිඳු නානායක්කාර

## සම්බා කාලත් හමාරයි

ක්‍රිෂාන් පතිරත් ජයසූරිය

ලංකාවේ සම්බා සහල්වලට පොන්නි සම්බා මිශ්‍ර කර වැඩි මිලට විකුණන ජාවාරමක් පිළිබඳ තොරතුරු වාර්තා වී ඇති බව පාරිභෝගිකයෝ පවසති. පොළොන්නරුවේ සහල් නිෂ්පාදිත, ආයතනවල ඇසුරුම් කවර යොදාගෙන මෙම සහල් ජාවාරම සිදුකෙරෙන බවද වාර්තා වේ.

▸ 02 පිටුවට


සුපිරි බව
තහවුරු කරගන්න
දියවැඩියාව
පරදන්න
ජින්සෝමින්



GINSOMIN®

ක්‍රියාශීලි ජවසම්පන්න සවිමත් නිරෝගී දිවියක් සඳහා

ජින්සෝමින් හී ප්‍රධාන සංඝටකය වන නියම කොරියන් පැනැක්ස් ජින්සෙන් ශාකයේ මුලයෙන් උකහා ගන්නා සාරය, ශරීරයේ නිපදවන ඉන්සියුලින් හී ක්‍රියාකාරිත්වය වර්ධනයට මනා පිටුවහලක් වන බව බොහෝ සායනික පරීක්ෂණවලින් තහවුරු කර ඇත.

MEGA 0114 366 609 0773 410 071

සියලුම ෆාමසි සහ සුපිරි වෙළඳසල් වලින් මිලදී ගතහැක.
ගෙන්වා බෙදාහැරීම: ඒ. බවර් සහ පුද්ගලික සමගම
www.megawecare.com
ginsomin srilanka





ඔබේ ජීවිතයේම කෙනෙක්

DFCC ආලෝකා වෙතින් පිරිනැමෙන සුවිශේෂී ප්‍රතිලාභයන්

- වැඩිවෙන ඉතිරියත් සමඟ ඉහළ යන ආකර්ෂණීය පොලී අනුපාතයන්
- ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් සමරන සෑම විටකදීම වටිනා තිළිණපත්
- නොමිලේ ජීවිතාවරණයක් සහ DOC 990 ඩිජිටල් වෛද්‍ය උපදේශන සේවාවන්
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සමග සහනදායි පොලී අනුපාත, අවම සැකසුම් ගාස්තු සහ උපදේශන සේවා
- සතියේ සෑම දිනකම, පැය 24 පුරා ඔබ වෙනුවෙන් කැපවූ ක්ෂණික ඇමතුම් සේවා අංකය 0112 350055

0112 350000 www.dfcc.lk



DFCC ආලෝකා
DFCC බැංකුව

1>>

## ඊළඟ ඡන්දෙට...

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඇඟිල්ල දිගු කිරීමෙන් වැළැකී පොහොට්ටුවේ පසුපෙළ මන්ත්‍රීවරුන් රටේ සැබෑ අර්බුදයට විසඳුම් සෙවිය යුතු යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස 'මව්බිම' ට පැවැසීය.

ඉතිහාසය පුරා සන්ධාන ආණ්ඩු බිඳවැටුණේ හවුල්කාර පක්ෂ සමඟ නිවැරැදි දේශපාලන සම්බන්ධතාවක් පවත්වාගෙන යෑමට නොහැකි වූ නිසා යැයිද චෝදනා කරන්නන් ඒ ඉතිහාසය සොයා බැලිය යුතු යැයිද මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස අවධාරණය කළේය.

ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂය වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා හවුල්කාර පක්ෂ අතර මේ වනවිට නිර්මාණය වී ඇත්තේද එවැනි තත්ත්වයක් යැයිද ඒ අනුව ඉදිරියේදී පැවැත්වෙන ඕනෑම මැතිවරණයක් සඳහා නව සන්ධානයකින් තරග වැදීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සූදානම් යැයිද මහාචාර්ය පියදාස කීය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලක්ෂ 18ක් පමණ වූ ඡන්ද ගොඩ නොවන්නට ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනාධිපතිවරණය ජය ගැනීමට හැකියාවක් තිබුණේ නැතැයිද හෙතෙම පැවැසීය.

ආණ්ඩුව නිර්මාණය කිරීමේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට ගිවිසුම් තුනකට එළැඹුණත් ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂය වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ එම එකඟතා මේ වනතුරු ඉටු කර නැතැයි ද මහාචාර්යවරයා චෝදනා කළේය.

ඇමැති තනතුරු, නිලතල, ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර කිසිවක් එකඟ වූ පරිදි ලබා නොදුන්නේ යැයි කී හෙතෙම ඒවා සියල්ල ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඒකාධිකාරී ලෙසින් අත්පත් කරගත්තේ යැයි ද කීය.

මේ වනවිට කොමියුනිස්ට්, සමසමාජ ඇතුළු සෙසු හවුල්කාර පක්ෂවලටත් අත්වී ඇත්තේ එකම ඉරණම යැයිද මහාචාර්ය පියදාස පැවැසීය.

සමාජ හා ආර්ථික උග්‍ර වී ඉදිරියේදී රටෙහි සාගත තත්ත්වයක් පවා ඇති විය හැකි බවට විද්‍යාඥයන් අනතුරු අඟවා ඇතැයිද පොහොට්ටුවේ පසුපෙළ මන්ත්‍රීවරුන් උනන්දු විය යුත්තේ එම ජාතික ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට යැයිද පියදාස මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මේ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සන්ධානගත වූ සෑම පක්ෂයක්ම විනාශ වූ බව කියමින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණටද එම ඉරණම අත්වීමට පෙර තීරණයක් ගන්නැයි එම පක්ෂයේ පසු පෙළ මන්ත්‍රී කණ්ඩායම පක්ෂ නායකත්වයෙන් ඉල්ලීමක් කර ඇති බව 'මව්බිම' ට වාර්තා වේ.

වත්මන් ආණ්ඩුව බලයට පැමිණියේ පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට දඬුවම් දෙන බව පවසමින් බවද පාස්කු ප්‍රහාරයේ ප්‍රධානතම වගඋත්තරකරුවකු වන ශ්‍රී ල.නි.ප. සභාපති මෛත්‍රීපාල සිරිසේන තම දේශපාලන සන්ධානය තුළ සිටීම තමන්ට ප්‍රශ්නයක් බවද පොදුජන පෙරමුණු පසුපෙළ මන්ත්‍රීවරු කණ්ඩායම එහිදී දන්වා ඇති බව කියැවේ.

මීට අමතරව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පක්ෂය හා ආණ්ඩුව ගන්නා තීන්දු තීරණ විවේචනය කරන එම දේශපාලන සන්ධානයේ මැති ඇමැතිවරුන් සම්බන්ධයෙන් වහාම පියවර ගන්නා ලෙස ඉල්ලමින්, පොදුජන පෙරමුණු පසුපෙළ මන්ත්‍රීවරු පක්ෂ නායකත්වයෙන් ඉල්ලා ඇති බවද ශ්‍රී ල.පො.පෙ. පසුපෙළ නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් පැවැසීය.

පොදුජන පෙරමුණු ආණ්ඩුවක් තුළ සිටිමින්, වරදාන - වරප්‍රසාද ලබමින්, ආණ්ඩුව විවේචනය කරන ඇමැතිවරුන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලෙසද පොදුජන පෙරමුණු පසුපෙළ මන්ත්‍රීවරු කණ්ඩායම පක්ෂ නායකත්වයෙන් ඉල්ලා ඇති බව එම මන්ත්‍රීවරයා කීය.

මේ පිළිබඳවත් රටේ මතුව ඇති ප්‍රශ්න සම්බන්ධයෙනුත් ඉදිරි සති 2 ඇතුළත ජනාධිපතිවරයා හා අගමැතිවරයා හමුවී සාකච්ඡා කිරීමට සූදානමින් සිටින බව ආණ්ඩු පක්ෂ සහකාර සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් පැවැසුවේය.

විශේෂයෙන්ම ඉදිරි දේශපාලන කටයුතු සහ පක්ෂයේ විනය කඩ කරමින් හැසිරෙන මන්ත්‍රීවරු පිළිබඳ ඉදිරි පක්ෂ දේශපාලන මණ්ඩල රැස්වීමේදී පුළුල් ලෙස සාකච්ඡා කිරීමට නියමිත බවද පක්ෂයේ ප්‍රගතිය වෙනුවෙන් එහිදී වැදගත් තීන්දු තීරණ රැසක් ගැනීමට නියමිත බවද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන ලේකම් නීතිඥ සාගර කාරියවසම් පැවැසුවේය.

## මෛත්‍රීට රිටර්න්...

පාස්කු බෝම්බ ප්‍රහාරයට අදාළව පැවැති ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සම්බන්ධයෙන් සටහන් වී ඇති තොරතුරු අධ්‍යයනය කර ඔහු සම්බන්ධයෙන් නීතිමය පියවරක් ගතයුතු බවට ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරු පිරිසක් ආණ්ඩුවේ ප්‍රධානීන්ට යෝජනාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වන බවට තොරතුරු අනාවරණය වෙයි.

පසුගියදා මාතලේ පැවැති ශ්‍රීලනිප පාක්ෂිකයන්ගේ රැස්වීමකදී සිරිසේන හිටපු ජනාධිපතිවරයා රජයට ප්‍රහාරයක් එල්ල කරමින් කළ සැර කතාව ගැන රජයේ මැති ඇමැතිවරුන් සාකච්ඡා කර තිබෙන අතර පසුපෙළ මන්ත්‍රී කණ්ඩායමක් ඉහත යෝජනාව ඉදිරිපත් කරන්නට යන්නේ එම සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙනි. සිරිසේන මහතාට එරෙහිව කිසියම් පියවරක් නොගැනීම නිසා කාදිනල්තුමාගේ විරෝධය ප්‍රකාශවීම ගැනද මේ සාකච්ඡාවලදී සඳහන් වූ බවද දැනගන්නට තිබේ.

හිටපු ජනාධිපතිවරයාගේ එම සැර කතාවෙන් පසුව ආණ්ඩුවේ මැති ඇමැතිවරුන් කිහිපදෙනකු එය විවේචනයට ලක්කරමින් අදහස් ප්‍රකාශ කර තිබූ අතර ඉකුත් 05 වැනිදා මහනුවරදී පැවැති රැස්වීමකදී රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා ප්‍රකාශ කර තිබුණේ පොල්ල තියලා යන්න කලින් මෛත්‍රී එළවන්න කියායි.

ඉන්දියානු ඔත්තු සේවා මඟින් දහ දොළොස් වතාවක් දැනුම්දී තිබියදීත් පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට නොහැකිව සිය ගණනක් බැතිමතුන් පල්ලි තුළ මරණයට පත්වූයේ මෛත්‍රීපාල සිරිසේන ආරක්ෂක ඇමැතිවරයා ලෙස කටයුතු කරද්දී බවද රාජ්‍ය ඇමැති අමුණුගම ප්‍රකාශ කර තිබිණි.

## මෝදිගේ අතට...

මෙරට ජීවත් වන දෙමළ, මුස්ලිම් ජනතාවගේ පොදු අභිලාෂ ඇතුළත් කරමින් සකස් කොට ඇති ලේඛනයට ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය හා දෙමළ ප්‍රගතිශීලී සන්ධානය අස්සන් නොකළද එය නුදුරේදීම ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතාට භාරදීමට නියමිත බව දෙමළ ජාතික සන්ධානය පවසයි.

කෙසේ වෙතත් අදාළ ලේඛනයට දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්පන්දන්, තමිල් මක්කල් තේසීය කූට්ටනි පක්ෂයේ නායක සී.වී. විග්නේශ්වරන්, ඊ.පී.ආර්.එල්.එෆ්. පක්ෂයේ නායක සුරේෂ් ප්‍රේමචන්ද්‍රන්, දෙමළ ජාතික පක්ෂයේ නායක එන්. ශ්‍රීකාන්තා, ප්ලොට් නායක පාර්ලිමේන්තු මන්ත්‍රී ධර්ලිංගම් සිද්ධාර්ථන්, ටෙලෝ නායක සෙල්වම් අඩෛක්කලනාදන්, ඉලංගෙයි තමිල් අරසු පක්ෂයේ නායක මාවෙයි සේනාධිරාජා යන මහත්වරු අස්සන් තබා ඇත.

මෙම ලේඛනය සකස් කිරීමේ ආරම්භක සාකච්ඡාවලට වඩාත් සහාය දැක්වූ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම් මහතා හා දෙමළ ප්‍රගතිශීලී සන්ධානයේ මනෝ ගනේෂන් යන මහත්වරු මෙතෙක් අස්සන් තබා නොමැති වුවත් මෙම සති අන්තයේ පැවැත්වීමට නියමිත එම පක්ෂවල දේශපාලන මණ්ඩල රැස්වීම්වලින් පසුව එම ලේඛනයට අස්සන් තැබීම පිළිබඳව අවසන් තීරණයක් ගැනීමට නියමිත බව පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේෂන් මහතා සඳහන් කළේය.

මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දැක්වූ දෙ.ජා.ස මන්ත්‍රීවරයකු පැවැසුවේ ජාතික ගැටලුවට එක්සත් රාජ්‍ය සංකල්පය වඩාත් උචිත බවත් ඒ යටතේ අර්ථාන්විත බලය බෙදා හැරීමක් අවශ්‍ය බවත් එවැනි විසඳුමක් වෙනුවෙන් ඉන්දීය රජය ශ්‍රී ලංකා රජය වෙත බල කළ යුතු යැයි යන්න ප්‍රධාන වශයෙන් මෙම ලේඛනයෙන් ඉල්ලා තිබෙන බවත්ය.

## කොටදෙණියාවේ පැටව්...

කොටදෙණියාව, බාඳුරාගොඩ ප්‍රදේශයේ නිවෙසක සිට දින 45ක කාලයක් අතුරුදන්ව සිටි 10 හැවිරිදි සහ 12 හැවිරිදි ඥාති සොහොයුරන් දෙදෙනා ඔවුන්ගේ නිවෙස වෙත නැවත යෑමට අකැමැත්ත පළකිරීම මත එම දරුවන් දෙදෙනා පරිවාස භාරයට යොමු කිරීමට අධිකරණයට කරුණු වාර්තා කිරීමට නියමිත බව උසස් පොලිස් නිලධාරියෙක් 'ඉරිදා මව්බිම'ට පැවසීය.

මෙම ඥාති සොහොයුරන් දෙදෙනා නැවත ඔවුන්ගේ නිවෙස වෙත යෑමට අකැමැති බවත් ගියහොත් මව විසින් තමන්ට නැවත පහර දෙන බව මෙම දරුවන් දෙදෙනා පොලිසිය හමුවේ පාපෝච්චාරණය කිරීම මත දරුවන් දෙදෙනා අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී මෙම කරුණු දැක්වීම අධිකරණයට සිදුකිරීමට නියමිත බවද එම පොලිස් නිලධාරියා සඳහන් කළේය.

කෙසේ නමුත් මෙම දරුවන්ගේ භාරකාරත්වය පිළිබඳ අධිකරණය තීන්දු කරන බවද එම පොලිස් නිලධාරියා වැඩිදුරටත් පැවැසීය. දරුවන් දෙදෙනා අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කොට අධිකරණ වෛද්‍ය වාර්තා ලබා ගැනීමට නියමිතව ඇත.

මෙම බාල වයස්කාර දරු දෙදෙනා මාසයකට වැඩි කාලයක්ම රඳවාගෙන සිට ඇත්තේ ඔවුන් පොලිසියට භාරදුන් කාන්තාවගේ නිවෙසේ බව කොටදෙණියාව පොලිසිය විසින් කරන ලද විමර්ශනයේදී අනාවරණය විය. මෙම කාන්තාවට මීරිගම ප්‍රදේශයේ වෙළෙඳසලක් පවත්වාගෙන යන අතර කෑමට යමක් ඉල්ලමින් පැමිණි දරු දෙදෙනා ඇය විසින් ඇගේ නිවෙසට රැගෙන ගොස් මෙලෙස රඳවාගෙන සිට ඇති බව ප්‍රශ්න කිරීම්වලදී හෙළි විණි.

දරුවන් අතුරුදන් වීමේ පුවත මාධ්‍ය මඟින් ප්‍රචාරය වීමත් සමඟ බියට පත්වූ මෙම කාන්තාව මුදල් රුපියල් හත්සියයක් ඔවුනට දී නිවෙස් බලා යන ලෙස පවසා දරුවන් පිටත් කර යවා ඇතත් ඔවුන් නැවතත් ඇගේ නිවෙසට පැමිණ තිබේ.

පොලිසිය පවසන්නේ දරුවන් බාඳුරාගොඩ නිවෙසින් පිටව යෑමෙන් පසු මීගමුව බලා ගොස් පසුදින මීරිගම ප්‍රදේශයට පැමිණ මෙම කාන්තාවගේ වෙළෙඳසලට පැමිණීමෙන් පසු ඇය මෙම දරුවන් මෙලෙස සිය නිවෙසේ රඳවාගෙන සිට ඇති බව ප්‍රශ්න කිරීමේදී හෙළි වූ බවයි.

එහෙත් ඇය මුලින්ම මීරිගම පොලිසියට ප්‍රකාශ කර තිබුණේ දරුවන් පොලිසියට භාරදීමට කලින්දා ඔවුන් කෑමට යමක් ඉල්ලාගෙන පැමිණි නිසා ඔවුන් සිය නිවෙසට කැඳවාගෙන ගොස් ආහාරපාන ලබාදී පසුදිනම පොලිසියට රැගෙන පැමිණි බවය.

අදාළ කාන්තාව විසින් මෙවන් පරස්පර අදහස් ප්‍රකාශ කරන බැවින් කොටදෙණියාව පොලිසිය ඇගේ සැමියාද පොලිසියට ගෙන දීර්ඝ ලෙස ප්‍රශ්න කර ඇත.

කොටදෙණියාව පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක හේමාල් ලියනගේ හා ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි ආර්.පී.ඒ. රන්දුනු මහත්මිය මේ සම්බන්ධයෙන් විමර්ශන පවත්වති.

සංවේගයෙන් දැනුම් දීමයි..!



හේනේගම විලිඹුල සැනසුම ඉසව්ව 190/44 දරන නිවසේ පදිංචිව සිටි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික

**ජීවන්දරගේ විමලතුංග මහතා**

07 වැනි සිකුරාදා අභාවප්‍රාප්ත විය.

**දැනුම් දෙන්නේ**

ශෝකයට පත් පද්මා මෙන්ඩිස් (බිරිය),
කිරිඳිවැල මහ විද්‍යාලයේ ආචාර්නි ගංගා දීපානි (දියණිය),
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් තුෂාර චන්දන (පුතා), දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරිනී අනුෂා දිල්හානි (දියණිය),
ගම්පහ මහ රෝහලේ ඖෂධවේදිනී සමන්ති ප්‍රියංගිකා (දියණිය).

ඒ මහතාගේ අවසන් කටයුතු 09 වැනි ඉරිදා 4 ට මල්වතුහිරිපිටිය ආදාහනාගාරයේදී සිදුකෙරේ.

## ඇහැළේපොළ වලව්වේ ප්‍රතිසංස්කරණ ජනපති නිරීක්ෂණයට



වසර 400කට වඩා ඉපැරැණි මහනුවර රජවීදියේ පිහිටි ඇහැළේපොළ වලව්වේ සිදුකරන ප්‍රතිසංස්කරණ කටයුතු ඉකුත්දා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ නිරීක්ෂණයට ලක්විය.

බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේදී සිරමැදිරියක් හා පසුකාලීනව රිමාන්ඩ් බන්ධනාගාරයක් ලෙස මේ ගොඩනැඟිල්ල පවත්වාගෙන ගොස් ඇත. නාගරික සංවර්ධන අධිකාරිය යටතට පවරා ගත් මෙය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සංවර්ධනය කෙරිණි.

ඓතිහාසික වටිනාකමකින් යුතු මෙම ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් සියල්ල මුල් වකවානුවේ පැවති වලව්වේ පෞරාණික සැලැස්මට හානියක් නොවන පරිදි සිදුකර තිබේ. ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කරන ලෙස ජනාධිපතිවරයා විසින් නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබීය.

දියවඩන නිලමේ නිලංග දෑල ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

## ට්‍රින්කො ගිවිසුමට...

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධව ලංකා ඉන්දියානු තෙල් සමාගම(LIOC) සහ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් සමාගම අස්සන් කළ ගිවිසුමට එරෙහිව හෙට (10දා) චීන වරාය පරිශ්‍රයේ දැවැන්ත විරෝධතාවක් පවත්වන බව සමගි ජන බලවේගය සඳහන් කරයි. සජබයට අනුබද්ධ ඒකාබද්ධ වෘත්තීය සමිති බලවේගය මෙම විරෝධතාව සංවිධානය කරයි. අධිකරණය ඉදිරියේ මෙම ගිවිසුම් සම්බන්ධයෙන් නඩු 2ක් විභාග වෙමින් පවතින අවස්ථාවක මෙවැනි ගිවිසුමකට එළැඹීම බරපතළ කරුණක් බව සමගි ජන බලවේගයේ මහලේකම් රංජිත් මද්දුම බණ්ඩාර පැවැසීය.

## චීන පොහොර...

චීනයේ බාල පොහොර නැව වෙනුවෙන් වන්දි ලෙස මේ රටේ මහජන ධනයෙන් එකදු රුපියලක් හෝ ගෙවීමට කටයුතු නොකරන්නැයි රජයට බල කරන බව ජනතා විමුක්ති පෙරමුණේ නායක, කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක අවධාරණය කරයි.

ආණ්ඩුව පහුගිය කාලය පුරා විවිධ ආකාරයට රටට අවධාරණය කළේ මෙම චීන පොහොර නැව වෙනුවෙන් මුදල් නොගෙවන බව වුවත් මෙම ගනුදෙනුව පිටුපස අයථා ගනුදෙනු රැසක් ගොඩගැසී ඇති නිසා අනිවාර්යය ලෙස මෙම මුදල් ගෙවන බව ජවිපෙ කල්තියා අනාවැකි පළ කළ බවද ජවිපෙ නායකයා සිහිපත් කළේය.

අවසානයේ ආණ්ඩුව ගෙවීමට තීරණය කර ඇති මෙම මුදල් මහජන මුදල් බව ඒ මහතා පෙන්වා දුන්නේය.

චීනයෙන් බාල පොහොර ආනයනය කිරීමට හෝ ණයවර ලිපි නිකුත් කිරීමට මේ රටේ කිසිදු පුරවැසියෙක් සම්බන්ධ විය යුතු නැති බව ඒ මහතා 'ඉරිදා මව්බිම'ට සඳහන් කළේය.

මෙම මුදල් ගනුදෙනුවේ කරුණු රටට වසන් කර විවිධ අසත්‍ය තොරතුරුද රටට ඉදිරිපත් කළ ගනුදෙනුවක් බව පවසන ඒ මහතා සඳහන් කළේ මෙයට ජනතාවගේ මුදල් කිසිසේත් වන්දි ලෙස නොගෙවිය යුතු බවයි.

මෙම වංචාවට හවුල් වී මෙම මූල්‍ය හානිය රටට කළ අය නිදැල්ලේ සිටියදී ජනතා මුදල්වලින් මෙම වන්දි ගෙවීමට ගත් තීන්දුව වහාම නැවැත්විය යුතු බව දිසානායක මහතා අවධාරණය කරයි.

හෙතෙම වැඩිදුරටත් පැවසුවේ කිරිපිටි ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට ඩොලර් හිඟයක් පවතින මේ මොහොතේ මේ විනාශකාරී ක්‍රියාවට හවුල් වූ සියල්ලට දඬුවම් දීමට ආණ්ඩුව කටයුතු කළ යුතු බවත් එසේ නැතුව මහජන මුදල් මේ අපරාධය වෙනුවෙන් යෙදවීමට කිසිදු ඉඩක් නොදිය යුතු බවත්ය.

## ලබන සතියේ එන...

මේ මස තෙවැනි සතිය පමණ වනවිට දිවයින පුරා වරින් වර විදුලි කප්පාදුවක් සිදුවිය හැකි බව ලංකා විදුලිබල මණ්ඩල ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයකු 'ඉරිදා මව්බිම'ට පැවැසීය.

මෙරට තුළ පවතින ඉන්ධන අර්බුදය සහ ඉදිරියේදී ඇතිවිය හැකි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් රාත්‍රී කාලයේ පවතින අවශ්‍යතාව සැලකිල්ලට ගෙන දිවයිනේ ප්‍රදේශ රැසක මෙම විදුලි කප්පාදුව සිදුවිය හැකි බව එම ප්‍රකාශකයා සඳහන් කළේය.

මෙරටට අවශ්‍ය දෛනික විදුලි පරිභෝජනය සඳහා විදුලිය උත්පාදනය කර ගැනීම මේ ආකාරයට ගැටලු සහගත වීම මත කාර්යබහුල වේලාවන්හිදී විදුලි ඉල්ලුම ඉහළ ගියහොත් විදුලිබල පද්ධතියේ හදිසි බිඳවැටීමක් අපේක්ෂා කළ හැකි බවද එම ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයා කියා සිටියේය.

කෙසේ නමුත් මේ තත්ත්වය විදුලි බලාගාරවලට අවශ්‍ය ඉන්ධන සපයා ගැනීමෙන් වළකා ගත හැකි බවත් එසේ නොවී වියළි කාලගුණික තත්ත්වය වර්ධනය වුවහොත් මේ මස තෙවැනි සතියේ පමණ සිට දිවයින පුරා විටින් විට විදුලි කප්පාදුවක් සිදුවිය හැකි බවද එම ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයා වැඩිදුරටත් 'මව්බිම'ට අදහස් දක්වමින් සඳහන් කළේය.

මේ සම්බන්ධයෙන් 'මව්බිම' කළ විමසුමකදී ලංකා විදුලිබල මණ්ඩලයේ ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ කැඳවුම්කරු රන්ජන් ජයලාල් මෙසේ පැවැසීය.

"මාස හතරකට පහකට වගේ සෑහෙන්න ගල් අඟුරු ගෙනැවිත් තියෙනවා. දැන් ජලාශවල තිබෙන ජලය හිඳී යනවා. පසුගිය දවස්වල ශ්‍රී ලංකාවට ලොකු බලපෑමක් ඇති වුණේ නැත්තේ ජල පෝෂකවලට ලැබුණු ජලයෙන් විදුලිය නිපදවන්න ලැබුණු නිසා. ජල විදුලියෙන් සියයට හතළිහක පමණ විදුලි ධාරිතාවක් නිපදවගන්න අපේ රටට අවස්ථාව ලැබිලා තිබුණා. ඉතුරු සියයට හැට තාප විදුලි බලාගාරවලින්, ගල්අඟුරු සහ ඩීසල්වලින් තමයි අපි උත්පාදනය කර ගත්තේ.

සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් ලැබුණු මෙගාවොට් 160ක් නවත්තන්න සිදුවුණේ තෙල් සංස්ථාව තෙල් දෙන්නෙ නැති නිසා. අද හෙට ඉන්දියානු තෙල් සමාගමක් එක්ක ගිවිසුමක් ගැහුවොත් අනිවාර්යයෙන් ඒ සමාගම කොන්දේසියක් දමාවි ඇමෙරිකාවට විතරක් නෙවෙයි අපිටත් බලාගාර ටික දෙන්න කියලා. ඔවුන් කියාවි අපේ ඉන්ධනවලින් බලාගාර දුවවලා අපි විදුලිය දෙන්නම් කියලා. ඒ කියන්නෙ අපිට අනතුරක් තියෙනවා බලාගාර ටිකත් ඉන්දියාවට දෙයිද කියලා.

බලශක්ති ක්ෂේත්‍රය කිව්වම තෙල් වගේම විදුලියත් අයිතියි. දැන් ගල්අඟුරු ගේන්න අපට ඩොලර් නෑ. බෙහෙත් ගේන්නත් සල්ලි නැතුව ගල්අඟුරු ගේන්නේ කොහොමද?

කොයි මොහොතක හරි අනිවාර්යයෙන්ම රටේ විදුලිය ස්වයංක්‍රියවම නතර වෙනවා. ජනතාවට කියන්න තියෙන්නෙ දැන්ම ඉඳලා පෝලිමේ ඉන්නේ නැතුව අවශ්‍ය කරන ඉටිපන්දම් එහෙම එකතු කරගන්න කියලා. මොකද ඒ දවස් වෙනකොට ඒවත් ගණන් යයි. වෛද්‍යවරයකුට කියන්න පුළුවන් පිළිකාවක් හැදුණු අයකු කොච්චර කල් ජීවත් වෙනවද කියලා. ඒ වගේම අපිටත් දැනෙනවා ඉස්සරහට එන අර්බුදයේ තරම."

මේ අතර කැලණිතිස්ස බලාගාරයේ ජනන යන්ත්‍රයක ඇති වූ දෝෂයක් හේතුවෙන් දිවයිනේ ප්‍රදේශ කිහිපයක විදුලිය බිඳ වැටීම් සිදුවිය හැකි බවට ලංකා විදුලි බල මණ්ඩලය පෙරේදා (07දා) නිවේදනය කළේය.

## කුකුළු මස්...

කුකුළු මස් හා බිත්තර කර්මාන්තය කඩා වැටී ජනතාව විකල්ප ආහාරවලට යොමුවීමේ අවදානමක් මතුව ඇතැයි සමස්ත ලංකා කුකුළු ව්‍යාපාරිකයන්ගේ සංගමයේ සභාපති අජිත් ගුණසේකර 'ඉරිදා මව්බිම' ට පැවැසීය.

කුකුළන්ට අවශ්‍ය ආහාර සකසා ගැනීමට ඇති නොහැකියාව නිසා මෙම අවදානම මතුව ඇතැයි සභාපතිවරයා කීය.

මෙරට සත්ත්ව ආහාර සැකැසීමට පිටරටින්ද අමුද්‍රව්‍ය ගෙන ඒමට සිදුව තිබුණත් රට තුළ පවතින ඩොලර් හිඟය හේතුවෙන් මේ වනවිට එය අභියෝගයක්ව පවතින බවටද ඒ මහතා කීය. සහල් මෝල් හරහා මෙන්ම මෙරට බඩඉරිඟු වගාවෙන්ද සැලකිය යුතු මට්ටමකින් අවශ්‍ය අමුද්‍රව්‍ය ලැබුණද පොහොර ගැටලුවත් සමඟ ගොවීන් සිය වගා කටයුතුවලින් ඈත් වීමද මෙම කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනයට ප්‍රබල ලෙසම තර්ජනයක්ව ඇති බවට සභාපතිවරයා සඳහන් කළේය.

විශාල මුදලකට සත්ත්ව කෑම ලබාගෙන නිෂ්පාදන වෙළෙඳපොළට ලබාදිය නොහැකි බැවින් කුකුළු මස් සහ බිත්තර වෙළෙඳපොළට ලබාදීම සියයට 40කින් අඩුවී ඇතැයිද ඒ මහතා සඳහන් කළේය.

මේ කාලය වන විට හෝටල් ක්ෂේත්‍රය තුළද උත්සව රාශියක් පැවැත්වීම සහ විදේශිකයන් රැසක් මෙරටට පැමිණෙන කාල සීමාවක් බැවින් කුකුළු මස් සහ බිත්තරවලට විශාල ඉල්ලුමක් පැවැතියද ඉල්ලුමට සරිලන නිෂ්පාදන ලබාදීම දැඩි අභියෝගයක් වී ඇතැයිද සභාපතිවරයා පැවැසීය.

මෙම වසරේ උත්සව සමය වන විටත් කුකුළු මස් සහ බිත්තර හිඟයක් ඇති විය හැකි බවටද ඒ මහතා අවධාරණය කළේය.

පවතින සත්ත්ව ආහාර හිඟය මත කවරකු මිල අඩු කරන්න යැයි පැවැසුවත් නිෂ්පාදනයේ ප්‍රවණතාවක් නොමැතිව එය සිදු කළ නොහැකි බවටද ගුණසේකර මහතා සඳහන් කළේය.

## දෙනවා කිව්වට...

විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ට ජනවාරි මාසයේ සිටම රජය ලබාදීමට තීරණය කළ රුපියල් පන්දහසක දීමනාව රජයේ කිසිදු විශ්‍රාමික සේවකයකුට විශ්‍රාම වැටුප් දිනය වූ පෙරේදා (07දා) ලැබී නොමැති බවට වාර්තා වේ.

දීමනාව ගෙවීමට අදාළව කිසිදු චක්‍රලේඛයක් මෙතෙක් නිකුත් කර නොමැති අතර අප ඒ සම්බන්ධයෙන් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උසස් නිලධාරියකුගෙන් සිදුකළ විමසීමකදී ඔහු පැවැසුවේද දීමනාව ගෙවීමට අදාළ කිසිදු චක්‍රලේඛයක් ලේකම් කාර්යාලය වෙත නිකුත් කර නොමැති බවයි. අදාළ සහන ලබාදීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ඉකුත් සඳුදා දින පැවැති විශේෂ මාධ්‍ය හමුවකදී මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා පවසා සිටියේ ජනවාරි මාසයේ විශ්‍රාමික වැටුපටම පන්දහසක දීමනාව ලබාදීමට තීරණය කර ඇති බව සහ ඊට අදාළ චක්‍රලේඛය නිකුත් කිරීමට අදාළ අමාත්‍යාංශයට උපදෙස් ලබාදී ඇති බවයි.

ඒ සම්බන්ධව රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉකුත් දින අප කළ විමසුමකදී පවසා සිටියේ කෙසේ හෝ මේ මස 7 වැනිදා ලබාදීමට නියමිත විශ්‍රාමික වැටුප සමඟ රුපියල් පන්දහසක දීමනාව ලබාදීමට නියමිතව තිබූ බව පැවසීය.

## හකීම් - රිෂාඩ්...

පසුගිය මහ මැතිවරණයේදී සමගි ජන බලවේගයෙන් තරග කොට මන්ත්‍රී ආසන නවයක් දිනාගත් ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ සහ සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ මන්ත්‍රීවරුන්ගෙන් හත්දෙනකු (07) ආණ්ඩුවට සහාය දීම හේතුවෙන් එම පක්ෂ දෙකේ නායකයන් වන රවුෆ් හකීම් සහ රිෂාඩ් බදියුදීන් පක්ෂ තුළ තනිවී සිටින බව වාර්තා වේ.

සුළු ජාතික පක්ෂ ලෙස සැලකෙන මුස්ලිම් කොංග්‍රසයෙන් මහනුවර දිස්ත්‍රික්කයට සජබෙන් තරග කළ පක්ෂ නායක රවුෆ් හකීම්, මඩකළපුවට එම පක්ෂයෙන් තනිව තරග කළ හිටපු මහ ඇමැති නසීර් අහමඩ්, දිගාමඩුල්ල දිස්ත්‍රික්කයෙන් තරග කළ එච්.එම්.එම්. හාරිෆ් සහ ෆයිසාල් කාසිම් හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් එච්.එස්. තව්ෆික් තරග කොට ජය ගත්හ. ඒ අනුව මුස්ලිම් කොංග්‍රසයට මන්ත්‍රී ධුර පහක් හිමිවිය.

එම මහ මැතිවරණයේදී සජබයෙන් තරග කළ සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ නායක රිෂාඩ් බදියුදීන් වන්නි දිස්ත්‍රික්කයෙන්ද, රහීම් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන්ද, මුස්ලිම් එකමුතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයට තරග කළ අලි සබ්‍රි රහීම්, දිගාමඩුල්ල දිස්ත්‍රික්කයෙන් තරග කළ එම්.එස්. මුසාරෆ් මන්ත්‍රීවරු ලෙස තේරී පත්වූහ.

මේ මන්ත්‍රීවරුන්ගෙන් හකීම් හා රිෂාඩ් හැරුණු විට අනෙක් සියලුම මන්ත්‍රීවරු පසුගිය අය-වැයට ආණ්ඩුව සමඟ ඡන්දය දුනි. ඒ අනුව ඔවුන්ගේ සාමාජිකත්වය එම පක්ෂ දෙක විසින් අත්හිටුවා ඇතත්, ඊට එහා ගිය විනය ක්‍රියාමාර්ගයක් ගෙන නැත.

මේ වනවිට එම මන්ත්‍රීවරුන් පක්ෂ දෙක සමඟ කිසිදු දේශපාලන කටයුත්තකට සහභාගි වන්නේද නැත.

මේ තත්ත්වය උඩ දෙමළ හා මුස්ලිම් පක්ෂ ඒකාබද්ධ සංවිධානයක් ගොඩනැඟීමට යම් උත්සාහයක් ගෙන තිබුණත් ඒ හා සම්බන්ධ මුල්ම සාකච්ඡාවේදී රිෂාඩ් බදියුදීන් ඉවත්වීම නිසා එම සංවිධානය ගොඩනැඟීමක්ද සිදුවූයේ නැත.

මේ තත්ත්වය හමුවේ හකීම් හා රිෂාඩ් මුස්ලිම් පක්ෂ නායක දෙපළ තනි වූ තත්ත්වයකින් පසුවෙති. ඔවුන් දෙදෙනා සජබ සමඟ දේශපාලන සම්බන්ධතා තවදුරටත් පවත්වාගෙන යයි.

## සම්බා කාලත්...

මෙම සහල් ලංකාව පුරා මේ වනවිට බෙදාහරින බවට දැනගන්නට තිබෙන අතර මේ පිළිබඳව පාරිභෝගික සේවා අධිකාරිය සොයා බලා කටයුතු කළ යුතු බව පාරිභෝගික ජනතාව පවසති.



**දවසේ පද 4**

උතුරන ගෑස් ගැන රහසින් හොයනවලු
ජෝනී කියයි පොඩි සැකයක් තියෙනවලු
මේකත් කුමන්ත්‍රණයක් බව සිතනවලු
ගෑස් නාටකය තව දික් ගැහෙනවලු

විදුර අබේනායක

එතෙර සිට වෙහෙසී උපයන විදේශ මුදල් සඳහා වඩා වැඩි වටිනාකමක්

රු.10

විදේශයන්හි සිට රටවිරුවන් එවන සෑම ඇමෙරිකානු ඩොලරයකටම හෝ වෙනත් ඕනෑම මුදල් වර්ගයකින් එවන ඊට සමාන අගයන් සඳහා වැඩිපුර රු.10ක් මහජන බැංකුවෙන් ගෙවනු ලැබේ*.

ඔබේ පහසුව සඳහාම දිවයින පුරා ඇති අපගේ ශාඛා 741කින් මෙම සේවාව ලබාගත හැක.

PEOPLE'S Remittance | WesternUnion WU | ria Money Transfer

*2022 ජනවාරි 31 දක්වා අදාළ වේ.

www.peoplesbank.lk

1961 PEOPLE'S BANK CALL CENTRE

PEOPLE'S BANK

Pride of the Nation

AA- (lka) Fitch Rating, AAA- Brand Finance Rating

People's Bank is a licensed commercial bank supervised by the Central Bank of Sri Lanka.




# මෙහේ වගේම ගෑස් මිල ඉස්සූ කසකස්ථානය දැන් ලේ විලක්

ඉන්ධන මිල දෙගුණයකින් පමණ වැඩි කිරීමට එරෙහිව කසකස්ථානය තුළ පැතිරෙමින් ඇති දැවැන්ත විරෝධතාව ජාත්‍යන්තර දේශපාලන කරළියේ ප්‍රධානම මාතෘකාවක් බවට පත්ව තිබේ. පසුගිය සතියේ එරට ගෑස් මිල වැඩි කිරීමත් සමඟ ආරම්භ වූ විරෝධතාව මේ වනවිට රට තුළ මහත් උණුසුම් සහ අස්ථාවර තත්ත්වයක් නිර්මාණය කර තිබේ. ආරක්ෂක අංශ වෙඩි තැබීමෙන් සිකුරාදා වනවිට දුසිම් ගණනක් විරෝධතාකරුවන් මියගොස් ඇති බව සඳහන් විය. මේ අතර ආරක්ෂක අංශ සාමාජිකයන් 18 දෙනකුද මියගොස් ඇති බව මාධ්‍ය වාර්තා කර තිබිණි. තවත් දහසක් පමණ දෙනා තුවාල ලබා ඇති බවත් 400ක් පමණ රෝහල්ගත කර ඇති බවත්, සඳහන්වේ. 60කට වැඩි සංඛ්‍යාවක් දැඩි සත්කාර ඒකකවලට ඇතුළත් කර තිබේ. වසර තිහකින් මෙපිට කසකස්ථානය තුළ හටගත් දරුණුම විරෝධතා ව්‍යාපාරය මෙය බව සඳහන්වේ.

කසකස්ථාන ටෙන්ජ් 50කට තිබූ ගෑස් ලීටරයක මිල ටෙන්ජ් 120ක් දක්වා වැඩි වී ඇතැයි වාර්තාවේ. ගෑස් මිල වැඩි කිරීම විශාල ගැටලුවක් බවට පත්ව ඇත්තේ එරට වාහනවලින් විශාල ප්‍රමාණයක් ධාවනය වන්නේ ගෑස්වලින් වීම නිසාය. කසකස්ථානය විශාල වශයෙන් ගෑස් නිපදවන රටකි. නමුත් රට තුළ අලෙවියෙන් ලැබෙනවාට වඩා අපනයනයෙන් ලාභ ලැබෙන බැවින් නිෂ්පාදකයන් ඒ කෙරෙහි වැඩි උනන්දුවක් දක්වන බවද මේ නිසා නිතර රට තුළ ඉන්ධන හිඟයක් ඇතිවන බවද සඳහන්වේ. විරෝධතාකරුවන් රජයේ ගොඩනැඟිලිවලට කඩා වැදී ඒවා අල්ලා ගැනීමට පටන් ගත් බවද අවි ආයුධ ගබඩා කර තිබූ පරිශ්‍රයන් පවා ඔවුන් අල්ලාගත් බවද ජනාධිපති කාසිම් - ජෝමාර්ට් ටොකායෙව් ප්‍රකාශ කර තිබිණි. ජනාධිපති මන්දිරයකට සහ අල්මාටි හි නගරාධිපති කාර්යාලයට ගිනි තබා ඇති බවද සඳහන්ය.

මාර්ගවල වාහන ගිනි ගනිමින් ඇති අන්දමද දැකිය හැකි විය. රටේ විශාලතම නගරය වන අල්මාටිහි ගුවන් තොටුපළක තිබූ ගුවන්යානා කිහිපයක් පවා විරෝධතාකරුවන් සිය භාරයට ගෙන ඇති බවද ඔහු සඳහන් කර තිබිණි. ආරක්ෂක අංශ විරෝධතාකරුවන්ට වෙඩි තබා ඇත්තේ ඔවුන් අල්මාටිහි පොලිස් ස්ථානවලට කඩා වැදී ගිනි අවි රැගෙන යෑමට උත්සාහ කළ අවස්ථාවේ බව වාර්තාවේ. මෙම උණුසුම් තත්ත්වය හමුවේ හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීමටත් ඇඳිරි නීතිය පැනවීමටත් ජනාධිපතිවරයා පියවර ගත්තේය. රට තුළ වර්ධනය වන විරෝධතා හමුවේ පසුගිය බදාදා එහි කැබිනට් මණ්ඩලය ඉල්ලා අස්වීමට ද පියවර ගෙන තිබිණි.

කසකස්ථානයේ විරෝධතා ආරම්භ වූයේ ඉන්ධන මිල වැඩි කිරීම මුල් කරගෙන වුවද ඒ පිටුපස තවත් කාරණා ඇති බවද ඇතැම් නිරීක්ෂකයන්ගේ අදහසයි. රට තුළ පවතින ඒකාධිපති ආකාරයේ පාලනයට විරෝධය දැක්වීමක්ද මේ තුළින් සිදුවන බව ඔවුහු පෙන්වා දෙති.

කෙසේ වෙතත් ජනාධිපති ටොකායෙව් පවසන්නේ මෙම විරෝධතාවලට නායකත්වය දෙන්නේ විදේශයන්හි පුහුණුව ලැබූ ත්‍රස්තවාදී කණ්ඩායම් බවයි. තත්ත්වය පාලනය කිරීම අසීරු වීම නිසා ජනාධිපතිවරයා ඒ සඳහා විදෙස් සහාය ඉල්ලා තිබිණි. එම කලාපයේ ආරක්ෂක සංවිධානයක් වන සාමූහික ආරක්ෂක ගිවිසුම් සංවිධානයෙන් ඔහු මේ ආකාරයෙන් සහාය ඉල්ලා තිබේ. මෙය රුසියාව ප්‍රමුඛ රටවල් පහකින් සමන්විත සංවිධානයකි. මෙම සංවිධානයේ සාමාජිකත්වය දරන සෙසු රටවල් වන්නේ කසකස්ථානය, බෙලාරුස්, ටජිකිස්ථානය, කිර්ගිස්ථානය සහ ආමේනියාවයි මෙම රටවල් සියල්ල කලකට පෙර සෝවියට් සංගමයට අයත්ව තිබූ ඒවාය. සීමිත කාලයක් සඳහා සාම හමුදාවක් කසකස්ථානයට එවීමට පියවර ගන්නා බව සාමූහික ආරක්ෂක ගිවිසුම් සංවිධානයේ සභාපතිවරයා වන ආමේනියානු අගමැති නිකොල් පෂින්යාන් පවසා තිබිණි. මේ වනවිට රුසියානු හමුදා පෙරටු කරගත් බළඇණියක් කසකස්ථානයට පැමිණ ඇති බව සිකුරාදා මාධ්‍ය වාර්තා කළේය. තත්ත්වය මෙසේ තිබියදී ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවද පවසා තිබුණේ කසකස්ථානයේ වර්ධනය වෙමින් ඇති තත්ත්වය සම්බන්ධයෙන් තමුන්ද අවධානයෙන් පසුවන බවයි. මෙම කලාපයේ ආධිපත්‍යය වෙනුවෙන් රුසියාව සහ බටහිර රටවල් අතර උණුසුම් බල අරගලයක් පවතින බවද රහසක් නොවේ. කසකස්ථානය, රුසියාව සහ චීනය ආසන්නයේ පිහිටා ඇති රටකි. එය ඉතා විශාල රටක් වන අතර එහි භූමි ප්‍රමාණය බටහිර යුරෝපයේ සමස්ත භූමි ප්‍රමාණයට සමානය. ලෝකයේ තෙල් සංචිතවලින් සියයට 3ක් පමණ කසකස්ථානයේ පවතින බවද සඳහන්වේ.

■ සනත් වික්‍රමගේ

## දුසිම් ගණන් මැරිලා

## 400ක් රෝහල්වල




බෙන්ට්ලි හෝටල් උපකරණ

BENTLEY

අලෙවියෙන් පසු විශිෂ්ට සේවය

අලෙවිය වැඩිවන ආයෝජනයක් තරඟකරුවන්ගෙන් මුල් තැන ගන්න

මෙරටත් පිටරටත් 40 වසරක අලෙවියක්

කොරෝනාවෙන් ආරක්ෂා වීමට උණු උණුවෙන් කෑම සපයන්න

බබල් ග්ලාස් බේන් මාරි

බොක්ස් ටයිප් ෂෝකේස් (උණුසුම්, ශීත, සාමාන්‍ය)

මාස 12ක වගකීම

මෙරට වැඩියෙන්ම අලෙවි වන හෝටල් උපකරණ

නිෂ්පාදනය සහ අලෙවිය

බෙන්ට්ලි ප්‍රඩක්ට්ස් කම්පනි

ඉල්ලාන, මීරිගම. ටෙලි : 94 33 2273235, 2273795

Hotline : 077 304 55 68

email : bentleyproducts@gmail.com / web: www.bentley.lk

අලෙවි නියෝජිත :- 247/සී, R.A.D. මැල් මාවත, කොළඹ 03. ටෙලි : 011-2301123



BCI CAMPUS

UGC APPROVED

පවුලේ මූල්‍ය තත්ත්වය අධ්‍යාපනයට බාධාවක් කර නොගෙන ඔබගේ උපාධි සිහිනය සැබෑ කරගන්න.

රජය විසින් ලබා දෙන පොලී රහිත ශිෂ්‍ය ණය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය අනුමත සහ විශ්ව විද්‍යාල කොමිෂන් සභාව පිළිගත් "ගෞරව උපාධියක්" හදාරන්න ඔබට අවස්ථාවක්.

- ✓ අධ්‍යයන කාලය තුළ කිසිදු ගෙවීමක් කිරීමට අවශ්‍ය නැත.
- ✓ සම්පූර්ණ පාඨමාලා පිරිවැයම ආවරණය කෙරේ. (වසර 4)
- ✓ ණය පහසුකම ලබා ගැනීමට කිසිදු ඇප කරුවන් අවශ්‍ය නැත.
- ✓ ණය ආපසු ගෙවීමට වසර 12ක කාලයක් ලබා දෙයි.



2022 කණ්ඩායම සඳහා අදම අයදුම් කරන්න

Bachelor of Business Management Hons. (BBM)

Bachelor of Science Hons. in Information Technology (BSc in IT)

ඉහළ සුදුසුකම්ලත් ආචාර්ය මණ්ඩලය | පූර්ණ කාලීන අධ්‍යාපන පාඨමාලාව | අනිවාර්ය සීමාවාසික පුහුණුව | නවීන පහසුකම් වලින් සපිරි අධ්‍යාපනික පරිසරය | ආරක්ෂිත නවාතැන් පහසුකම්

Our Location 495, Minuwangoda Road, Bolawalana, Negombo

For more information 031 20 35 100

Visit us www.bci.lk

Email us info@bci.lk




ජ්‍යොතිෂයෙන් විග්‍රහයක්

# විසි ගණක් මරාගෙන '22 ලබපු මොකක්ද මේ මාරක යෝගය



## සඳු පාප පීඩිත වීම විනාශයට හේතුවක්

2021 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින මධ්‍යම රාත්‍රි 12.00 පසුවී 2022 වර්ෂය උදාවන මොහොතේ තත්කාල ලග්නය ලෙස අහස් මුදුනෙහි සටහන් වූයේ කන්‍යා රාශියයි. මෙම තත්කාල කේන්ද්‍රයේ කාල සර්ප යෝගයක්ද පැවැති අතර ලග්නාධිපති බුධ ග්‍රහයා කේන්ද්‍රයේ පස්වැනි භාවයේ මකර රාශියේ සෙනසුරු සහ ප්ලූටෝ යන ග්‍රහයන්ගෙන් පීඩාවට පත්වී ගෝචර විණි. මෙම අවස්ථාවේ කේන්ද්‍රයේ නව වැන්නේ සිටි රාහු ග්‍රහයා විසින් පස්වැනි දෘෂ්ටියෙන් බුධ ග්‍රහයා දැකීමද අයහපත් පිහිටීමකි.

මෙවැනි ග්‍රහචාරයක් තුළ කුජ, කේතු සහ සඳු යන ග්‍රහයන් තත්කාල කේන්ද්‍රයේ තුන්වැනි භාවයේ පතිත වී සිටීම සැලකිය යුතු කරුණකි. මෙහි තේජෝ ගුණයෙන් යුත් කුජ ග්‍රහයා ස්වක්ෂේත්‍ර බලයෙන් යුතුව දුම්රිය හා එහි ක්‍රියාකාරකම් ගමනාගමනය රථවාහන නියෝජනය කරන අතර අටවැනි භාවයේ අධිපති ග්‍රහයා වේ. මීට අමතරව කේතු සහ කුජ යන ග්‍රහයන්ගෙන් පීඩාවට පත්වී අව බලයෙන් යුත් සඳු ග්‍රහයා මහජනතාව නියෝජනය කරමින් තුන්වැන්නේ ගෝචර වී සිටියේය.

මෙම තත්කාල කේන්ද්‍රයේ අවධානය යොමු කළයුතු වැදගත්ම භාවය අටවැනි භාවයයි. කුජ ග්‍රහයාට හිමි මේෂ රාශිය වූ අටවැනි භාවය විසින් සියදිවි නසාගැනීම් මරණ සංඛ්‍යාව පාර්ලිමේන්තුව නියෝජනය කරන අතර එම මොහොතේ අටවැන්නේ ගෝචර වී සිටින යුනෙස් ග්‍රහයාගෙන් දුම්රිය, අහස්යානා, කැරැලි කෝලාහල, නව සොයා ගැනීම්, ගෑස් සහ ජල කර්මාන්ත නිවේදනය වේ.

ලෝකායත සහ ලංකා කේන්ද්‍රවලට අනුව මහජනතාව නියෝජනය කරන්නාවූ සඳු ග්‍රහයා අවුරුදු උදාවන විට අව බලයෙන් යුතුව කුජ සහ කේතු යන ග්‍රහයන්ගෙන් පීඩාවට පත්වීම හදිසි අනතුරුවලට සහ වාද භේද කැලඹිලිවලට හේතුවේ. එමෙන්ම තේජෝ ධාතුවට අයත් ගිනි කාරක ග්‍රහයෙක් වූ කුජ ග්‍රහයා ලේ ධාතුවටද අධිපතිකම් දරමින් තුන්වැනි භාවයේ සිටීම මත ගමන් බිමන්වලදී හදිසි අනතුරු සහ ප්‍රසිද්ධියට පත්වන භයානක විපත් ඇතිවීමට බල පවත්වයි.

මීට අමතරව 2022 උදාවන විට පැවැති තත්කාල කේන්ද්‍රයෙහි අටවැනි භාවයේ සිටි යුනෙස් ග්‍රහයාගේ බලපෑම මත හදිසි අනතුරු, පිපිරීම්, ගිනි ගැනීම්, පිලිස්සීම්, සියදිවි හානිකර ගැනීම් සහ විදුලි සැර වැදීම් ආදී අදහාගත නොහැකි ආකාරයේ ක්‍රමවලින් ක්ෂණිකව සිදුවන මරණ බහුල වශයෙන් සිදුවීමට හේතුවේ. කේන්ද්‍රයක බාධක ස්ථානයක් ලෙස හඳුන්වන එකොළොස්වැනි භාවය කටක රාශියට අයත් වේ. කටක රාශිය අධිපති ග්‍රහයා වූ සඳු 2022 වර්ෂය උදාවන විට පාපී ග්‍රහයන්ගෙන් පීඩාවට පත්වී තුන්වැනි භාවයේ සිටීමෙන් මෙවැනි අනතුරු ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතුවූ බව පෙන්වා දිය හැකිය.

■ කිව්පති ජ්‍යොතිර්වේදිනි කලයාණී හේරත් මැණිකේ



## සුනාමි පාස්කු සිදුවුණු වර්ෂවලත් මේ වගේ ග්‍රහචාර තිබුණා

වසරක් ගෙවී වසරක් ලබන මොහොතේදී නැගෙනහිර ක්ෂිතිජයෙන් උදාවෙන රාශිය හෙවත් තත්කාල ග්‍රහ පිහිටීම සජීවී අජීවී සියල්ලටම සුබ අසුබ ඇති කිරීමට ප්‍රබල හේතුවකි. සෑම වසරක්ම උදාවෙන විටදී තත්කාල ලග්නය වන්නේ ධනු රාශියයි.

වසරක අග හා මුල රවි ග්‍රහයා ගෝචර වන්නේ ධනු රාශිය තුළ වීම එයට හේතුවකි. නමුත් තත්කාල ග්‍රහ පිහිටීම වසරින් වසර වෙනස්වනු ඇත. 2022 ජනවාරි පළමුවැනිදා උදාවන අවස්ථාව තුළ තත්කාල ග්‍රහ පිහිටීම ඉතාම අසුබ වූ අතර එහි බලපෑම මිනිස් ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි කිරීමට හේතු වූ බව පැහැදිලිය.

මෙදින රවි සිකුරු ලග්නයේද බුධ ශනි දෙවැන්න තුළද ගුරු තුන්වැන්නේද රාහු හයවැන්නේද සඳු කුජ කේතු වැයස්ථාන ගතවද පිහිටා තිබිණි. විශේෂයෙන් අනතුරුවලට විපත්වලට වැඩි වශයෙන් කාරකත්වය දරන්නේ අඟහරුයි. වසරක් ලබන සෑම මොහොතකදීම ධනු ලග්නයේ දෙවැනි දෙර්කාණය පැවැතීම නිසා අඟහරු තදබල ලෙසම අසුබ ප්‍රතිඵල ඇති කරන ග්‍රහයායි. අඟහරු පීඩනයට ලක්වීම සහ අඟහරුගෙන් සුබ ග්‍රහයන් පීඩනය වීම ඇතිවූ සෑම වසරක්ම ඉතාමත් අමිහිරි සිදුවීම් ඇති කළ අවස්ථා අනන්තවත් ඇත. පසුගිය 01දා 2022 වර්ෂය ලබන විටදී අඟහරු දොළොස්වැන්න වන වෘශ්චික රාශිය තුළම සිටි අතර චන්ද්‍රයාද නීච රාශිගතව අඟහරු හා කේතු සමඟ සිටීම අඟහරුගේ ගිනිකාරක බව රෝපණය කිරීමයි. ඒ වගේම ලග්නාධිපති ගුරු අඟහරුගේ දෘෂ්ටියට ලක්වීම 2022 වර්ෂය තුළ ඉතාමත් අහිතකර ප්‍රතිඵල ඇතිවීමේ ප්‍රවණතාවකි.

ජනවාරි පළමුවැනිදා පෙර නිමිත්තකින් පෙන්නුම් කළේ මෙම වර්ෂය තුළ දරුණු විපත් කරදර ඇති කරන බවයි. කෙසේ නමුත් ජ්‍යොතිර්වේදීන් හැටියට අපගේ එකම ප්‍රාර්ථනාව ලැබූ නව වසර රටට ජනතාවට ඉසුරුමත් වසරක් වීමේ අභිලාෂයයි. ග්‍රහ පිහිටීම්වල අසුබත්වය පෙන්වා දෙන්නේ සියලු දෙනාටම ඒ තුළින් මිදීමේ හැකියාව ලබාගැනීම පිණිසයි. මීට ඉහතදී මෙවැනිම ග්‍රහ පිහිටීම්වලින් ආරම්භ වූ වසරවල් ඉතාමත් අමිහිරි සිද්ධීන් ඇති කළ වර්ෂ හැටියට සඳහන් කළ හැකිය.

2019 වර්ෂය තුළ වසර ආරම්භ වෙන වෙලාව තුළ තත්කාල පිහිටීම අනුව ගුරු බුධ වැය ස්ථානගතව අඟහරුගේ රාශිය තුළ සිටිමින් වසර ආරම්භ විය. එම වසරේ අප්‍රේල් 21 වැනිදා පාස්කු ප්‍රහාරය එල්ල විය. මුළු රටම මළ ගෙයක් විය. එපමණක් නොව අඟහරුගේ දෘෂ්ටියට සඳු සිකුරු පීඩනයට ලක්වීමද 2019 වසර ආරම්භය තුළ තිබිණි.

2020 වර්ෂය ආරම්භ වන විටදීද අඟහරු වැයස්ථානගතව සඳු ග්‍රහයාව පීඩනයට ලක් කිරීම රට තුළ කොරෝනා වයිරසය පැතිරීමට හේතුවිණි.

2004 වර්ෂය තුළද චන්ද්‍රයා රාහු සමඟ අඟහරුගේ මේෂ රාශිය තුළ ගෝචර විය. අඟහරුගේ දෘෂ්ටියට සෙනසුරු ලක්වීමත් 2004 දෙසැම්බර් 26 වැනිදා සුනාමි ඛේදවාචකය නිසා මුළු රටම, ලොවම මළගෙයක් විය.

■ ජ්‍යොතිෂවේදී සරත්චන්ද්‍ර බෝතලාගේ



## සඳු කුජ සෙනසුරුගේ අයහපත් බලපෑමක්

වසර ලබන විටම යහපත් දේට වඩා අයහපත් දේ ගැන අසන්නට දකින්නට ලැබිණි. ජලයෙන්, වාහන අනතුරුවලින් ජීවිත ගණනාවක් අහිමි විය. මෙයට හේතුව කුමක්ද යන්න ජ්‍යොතිෂය තුළින් සලකා බැලීම වැදගත්ය.

අනතුරුදායක රාශි වශයෙන් තුලා, වෘශ්චික, මකර, කුම්භ රාශි ගැනේ. මෙයට මූලික වන සඳු, කුජ, ශනි ග්‍රහයන්ගේ බලය අඩුවක් නැතිව ක්‍රියාත්මක වේ. සඳු ජලයෙන් වන අනතුරුවලටත්, වාහන වැනි අනතුරුවලට කුජත් එය ක්‍රියාත්මක කිරීමට සෙනසුරුගේ බලය අවශ්‍යමය.

නැගෙනහිර සිතිජයෙන් හිරු උදාවත් සමඟ උදේ 06.18ට පමණ ශ්‍රී ලංකාවට නව වසර උදා විය. මෙම අවස්ථාවේ ගුරුට අයත් ධනු ලග්නයත්, රවිට අයත් සිංහ නවාංශකය පැවැති අතර බුධට අයත් දෙට නැකත පැවැතිණි.

පැවැති ධනු ලග්නයේ ලග්නාධිපති ගුරුය. ගුරු 22 වැනි දෙර්කාණාධිපති වෙමින් 3 වැන්නේය. 3 වැන්න අධිපති වගේම එදින පැවැති නැකැත අධිපති බුධ 2 වැන්න අධිපති සෙනසුරු සමඟ 2 වැන්නේය.

තත්කාල ලග්නයේ සඳු අට අධිපති වෙමින් 12 අධිපති කුජ සහ කේතු සමඟ සංයෝගව 12 වැන්නේ තැම්පත්ය. සඳු නීච රාශිගතව කුජගෙන් සහ කේතුගෙන් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත.

8 වැන්න මාරක ස්ථානයක් වගේම, 12 වැන්න විනාශය, නැති වීම පෙන්වන ස්ථානයන්ය. 12 වැන්නට සිකුරු හැර ඕනෑම ග්‍රහයෙක් දුර්වල වන බවට සැලකේ. මා මුලින් සඳහන් කළ පරිදි මාරක ස්ථාන අධිපති සඳු, කුජ සහ කේතු සමඟ සංයෝගව තිර රාශියක් වන කුජට අයත් වෘශ්චික රාශියේ සිටීම තුළ පැහැදිලිව පෙනෙන දෙයක් ඇත. හදිසි අනතුරු සිදුවීමට මෙම ග්‍රහ බලපෑමක් මූලික වී ඇත. ලග්නාධිපති ගුරු 22 වන දෙර්කාණාධිපති වෙමින් දුර්වල වීමත් එදින පැවැති නැකත අධිපති බුධ ශනිගෙන් පීඩාවට පත්වීමත් රාහු සත්ව දෘෂ්ටියෙන් 12 වැන්න පීඩාවට පත්වීමත් රාජ්‍ය බලය පෙන්වන 10 වැන්න, විපක්ෂය පෙන්වන 4 වැන්න සමඟිය, සාමය, හවුල් පවුල් කටයුතු පෙන්වන 7 වැන්න පීඩා වීම තුළ පැවැති තත්කාල ලග්නය දුර්වල වී ඇත.

තත්කාල ලග්නයෙන් කරුණු විමසීමේදී සඳු මූලික වේ. පැවැති තත්කාල ලග්නයේ 8 අධිපති සඳුය. මෙයින් අනතුරක් පෙන්වන බව පැහැදිලිය. 8 අධිපති විනාශය, නැති වීම පෙන්වන කුජට අයත් වෘශ්චික රාශියයි. එහි අධිපති කුජ සහ කේතු සමඟ සඳු දැඩි ලෙස පීඩාවට පත්වීමත් පැවැති නැකැත අධිපති බුධ, සෙනසුරුගෙන් පීඩාවට පත් වීමත් ලග්නාධිපති ගුරු දුර්වල වීම තුළ 2022 වර්ෂය ගැන එතරම් බලාපොරොත්තු යහපත් නොවන බව පැහැදිලිය. මෙම අනතුරුවලට මෙම මූලික කරුණු ඒ අයුරින්ම යෙදී ඇති බව පැහැදිලිය. ඉදිරියටත් අඩුවක් නොවන බැවින් සෑම දෙනාම ඉවසීමෙන්, බුද්ධියෙන් කටයුතු කළ යුතුය.

■ සාම විනිසුරු දේශබන්ධු එස්. ජේ. සමරකෝන්



## ලංකාවෙ කේන්දරයේ කාලසර්ප යෝගය යෙදුණු දවසක්

හදිසි අනතුරු ඇතිවීමට ජ්‍යොතිෂමය සාධක රැසක් බලපානු ඇත. ඒ අතර කේන්ද්‍රයක අටවැන්නට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයක් බව මහා සෘෂීන් ප්‍රකාශ කර තිබේ. අටවැන්න සෘෂීන් වහන්සේලා හඳුන්වාදී ඇත්තේ "මෘත්‍යු" නමින්ය. ඉන් අදහස් වන්නේ මරණයයි.

සෑම ජන්මියකුටම අටවැන්න අධිපතියා මාරක ග්‍රහයා වෙයි. මේෂ හා තුලා යන ලග්න දෙකට විශේෂත්වයක් ඇත. ඊට හේතුව එම ලග්න දෙකේ අධිපතියන් වන කුජ හා සිකුරු (ශුක්‍ර) යන ග්‍රහයන් දෙදෙනා, එකී ලග්න දෙකේ අට අධිපතීත්වය දරන බැවිනි. එම නිසා අට අධිපතියාගේ දෝෂය නොයෙදෙන අතර මාරක යෙදෙන්නේද නැත. නමුත් වෙනත් අසුබ ග්‍රහයකු සමඟ සංයෝග වුවහොත් මාරක විපත් ගෙනදීමට ඉඩ නැත්තේද නොවේ.

වෘෂභ, තුලා, සිංහ, වෘශ්චික හා කුම්භ යන ලග්න හිමියන්ගේ අටවැන්න සුබ ග්‍රහයන්ට හිමිවෙයි. එසේ හිමි වී මාරක ග්‍රහයා අටවැන්නේ යෙදීමද 2,7, 12 අධිපතියන් සමඟ සංයෝග වීමද, එසේ නොමැතිව ශනි, කුජ හා රවි ආදී ග්‍රහයන් හා සංයෝගව සිටියේද එකල මාරක අනතුරු හෝ විපත් සිදුවීම නොවැළැක්විය හැකිය. ඉහත කී සංයෝගයන්ට සාපේක්ෂව 2,8,12, අධිපතියන්ගේ මහ දශා, අතුරු දශා හෝ 22 වැනි දෙර්කාණාධිපතිගේ මහ දශාවක් පැවැතීමද මාරක අනතුරකට මඟ පාදනු ඇත.

සෙනසුරු අටවැන්නේ සිටියදී, හතර අධිපතියා හයවැන්නේ නම් ගමන් බිමන්වලදී විපතට පත්වේ. තුන්වැන්නාධිපති වෙනත් පාප ග්‍රහයකුගේ නැකැතක තැන්පත් වූයේ ද ගමනේදී අනතුරු ඇති කරන බව උසස් ජ්‍යොතිෂයේ දක්වා තිබේ. ආපෝ, තේජෝ, වායෝ, පඨවි වශයෙන් රාශි වෙන්කර ඇත. ඒ අනුව ආපෝ රාශි පීඩා වීමෙන් ජලයෙන්ද, තේජෝ රාශි පීඩාවීමෙන් ගින්නෙන්ද, වායෝ රාශි පීඩා වීම නිසා සුළි සුළං වැනි ස්වාභාවික විපතින්ද පඨවි රාශි පීඩාවීමෙන් පොළොවට සම්බන්ධ භූමිකම්පා වැනි විපත්තිද ඇති කරවයි.

එමෙන්ම තවත් අමතක කළ නොහැකි ප්‍රබල යෝගයක් වන"කාල සර්ප" යෝගය පෙන්වා දිය හැකිය. 2022 ජනවාරි 01 වැනිදාට එළිවන්නේ අප රට කුම්භ ලග්න කේන්ද්‍රයට "කාලසර්ප යෝගය" නමැති අයහපත් යෝගය උදාකරවමිනි. රාහු වෘෂභය වූ සිවුවැන්නේත්, කේතු දසවැන්න වූ වෘශ්චිකයේත් ගමන් කරමින් එම "කාල සර්ප යෝගය" නිර්මාණය කර ගෙන ඇත. එම යෝගය එලෙස පවතිද්දී රාහු තම පස්වැනි දෘෂ්ටිය අප රට කේන්ද්‍රයේ මාරක ස්ථානයත්, අටවැන්නත් වූ කන්‍යාව මතට පතිත කර ඇත. එය අප රටේ තත්කාලයට අනුරූප සිදුවීමකි.

ඉහත කී ජනවාරි පළමුවැනිදා පැය 48ක් තුළදී සිදුවූ මාරක අනතුරුවලට වගකිවයුත්තේ, රාහු පමණක් නොවේ. එදින අනතුරුවලින් විපතට පත් වූවන්ගේ කේන්ද්‍රවල සෙනසුරු ඒරාෂ්ටක අපල උදාකරන ලද ශනි හෙවත් සෙනසුරු ග්‍රහයාටද වැඩි වගකීමක් ඇති බව අවධාරණය කරමි. මෙහිදී අප අමතක නොකළද යුතුම කාරණය වනුයේ අප රට කුම්භ ලග්න කේන්ද්‍රයටද සෙනසුරු ලග්න ඒරාෂ්ටක අපලය පවතින බැවින් ඉදිරියටත් මෙවැනි මාරක අනතුරුවල අඩුවක් ඇතිවේදැයි සැක සහිත බවය.

■ පාරම්පරික ජ්‍යොතිෂවේදී කොටදෙණියාවේ ඩග්ලස් ගුණවර්ධන

■ තිස්ස කොරතොට



# වතුර රත් වෙනකම් පීනන කකුළුවා වගේ අනේ අපි විඳින සැප චීන ණය හැළියේ

චීන ආයෝජන වනාහී විස පිරවූ කුසලානයක් යැයි මැලේසියාවේ හිටපු අගමැති මහතීර් මොහොමඩ් වරක් ප්‍රකාශ කළේය. එසේ වුවද ලෝකයේ රාජ්‍යයන් 60කට වැඩි ප්‍රමාණයක් චීන ආයෝජන ව්‍යාපෘතිවලට අනුගතව තිබේ. නැගෙනහිර ආසියාවේ සිට යුරෝපය දක්වා විහිදෙන තීරයේ රාජ්‍යයන් චීන ආයෝජන සඳහා විශාල ලෙස ආකර්ෂණය වී තිබේ. චීන ආයෝජන ව්‍යාප්ත කිරීම සඳහා මුලපුරන ලද්දේ ජනාධිපති ෂී ජින් පින් විසිනි.

සංවර්ධන හා ආයෝජන සඳහා මුලපිරීම චීනයේ නව සේද මාවත සැලැස්මේ පියවරක් විය. චීන ආයෝජන කලාපීය සංවර්ධනය සහ යුදමය ව්‍යාප්තිය සඳහා අනාගතයේදී ට්‍රෝජන් අශ්වයකු වනු ඇතැයි ආසියාවේ ඇතැම් රාජ්‍ය කනස්සල්ල පළකර සිටියි. එහෙත් චීනය වඩාත් ආකර්ෂණීය ආර්ථික දැක්මක් ඉදිරිපත් කරමින් ඔවුන්ගේ වැඩපිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙනයමින් සිටී.

චීනයේ ආර්ථික උපායමාර්ගය ඔවුන් හඳුන්වන්නේ එක තීරයක්, එක මාවතක් (belt and road) යනුවෙනි. නව සේද මාවත ලෙසද ඇතැම් විට හඳුන්වයි. නව සේද මාවත සැලසුමට ඉතා දීර්ඝ ඉතිහාසයක් තිබේ. චීනයේ හන් රාජ වංශය ක්‍රිස්තු වර්ෂ 206 සිට 220 දක්වා බටහිර දෙසට ව්‍යාප්ත වීමේදී මුල් සේද මාවත ඇති විය. නූතන ඉන්දියාවෙන් සහ පාකිස්තානයෙන් දකුණට එම මාර්ගය යුරෝපය දක්වා සැතපුම් 4000කට වඩා වැඩි දුරක් විහිදී ගියේය.

අද මධ්‍යම ආසියාවේ රටවල් වන ඇෆ්ගනිස්තානය, කසකස්තානය, කිර්ගිස්තානය, තජිකිස්තානය, උස්බෙකිස්තානය වැනි රටවල් පුරා වෙළෙඳ ජාලයක් ඇති කළ හන් රාජ වංශය මධ්‍යම ආසියාවේ ගෝලීයකරණයේ ප්‍රථම රැල්ල වශයෙන් හැඳින්විය හැකිය.

චීන ජනාධිපති ෂී ජින් පින් කසකස්තානයේ සහ ඉන්දුනීසියාවේ නිල සංචාරයක් අතරතුර 2013දී නව සේද මාවත ප්‍රකාශයට පත් කළේය. එක් තීරයක් එක් මාවතක් සැලැස්ම අංශ දෙකකින් යුක්ත විය. ගොඩබිම් සේද මාවත ආර්ථික තීරය සහ සමුද්‍ර සේද මාවත යනුවෙනි. එය එක් තීරයක්, එක් මාවතක් මුලපිරීම ලෙස හෙතෙම නම් කළේය. චීනය ලෝක බලවතා වීමේ භූ දේශපාලනික ආර්ථික අභිමතාර්ථය මත සියල්ල පදනම්ව තිබේ.

අද වන විට ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් සඳහා රටවල් 60කට වඩා වැඩි ප්‍රමාණයක් චීන ආයෝජන ව්‍යාපෘති සඳහා අස්සන් කර හෝ එසේ කිරීමට කැමැත්ත දක්වා හෝ තිබේ. ගෝලීය වේදිකාව මත චීනය තම පැවැත්ම තහවුරු කර ගනිමින් සිටී.

මැලේසියාවේ අගමැති මහතීර් මොහොමඩ් 2018දී ඩොලර් බිලියන 22ක් වටිනා චීන ව්‍යාපෘති අවලංගු කළේය. 2019 කසකස්තානයේ චීන කර්මාන්තශාලා ඉදිකිරීමට එරෙහිව විරෝධතා පැනනැංගේය. ගෝලීය සංවර්ධන මධ්‍යස්ථානයේ 2018 වාර්තාවට අනුව රටවල් 8ක් මේ වනවිට චීන ණය අර්බුදයේ බරපතළ ගොදුරු බවට පත්ව තිබේ. චීන ණය සමහර රටවල දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 20 ඉක්මවා ගොස් ඇති බව පවසයි.

එක්සත් ජනපදයේ virginiya ප්‍රාන්තයේ විලියම් සහ මේරි පර්යේෂණාගාර ඉදිරිපත් කරන දත්ත විශ්ලේෂණය අනුව වසර දහඅටක් තුළ රටවල් 165ක චීන ව්‍යාපෘති 13,427ක් සඳහා ලබාදී ඇති ණය මුදල ඇමෙරිකන් ඩොලර් බිලියන 843 කි. Aid data හි අධ්‍යක්ෂ බ්‍රැඩ් පාර්ක්ස් පැහැදිලි කරන්නේ අපට මෙම දත්ත අභ්‍යන්තරව ලබාගැනීමට නොහැකිය යන්නයි.

චීනයේ භූ දේශපාලන උපාය මාර්ගික සැලැස්මට අනුව නිරිතදිග චීනය සහ අග්නිදිග ආසියාව සම්බන්ධ කිරීමට දොරටුවක් අවශ්‍ය වී තිබේ. ඒ සඳහා චීනය තෝරාගෙන ඇත්තේ අග්නිදිග ආසියාවේ දිළිඳු රාජ්‍යයක් වූ ලාඕසයයි. චීනය-ලාඕසය යා කරන යූ මෝ දුම්රිය මාර්ගය ඉතා දුෂ්කර කඳු, බෑවුම්, උමං මාර්ග ඔස්සේ වැටී තිබේ. චීනයට එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කළේ මූල්‍ය ප්‍රතිපාදන චීනය විසින්ම දරමිනි. ව්‍යාපෘති වාර්තාවට අනුව ඊට ඇ.ඩො. බිලියන 5.9ක් වැය වේ. යූමෝ දුම්රිය මාර්ගයේ වැඩ අවසන් වූ පසු චීනය සහ දකුණු ආසියාව සම්බන්ධ වන්නේය. එහෙත් අවසානයේ චීන ණය මුදලට වගකිවයුත්තේ ලාඕසයයි. ලාඕසයේ රසායනික ද්‍රව්‍ය ආකර ඒ සඳහා ඇපකර ලෙස චීනය විසින් හිර කරගෙන තිබේ. මෙම ගනුදෙනුවේ අඳුරු කොන්දේසිය එයයි.

අතීතයේදී අප්‍රිකානු රටවල් ණය උගුලකට ඇද දැමීම සම්බන්ධයෙන් බටහිර රටවල් වැරදිකරුවෝ වූහ. නමුත් චීනය ණය ලබා දෙන්නේ වෙනත් ආකාරයකින් එක් රටකින් තවත් රටක යහපත සඳහා මූල්‍යාධාර ලබා දීමක් ලෙසය. ණය දීමක් වෙනුවට මෙහිදී සිදුවන්නේ මුදල් සියල්ලම පාහේ චීන බැංකුවක ණය ස්වරූපයෙන් ලබා දීමය.

එසේ ලබාදෙන ණය මුදල් රජයේ ණය පිළිබඳ නිල ගිණුම්වල පෙන්වන්නේ නැත. චීන රාජ්‍ය බැංකු විසින් සිදුකරන බොහෝ ගනුදෙනුවලදී මධ්‍යම රජයේ ආයතන නම් නොකිරීම මීට හේතුවයි. ඒ අනුව ඩොලර් බිලියන 385ක වාර්තා නොවූ ණය ප්‍රමාණයක් ඇති බව aiddata සොයාගෙන තිබේ.

රටවල සංවර්ධනය වෙනුවෙන් චීනය ලබා දෙන ණය සඳහා බොහෝ විට අසාමාන්‍ය ඇපකරද අවශ්‍ය වේ. චීනයෙන් ලබාදෙන ණය වෙනුවෙන් ස්වාභාවික සම්පත් විකිණීමෙන් උපයන මුදල් ලබාදෙන බවට ණය ගැනුම්කරුවන් පොරොන්දු කර ගැනීම වැඩි වශයෙන් සිද්ධ වෙමින් තිබෙන බව පෙනෙන්නට ඇත.

උදාහරණයක් ලෙස වෙනිසියුලාව සමඟ ඇති කරගත් ගනුදෙනුවකදී චීනය ඉල්ලා ඇත්තේ වෙනිසියුලාවේ තෙල් අලෙවි කිරීමෙන් උපයන විදේශ මුදල් චීනය පාලනය කරන බැංකු ගිණුමකට සෘජුවම තැන්පත් කරන ලෙසය.

ණය ආපසු ගෙවීමක් අතපසු වුවහොත් චීනයට ණය ගිණුමේ ඇති මුදල් වහාම ආපසු ගත හැකිය. ඔවුන් ණයකාරයාට දෙන පණිවුඩයක් තිබේ, එනම් ඔවුන් ණය ගත් තැනැත්තාට සංඥාවක් දෙනවා "අපි තමයි මෙතැන ලොකුම ලොක්කා" කියා. මේ වටිනා ණය පහසුකම් ලබා ගැනීමට ඔබට ඉන්නේ අප පමණක් වන නිසා වෙන කිසිවකුටත් පෙර ඔබ අපට ආපසු ගෙවන්න ඕනෑ යන්නයි.

එයම වෙනත් ආකාරයකට කියනවා නම් ඒ කියන්නේ මේ දුප්පත් රටවල ඩොලර් සහ යුරෝ ආදායම විදෙස් බලයක් මඟින් පාලනය වන පිටරටක ගිණුමට දමා අප විසින් අගුළු දැමිය යුතු බවය.

2018 දෙසැම්බරයේදී චීනයෙන් ලබා ගත් අධික ණය ආපසු ගෙවීමට නොහැකි වූ ශ්‍රී ලංකාව ලොව කාර්යබහුල නාවි මාර්ගයක් වන නැගෙනහිර බටහිර නාවික මාර්ගයේ ඇති හම්බන්තොට වරාය චයිනා මර්චන්ට් හෝල්ඩින්ග්ස් සමාගමට පවරා ගැනීමට සැලැස්වීය. චීන සමාගමට වසර 99 කල්බදු ක්‍රමයට ලබා දුන් මෙම ගනුදෙනුව, චීනයේ විදේශීය බලපෑම් ක්‍රියාත්මක කිරීම සඳහා ණය උගුල් භාවිත කරන අන්දම පිළිබඳව ලෝක සංවාදයක් ගොඩනැගීය.

චීන ණය උගුල යනු රාජ්‍යතාන්ත්‍රික ලෝකයේ මෑතකදී වැඩියෙන්ම කතාබහට ලක්වූ යෙදුමකි. ශ්‍රී ලංකාව චීන ණය උගුලක සිරවී ඇති බව කලක සිටම පැවැති චෝදනාවක් විය. රටවල් චෝදනා කර සිටින්නේ චීනය ශ්‍රී ලංකාවට සහ අප්‍රිකානු කලාපීය රටවලට ණය ලබා දෙමින් එම රටවල ආර්ථික මර්මස්ථාන අත්පත් කරගන්නා බවය. එම චෝදනාව ප්‍රතික්ෂේප කරන කොළඹ චීන තානාපති කාර්යාලය පෙරළා පිළිතුරු දෙන්නේ බටහිර ණය උගුලෙන් ශ්‍රී ලංකාව බේරා ගත්තේ චීනය බව පවසමිනි. ශ්‍රී ලංකාවේ මෙන්ම අප්‍රිකාවේද ඇතැම් රටවල වරාය, ගුවන් තොටුපළවල පහසුකම් වැඩිදියුණු කිරීමේ සංවර්ධන ව්‍යාපෘති රැසකට චීනය ණය සපයා ඇත.

පසුගිය සතියේ බොහෝ ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කළේ චීනයෙන් ගත් ණය ගෙවා දැමීමට නොහැකි නිසා උගන්ඩාවේ එකම ජාත්‍යන්තර ගුවන් තොටුපළේ පාලනය එරට රජයටද අහිමි වී ඇති බවය. එන්ටබේ ජාත්‍යන්තර ගුවන්තොටුපළ උගන්ඩාවට අහිමි නොවන බව සහතික කිරීම සඳහා 2015දී උගන්ඩාව චීනය සමඟ අස්සන් කළ ණය ගිවිසුමක් සංශෝධනය කිරීමට උත්සාහ ගන්නා බවද ඇතැම් මාධ්‍ය වාර්තා කළේය. එන්ටබේ ගුවන් තොටුපළ පුළුල් කිරීම සඳහා උගන්ඩාව චීනයේ එක්සිම් බැංකුවෙන් ඩොලර් මිලියන 200 ක් ණයට ගත් බවත් එම ණය කොන්දේසි වෙනස් නොකරන්නැයි උගන්ඩා රජයේ ප්‍රධාන නීති නිලධාරි එරට මුදල් අමාත්‍යාංශයට උපදෙස් දුන් බවත් bloomberg වෙබ් අඩවිය මේ සම්බන්ධයෙන් පළ කළ වාර්තාවෙහි සඳහන් වේ. කෙසේ නමුත් උගන්ඩාවේ එන්ටබේ ජාත්‍යන්තර ගුවන්තොටුපළ චීනය අත්පත් කරගත් බවට පළ වන වාර්තා ප්‍රතික්ෂේප කරන බව කොළඹ චීන තානාපති කාර්යාලය ප්‍රකාශ කළ බව බී. බී. සී. ය වාර්තා කර තිබිණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කෙරුණු විදේශ ණය සාරාංශය අනුව 2021 අප්‍රේල් මාසය අවසන් වන විට රජයේ මුළු හිඟ විදේශ ණය ප්‍රමාණය අමෙරිකානු ඩොලර් බිලියන 35.1 කි. 2020 ජනවාරි 01 සිට අප්‍රේල් 30 දක්වා එහි ගෙවීම් ඩොලර් මිලියන 981ක් වූ අතර එයින් ඩොලර් මිලියන 520.6 ක් මූලික ණය ආපසු ගෙවීම් වෙනුවෙන්ද ඉතිරි ඩොලර් මිලියන 460.6 පොලිය ගෙවීම සඳහාද භාවිත කර ඇත. මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන විදේශ ණය සාරාංශය උපුටා දක්වමින් කොළඹ චීන තානාපති කාර්යාලය ශ්‍රී ලංකාවේ ණය සාරාංශයක් ඉදිරිපත් කළේය. එහි සඳහන් කර තිබුණේ වෙනත් වචනවලින් කියනවා නම් බටහිර ණය උගුලෙන් ශ්‍රී ලංකාව ගලවා ගත්තේ චීනය යනුවෙනි.

කෙන්යාවේ සෙනෙට් සභික මුටුලා කොලොන්සො කෙන්යා පාර්ලිමේන්තුව අමතා වරක් ප්‍රකාශ කළේ කෙන්යානු ජනතාව චීන ණය උගුලේ සිර කිරීම සම්බන්ධව ඉතිහාසය මහා කෲර අන්දමින් අපව විනිශ්චය කරාවි යනුවෙනි.

චීනය එක් වසරකදී ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය බැඳීම් සඳහා වියදම් කරන මුදල ඩොලර් බිලියන 85කි. එය චීන භූ දේශපාලනයේ උපායමාර්ගික වැඩසටහන අත්හැරිය නොහැකි කොටසකි. චීනය ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කරන අතරම චීන ශ්‍රමිකයන් චීන යන්ත්‍රෝපකරණ භාවිතාවේ යොදවමින් ආයෝජනය කළ මුළු මුදලම නැවත චීනෙට ලබාගන්නා අතර ශ්‍රී ලංකාවට මහා ණය කන්දක් ඉතිරි කරයි. නෙළුම් කුලුන, හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාව, සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ආදී චීන ව්‍යාපෘති ශ්‍රී ලංකාවට ණය කන්දක් ඉතිරි කළත් ඉන් ලැබෙන ප්‍රතිපාදනයක් නොමැත. ශ්‍රී ලංකාව ණය ගෙවා ගැනීම සඳහා තව තවත් ණය ගනිමින් ණය උගුල තුළම දඟලනවා මිස ගොඩ ඒමක් නැත.

■ උදේනි සමන් කුමාර

# මහරහතන් වහන්සේලා විෂයයෙහි ගුණ පූජාවක්



සීමිත කාලය තුළදී එක්වරක් හෝ සිදුකර ගතයුතු මහරහතන් වහන්සේලා විෂයෙහි පවත්වන ලද මහා ගුණ පූජාවකි. ඊට ඔබටත් සහභාගී වී සංසාර දිවියට එක් කරගෙන අතිශය ඝෝරභයංකාර වූ සංසාර චක්‍රයෙන් මිදීමේ භාග්‍යය උදාකර ගැනීමට වාසනාවන්තයකු විය හැකිය.

ඒ අසිරිමත් මහරහතන් වහන්සේලාගේ ගුණ විෂයෙහි පවත්වන අටපිරිකර දහසක් සහිත ගිරිභාණ්ඩ පූජා කිරීමේ මහා ගුණ පූජාව නාඹුළුව ශ්‍රී මංගලාරාම විහාරස්ථානයේදී 2022 පෙබරවාරි මස 04 වැනි සිකුරාදා දින සවස 05.00ට පැවැත්වේ. පින් කැමති සියලුදෙනා මෙම පින්කම දැක බලා සතුටු විය හැකිය.




කාලානුරූපව පැමිණීමට නොහැකිවන දායක පින්වතුන්ට Oneline තාක්ෂණය ඔස්සේ සජීවීව පින්කමට සහභාගී වීමේ හැකියාවද ඇත.

පුණ්‍යාභිලාෂී සුපින්වතුන් හට මෙම අතිදුර්ලභ මාහැඟි පින්කමෙහි දායකත්වය ලබා ගත හැකිය.

0717585872

**විහාරස්ථානය -** 0710565518, 0332285218




සමස්ත ලංකා 1985 උපන් සංසදය දෙවැනි වරට සංවිධාන කරන "ජීවිතයට වාරුවක් - 85න් යුතුකමක්" ලේ දන් දීමේ වැඩසටහන ජනවාරි 16 වැනි දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා රාගම, හොරපේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේදී පැවැත්වේ. එයට සහභාගි වන ලෙස ඔබට ආරාධනා කර සිටිමු.

**මේ පිළිබඳ විමසීම් සඳහා**

ප්‍රගීත් - 07615277600 චාමර - 0777555294
බිනර - 0761673894 මේරි - 0776383409

# පානදුර රාජකීයයේ 44 සංවත්සරය නිමිත්තෙන් ලේ දන්දීම ඇතුළු පින්කම් මාලාවක්

පානදුර රාජකීය විද්‍යාලයේ 44 වැනි සංවත්සරය මෙම මස 9 වැනි දින අභිමානවත්ව සමරන එම විද්‍යාලය ඒ වෙනුවෙන් පින්කම් මාලාවක් සංවිධානය කර ඇත. ඒ අතර ජනවාරි 9 වැනි දින පෙ.ව. 8.30ට සිට ප.ව. 3.30 දක්වා ලේ දන්දීමේ වැඩසටහනක් විදුහල් ආදි සිසු සංගමය සංවිධානය කර ඇත. ඒ සඳහා ලේ පරිත්‍යාගශීලී සැමට ආදි සිසු සංගමය ගෞරවයෙන් ඇරයුම් කර සිටී. මීට අමතරව උදෑසන පරිත්‍රාණ ධර්ම දේශනාවක් සහ සංඝගත දක්ෂිණාවක් පැවැත්වීමටද විදුහල්පතිතුමා, ආචාර්ය මණ්ඩලය හා පාසල් සංවර්ධන සමිතිය කටයුතු සංවිධානය කර ඇත.


## ඇබෑර්තු

**රාජගිරිය, දෙහිවල, රත්මලාන, බොරැල්ල, අතුරුගිරිය, මොරටුව හා නුගේගොඩ පිහිටි ජාත්‍යන්තර පාසල් සඳහා පහත සඳහන් ඇබෑර්තු වෙත අයදුම් කළ හැක.**

### රියදුරු (ලොරි, බස්, වෑන්)

- වයස අවු: 25 - 40 ත් අතර විය යුතුය
- බර/ සැහැල්ලු වාහන සඳහා බලපත්‍රය තිබිය යුතු අතර අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් තිබිය යුතුය

### බස් රථ සහායකයින්

- වයස අවු: 25 - 40 ත් අතර විය යුතුය
- පළපුරුද්දක් තිබීම අත්‍යවශ්‍ය නොවේ

### සේවිකාවන් (කාන්තා)

- වයස අවු 25 - 50 ත් අතර අයකු විය යුතුය
- කැපවීමෙන් හා වගකීමෙන් කටයුතු කරන අයෙකු විය යුතුය
- පළපුරුද්දක් තිබීම අත්‍යවශ්‍ය නොවේ

### ආරක්ෂක නිලධාරීන්

- වයස අවු 25 - 50 ත් අතර අයකු විය යුතුය
- කැපවීමෙන් හා වගකීමෙන් කටයුතු කරන අයෙකු විය යුතුය

**2022 ජනවාරි 20 ට දිනට පෙර ඔබගේ අයදුම්පත රැගෙන සතියේ දිනවල පෙ.ව 8.30 සිට ප.ව 3.00 අතර පහත සඳහන් ලිපිනයට පැමිණෙන්න.**

**වහාම බඳවා ගැනේ**

**මානව සම්පත් කළමනාකරණ අංශය, ගේට්වේ ප්‍රධාන කාර්යාලය, නො-06, රොඩ්නි වීදිය, කොළඹ - 08. (බොරැල්ල - කෝට්ටේ පාර දුම්රිය ස්ථානය ඉදිරිපිට)**
**දු.ක. - 0112670670**
**වි.තැ. - hrm@gatewayworldwide.com**

Gateway to Learning
**Gateway College**


# 'ස්මාර්ට් කූඹියාගේ වලාකුළු සවාරිය' 13 වැනිදා සුදර්ශියේදී ජනගත වෙයි



නුවන් කුමාර කටුගම්පල විසින් රචනා කරන ලද "ස්මාර්ට් කූඹියාගේ වලාකුළු සවාරිය" යොවුන් කාව්‍ය සංග්‍රහය 2022 ජනවාරි මස 13 වැනි දින සවස 2.00ට කොළඹ -7 බෞද්ධාලෝක මාවතේ (BMICH ඉදිරිපිට) පිහිටි සුදර්ශි - සිංහල සංස්කෘතික ආයතනයේ දී ජනගත කෙරේ. 46 වැනි මහගම සේකර අනුස්මරණයට සමගාමීව "යෞවනයටත් කවියක්" යන්න තේමා කර ගෙන මෙම වැඩසටහන පැවැත්වේ.

මෙහිදී ජනශ්‍රැති පර්යේෂක, සම්මානිත සාහිත්‍යවේදී විශ්වවිද්‍යාල කථිකාචාර්ය මහින්ද කුමාර දළුපොත, ප්‍රවීණ කිවියර, ජීවන මුද්‍රා සංස්කෘතික සාමූහිකයේ අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල කථිකාචාර්ය සුමින්ද කිත්සිරි ගුණරත්න යන මහත්වරුන් දේශන පවත්වනු ලබයි. තවද පාසල් ශිෂ්‍යය, යොවුන් සාහිත්‍යවේදිනි අමන්දා දළුපොත, පාසල් ශිෂ්‍ය, ළමා සාහිත්‍යවේදී චමත්ක කවීන් යන දරුවන්ද අදහස් දැක්වීමට නියමිතය. කවි ගැයුම් සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂිකා මදාරා මධුශානි සහ චින්තක ලංකා පුත්‍ර මහතාගෙනි. කථනය ප්‍රවීණ මාධ්‍යවේදී සම්මානලාභී නිවේදන ශිල්පී ක්‍රිශාන්ත දයානන්දගෙනි.

නුවන් කුමාර කටුගම්පළ විසින් රචිත ජනප්‍රිය ළමා ගී කිහිපයක් රසවිඳීමට මෙහිදී ඉඩ සැලසේ "ස්මාර්ට් කූඹියාගේ වලාකුළු සවාරිය" IBMC ප්‍රකාශනයකි.


# උකසට තබා බේරා ගැනීමට නොහැකිවූ ඔබේ රන් භාණ්ඩ නැවතත් ඔබේ අතටම

F.A.Ads

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

**වැඩි විස්තර සඳහා අමතන්න**

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | වැල්ලවත්ත | 0710 870 686 |
| මොරටුව | 0766 227 059 | කළුතර | 0776 167 149 |
| මීගමුව | 0766 227 056 | ගම්පහ | 0779 230 549 |
| වෙන්නප්පුව | 0710 869 378 | හලාවත | 0779 256 191 |
| ගාල්ල | 0705 979 274 | මාතර | 0705 979 237 |
| කුරුණෑගල | 0766 227 061 | ගම්පොල | 0710 870 735 |
| දිගන | 0778 156 738 | නාවලපිටිය | 0710 870 706 |
| තලවකැලේ | 0710 871 009 | හැටන් | 0778 790 372 |
| මාතලේ | 0702 539 389 | කෑගල්ල | 0703 583 363 |
| බේරුවල | 0772 999 934 | පූඩළුඔය | 0777 683 889 |
| මතුගම | 0772 206 413 | රාගල | 0710 870 703 |
| වව්නියාව | 0740 920 313 | උඩප්පුව | 0771 201 851 |
| මොණරාගල | 0771 201 852 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බදුල්ල | 0771 201 863 | පුත්තලම | 0771 201 861 |
| කොටහේන | 0702 539 382 | මහියංගනය | 0771 201 862 |
| කල්පිටිය | 0761 605 803 | මස්කෙලිය | 0760 909 822 |
| කටුගස්තොට | 0779 476 206 | පානදුර | 0776 157 119 |
| නාඋල | 0763 226 230 | | |




මව්බිම

සිලෝන් නිවුස්පේපර්ස් (පෞද්.) සමාගම,
101, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

- දුරකතන, කර්තෘ මණ්ඩලය
011-7566511
011-7566512
- ෆැක්ස්
011-7566514
- වෙබ් අඩවිය
www.mawbima.lk
- ඊ.මේල්
news@mawbima.lk
- බෙදාහැරීම්
011-7566583
011-7566584
- ෆැක්ස්
011-7566587
- දැන්වීම්
011-7566568
011-7566572
- ෆැක්ස්
011-7566569

# ඇතුළත් ගිනි, පිටත් ගිනි

ඇතුළත ගිනි පිටතට දෙන්න එපා යැයිද, පිටත ගිනි ඇතුළට දෙන්න එපා යැයිද, කතාවක් ජනවහරේ තිබේ. ප්‍රෝපේන් – බියුටේන් සංයුතිය වෙනස් වූ විට ගෑස් සිලින්ඩරයේ පීඩනය වැඩි වුණා සේ. ආණ්ඩුවේ අභ්‍යන්තර පීඩනයද වැඩි වී තිබේ. අත ගහන, අත ගහන වැඩපිළිවෙළ අවුල් වන විට පීඩනය වැඩි වීම පුදුමයට හේතුවක් ද නොවේ.

හතර පැත්තම පටලවාගෙන යුද්ධ කරන ගැමුණු කුමාරයාට නියම්ගමක අම්මා කෙනෙක් කීවේ, උණු උණුවේ බත් ගුළි ගිලින ආකාරයට කොනින් කොනට එකින් එක හමාර කරපන් කියාය. ආණ්ඩුවට ඒ බණේ තේරෙන්නේම නැත. කාබනික පොහොර, ගෑස්, කිරිපිටි හැම ප්‍රශ්නයක්ම එකට අනාගෙන අවුලෙන් අවුලටම ගියේය.

පිටත ගිනි ඇවිළෙන විට ඇතුළේද ගිනි ඇවිළෙමින් තිබේ. රාජ්‍ය ඇමැති සුසිල් නෙරපුවා යැයි ආණ්ඩුව කියන විට තමාට දෙල්කඳ පොළේ ටිකට් එකක් ඇදුණා යැයි ඇමැති සුසිල් කියයි. ජනතාව බලා ඉන්නේ කාට කාටත් ටිකට් ඇදෙනතුරුය.

ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍යයේ මූල්‍ය පරිපාලනය පිළිබඳ පූර්ණ බලය පවතින්නේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුවය. රජය මුදල් හැසිරවීම පිළිබඳව ගන්නා සියලු තීරණ පාර්ලිමේන්තුවේ අධීක්ෂණයට යටත් විය යුතුය.

එහෙත් එය එසේ සිදු වෙනවාද යන්න පිළිබඳව වර්තමානයේ බරපතළ ප්‍රශ්නයක් මතු වෙමින් තිබේ. රජයේ මුදල් කටයුතු පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව හිතූ හිතූ පරිදි සිදු වෙමින් තිබේ. 2021 නොවැම්බර් 12 වැනිදා මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ විසින් 2022 වසර සඳහා වූ අය-වැය ලේඛනය ඉදිරිපත් කළේය. එය පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් සම්මත විය.

ජනවාරි 18 වැනිදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ රාජාසන කතාව පවත්වා නව පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භ වනතුරු පාර්ලිමේන්තුව රැස් වන්නේ නැත. මේ අතර මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ විසින් 2022 ජනවාරි 3 වැනිදා ජනතාවට සහන පැකේජයක් ඉදිරිපත් කළේය.

අතිශය අසීරු ආර්ථික අර්බුදයක කරවටක් ගිලී සිටින ජනතාවට එය යම් සහනයක් වූ බවට විවාදයක් නැත. එහෙත් ප්‍රශ්නයක් තිබේ. හදිසියේ සහන පැකේජයක් ඉදිරිපත් කිරීමට මුදල් ඇමැතිවරයා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගත්තේ කෙලෙසද යන්නයි.

මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ පවසන අන්දමට රාජ්‍ය සේවකයන් 14 ලක්ෂයකට රුපියල් 5000 බැගින් අතිරේක දීමනාව ලබාදීම සඳහා බිලියන 87ක අතිරේක වියදමක් දරන්නට සිදුවේ. විශ්‍රාමික රාජ්‍ය සේවකයන් සඳහා රුපියල් 5,000ක දීමනාව ලබා දීමට රුපියල් බිලියන 40ක අතිරේක වියදමක් දැරීමට රජයට සිදුවේ. ඒ පිළිබඳ කිසියම් ඉඟියක් හෝ මුදල් ඇමැතිවරයා අය-වැය ලේඛනයේ දී පවසා තිබුණේ නැත.

කිසිදු අමාත්‍යාංශයක් සඳහා අය-වැය ලේඛනයේ අනුමත කර ඇති ප්‍රතිපාදනවලට අමතරව පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් නොකරන ලෙසත් පරිපූරක ඇස්තමේන්තු සඳහා කිසිසේත් මුදල් වෙන් නොකරන බවත් ඇමැතිවරයා අවධාරණය කර තිබිණි. මෙයින් පැහැදිලි වන්නේ මුදල් ඇමැතිවරයාට එය වලංගු නොවන බවය.

චීන කුණු පොහොර ලංකාව භාර නොගත් නිසා චීනය මහජන බැංකුව අසාදු ලේඛනගත කළේය. අවසානයේ පසුගිය සති අන්තයේ මහජන බැංකුව චීන පොහොර සමාගමට ඇ.ඩො. මිලියන 6.7ක් වන්දි ගෙවීය. ආණ්ඩුව එක පැත්තකින් ඩොලර් නැති බව පවසමින් කෙඳිරිගාන අතර තවත් පැත්තකින් මහ බැංකු අධිපති නිවාඩ් කබ්රාල් කියන්නේ රජයට ඩොලර් හිඟයක් නැති බවය.

පාර්ලිමේන්තුව විසුරුවන්නට පෙර ශ්‍රී ලංකාව සතුව තිබූ ත්‍රිකුණාමලේ තෙල් ටැංකි සමූහය 18 වැනිදා පාර්ලිමේන්තුව සැසිවාරය විවෘත වන විට ලංකාව සතුව නොතිබෙන්නට ඉඩ තිබේ. ආණ්ඩුව බොහෝ තීරණ ගන්නේ මැදියම් රැයේය.

ජනතාවට දැඩි පීඩනයක් එල්ල වෙන එකදු ප්‍රශ්නයක් හෝ නිට්ටාවට විසඳන්නට ආණ්ඩුව අපොහොසත්ව ඇත. අවුරුද්දකට ආසන්න කාලයක් ඇදි ඇදී යන ගෑස් ප්‍රශ්නයටද තාමත් විසඳුම් ලබාදී නැත.

ප්‍රථමයෙන් කළ යුත්තේ පිටත තිබෙන ගිනි නිවා දැමීමය. එවිට ඇතුළත ගිනි ඉබේම නිවී යනු ඇත. තනිව ගනු ලබන උද්දච්ච තීරණවලට සාමූහික වගකීම අපේක්ෂා කිරීම අනුවණකමකි.



# ක්‍රමය වෙනස් නොකර දෙන සහන මල්ලක බර

ජීවන වියදම සම්බන්ධව බරපතළ ගැටලුවක් තිබේ. ජනතා විරෝධය නැඟෙමින් තිබිණි. මිල වැඩිවීම පමණක් නොව භාණ්ඩ හිඟයද ජනතාව පෙළූ හිරිහැරයකි. අත්‍යවශ්‍ය දේ මිලදී ගැනීම සඳහා පෝලිම් සුලබ දර්ශනයකි. සහන පැකේජයක් ප්‍රකාශයට පත් කරන්නේ මෙම පසුබිම අතරවාරයේය. ආණ්ඩුව ප්‍රකාශයට පත් කර ඇති සහන අනුව රජයේ සේවකයන්, විශ්‍රාමිකයන් ඇතුළු ජන කොටසකට සහනයක් ලැබී ඇත. සහන ප්‍රතිලාභ සියලු පුරවැසියන්ට ලැබෙන බව සඳහන් කිරීම නිවැරදි නොවේ. ආදායම පහත වැටී, ජාත්‍යන්තරයෙන් එන පීඩනයකටද මුහුණ දෙමින් සිටි ආණ්ඩුව වහාම ලබා දුන් සහන අවසානයේදී ආර්ථිකය ගෙනයන තැන ගැන ප්‍රශ්න කළ යුතුය.

කොවිඩ් වසංගත තත්ත්වය විශාල කලබැගෑනියක් කළේය. නිෂ්පාදන අඩාළ වූ අතර වැඩ කරන ජනතාවගේ ආදායම පහත වැටිණි. වරින් වර ප්‍රකාශයට පත්කළ ලොක්ඩවුන් තීන්දු එදිනෙදා ආදායමෙන් ජීවත් වූ ලක්‍ෂ ගණනකගේ ජීවිත අසරණ කළේය. යහපාලන ආණ්ඩුව පරාජයට පත් කරන්නට ජනතාව ගත් තීරණය නැවත සිහිපත් කළ යුතුය. රට ඉදිරියට ගෙනයන පියවර කෙරෙහි දැක්වූ අලස භාවය ප්‍රශ්න සංකීර්ණ තැනකට පත් කර තිබිණි. රටට අලුත් නායකත්වයක්, අලුත් බලවේගයක් තෝරා ගත් නමුත් මතුව ඇති සංකීර්ණ ව්‍යුහය ජනතා අපේක්ෂා ආපසු හරවා ඇත.

## සහන ලැබෙන ජන කොටස සීමිත පිරිසකි

ආණ්ඩුවේ සහන පැකේජය ඒවා අවශ්‍යම ජන කොටසට ලැබෙන්නේද යන්න ගැටලුවකි. රජයේ සේවකයන්, විශ්‍රාමිකයන් සහ ආබාධිත රණවිරුවන් මෙම සමාජයේ කොටසකි. සමෘද්ධිලාභීන් ජීවත් වූයේ අපහසුවෙන්ය. වතු සේවකයන්ගේ අවම වැටුප පවා නොගෙවන ලද බව මතක් කළ යුතුය. මේ අයටද ජීවන වියදම දැනිණි. වී ගොවියන්ගේ සහතික මිල නැංවීම, අත්‍යවශ්‍ය ආහාර හා ඖෂධ සඳහා අය කරන ලද බදු ඉවත් කිරීම නරක අදහසක් නොවේ. එහෙත් පෞද්ගලික අංශයේ සේවය කරන ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ලැබෙන ආවරණය කුමක්ද? ස්වයං රැකියාවක නිරත පිරිසට ලැබෙන පිට්වහලක් තිබේද? මාසික වැටුපක් ස්ථිරව ලැබෙන ජන කොටස වෙනුවට ආදායම නොලැබී අසරණ වූ පිරිස ගැන කල්පනා කිරීමට වගකීමක් ඇත.

රට පුරා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ලක්ෂ ගණනක් වැසී ඇත. ත්‍රීවීලර්, බස්, පාසල් හා කාර්යාල සේවා බස් රියැදුරන් ඇතුළු පිරිසකට ප්‍රශ්න තිබේ. ලබාගත් ණය ගෙවාගත නොහැකි පිරිස් විශාලය. බැංකු හා මූල්‍ය ආයතන දිගින් දිගටම පොලිය හා දඩ නියම කරමින් සිටියි. රාජ්‍ය හා පෞද්ගලික බැංකුවලත් උකස් ආයතනවලත් තත්ත්වය ගැන අවධානය යොමු කරන්න. මැදි ආදායම් ලබන පිරිස් දක්වා සියලුම දෙනා කනකර උකස් කරන තැනට පත්ව ඇත. සෑහෙන පිරිසකගේ ක්‍රෙඩිට් කාඩ් ණය සම්පූර්ණයෙන් ගෙවාගත නොහැකි වී ඇත. එය පවතින ආර්ථික පසුබෑම තුළ පැහැදිලිව දැකගත හැකි තැන්ය.

ඉන්ධන මිල වැඩි කිරීම සියලුම දෙනා එක හා සමාන දුෂ්කර තැනකට පත්කළ තීරණයකි. ඒ නිසා බේකරි නිෂ්පාදනයේ සිට සියලු දේ මිල වැඩි වී තිබේ. වැඩි කළ බස් ගාස්තුව දරාගත හැකි එකක්ද? ගෑස්, කිරිපිටි, සීනි, සහල් ඇතුළු අත්‍යවශ්‍ය දේ නැවත වටයකින් මිල ඉහළ නැඟ ඇති බව පාලකයෝ තේරුම් ගත යුතුය. එක පැත්තකින් සියලු දේ නංවා අනෙක් පැත්තෙන් එක ස්තරයකට පමණක් ආවරණයක් ලබා දීම ප්‍රශ්නයකි.

## සහන අසහනයක් වන දිනයක් ඇත

සහන පැකේජය සඳහා වැය කරන මුදල රුපියල් බිලියන 299කි. මෙම අවුරුද්දේ රජයේ ආදායමෙන් සියයට දහයක් වෙන් කොට ඇති බව පෙනේ. අය-වැය ප්‍රකාශයට පත් කළ මුදල් ඇමැතිවරයා සියලු වියදම් කපා හැරියේය. අලුත් ඉදිකිරීම් අත්හිටුවන ලද අතර රැකියාවලට බඳවා ගැනීම නතර කරන ලද බව මතක් කළ යුතුය. සංවර්ධන වැඩ අලුතින් ආරම්භ කළ නොහැකි බව පෙන්වා දුන්නේය. ඒ වන විටත් රජයේ ආදායමෙන් සියයට අසූ තුනක කොටසක් රජයේ සේවක වැටුප් සඳහා ගෙවන ලද බවද අවධාරණය කොට දැක්විය යුතු කරුණකි. මහජනතාවගෙන් අය කරන බදු ගැන නොතකා නැවත වතාවකින් රජයේ සේවය සඳහා දීමනාවක් යෝජනා කර ඇත. මෙම දීමනා තාවකාලික ඒවා නොවේ. එකක් දුන් පසු ආපසු හැරවිය නොහැකිය. ලබන අවුරුද්දේ අය-වැය සකස් කරන විට මෙම වියදම සඳහා අලුත් බදු පනවන්නට සිදුවනු නොඅනුමානය.

පසුගිය වසර අවසන් වන විට රට තුළ උද්ධමනය සියයට 12.1කි. එය ආසියාවේ දෙවැනියට වැඩිම උද්ධමන අනුපාතිකය බව ජාත්‍යන්තර වාර්තා දක්වයි. ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යෑම සියයට 22.1කි. මෙම උද්ධමනය ශ්‍රී ලංකාවේ වසර දොළහක ඉතිහාසයේ ඉහළම අගය බව පෙන්වා දිය යුතුය. මෙම වසරේ අය-වැය හිඟය සියයට 8.8ක් වනු ඇතැයි ගණන් බලා තිබිණි. පසුගිය අවුරුද්ද අවසන් වූයේ සිතාගත නොහැකි හිඟයක් ඉතිරි කරමින් බව මතක් කළ යුතුය. ආණ්ඩුවට සිය ණය සීමාව රුපියල් බිලියන 3,397 දක්වා බිලියන හාරසියයකින් වැඩි කරන්නට සිදුවූයේ ඉකුත් නොවැම්බරයේදීය. මෙම ණය පියවන්නේ අලුත් මුදල් මුද්‍රණය කිරීමෙන් බව නොරහසකි. අවසානයේදී රට තුළ සංසරණය වන මුදල් ප්‍රමාණය ඉහළ යන අතර එය තවත් වටයකින් උද්ධමනයට හේතුවකි. ආණ්ඩුවේ ආර්ථික උපදේශකයන් මෙහි අනිටු විපාක නොදන්නවා නොවේ.

## ප්‍රතිසංස්කරණය වෙනුවට අලුත් වටයකින් බදු

අර්බුදකාරී අවස්ථාවක ක්‍රමය වෙනස් කරන්නට අවශ්‍යය. වියදම පිරිමසන අලුත් පැති ගැන සොයා බැලිය යුතුය. මෙම වසර තුළ ජගත් ප්‍රජාවට පියවිය යුතු ණය ඇමෙරිකානු ඩොලර් බිලියන 7.1කි. එය ආවරණය කරගැනීම සඳහා තාවකාලික සංචිතයක් මූල්‍ය අරමුදලෙන් ලබාගත හැකිව තිබේ. ආණ්ඩුවේ ප්‍රධානීහු මූල්‍ය අරමුදලේ සහාය ප්‍රතික්ෂේප කරති. එතැනින් එන නිර්දේශ හා ප්‍රතිසංස්කරණ අහිතකර බවට දැවැන්ත මතයක් සමාජගත කරති. විපක්ෂය පවා එයට හවුල් වීම කනස්සල්ලට හේතුවකි. රටට අවශ්‍යම කරන මූල්‍ය විනය ඇති කරන්නට ගෙන එන වැදගත් නිර්දේශ නොතකා නොසලකා හැරීම සුදුසු නැත.

මූල්‍ය අරමුදලේ නිර්දේශ විය හැකි ප්‍රධාන කරුණු මොනවාද? අලාභ ලබන රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කළ යුතුය. තෙල්, විදුලිය, ශ්‍රී ලන්කන් වැනි ප්‍රධාන තැන් වෙනස් කළහොත් මහා භාණ්ඩාගාරයට ඉතිරි කරගත හැකි ධනය මෙම සහනවලට නිකුත් කළ ප්‍රමාණය ඉක්මවයි. අසාර්ථක ව්‍යවසාය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.5 - 1 අතර ප්‍රමාණයක් වනසන බව නොරහසකි. රජයේ සේවය අඩු කරගත යුතුය. සහනාධාර පාලනය අවශ්‍යය. අය-වැය හිඟය සියයට හතර දක්වා පාලනය කරගත යුතු අතර ආයෝජන සඳහා වැඩි අවස්ථා නිර්මාණය කරගැනීමට බල කෙරේ. මේවා ක්‍රමය වෙනස් කරන අලුත් අදහස්ය. දහසය වතාවක් ශ්‍රී ලංකාවට කියා දී ඇත. එකම චක්‍රය තුළ අතිශය පීඩාකාරී ගමන වෙනුවට පැති මාරු කර වේගවත් සංවර්ධනයක් සඳහා උපදෙස් සපයා ඇත. එහෙත් දේශපාලන නායකයෝ මේවා ගැන නොතකති. වත්මන් ආණ්ඩුව පමණක් නොවේ, පැවැති සියලුම ආණ්ඩු ජනතාව සිහිනවල සතපවා ඡන්දය පැහැර ගැනීමට නැති සම්පත් බෙදාදී ඇත. එහි අවසාන ප්‍රතිඵලය ණය කන්දක් බව පෙන්වා දිය යුතුය.

## අර්බුදය අපට පමණක් සීමා වූ එකක් නොවේ


අප අත්විඳිමින් සිටින විපාක ලෝකයේ අනෙක් රටවලද සිදුවෙමින් පවතින බව ඇත්ත කතාවකි. පරෙස්සමෙන් අධ්‍යයනය කළහොත් එය සනාථ වෙයි. ඇමෙරිකාවේ උද්ධමනය සියයට 6.8කි. වසර හතළිහකට පසු වැඩිම අගය බව දැක්වේ. නොවැම්බර් මාසයේ තෙල් මිල වැඩි වීම සියයට 58.1කි. 1980 සිට වසරක් තුළ වාර්තා වූ වැඩිම මිල ගණන්ය. ජර්මනියේ උද්ධමනය සියයට 4.9ක් වන අතර එය වසර 29කට මෙපිට වැඩිම අගය බව වාර්තා කර ඇත. තුර්කියේ සියයට 21.3කි. බ්‍රසීලයේ සියයට 10.7කි. රුසියාවේ උද්ධමනය සියයට 8.4ක් බව ෆිච් රේටිං ආයතනය කියයි. පාකිස්තානයේ උද්ධමන අගය සියයට 12.3කි. මෙම රටවල වැඩිම උද්ධමනය හා සමානව ඉතාම වේගයෙන් ප්‍රතිසංස්කරණ යෝජනා කෙරේ. කොවිඩ් වසංගත තත්ත්වය සමඟ වේගයෙන් පහත වැටුණු ආර්ථික හරි ක්‍රම අනුගමනය කරමින් වැඩිම වේගයෙන් නැඟී සිටින තැන් බවට පත්ව ඇත.

නිදහසින් පසු බලයේ සිටි ආණ්ඩුවලට ඉක්මන් වෙනස්කම් කරන ධෛර්යයක් තිබුණේ නැත. නොතිබුණාම නොවේ, කරන වෙනස්කම් පවා අනෙක් ආණ්ඩුවක් බලයට පත් වහා ආපසු හැරවීය. ඒවාට වන්දි ගෙවන්නේ පොදු මහජනතාව බව අප අමතක කළ කරුණකි. පෞද්ගලීකරණය කර තිබුණු ශ්‍රීලන්කන් ගුවන් සේවය ආපසු මිලදී ගත් අතර එය පවරා ගත් දිනයේ සිට පාඩු ලබයි. මිලදී ගන්නට වැය කළ ඩොලර් ණය සඳහා තවමත් පොලිය ගෙවන රටකි. රක්ෂණ සංස්ථාව නැවත ලබාගත් අතර භාණ්ඩාගාර බිල්පත්වලින් එම මුදල් ගෙවා දැමීය. ඛනිජ තෙල් මිලදී ගැනීමේ ක්‍රමවේද, පොහොර සහන, බදු වෙනස් කිරීම් වැනි අනුචිත තීරණ අවසානයේදී රටට ඇති කළේ ආර්ථික විපත්ය. ඒවායෙන් අත්පත් වූ අවාසි ලංකා ඉතිහාසයේ කැළැල් සේ ඉතිරි වී තිබේ.

## බදු වැඩි නොකරන රටක් වෙත ගෙන යන්න

මෙම සහන වෙනුවෙන් බදු අලුතින් පනවන්නේ නැති බව මුදල් අමාත්‍යවරයා ප්‍රකාශ කර ඇත. එය ඉතාම සුදුසුය. එහෙත් බදු ගෙවිය යුතු විශාල පිරිසක් එසේ නොකරන බව නොරහසකි. මධ්‍යම පාන්තික ජනතාවගේ ඇඟට කඩාපැන වටලන බදු නිලධාරීන් විශාල වශයෙන් වත්කම් උපයාගෙන සිටින පිරිස් වෙත දයාර්ද්‍රය. ආදායම් බදු එකතු කරන ක්‍රමවේදය පලක් නැති බව රාජ්‍ය මට්ටමින් කරන ලද පර්යේෂණවලදී අනාවරණය වූ කරුණකි. බදු අය කරන්නට යොදන නිලධාරීන්, එයට යොදවන වෙහෙස හා පිරිවැය අනුව රටට ආදායම් බදු ලැබෙන්නේ නැත. එය වෙනුවට වක්‍ර බදු පැනවීම සුදුසු බව එහි පෙන්වා දී තිබිණි. එහෙත් වක්‍ර බදු සාමාන්‍ය ජනතාව පීඩාවට පත් කරයි.

2022 අය-වැය යෝජනා අනුව එක වරක් පමණක් අය කරන විශේෂ බද්දක් හා සමාජ සංරක්ෂණ අරමුදලක් යෝජනා කර ඇත. මූල්‍ය සමාගම්වල සේවා ගාස්තු වෙනස් කර තිබේ. අගය එකතු කළ බදු සඳහා සංශෝධන යෝජනා කර ඇත. මෙම බදුවලින් උපයන්නට ඉලක්ක කරන ධනය රුපියල් බිලියන 333කි. මෙම පැත්ත ගැන සලකා බලන විට තුන්සිය තිස්තුනක් උපයාගෙන දෙසිය අනූ නවයක් ආපසු පිරිනැමීම අපහසු කාරණයක් නොවේ. ආණ්ඩුවට තවත් ලාභයක් ඇත. මුළු ජන කොටසම මෙම සංශෝධිත බදු ගෙවන අතරවාරයේ කොටසකට පමණක් සහන ලැබීම නරකම තීන්දුවකි. ආණ්ඩු තීරණ ගන්නේ ඉලක්ක ඇතිවය. අරමුණක් නොතිබෙනවා නොවේ. ඒවායේ අභ්‍යන්තරය වෙනම සාධකයකි. පැවැත්ම සඳහා අවශ්‍යම කරන කොටස තෝරාගැනීමට පාලකයන් දක්ෂය. මෙම අවුරුද්ද තුළ තවත් බදු වැඩි නොකරන තීන්දුව පමණක් පොදු මහජනතාවගේ තෘප්තියට හේතුවකි.




ශාමින්ද වත්තේගෙදර


බලශක්ති අමාත්‍යාංශය
வலுசக்தி அமைச்சு
Ministry of Energy
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
இலங்கைப் பெற்றோலியக் கூட்டுத்தாபனம்
Ceylon Petroleum Corporation
1920 දශකයේ දී ඉංග්‍රීසීන් ඉදිකළ
1987 ඉන්දු - ලංකා හවුල් ව්‍යාපාරයකට එකඟ වූ
2003 ටැංකි 99ම ඉන්දියාවට බදු දුන්
2017 ටැංකි 99ම වසර 99කට ඉන්දියාවට බදු දීමට එකඟ වුණු
ත්‍රිකුණාමලය
තෙල් ටැංකි
යළි රටට...
තවත් වසර 28කට පසු පරිසර ගිවිසුම් අනුව
පොසිල ඉන්ධන යුගය අවසන් වීමට පෙර
මුළු ටැංකි ගණන 99
=
අපට ටැංකි
85ක්
+
IOC 14
24
TPTL
61
51%
IOC
49%
ත්‍රිකුණාමලය
තෙල් ටැංකි සංකීර්ණය
අපේ වූ වගයි
අපි බලශක්තියට අපේ ශක්තිය එකතු කළෙමු!
MediaMax

# මහජන බැංකුව පොහොර නැවට ගෙවයි

■ අමිල අබේරත්න

මතභේදයට තුඩු දුන් චීන කාබනික පොහොර නැවට ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක මුදලක් මහජන බැංකුව මඟින් පෙරේදා (07දා) මුදා හැර ඇත. ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක අදාළ මුදල මහජන බැංකුව මඟින් එලෙස මුදාහැර ලැබ ඇත්තේ වාරණ නියෝගය ලබාගත් රජයට අයත් ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම චීන සමාගම සමඟ සමථකරණයේ ඇතිවූ එකඟතාව මත කොළඹ වාණිජ මහාධිකරණය මඟින් පනවා තිබූ වාරණ නියෝගය ඉවත් කිරීම මතය.

ඒ අනුව අදාළ පොහොර තොගය අයත් "ෂින්ඩාවෝ සී. වින් බයෝටෙක් ගෲප්" (shingdo seawin bio tech groop co.ltd) නමැති කාබනික පොහොර නිෂ්පාදන සමාගමට අදාළ මුදල මුදා හැරෙනු ඇත.

වන්දි මුදලක් වශයෙන් අදාළ ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක මුදල චීන සමාගමට මහජන බැංකුව මඟින් එලෙස ගෙවා ඇති අතර පොහොර නෞකාව මෙරටට භාර නොදුන්නද ප්‍රමිතියෙන් යුත් පොහොර නැවත ලබාදෙන බවට දෙපාර්ශ්වය අතර එකඟතාවකට පැමිණි බව අධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබුණි.

ඒ අනුව නව කාබනික පොහොර සහිත නැවක් ලංකාවට ලැබීමට නියමිතය.




# පාස්කු ප්‍රහාරයේ නඩු ගැන මෛත්‍රී කළ ඉල්ලීම උසාවිය ඉවත දමයි

■ හංසි නානායක්කාර

පාස්කු ප්‍රහාරයෙන් තුවාල ලැබූ හා සදාකාලික ආබාධිත වූ අගතියට පත් වූ පවුල්වල සාමාජිකයන් එකසිය විසිඅට දෙනකු පවරා ඇති නඩු සියල්ල විභාගයට ගැනීමකින් තොරව නිෂ්ප්‍රභ කරන්නැයි හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් කරනු ලැබූ ඉල්ලීම කොළඹ අතිරේක දිසා විනිසුරු චතුරිකා ද සිල්වා මහත්මිය පෙරේදා (07දා) ප්‍රතික්ෂේප කළාය.

මෙම නඩු සියල්ල සිවිල් නඩු විධාන සංග්‍රහය ප්‍රකාරව නඩු නිමිත්තක් නොමැතිව පවරා ඇති බවත්, නඩුව පවරන ලද අවස්ථාවේ මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා නොවන බවත්, ප්‍රහාරය සම්බන්ධයෙන් දැන සිටියාය යන උපකල්පනය මත නඩු පැවැරීම කළ නොහැකි බවත් සඳහන් කරමින් පසුගිය නොවැම්බර් මස 30 වැනි දින මෝෂන් පත්‍රයක් මඟින් ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් මෙම නඩු නිෂ්ප්‍රභ කරන ලෙසට අධිකරණයෙන් ඉල්ලා තිබිණි.

# ශ්‍රී ල.නි.ප. මාධ්‍ය මධ්‍යස්ථානය විවෘත කිරීම හෙට

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රචාරණ හා මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කිරීමට අභිනවයෙන් ස්ථාපිත කළ 'මාධ්‍ය මධ්‍යස්ථානය' හෙට (10දා) උදෑසන 10.00ට විවෘත කෙරේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මූලස්ථානයේ ස්ථාපිත නව මාධ්‍ය මධ්‍යස්ථානය පක්ෂ සභාපති හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට නියමිතය.

## දිවයින පුරා සිය 4G ආවරණ ජාලය පුළුල් කිරීම යටතේ එයාර්ටෙල් උතුරු පළාතේ ආවරණ ජාලය ඉහළ නංවයි.

එයාර්ටෙල් ලංකා දිවයින පුරා සිය 4G ජාලය ව්‍යාප්ත කිරීමේ සැලසුමේ නවත් අදියරක් සාර්ථකව නිම කරමින් උතුරු පළාත තුළ සිය 4G ජාලය පුළුල් කිරීමේ කටයුතු සාර්ථකව අවසන් කළ බව නිවේදනය කර සිටී. යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මෙම ව්‍යාප්තිය සිදු කොට තිබේ.

මෙම අමතර 4G සන්නිවේදන කුළුණු මඟින් 50%ක වඩාත් හොඳ ගෘහස්ථ ආවරණයක් සහිත හතර ගුණයක් දක්වා වේගවත් අන්තර්ජාල අත්දැකීමක් සමඟින් ඉහළ පරිශීලක අත්දැකීමක් ලබා දෙනු ඇත. එයාර්ටෙල් හි 4G යටිතල පහසුකම් 5G තාක්ෂණය සඳහා ද සූදානමින් යුතුව එන නිසා පහසුවෙන් නව ජාලයට මාරුවීමේ හැකියාව ඇත.

දැනට දිප ව්‍යාප්තව ක්‍රියාත්මක 4G ආවරණ ජාලය ව්‍යාප්ත කිරීම යටතේ සියලුම ශ්‍රී ලාංකිකයින්ට හඳුනා වෙනසක් සහිත එයාර්ටෙල් හි සුපිරි ජාල අත්දැකීමක් ලබා දෙනු ඇත.

සුපිරි ස්මාර්ට් ජංගම දුරකතන අත්දැකීමක් පාරිභෝගිකයා වෙත ලබා දීමට එයාර්ටෙල්හි වැඩිදියුණු කළ 4G ජාලය පුළුල් ආවරණයක් සහ ධාරිතාවකින් යුතුව කදිම සුසංයෝජනයක් ලබා දෙයි.

මේ යටතේ දරුවන්ගේ සිට වැඩිහිටියන් දක්වා වූ සෑම පරිශීලකයෙකුටම online අධ්‍යාපන කටයුතු, නිවසේ සිට වැඩ කිරීම සහ අන්තර්ජාලය හරහා එකිනෙකා සමඟ සම්බන්ධ වීම ආදී කටයුතු ඇමතුම් බිඳවැටීම්, බාධා ඇතිවීම් හා ආවරණ දෝෂ වලින් තොරව භුක්ති විඳිය හැකිය.

මීට අමතරව පරිශීලකයින්ට එයාර්ටෙල් හි සුපිරි 4G ජාලයට වැඩි ප්‍රවේශයක් ලබා දෙමින් සහ ඔවුන්ට අන්තර්ජාලය පුරා සැරිසැරීමේදී වැය කරන මුදල්වලින් 80%ක් දක්වා ඉතිරි කර ගත හැකි එයාර්ටෙල් හි නවතම Freedom Pack අත්විඳීමට ද මෙමඟින් අවස්ථාව ලැබේ.




# වේලාසනින් පිළිකාව හඳුනාගෙන සුවපත් කරගන්නට

ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ ප්‍රතිකාරය සහ කැන්ගන් ජලය ඒකාබද්ධ ප්‍රතිකාරයෙන් හැකි වුනා.

**විශ්මිත වතුරක් - 6 වන කොටස**

''ඊයේ එයයි අපි ඔක්කෝමයි හොඳට කථා කර කර හිටියේ... එයාට කිසි ලෙඩක් තිබුණෙත් නෑ... එකපාරටම පපුව රිදෙනවා කියලා පුටුව උඩ ඉඳගත්තා. හොඳට දහඩිය දැම්මා.. කලන්තේ ඇල්ලුවා.. අපි හොඳටම බය වුණා. ටක්ගාලා හොස්පිටල් ගෙනිච්චා. දැන් අයි.සී.යූ එකේ ඉන්නේ. ඩොක්ටර් කිව්වා ඉක්මණට.......''

කොතරම් අකමැති වුණත් මෙවන් වදන්, දෙබස් ඔබත් අපත් එකවරක් හෝ අසා තිබෙනවා නේද? පවුලේ සියලු සාමාජිකයින් තැතිගන්වන, මහත් බියට පත්කරන, මානසික අපහසුතාවන්ට පත්වෙන පපුවේ අමාරු (හාර්ට් ඇටෑක්) හැදුණු විට ඇති වන ප්‍රශ්න සහ අපහසුතාවන් ගැන අමුතුවෙන් පැවසිය යුතු නොවේ.


අති නවීණ තාක්ෂණයෙන් යුතු ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයකින් මෙවන් රෝගී තත්ත්වයන් පමණක් නොව ශරීරයක හටගන්නා ඕනෑම රෝගයක් සහ ඉදිරි මාස කිහිපයකදී වර්ධනය වීමට නියමිත රෝග පවා කල්වේලා ඇතිව හඳුනා ගත හැකි බව මාතර රාහුල රහස් පාරේ වෛද්‍ය එල්. ගුණරත්න මහතා පවසනවා. ඔහුගේම පර්යේෂණයකට අනුව, ජපන් තාක්ෂණයෙන් හෙබි කැන්ගන් ජලය සහ රුසියානු තාක්ෂණයෙන් හෙබි මෙම ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ ප්‍රතිකාරය උපයෝගී කොට ගෙන ඉතා හොඳින් ලෙඩ රෝග වලට ප්‍රතිකාර ක්‍රම සොයා ගෙන ඇති බව සාක්ෂි සහිතව අප කලින් වාරයේදීත් පෙන්වා දී තිබෙනවා.

ඉහත කී භයානක තත්ත්වයකට පත්වීමට පෙර ශරීරයක හටගෙන වර්ධනය වීමට නියමිත රෝග හඳුනාගත හැකි නම්, විශේෂයෙන්ම හෘද රෝග (හාර්ට් ඇටෑක්) අනවශ්‍ය මුදල් වියදම් නොකර, ජීවිතය සුරක්ෂා කරගනිමින්, සුවපත් වීමට හැකි බව රහසක් නොවේ. ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයේදී හඳුනාගත් රෝග ඒ මොහොතේම සුවපත් කරගැනීමට ඇති හැකියාව පිළිබඳව පැහැදිලි උදාහරණයක් ලෙස අද අප ඔබට ඉදිරිපත් කරන්නේ මොරවක ප්‍රදේශයේ මාලනී නම් මහත්මියක් සමග අප දුරකථනයෙන් කථා බහ කර ලබාගත් ප්‍රවෘත්තියයි.

ඇය ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයකින් තමන්ගේ ලෙඩ රෝග හඳුනාගැනීමත් එම යන්ත්‍රයෙන් කරන ලද සුවකිරීමේ ප්‍රතිකාරයන් සහ කැන්ගන් ජලය පානය කිරීමෙන් සුවපත් වු ආකාරය ප්‍රකාශ කළේ මෙලෙසයි.


''මම වැදගත් පිළිගත් රැකියාවක් කරන්නේ. අසනීප තිබීම මගේ රැකියාවට මහත් බාධාවක්. වසර ගණනාවක සිට මගේ බෙල්ලේ දෙපස රිදීමක් හටගෙන තිබුණා. බටහිර සහ දේශීය වෙදකම් කළත් පැහැදිලි සුවයක් නම් තිබුණේ නැහැ. මීට මාස කිහිපයක සිට මගේ කණ පිටුපස ඉදිමීමක් හටගත්තා. කට ඇතුළේ පොඩි තුවාලයක් හැදුනා. උකුළ ප්‍රදේශයේ සිට උරහිස දක්වා කැක්කුමක් වේදනාවක් ඇති වෙලා තිබුණා.

මම ගොඩක් පරීක්ෂණ කළා. ඒත් වෛද්‍යවරුන් කීවේ ලොකු අසනීපයක් නැති බවයි. මට දුන්නේ සැර බෙහෙත්. ඒවා බොන කොට අසනීප අඩු වුණා. ඒත් උකුළේ සිට කොන්ද දක්වා එන රිදීම සම්පූර්ණයෙන්ම සුව වුනේ නැහැ. කන පිටුපස ඉදිමුමත් එහෙමමයි. මේ වෙනකොට කැන්ගන් පානීය ජල ප්‍රතිකාර සහ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ ක්‍රමය ගැන මට දැනගන්න ලැබුණා. පසුව




වෛද්‍ය එල්.ගුණරත්න මහතා අමතා දිනයක් වේලාවක් වෙන්කර ගෙන ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයට සහභාගී වුණා. එහිදී අසනීප තත්ත්වයන් කිසිවක් ගැන වෛද්‍ය ගුණරත්න මහතා මා හට පැවසුවේ නැහැ.''

''ස්කෑන් පරීක්ෂණයෙදී වෛද්‍ය ගුණරත්න මහතා මා හට වැළඳී ඇති මා දන්නා රෝග සියල්ල පැවසුවා. වෙනත් රෝග කිහිපයක් හටගනිමින් ඇති බව පැවසුවත් ඒ මොනවාදැයි එදින මට පැවසුවේ නැහැ. මගේ තිබූ අසනීප වලට එම ස්කෑන් යන්ත්‍රයෙන්ම කරන ලද සුවකිරීමේ ප්‍රතිකාරය නිසා ඒ මොහොතේම මට මහත් සුවයක් දැනුණා. එදින සිට දිනපතා පානීය ජලය සඳහා කැන්ගන් ජලය පමණක් පානය කරන ලෙසත් එම ජල ප්‍රභේදයන් මොනවාද යන්නත් මට පැහැදිලි කර දී හැකි ඉක්මණින් නැවතත් පැමිණ සුවකිරීමේ ප්‍රතිකාර ලබා ගන්නා ලෙසට ද පැවසුවා.''




''තවත් සතියක පමණ කාලයක් කැන්ගන් ජලය පානය කර නැවතත් ස්කෑන් සහ සුවකිරීමේ ප්‍රතිකාර ලබාගත්තා. තුන්වෙනි වර ස්කෑන් කළාට පසුව තමයි එතුමා මට වැළඳීමට මුල පුරමින් සිටි රෝගයක් ගැන පැවසුවේ. මගේ පෙනහැල්ලේ පිළිකාවක් හටගැනීමේ ආසන්න අවස්ථාවට මා පත්ව සිටි බව වෛද්‍ය ගුණරත්න මහතා පැවසුවේ ස්කෑන් යන්ත්‍රය තුළින් ප්‍රතිකාර කිරීමට පෙර පෙනහැල්ලේ තත්ත්වයත්, තෙවරක් සුවකිරීමේ ප්‍රතිකාර කළාට පසුව සුවපත් වී ඇති පෙනහැල්ලේ තත්ත්වයත් පෙන්වා දෙමින්.

මගේ උකුළේ සිට ඉලඇට ඇතුළතින් උරහිස දක්වා තිබූ වේදනාවන් සියල්ල පහව ගොස් තිබුණා. කණ පිටුපස ඉදිමීමත් දැන් නැහැ. කලක සිට තිබූ බෙල්ලේ වේදනාව තව බොහොම ටිකක් තිබෙනවා. එයත් ඉක්මණින් සුවපත් වන බවයි වෛද්‍ය ගුණරත්න මහතා පැවසුවේ. මම දිගින් දිගටම කැන්ගන් ජලය තමයි පානය කරන්නේ.

ඇත්තටම මම හොඳ වේලාවට තමයි වෛද්‍ය ගුණරත්න මහතා මුණගැසුනේ. ඉදිරියේදී හටගන්නා රෝග කල්වේලා ඇතිව හඳුනා ගැනීමට ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයකින් හැකි බව මම විශ්වාස කරන්නේ දැන් අත්දැකීමෙනුයි. ගුණරත්න මහතාට බොහෝ පිං අත්වෙනවා මේ කරන සේවයට''.

**කැන්ගන් වතුර සුවිශේෂී වන්නේ ඇයි?**

**ප්‍රතිඔක්සිකාරක ඉතා බහුල වීම** - (ඇන්ටිඔක්සිඩන්ට් - ඕ.ආර්.පී. අගය මිලි වෝල්ට් **-300** සහ **-850** අතර වේ.) කැන්ගන් ජලයෙහි ග්‍රීන් ටී මෙන් දස ගුණයක් පමණ ප්‍රතිඔක්සිකාරක අඩංගු වේ. එමගින් අප වයස් ගතවීමේ හා දිරාපත්වීමේ ක්‍රියාවලියේ වේගය අඩු කරන අතර පිළිකාව, හෘද රෝග, පාර්කින්සන් රෝගය, ඇල්සයිමර් රෝගය, හන්දි රෝග (බෝ නොවන රෝග) යනාදිය සෑදීමට මුල් වන ඔක්සිජන් මුක්ත බණ්ඩක(ෆ්‍රී රැඩිකල්) උදාසීන කරයි.

**ඉතා කුඩා අංශුමය ස්වභාවය** - (මයික්‍රෝ ක්ලස්ටර්ඩ් - ශරීරයට ඉතා ඉක්මණින් උරා ගනී) කැන්ගන් ජලයෙහි ඉතා ක්ෂුද්‍ර ජල අංශූ අඩංගු වන අතර එමගින් ශරීරයේ විජලනය හොඳින් වළක්වයි. එය අනෙක් පානීය වතුර වලටත් වඩා ඉතා හොඳින් විජලනය වළක්වයි.

**තරමක් භාෂ්මික වීම** - (ඇල්කලයින්) ආම්ලික තත්ත්වයේ පවතින රුධිරය නැවතත් නීරෝගී වීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට භාෂ්මික තත්ත්වයට හෙවත් පී.එච්. 7.3 - 7.4 අතරට ගෙන ඒමට ඉවහල් වේ. කැන්ගන් ජලය පානය කළ විට ආම්ලිකව ඇති ඔබගේ ශරීරය ප්‍රමාණවත් තරමට භාෂ්මික තත්ත්වයට පත් කරයි. එවිට රුධිර සෛල හොඳින් ක්‍රියාකාරීත්වය ඇති කරන අතර පිළිකාව වැනි පිරිහෙන සුළු රෝග (බෝ නොවන රෝග) සෑදීම වැළැක්වීමට හේතු වෙයි.

සාමාන්‍ය වතුර වෙනුවට මෙම කැන්ගන් වතුර දිනපතා පානය කිරීමෙන් සිරුරේ අනවශ්‍ය ආම්ලික අපද්‍රව්‍ය ඉතා ඉක්මණින් ඉවත්ව යාමත් අප සිරුරේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ඉතා ඉක්මණින් නිවැරදි වීමත් නිසා අපගේ ලෙඩ රෝග සියල්ල අප ශරීරය විසින්ම සුව කරගැනීමට හේතු වේ.

**0777 362 860 යන අංකයෙන් වෛද්‍ය එල්. ගුණරත්න මහතා ඇමතිය හැක (සවස 7 ත් රාත්‍රී 9 ත් අතර කාලය තුළදී වඩාත් පහසුයි).**

**සැකසුම: අමරසිංහ මාලගේ**




C M Y K

රෝහණ විජේවීර මහජන රැස්වීම්වලදී පැවැත්වූ කතා ව්‍යක්තය. සාරගර්භය. ඔහුගේ දේශපාලන විශ්ලේෂණ අතිශයින් තියුණුය. සවන් දෙන්නන් එතෙක් ස්පර්ශ නොකළ නව මානයන් හා දිශානතීන් කරා අවධානය යොමු කරවන්නේය. අසන්නන්ගේ හදවත ඇද බැඳ තබා ගනිමින් විශාල පිරිසක් ආමන්ත්‍රණය කරන්නට ඔහු සමත්ය. විජේවීරගේ ලිඛිත භාෂාවද ඊට දෙවැනි නැත. බොහෝ තොරතුරු මූලාශ්‍ර සහිතව මතකයෙන් ඉතා සරල බසින් ලිපි ලියන්නටද ඔහු සමතෙකි. ඊට ඉඳුරාම වෙනස් මඟක් ගෙන ග්‍රන්ථකරණයේදී ඉතා ගැඹුරු බස්වහරක් උපයෝගී කර ගනිමින් දේශපාලන විද්‍යාවට සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීම හෙතෙම සිදුකළේය. මෙහිලා ඉදිරිපත් කරන ලිපි රෝහණ විජේවීර විසින් 1981- 82 කාලවකවානුවේ ලියන ලියන ලද ඒවාය. ඊට ඇතුළත් වන්නේ එම වකවානුවේ පැවැති දේශපාලන පසුබිමට අයත් කරුණු කාරණාය. ශ්‍රී ලංකාවේ තත් කාලීන දේශපාලන ඉතිහාසය හදාරන්නවුනටද මෙම ලිපි ප්‍රයෝජනවත් වනු නිසැකය.

## ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනාගතය කොයිබටද?

**රෝහණ විජේවීර ලියූ ලිපි... 02**

# ශ්‍රීලනිප-එජාප රහස් කසුකුසු

**ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට කවුරු පත්වුවත් එය මෙහෙය වන්නේ කවුද? යන ප්‍රශ්නය විසඳීමට උග්‍ර සටන් මේ වන විටත් ඇවිළෙමින් පවතී**


**නායකත්වය තමාගේම හෝ තමාගේ ළඟම ඥාතීන් අත රඳවා තබා ගැනීමට ඇය වියරු උත්සාහයක යෙදී සිටී**

**පවුල් සංකීර්ණය සටනකට අවතීර්ණ වී තිබීම තුළින්ම ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනාගත ඉරණම පැහැදිලි වේ**

**යූ.එන්.පී.ය සහ ශ්‍රී.ල.නි.ප.ය අතර ගැටුම හුදෙක් බලය පිළිබඳ කාරණය මතම පදනම් වූවකි**

**එකට හොරකමේ යෙදුණු හොරු හොරබඩු බෙදාගත නොහැකිව අමනාප වී ගහ ගන්නා විට සියල්ල හෙළිදරව් වීම ස්වභාවිකය**

**සර් ජෝන් කොතලාවල මැදිහත් කර ගනිමින් ජේ. ආර්. ජයවර්ධන මඟින් රහසේ සමාවක් ලබා ප්‍රජා අයිතීන් ආරක්ෂා කර ගැනීමට සිරිමා බණ්ඩාරනායක මාන බැලුවේය.**



**ලංකාවේ ධනේශ්වර ක්‍රමය කොතරම් ගැඹුරු අර්බුදයකට පත්වී ඇද්දැයි කිවහොත් එයට තාවකාලික ප්‍රතිකර්මයක් හෝ කිරීම සඳහා ධනපති පන්තිය උත්සාහ දරමින් සිටී. ආර්ථික අර්බුදයට මුහුණදීම සඳහා සමස්ත ධනපති පන්තියේ එක්සත් ප්‍රයත්නයක අවශ්‍යතාව ගෙවුණු 70 දශකය මුළුල්ලේම ප්‍රධාන ධනපති දේශපාලන පක්ෂ දෙක අවබෝධ කරගෙන සිටියේය. යූ.එන්.පී.යේ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයන් විසින් මේ සම්බන්ධව වරින්වර රහස් සාකච්ඡා පවත්වා තිබිණි.**

එහෙත් ඔවුන් අතර එකඟතාවක් ඇතිකර ගැනීමට නොහැකි වූයේ කාගේ නායකත්වයෙන්, කුමන රජ පවුලේ නායකත්වයෙන්, මේ සමඟිය ඇති කරනවාද යන්න පිළිබඳව තිබූ මතභේදය නිසාය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකා සිරිමා බණ්ඩාරනායක බලයේ සිටියදී මේ පන්ති සමඟිය ඇති කිරීම සඳහා යූ.එන්.පී. නායක ඩඩ්ලි සේනානායකට හොර රහසේ උපනායක ජේ. ආර්. ජයවර්ධනගේ සහාය ලබා ගැනීමට උත්සාහ කළාය. ඒ හේතුවෙන් ඩඩ්ලි සේනානායක සහ ජේ. ආර්. ජයවර්ධන අතර හබයක්ද ඇතිවිය.

ඩඩ්ලි සේනානායක යූ.එන්.පීයෙන් එළ වන්නට ජයවර්ධන, විජේවර්ධන කල්ලිය උත්සාහ කළ අතර ඩඩ්ලිට විරුද්ධව ජේ.ආර්. අධිකරණයටද ගියේය. ඩඩ්ලි සේනානායකගේ හදිසි අභාවය හේතුවෙන් ඩඩ්ලි - ජේ. ආර්. හබය අවසන් විය.

හැත්තෑවේ තුන් හවුල් ආණ්ඩුවට එකතු වන ලෙස සිරිමා බණ්ඩාරනායක ගෙනා යෝජනාව ජේ.ආර්. විසින් ප්‍රතික්ෂේප කළේය. එවිට සිරිමා බණ්ඩාරනායක අගමැතිනිය කළේ ජේ.ආර්. ජයවර්ධනට විරුද්ධව විදේශ විනිමය වංචා නඩුවක් පැවැරීමට සැලසුම් කිරීමය. එහෙත් එය ක්‍රියාවට නැඟුණේ නැත.

1977 ජූලි මහ මැතිවරණයෙන් මහ පරිමාණ ජයග්‍රහණයක් ලබාගැනීමෙන් පසුවද ජේ.ආර්. ජයවර්ධන පක්ෂ දෙක සමඟි කරන්නට වෑයම් කළේය. පරාජිත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් හවුල් කරගෙන මහ සභාග රජයක්, ධනපති පන්තියේ එක්සත් රජයක් ගොඩනැඟීම ඔහුගේ අභිප්‍රාය විය. ඒ සඳහා හෙතෙම මසුරුකම් නැතුව ප්‍රධාන ඇමැතිකම් දෙකක්, එනම් විදේශ කටයුතු පිළිබඳ ඇමැතිකම හා මහවැලි සංවර්ධන කටයුතු පිළිබඳ ඇමැතිකම, ආසන 8ක් පමණක් සහිත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාවටත්, නියෝජ්‍ය නායකයාටත් පිදීමට සූදානම් විය.

එහෙත් 1983දී නැවතත් බලයට ඒමේ බලාපොරොත්තුවෙන් සිටි සිරිමා බණ්ඩාරනායක ඒ අවස්ථාවේ දී ජේ.ආර්.ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළාය. යූ.එන්.පී.ය සහ ශ්‍රී.ල.නි.ප.ය අතර ගැටුම හුදෙක් බලය පිළිබඳ කාරණය මතම පදනම් වූවකි.

සිරිමා බණ්ඩාරනායකගේ ආණ්ඩුවට එක්වීම 1970දී ප්‍රතික්ෂේප කළ විට තමාට සිරිමා පහර දුන් ආයුධයෙන්ම ජේ. ආර්. සිරිමාට දමා ගැසීය. ඔහු සිරිමාගේ ආණ්ඩුව කළ වැරදි සම්බන්ධව පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර, එම කොමිෂන් සභා වාර්තාවට අනුව ඇයගේ ප්‍රජා අයිතිය අහිමි කළේය. ඒ සමඟම ඇගේ පුරෝහිත බමුණා වූත්, බෑනා වූත්, ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකගේ ප්‍රජා අයිතියත් අහිමි කරන්නට කටයුතු කළේය.

හිටපු අගමැතිනියගේ ප්‍රජා අයිතිය අහිමි කිරීමත් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ මතභේද ඇවිළෙන්නට විය. නිවැරදිව කියනවා නම් කලින් පැවැති මතභේද උග්‍ර වන්නට පටන් ගත්තේ ය. අත්තනගල්ලේ හිස් වූ අසුන සඳහා සිය බාල දියණිය චන්ද්‍රිකා නම් කළ යුතු යැයි බණ්ඩාරනායක මහත්මිය ඇයගේ දේශපාලන මණ්ඩලයට යෝජනා කළාය. එහිදී අනුර බණ්ඩාරනායක ඇතුළු දේශපාලන මණ්ඩලයේ බහුතරයක් නියෝජ්‍ය නායක මෛත්‍රිපාල සේනානායකගේ නායකත්වයෙන් ඊට විරුද්ධ විය.

අවසානයේ මේ නිසාම සිරිමා බණ්ඩාරනායක මහත්මියට ඇය කැඳ වූ, ඇයගේ නිවසේම, ඇගේ මූලාසනයෙන් මුළුදුන් දේශපාලන මණ්ඩල රැස්වීමෙන් නැඟිට ඇගේ සහෝදරිය වන දිවිතොටවෙලගේ ගෙදරට පිටවී යෑමට පවා සිදුවිය. අත්තනගල්ල ආසනයේ සංවිධායක ලෙස ලොකු දියණිය සුනේත්‍රාගේ නාමයෝජනා නොකළේ බොම්බායේ නවාස් ඩාවුඩ් සිදුවීමෙන් පසුව ඇය ප්‍රසිද්ධියේ රටට මුහුණදීමට නොහැකිව සිටින නිසා යැයි කියනු ලැබේ.

අන්තිමේදී තමන්ගේ තවත් ඥාතියකු වන ලක්ෂ්මන් ජයකොඩි අත්තනගල්ල ආසනයට ඉදිරිපත් කර ප්‍රශ්නය සමථයකට පත්කර ගැනීමට හැකි විය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට පත්වන්නේ කවුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට කවුරු පත්වුවත් එය මෙහෙය වන්නේ කවුද? යන ප්‍රශ්නය විසඳීමට උග්‍ර සටන් මේ වන විටත් ඇවිළෙමින් පවතී.

සර් ජෝන් කොතලාවල මැදිහත් කර ගනිමින් ජේ. ආර්. ජයවර්ධන මඟින් රහසේ සමාවක් ලබා ප්‍රජා අයිතීන් ආරක්ෂා කර ගැනීමට සිරිමා බණ්ඩාරනායක මාන බැලුවේය. එහෙත් එය සාර්ථක කර ගත නොහැකි විය. එය වැරදුණු පසු ප්‍රජා අයිතීන් අහෝසි කළ දිනයේ මිනිසුන් නොමඟ යවා කලබලයක් ඇති කර විශාල ලේ හැලීමක් කිරීමටත්, ඒ මඟින් තමාගේ තත්ත්වය ලොවට ප්‍රකාශ කිරීමටත්, ඇය උත්සාහ දැරුවාය.

අවසානයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය තමාගේම හෝ තමාගේ ළඟම ඥාතීන් අත රඳවා තබා ගැනීමට ඇය වියරු උත්සාහයක යෙදී සිටින බව පෙනෙන්නට තිබේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ එහි නායිකාවත්, නියෝජ්‍ය නායකයාත් යන දෙදෙනාගේ නායකත්වයෙන් දෙපිල බෙදුණු කණ්ඩායම් දෙක අනුත් සමඟ සටන් වැදී සිටී. මේ සටන විසින් මෙතෙක් ජනතාවගෙන් සඟවාගෙන සිටි ජරාව සියල්ලක්ම නැති වුවත් ටිකක් හෝ එළියට ඇද දමා ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයන් පිළිබඳව අප මෙතෙක් කී කරුණු සියල්ලක්ම සම්බන්ධව ඕනෑ තරම් සාක්ෂි මේ ගැටුම විසින් එළියට දමමින් තිබේ. ස්විස් බැංකු ගිණුම් පිළිබඳ චෝදනා, මේ රටේ දුගී දුප්පත් ජනතාව රවටා ලබාගත් බලය අයුතු ලෙස පාවිච්චි කරමින් කොමිස් ගැනීම් ගැනද, පගා ගැනීම්, අල්ලස් ගැනීම් හා මහ පරිමාණ දූෂණ වැඩ ගැනද දෙපැත්තෙන්ම දෙපැත්තට පහරදෙනු දැකිය හැකිය. එසේම දෙගොල්ලන්ම දෙගොල්ලන්ටම තම පැරණි ඉතිහාසය ගැන ආඩපාළි කීමටද පටන්ගෙන ඇත.

එකට හොරකමේ යෙදුණු හොරු හොරබඩු බෙදාගත නොහැකිව අමනාප වී ගහ ගන්නා විට සියල්ල හෙළිදරව් වීම ස්වභාවිකය. සියල්ල සිදු වන්නේ මේ රටේ දුගී දුප්පත් කම්කරු ගොවි ජනතාවගේ යහපතටය. ඒත් තවම සියල්ල හෙළිදරව් වී නැත. හෙළිවීමට තවත් බොහෝ දේ තිබේ. ඒවා සියල්ල සැකයෙන් තොරව සනාථ කර ගැනීමට, කරුණු සහිතව හෙළිදරව් කර ගැනීමට මේ රටේ මේතාක් කල් නොමඟ යවනු ලැබූ කම්කරු, ගොවි ජනතාව ආශාවෙන් පුලපුලා බලා සිටිති.

ශ්‍රී.ල.නි.ප. දේශපාලන මණ්ඩලයේදී 4 දෙනාගේ කල්ලියක් බවට පත් වී පරාජයට පත් වූ සිරිමා බණ්ඩාරනායක මහත්මිය දේශපාලන මණ්ඩලයේ සිය විරුද්ධවාදීන් 12 දෙනාගෙන් 4 දෙනකු තෝරා ඔවුන් හතර දෙනාගේ කල්ලිය ලෙස නම්කර තිබෙන බව දක්නට තිබේ. ඊට අයත් වන්නේ මෛත්‍රිපාල සේනානායක, ස්ටැන්ලි තිලකරත්න, ආර්. පී විජේසිරි, සහ ජේ. ආර්. පී. සූරියප්පෙරුමයි.

දෙගොල්ලන්ම දෙගොල්ලන්ටම 4 දෙනාගේ කල්ලිය ලෙස නම් කර ගනිති. නමුත් 4 දෙනාගේ කල්ලිය යන නම වඩාත් උචිත වන්නේ දේශපාලන මණ්ඩලයේදී හතර දෙනාගේ කල්ලිය ලෙසට සැබෑ ලෙසම පත් වූ හිටපු අගමැතිනියගේ කල්ලියයි.

චීනයේ සුප්‍රසිද්ධ 4 දෙනාගේ කල්ලියේ නායකයා වූයේ මා ඕ සේතුංගේ වැන්දඹු බිරිය චියෑං චිං වීම නිසා ලංකාවේ 4 දෙනාගේ කල්ලියේ නායකත්වය හිමි විය යුත්තේ සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායකගේ වැන්දඹු බිරියටය.

කෙසේ වෙතත් දේශපාලන මණ්ඩලයේදී පැරදුණු සිරිමා බණ්ඩාරනායක පරාජය භාර ගන්නට සූදානම් නැත. ඒ වෙනුවට දැනගන්නට ලැබෙන කරුණු අනුව පැරණි පුරෝහිත බ්‍රාහ්මණයාගේ උපදෙස් පිට හා ඩයස් බණ්ඩාරනායක, ඔබේසේකර, රත්වත්තේ, කොබ්බෑකඩුව, ගොපල්ලව, දිවිතොටවෙල, ආදී ඥාති ගණයාගේ නොමසුරු සහාය ඇතිව සමස්ත ලංකා කාරක සභාව කැඳවා සිය විරුද්ධවාදීන් පලවා හැරීමට කුමන්ත්‍රණයක යෙදී සිටින බව පෙනෙන්නට තිබේ.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මීළඟ සමස්ත ලංකා කාරක සභාව නිර්ධන පන්තියේ දෘෂ්ටි කෝණයෙන් බැලූ විට වැදගත් එකක්සේ පෙනී යයි. මෙහිදී සිරිමා බණ්ඩාරනායක රජ පවුලේ කණ්ඩායම විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මීළඟ නායකයා වශයෙන් සිරිමාගේ ළඟම ඥාතියකු වන හෙක්ටර් කොබ්බෑකඩුවගේ නම යෝජනා කරන්නට යන බව දැනගන්නට තිබේ. ඇයගේ විරුද්ධවාදීන්ට එක්කෝ යූ.එන්.පී. කාරයන් හැටියට හෝ නැතිනම් ජේ.වී.පී. කාරයන් හැටියට අවලාද නැඟීමට යන බවද ආරංචිය.

ඩයස් බණ්ඩාරනායක, රත්වත්තේ, කොබ්බෑකඩුව, ගොපල්ලව, දිවිතොටවෙල පවුල් සංකීර්ණය බලයට පත් කළ හා බලයේ රඳවාගෙන සිටි බලවේගයන් සමග එම පවුල් සංකීර්ණය මහා සටනකට අවතීර්ණ වී තිබීම තුළින්ම ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනාගත ඉරණම කුමක්ද කියා නිර්ධන පන්තියට පැහැදිලි කර දෙයි.

■ උදේනි සමන් කුමාර

# රටේ නීති බල්ලට දාගෙන එහෙන් මෙහෙන් යන කාගෙද මේ ජෙට්...?

පසුගියදා අගමැති මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ පවුලේ උදවිය ඉන්දියාවේ තිරුපති දෙවොලට රත්මලාන ගුවන්තොටුපළේ සිට පෞද්ගලික ජෙට් යානයකින් ගමන් කිරීම නිසා පෞද්ගලික ගුවන් යානා පිළිබඳව අලුත් කුතුහලයක් හා උනන්දුවක් මෙරට ඇති වී තිබේ. රාජපක්ෂ පවුල ගමන් කළ ගුවන් යානය පිළිබඳව කතාබහේ උණුසුම මැකී යන්නටත් ප්‍රථම කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දින කිහිපයක් තිස්සේ නවතා තිබෙන ජෙට් යානා දෙකක් පිළිබඳ ආන්දෝලනාත්මක ප්‍රවෘත්තියක් සමාජගත වී තිබේ.

කටුනායක ගුවන්තොටුපළේ පෞද්ගලික ජෙට් යානා නවතා තිබීම එවැනි කුතුහලයක් ජනිත කරන්නට හේතු වූයේ එය මෙරට ජනතාවට එතරම් හුරු අත්දැකීමක් නොවන බැවිනි. ජාත්‍යන්තර ගුවන්තොටුපොළකට පෞද්ගලික ජෙට් යානා පැමිණීම අරුම පුදුම දෙයක් නොවේ. එහෙත් මෙම සිදුවීම කුතුහලය ඇතිකරවන්නක් වූයේ එකී යානාවල අනන්‍යතාව ගුවන්තොටුපළ බලධාරීන් විසින් අනවශ්‍ය ලෙස සැඟවීම නිසාය.

සතියක පමණ කාලයක සිට කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ නවතා ඇති මෙම සුඛෝපභෝගී ජෙට් යානා සම්බන්ධව තොරතුරු මේ වන විට හෙළිවී තිබේ. M - ERCI පෞද්ගලික ජෙට් යානය 2021 දෙසැම්බර් 27 වැනි දින සූරිච් සිට මාලදිවයිනට ළඟා වී ඇති අතර දෙසැම්බර් 28 වැනිදා ශ්‍රී ලංකාවට පියාසර කර ඇත. දින 7කට වැඩි කාලයක් ඒ යානය කටුනායක ගුවන්තොටේ නවතා තිබේ.

ගුවන්තොටුපළ ආරංචිමාර්ගවලට අනුව එම ජෙට් යානයේ හිමිකරු ලෙස ලැයිස්තු ගත කර තිබෙන්නේ merci limited නමැති ආයතනයකි. මෙම ගුවන් යානය කවර රාජ්‍යයක ලියාපදිංචි කර තිබේද යන්න දැනගැනීමට නැත. බ්‍රිතාන්‍යයට අයත් Isle of man දූපතේහි ලේඛන ගත කර ඇති බවක්ද ඇතැම් මාධ්‍යවල පළවිය.

ගුවන්තොටුපළ අංගණයේ නවතා තිබෙන අනෙක් ගුවන් යානය G - GSVI යනුවෙන් ලේඛනවල සටහන් වේ. එම යානය එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාවට පැමිණියේ දෙසැම්බර් 28 වැනිදාය. එය දැනට කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ අංගණයේ නවතා ඇති අතර දැනගන්නට තිබෙන තොරතුරු අනුව එය එක්සත් රාජධානියේ ඉහළම ප්‍රකෝටිපතියකුට අයත්ය. හිමිකාරිත්වය ලෙස සඳහන්ව තිබෙන්නේ Executive jet charter ltd යනුවෙනි.

ශ්‍රී ලංකාව පෞද්ගලික ජෙට් යානාවල ගමනාන්තයක් වීම ඉතා වැදගත් කාරණයකි. එහෙත් පෞද්ගලික ජෙට් යානාවලින් ලෝකයේ ධන කුවේරයන් ලංකාවට පැමිණෙනවා මෙන්ම පෞද්ගලික ජෙට් යානා හරහා ලොව පුරා නීති විරෝධී කටයුතුද සිදු කෙරෙන බව රහසක් නොවේ. සංචාරක ව්‍යාපාරයේ ඉහළතම අවස්ථාවක් ලෙස පෞද්ගලික ජෙට් යානාවලින් සංචාරකයන් පැමිණීම අගය කළ හැකිය.

නමුත් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිල්ල යොමුකිරීමේදී පෞද්ගලික ජෙට් යානා ශ්‍රී ලංකාවට පැමිණීමේ අරමුණ පිළිබඳව බලධාරීන් නිසි සැලකිල්ල යොමු කළ යුතුමය. මෙහිදී අනවශ්‍ය කුතුහලයක් ඉස්මතු වන්නේ ගුවන්තොටුපළ බලධාරීන් ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවට යන එන පුද්ගලයන් පිළිබඳව තොරතුරු ලබාදීම පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමේ පදනම යටතේ රහස්‍යභාවය රැකිය යුතු කරුණක් යැයි සඳහන් කරන විටය.

අගමැති මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ පවුලේ උදවිය ඉන්දියාවේ තිරුපති බලා ගමන් කළ පෞද්ගලික ජෙට් යානය සම්බන්ධයෙන් විශාල කුතුහලයක් උනන්දුවක් මෙරට ඇති වූයේද එම ජෙට් යානය පිළිබඳව පැහැදිලි තොරතුරක් ඉදිරිපත් නොවූ නිසාය. උගන්ඩාවේ සිට රත්මලාන ගුවන්තොටුපළ කරා පැමිණි 7 - JSG Legacy 600 දරන එම පෞද්ගලික ජෙට් යානය සෙන්ට් මැරිනෝ රාජ්‍යයේ ලියාපදිංචි කරන ලද්දකි. තිරුපති සංචාරය අවසන් කිරීමෙන් පසුව එම යානය ඉන්දියාවේ චෙන්නායි බලා පියාසර කොට ආපසු රත්මලානට පැමිණියේය.

අවසානයේ යානය උගන්ඩාව බලා ගමන් කර තිබිණි. එම පෞද්ගලික ජෙට් යානය උගන්ඩාව බලා පියාසර කරද්දී ටොන් 102ක් මුද්‍රිත කඩදාසි රැගෙන ගිය බව වාර්තා විය. එසේ රැගෙන යන ලද කඩදාසි මොනවාදැයි වාර්තා වූයේ නැත. එය කුතුහලය දනවන කරුණක් වන්නේ දැනට රත්මලාන ගුවන්තොටුපළේ ශ්‍රී ලංකා රේගුවේ කාර්යාලයක් ක්‍රියාත්මක නොවන බැවිනි. බොහෝ විට විදේශීය ගුවන් යානාද පැමිණෙන රත්මලාන ගුවන්තොටුපළේ රේගු කාර්යාලයක් නොතිබීම මහත් සැකයට තුඩු දෙන කරුණකි.

පෞද්ගලික ජෙට් යානයක ටොන් 102ක් පටවාගෙන ගියේ මොනවාද යන්නට මිනිස්සු විවිධ උපකල්පන ඇතිකර ගනිති. එය කිසිවකුට වැළැක්විය නොහැකිය. එය වළක්වන්නට නම් ශ්‍රී ලංකා රේගුවේ නීත්‍යනුකූල වාර්තා සටහන් තිබීම අනිවාර්යය. එසේ නොතිබෙන අවස්ථාවක ජනතාව පූර්ව නිගමනයන්ට එළඹීම අසාධාරණ යැයි කිසිවකුට තර්ක කළ නොහැකිය.

මෙරට ගුවන්තොටුපළවලින් කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, මත්තල අන්තර්ජාතික ගුවන්තොටුපළ සහ පලාලි ගුවන්තොටුපළ තුළ පමණක් ශ්‍රී ලංකා රේගු කවුළුවක් ඇති බව දැනගන්නට තිබේ. ශ්‍රී ලංකා රේගුවේ ක්‍රියාකාරීත්වයක් නැති ගුවන් තොටුපළක් හරහා විදේශීය ගුවන් යානා පැමිණීම සහ පිටවී යෑම ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් බරපතළ වරදක් මෙන්ම ජනතාව කනස්සල්ලට පත් වන කාරණයක්ද වන්නේය.

ගුවන් යානාවලින් මෙරටට රැගෙන එන්නේ මොනවාද? මෙරටින් බැහැරට ගෙනයන්නේ මොනවාද? යන්න ප්‍රශ්නයක් ලෙස නිතැතින්ම මතුවේ. එවිට රටේ ජනතාව නිගමනයකට එළැඹෙන්නේ පාලකයන්ට සම්බන්ධ කිසියම් කූට රහස් ව්‍යාපාර එම ගුවන්තොටුපළ ඔස්සේ සිදුවන බවය.

දුරාතීතයේ සිටම ගාලු වරාය විදේශීය නෞකාවල ගමනාන්තයක් විය. කුඩා යොට් යාත්‍රාවලින් එන විදේශීය සංචාරකයෝ ලංකාවට ඇතුළු වන්නේ ගාල්ලේ මාගාල්ලේ පිහිටි වරායෙනි. ශ්‍රී ලංකාවේ රේගු අධීක්ෂණයට ගාල්ල වරාය ලක් වන බැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් මතු නොවේ.

ප්‍රධාන වරායකට ඇතුළු වී සංකීර්ණ ක්‍රියාදාමයකට මැදි නොවී ඉතා පහසුවෙන් තම ආගමන - විගමන කටයුතු කර ගැනීමට සංචාරක ප්‍රජාව කැමැතිය. එබැවින් පෞද්ගලික ජෙට් යානා වඩ වඩාත් ලංකාවට පැමිණ විදේශ විනිමය ලබා දෙන්නේ නම් ඒ සඳහා වන සියලු අධීක්ෂණ කටයුතු පැහැදිලි විනිවිදභාවයකින් යුතුව සිදු කිරීමට රජයේ බලධාරීන් වගබලා ගත යුතුය.

මෙයට ඉහත අවස්ථාවක 2019 ජනවාරි 03 දින පෞද්ගලික ගුවන් යානයකින් ලංකාවට පැමිණි විදේශීය ආයෝජකයන් පිරිසක් ප්‍රථමයෙන් කටුනායක ගුවන්තොටුපළට යානය බස්වා දෙවැනි අවස්ථාවේ එම යානයෙන් ත්‍රිකුණාමලය චීන වරාය ගුවන්තොටුපළට ගොස් දෙවනුව එහි සිට සිංගප්පූරුවට පිටත්ව යෑම නිසා ජාතික ආරක්ෂාව පිළිබඳ ගැටලුවකට මුහුණ දුන්නේය.

උතුරේ යුද සමයේ සාම ගිවිසුම පැවති අවධියේ එල්.ටී.ටී.ඊ. නායක ප්‍රභාකරන්ගේ දේශපාලන උපදේශක ඇන්ටන් බාලසිංහම් පෞද්ගලික ගුවන් යානයකින් ඉරණමඩු ජලාශයට ගුවනින් පැමිණි අන්දමට බලහත්කාරයෙන් තම හිතුමතේට ගොඩවදින්නට කිසිවකුට ඉඩ දිය යුතු නැත.

ත්‍රිකුණාමලය චීන වරාය ගුවන්තොට ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා අනුමත ගුවන්තොටක් නොවීය. එහිදී ආගමන විගමන නීතිවලින් ආවරණය වීමක් සිදු නොවේ. එවැනි පසුබිමක හොංකොං සහ සිංගප්පූරු රටවල ආයෝජකයන් ත්‍රිකුණාමලයට පැමිණ එතැනින්ම පිටව යෑම බරපතළ ප්‍රශ්නයක් විය.

කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ නවත්වා තිබී පිටවී ගිය පෞද්ගලික ජෙට් යානයේ ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රිකයකුට සම්බන්ධය ඇති ඥාතියකු ගමන් කළ බවත් එම යානය ඕස්ට්‍රේලියාවේ ගෝල්ඩ් කෝස්ට් දිවයින බලා පියාසර කළ බවත් සමාජ මාධ්‍ය හෙළි කර තිබිණි. එවැනි තොරතුරු පියාපත් ලැබ වේගයෙන් ඉගිල යන්නේය. ඒවා පැතිර යෑමට ශක්තිය හා ජවය දෙන්නේ නිසි තොරතුරු සැඟවීම තුළිනි.

ගෝල්ඩ්න් කෝස්ට් නගරය ඕස්ට්‍රේලියාවේ මුහුදු වෙරළේ නිවාඩු ගමනාන්තයකි. අග්නිදිග ක්වීන්ස්ලන්ත කොරිඩෝව තුළ පිහිටා ඇති ගෝල්ඩ්කෝස්ට් ඕස්ට්‍රේලියාවේ වේගයෙන්ම වර්ධනය වන නගරවලින් එකකි. ජනගහන වර්ධන වේගය 1.8කි. ප්‍රාදේශීය නිෂ්පාදනය ඕස්ට්‍රේලියානු ඩොලර් බිලියන 9.7 සිට ක්‍රමයෙන් ඉහළ යමින් පවතී.

ගෝල්ඩ්කෝස්ට් නගරයට වසරකට පැමිණෙන සංචාරකයෝ මිලියන 10කට ආසන්නය. සෑම වසරකම නගර ආර්ථිකයට ඩොලර් මිලියන 4.4කට වඩා සෘජු දායකත්වයක් සපයන අතර දළ වශයෙන් ඇඳන් 65,000 සහිත හෝටල් සංකීර්ණ සහ කිලෝමීටර් 60ක වෙරළ තීරයක් ඇත.

එබැවින් ශ්‍රී ලංකාවේ ප්‍රකෝටිපතියෝද සිය ගමනාන්තයක් ලෙස ගෝල්ඩ්කෝස්ට් යොදා ගැනීම ගැන කිසිවකු පුදුම විය යුතු නැත.

■ උදේනි සමන් කුමාර



# අත්තනගල්ලේ කෝටිපතියා උස්සලා කෝටි 5ක කප්පම් ගන්න ගහපු රජ ගේම!

**පැය 2න් ඇල්ලූ හැටි**

**ඕනෑම අපරාධයක් විසඳිය හැකිය යන කියමනක් ඇත. එලෙස අපරාධයක් විසඳිය හැකි වන්නේ ඒ පිළිබඳ විමර්ශන පවත්වන පොලිස් නිලධාරීන්ගේ දක්ෂතාව අනුවය. අපරාධයක් එලෙස විසඳීමට නම් අපරාධයක් සිදුවූ සැණින් ඒ පසුපස හඹා යා යුතුවේ. පොලිසිය ඒ සඳහා උනන්දු නොවන්නේ නම් අපරාධය සිදුකළ පුද්ගලයන් ප්‍රදේශයෙන් පමණක් නොව රටින්ද පලායන බව අමුතුවෙන් කිව යුතු නැත. අපරාධයක් සිදුවූ සැණින් ඒ අපරාධය පසුපසම සිටිමින් විමර්ශන සිදුකිරීම තුළින් කුමන අපරාධයක් සිදුකළද ඔවුන් කොටු කර ගැනීමට දක්ෂ පළපුරුදු විමර්ශන නිලධාරීන්ට හැකියාවක් ඇත.**

මෙවන් සාර්ථක විමර්ශනයක් පසුගියදා අත්තනගල්ල ප්‍රදේශයෙන්ද වාර්තා විය. අත්තනගල්ල ප්‍රදේශයේ ව්‍යාපාර රැසක් හිමි කෝටිපති ව්‍යාපාරිකයකු පැහැරගෙන යෑමට පසුගියදා කොල්ලකරුවන් කණ්ඩායමක් උත්සුක වූහ. එහෙත් සිද්ධිය සැලවූ සැණින් ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන නිලධාරීහු ක්‍රියාත්මක වූහ. ඊට නායකත්වය දෙමින් ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාද සිය කාර්යය පසෙකලා විමර්ශන නිලධාරීන්ට උපදෙස් දෙමින් ඔවුන් උනන්දු කිරීම මෙම විමර්ශනය සාර්ථක වීමට බෙහෙවින් බලපෑවේය. ඒ හේතූන් නිසා කෝටිපති ව්‍යාපාරිකයා පැහැරගෙන ගොස් කප්පම් ගැනීමට උත්සාහ කළ අපරාධ කල්ලියේ මුල් සාමාජිකයා පැය දෙකක් ගතවන්නටද මත්තෙන් කොටුකරගැනීමට විමර්ශන නිලධාරීන්ට හැකිවිය. ඔහුගෙන් කළ දිර්ඝ ප්‍රශ්න කිරීමේදී අපරාධයට සම්බන්ධ සෙසු පිරිසද පැය විසි හතරකටත් පෙර කොටුකර ගැනීමට ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන නිලධාරීහු සමත් වූහ.

ගම්පහ පොලිස් කොට්ඨාසයේ අත්තනගල්ල ප්‍රදේශයේ පදිංචි තීක්ෂණපාල කෝටිපති ව්‍යාපාරිකයෙකි. ඔහු සතුව ඇති දේපළ ඉමහත්ය. අත්තනගල්ල පන්සලට යාබදව ඉන්ධන පිරවුම්හලක් ආසන්නයේ ඔහුගේ නිවෙස පිහිටා ඇත. අත්තනගල්ල ප්‍රදේශයේ ඇති මත්පැන් විකිණීමේ ස්ථාන දෙකක් මෙන්ම ඉන්ධන පිරවුම්හලද ඔහු සතුය. එමඟින් ලැබෙන ආදායම දිනපතා ඔහු අතට පත්වන අතර එම මුදල පසුදා අලුයම් කාලයේ අදාළ බැංකුවලට බැර කිරීම ඔහු විසින්ම සිදුකරගෙන යන ක්‍රියාවක් විය. ඒ ඔහුගේ සුපුරුදු දින චර්යාව විය.

ඒ ඉකුත් 30 වැනිදාය. වෙලාව උදෑසන 07.50ට පමණ තිබිණි. තීක්ෂණපාල මුදලාලි සුපුරුදු පරිදි පෙරදා එක්කාසු වූ මුදල් මල්ලද රැගෙන බැංකුවට යෑමට සූදානම් විය. තමාට අයත් බොලරෝ රථයට නැගුණු ඔහු බැංකුගත කිරීම සඳහා සූදානම් කරගත් ලක්ෂ 45කට ආසන්න මුදලද රථය තුළට දමාගෙන රිය අසුනට ගොඩවිය. බොලරෝ රථයේ ඇන්ජිම පණ ගැන්වූ හෙතෙම ඉදිරිපස ගේට්ටුව විවර කර රථය නිවෙසින් පිටත මාර්ගයේ නතරකොට යළි රථයෙන් බැසගත්තේ ගේට්ටුව වසා දැමීමේ අරමුණෙනි. රථයේ ඇන්ජිම ඒ වනවිටත් ක්‍රියාත්මකව පැවැතිණි. ඉදිරිපස ගේට්ටුව වසා දැමූ ඔහු යළි රථයට ගොඩවීමට තැත් කළා පමණි. කොහේදෝ සිට පැමිණි තුන්දෙනෙක් තීක්ෂණ මුදලාලි පැහැරගන්නට උත්සුක වූහ. ඔවුන් අත ගිනිඅවි තිබිණි.

"එදා මම බාර් දෙකේ සල්ලියි, තව අරක්කු කොම්පැනියකට දෙන්න තිබුණු රුපියල් හාරලක්ෂ විසිදාහකුයි, පොල්වලින් හම්බවුණු තුන් ලක්ෂ අසූදාහකුයි, ගෙදර තිබුණු ලක්ෂ තුනකුයි, තව අත්තනගල්ලේ කඩේ සල්ලියි ලක්ෂ 45ක් විතර ඒ සේරම සල්ලිත් දාගෙන බැංකුවට යන්න පිටත් වුණා."

"වාහනේ එළියට දාලා ජීප් එක ස්ටාට් එකේම තියෙද්දී මම ඇවිත් ගේට්ටුව වහලා වාහනයට නගින්න හදනකොටම එකපාරටම කවුදෝ කෙනෙක් මගේ ඔළුවට කොට්ට උරයක් දැම්මා. ඒත් එක්කම කට්ටියක් මට ගහගෙන ගහගෙන ගියා. උන් මාව තල්ලුකළා මගේම වාහනය ඇතුළට. මම වාහනයට කකුල තියලා තදකරගෙන උන් එක්ක පොර බැදුවා. උන් මට හොඳටම ගැහුවා. මාත් ගැහුවා. ඒත් එක්කම මම ඔළුවට දාපු කොට්ට උරය ගලවගත්තා. එකපාරක් උන් තුන්දෙනාම බිම වැටුණා. ඒත් උන් ආයේ නැගිටලා මට ගැහුවා. එකෙක් කෑගැහැව්වා වෙඩි තියපන්, තියපන්, මරපිය, මරපිය කියලා."

"ඒත් එක්කම වැලි ගේන්න යන ටිපර් එකක් එතන ස්ලෝ කරලා නතර කරන්න හැදුවා. මුන් බයවුණා. උන්ට ඕන වුණේ මාව උස්සන්න. ඒත් එක්කම අහල පහළ අය දුවගෙන එද්දි උන්ට කර කියා ගන්න දෙයක් නැතිවුණා. උන් තුවක්කුත් එක්කම මගේ බොලරෝ ජීප් එකට නැග්ගා. ඒක ඒ වෙනකොටත් ස්ටාට් එකේනේ තිබුණේ. පස්සේ උන් මගේ ජීප් එකත් අරන් පැන්නා"

මැරයන්ගෙන් ජීවිතය බේරාගත් තීක්ෂණපාල මහතා තමා මුහුණ දුන් අත්දැකීම එලෙස විස්තර කළේය. ඉන් අනතුරුව ඔහු මේ සම්බන්ධයෙන් අත්තනගල්ල පොලිසිය දැනුවත් කරමින් දුරකථන ඇමැතුම්ද දුන්නේය. ඒ සමඟ අත්තනගල්ල පොලිසිය ක්‍රියාත්මක විය. බොලරෝ වර්ගයේ ජීප් රියක් පැහැරගෙන යන කණ්ඩායමක් නිට්ටඹුව දෙසට පලා යන බව ගුවන් තරංග හරහා සියලු පොලිස් ස්ථාන හා මාර්ග බාධක දැනුවත් කෙරිණි. මෙම ගුවන් පණිවුඩය ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන මහතාටද අසන්නට ලැබිණි. ඒ සමඟම ඔහු ක්‍රියාත්මක විය.

මේ වනවිට ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්ද්‍රික ද සිල්වා මහතා සිටියේ නුවරඑළිය ප්‍රදේශයේය. නිවාඩු මත සිටි ඔහු සිය බිරිය හා දරුවන් සමඟ සංචාරයකට එක් වී සිටියේය. සිද්ධිය ඔහුටද සැලවිය. ඔහු වහා ක්‍රියාත්මක විය. දුරකථන ඔස්සේ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා ඇතුළු සෙසු නිලධාරීන් නුවරඑළියේ සිටම දැනුවත් කරන්නට ඔහු ක්ෂණිකව පියවර ගත්තේය.

"කොහොමහරි මුන්ට පනින්න දෙන්න එපා. ටීම් ටික දාලා වටකරන්න. මම ගමන කැන්සල් කරලා ඉක්මනට ගම්පහට එනවා. අතහරින්න එපා. මුන්ව කොහොම හරි අල්ලගන්න."

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා සිය නිලධාරීන්ට උපදෙස් දෙමින් කීවේය. සහකාර පොලිස් අධිකාරී තුසිත කුමාරවද දැනුවත් කරමින් හෙතෙම කියා සිටියේ තමා ගම්පහට පැමිණෙන තුරු වහා ක්‍රියාත්මක වන ලෙසය. සිය බිරිය හා දරුවන් සමඟ නිවාඩුව ගත කිරීමට නුවරඑළියට ගොස් සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා සිය ගමන අවලංගු කරමින් ගම්පහ බලා පිටත්විය.

ඒ වනවිට ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන කණ්ඩායම් දෙකක්ද සමඟ නිට්ටඹුව බලා පිටත්ව තිබිණි. ඉන් එක් කණ්ඩායමක් නිට්ටඹුවේ ස්ථානගත කළ ඔහු අනෙක් කණ්ඩායම සමඟ කෙළින්ම ගියේ තීක්ෂණපාල ව්‍යාපාරිකයාගේ නිවෙසටය. මුදලාලි මුණගැසුණු ඔහු සිද්ධිය සම්බන්ධයෙන් කරුණු විමසීය.

"උන් අඳුරගන්න බැහැ සර්. උන් ඔක්කොම මුහුණුවල් වහගෙන හිටියේ. අතේ තුවක්කුත් තිබුණා. උන්ට


තීක්ෂණපාල

ඕන වුණේ මාව පැහැරගන්න, ඒත් ඒක බැරිවුණා. මම බැංකුවට දාන්න ගෙනියපු ලක්ෂ 45ක් විතර ජීප් එකේ තිබුණා. ඒක උන්ට අහුවෙන්න ඇති. උන්ට ඒක හම්බවුණේ අහම්බෙන්. උන් මගේ සල්ලියි, ජීප් එකයි අරගෙන පැනලා ගියේ."

තීක්ෂණපාල මහතාගෙන් විස්තර විමසීමෙන් අනතුරුව නිලධාරීහු ඔහුගේ නිවෙසේ සවිකර තිබූ සී.සී.ටී.වී. කැමරා නිරීක්ෂණය කළහ. ඒ කිසියම් හෝඩුවාවක් ලබා ගැනීම සඳහාය.

"ඔය කැමරා බලද්දී අපිට පෙනුණා පාන්දර 5.40ට විතර තුන්දෙනෙක් මුදලාලිගේ ගෙදර ඉස්සරහා කැරකෙනවා. සේරම කට්ටිය හිටියේ මුහුණු වහගෙන, ජැකට් දාලා වගේ. ටිකක් ඈතින් තමයි පෙනුණේ. එතනදී අපි හිතාගත්තා මේ ටීම් එක පාන්දර ඉඳන් පැය දෙකක් විතර මුදලාලි එළියට එනකම් ගේ ඉස්සරහා හැංගිලා ඉඳලා කියලා"

ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා විමර්ශන ඇරැඹි ආකාරය එසේ සඳහන් කළේය. එහෙත් සී.සී.ටී.වී. කැමරා රූප රාමුවලින් පැමිණි කොල්ලකරුවන් හඳුනාගත නොහැකිවිය.

"ඉන් පස්සේ තමයි අපිට තොරතුරක් එන්නේ අත්තනගල්ල හුණුපොළ පාරේ 'එව්රි' වර්ගයේ වාහනයක් දාලා ගිහින් කියලා. අපි එතැනට ගිහින් බලද්දි අපිට තේරුණා ඒ වාහනයෙන් තමයි මේ රොබරියට ටීම් එක එන්න ඇත්තේ කියලා. ඒක දාලා ගිහින් තිබුණේ මුදලාලිගේ ගෙදරට මීටර 500ක් විතර දුරින්."

"පස්සේ අපි ඒ වාහනේ අංකය ආර්.එම්.වී. එකට දන්වලා ඒකේ ලියාපදිංචි අයිතිකාරයා හොයලා බැලුවා. එතනදී අපිට හොයාගන්න පුළුවන් වුණා ඒක ප්‍රදීප් කියලා වේයන්ගොඩ ගැරේජ් එකක් අයිති කෙනෙක්ගේ කියලා. ඒත් ලියාපදිංචි වෙලා තිබුණේ ප්‍රදීප්ට වුණාට ඒ වෑන් එක සංජීව කියලා මල්වත්තේ මෝටර් සයිකල් ගැරේජ් එකක් කරන කෙනෙකුට අයිති එකක් කියලා."

පොලිස් පරීක්ෂකවරයා සඳහන් කළේය. ඉන් අනතුරුව පොලිස් කණ්ඩායමේ අරමුණ වූයේ සංජීව කොටුකර ගැනීමය. එහෙත් සංජීව පොලිසිය මඟ හරින්නට විය. කෙසේ වෙතත් පොලිස් පරීක්ෂක සුමිත් කිසියම් උපාය මාර්ගයක් යොදා ගනිමින් සංජීව නමැත්තා උණගහපිටිය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත්තේය.

"අනේ සර් මම මේ මොකුත් දන්නෙ නැහැ. මේක මගෙන් ඊයේ රෑ නිශ්ශංක ඉල්ලගෙන ගියා. එයා ජනවාරි 15 බඳිනවා. එයාගේ වෙඩින් එකේ 'ප්‍රී ෂූට්' වගයක් කරගන්න ලොකේෂන් බලන්න යන්න තියෙනවා කියලා තමයි නිශ්ශංක මගෙන් වාහනේ ඉල්ලගත්තේ"

සංජීව පොලිස් පරීක්ෂක සුමිත්ට කීවේය. ඒ අනුව නිලධාරීන් ඊළඟට කළේ නිශ්ශංක පසුපස පැන්නීමය. එහෙත් නිශ්ශංක කොටුකර ගැනීම ලෙහෙසි පහසු නොවීය.

අවසානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා තවත් උපාය මාර්ගයකට අවතීර්ණ විය. ඒ සංජීව යොදා ගනිමින් ඔහුගේ මිතුරා නිශ්ශංකට ඇමතීමය. ඒ අනුව ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයාගේ උපදෙස් මත කිසිත් නොදන්නා අයුරින් සංජීව සිය මිතුරා වූ නිශ්ශංක ඇමැතීය.

"ඊයි අර වාහනේ හුණුපොළ පැත්තේ දාලා ගිහින්. මොකද බන් එතන දැම්මේ. ඒක අරගෙන පලයන්." සංජීව නිශ්ශංකට කීය. එහෙත් නිශ්ශංක කීවේ වෑන් රියේ යතුර මිතුරකු ළඟ බවත් එය ලබා ගත් වහාම වෑන් රිය රැගෙන යන බවත්ය. ඉන් පසුව නිශ්ශංක ඇමතුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත්ය.

"ඔයාද නිශ්ශංක කියන්නේ. ඔයාලගේ වෑන් එකක් හුණුපොළ දාලා ගිහින් තියෙනවා. මිනිස්සු බය වෙලා අපිට කෝල් කරනවා. ඒක එතනින් අරගෙන යන්න. ආවේ නැත්නම් වාහනේ උස්සගෙන ගේන්න වෙයි."

පොලිස් පරීක්ෂකවරයා කිසිත් නොදන්නකු සේ නිශ්ශංකට පැවැසීය. එහෙත් නිශ්ශංක නිලධාරීන්ට කීවේ තමන් මඳ දුරක සිටින බැවින් ඒ මොහොතේ පැමිණීමට නොහැකි බවය. ඒ වනවිටත් නිලධාරීන් නිශ්ශංක රැඳී සිටින ස්ථානය ඔහුගේ ජංගම දුරකථන අංකය ඔස්සේද නිරීක්ෂණය කරන්නට විය. ඒ බව නොදත් ඔහු පොලිසිය මඟහැරියද නිශ්ශංක රැඳී සිටින ස්ථානය සොයාගන්නට පොලිස් යතුරුපැදියක් යෙදවූ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා උපක්‍රමශීලීව කීවේය.

නිශ්ශංක පවසන්නේ බොරු බව දැනගත් නිලධාරීන් නිශ්ශංකගෙන් තදින් ප්‍රශ්න කළේ ඉන් පසුවය. නිශ්ශංක යනු කොල්ලකෑමට මුහුණ දුන් ව්‍යාපාරික තීක්ෂණපාලගේ ඥාති පුතෙකු බව එහිදී නිලධාරීන් අනාවරණය කර ගැනීමත් සමඟ ප්‍රශ්න කිරීම දීර්ඝ ලෙස සිදුවිය.

"ඔන්න ඔතැනදී තමයි නිශ්ශංක අපිට කිව්වේ රොබරිය දෙන්න ආව ටීම් එක ගැන. වෙපන් එක ගෙනාවේ ආමි සෝල්ජර් කෙනෙක් කියලාත් කිව්වා. පස්සේ අපි ආමි සෝල්ජර්ව හෙව්වා එයා කර්නල් කෙනෙක්ගේ 'බඩියා' විධියට රාජකාරි කරනවා කියලා හොයා ගත්තා. මිනිහගේ නම මධුසංක. පස්සේ පහුවැනිදා උදෙන්ම කර්නල්

පදිංචි වෙලා ඉන්න ගලිගමුව ගෙදරට ගියා. කර්නල් ගෙදර හිටියෙ නෑ. කර්නල් බඩියත් එක්ක රාජකාරි වැඩකට අම්පාරට ගිහින් තිබුණා."

"ඉන් අනතුරුව ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා ඒ බව ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා දැනුවත් කරන්නට විය. පසුව වැඩි විස්තරයක් නොකියා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් හමුදා කර්නල්වරයා දැනුවත් කළේ යම් හෙයකින් ඒ බව හමුදා සෙබළා දැනගත්තොත් ඔහු එතැනින් පලායන නිසාය. එම දැනුම්දීමෙන් අනතුරුව පොලිස් කණ්ඩායමක් අම්පාරට ගොස් කර්නල්වරයා සමඟ සිටි හමුදා සෙබළා අසලට පැමිණ ඇත. ඔවුන් සිවු දෙනාම සිට ඇත්තේ ජැකට් පැලඳගෙන මුහුණු ආවරණ සහිතවය. වෑන් රිය පැදවූයේ මධුසංඛය. සිය සගයන් තිදෙනා තීක්ෂණපාල මුදලාලිගේ නිවෙස අසලින් බැස්ස වූ මධුසංඛ වාහනය ඊට නුදුරින් හුණුපොළ මාර්ගයේ නතර කළේ කොල්ලය දීමෙන් පසුව නැවත එය රැගෙන යෑමේ අරමුණෙනි.

"ඒත් මේගොල්ලෝ මුදලාලි පැහැරගෙන යන්න හැදුවට අර ටිපර් එක එතැන නතර කරන්න හදපු නිසා මේ කට්ටිය බය වුණා. ඒ නිසා තමයි මෙයාලට ආපු වාහනේ ගෙනියන්න බැරි වුණේ. අනික වාහනයේ යතුර තිබුණොත් ආමි එක්කෙනා ගාව. ඒ නිසා කාටත් තිබුණු තැනින් වාහනේ ගෙනියන්න ලැබුණේ නැහැ."

"මුදලාලිගේ වාහනේ නැගලා ගිය මේ කට්ටියගෙන් ආමි එක්කෙනා අතරමඟදී බැහැලා ගිහින්. මොකද මිනිහට එදා කර්නල් එක්ක අම්පාරට යන්න තිබුණ නිසා. මිනිහා අතේ තමයි වාහනේ යතුර. සංජීවත් අතරමඟින් බැහැලා ගිහින් තිබුණා. මුදලාලිගේ සල්ලි ලක්ෂ 45 නිශ්ශංක අරගෙන කුජනත් එක්ක ගිහින් යාළුවෙක්ගේ ගෙදරින් බැහැලා සල්ලි ටික ඒ ගෙදර හංගලා බෙදාගන්න. ඒත් මෙයාලට සල්ලි බෙදාගන්න හම්බවුණේ නැහැ. අපි ඊට කලින් කට්ටිය අල්ලගත්ත නිසා"

ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා


ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්ද්‍රික ද සිල්වා


ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන

ඔහු රුක්ගහවිල ප්‍රදේශයේදී කොටුකර ගත්තේය. ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයට රැගෙන ගිය ඔහුට එතැනදී සංජීවද මාංචු යොදාගෙන සිටින අයුරු දැකගත හැකිවිය. "වැඩේ මාට්ටු" වී ඇති බව නිශ්ශංකට තහවුරු වූයේ එවිටය. එහෙත් නිශ්ශංක මුලින් පොලිසියට බොරු කීවේය.

"මගේ වෙඩින් එකට ප්‍රී ෂූට් ගන්න කට්ටියක් එක්ක ලොකේෂන් බලන්න ගියා සර්"

"එහෙනම් වෑන් එක එතන දැම්මේ ඇයි"

"ඒක එතැන දාලා වෙන වාහනයක ගියේ සර්"

එයින් සෑහීමකට පත් නොවූ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා 'ප්‍රී ෂූට්'වලට ලොකේෂන් බැලීම සඳහා වෑන් රියෙන් ගියේ කවුදැයි ඔහුගෙන් විමසීය. පසුව ඒ සඳහා ගිය දෙතුන් දෙනා පොලිසිය වෙත කැඳවනු ලැබීය.

නිලධාරීන් ඔවුන්ගෙන් වෙන වෙනම ගෙන ප්‍රශ්න කරන්නට විය.

"අපි එහෙම ලොකේෂන් එකක් බලන්න ගියේ නැහැ සර්. පොලිසියෙන් ඇහැව්වොත් එහෙම කියන්න කියලා අපිට නිශ්ශංක අයියා කිව්වා. අපි ඊයේ නිට්ටඹුවට නම් ගියා. කවුදෝ වාහනයක යතුරක් ගේනවා කියලා බලන්න."

නිශ්ශංක සිය විවාහ මංගල්‍යය සඳහා සූදානම් කරගෙන සිටි ඡායාරූප ශිල්පියා පොලිස් ප්‍රශ්න කිරීම් හමුවේ එලෙස අත්අඩංගුවට ගත්තේ කර්නල්වරයාටද ඇත්ත තත්ත්වය පහදා දීමෙන් අනතුරුවය. එතෙක් කර්නල්වරයා ඒ සම්බන්ධයෙන් කිසිවක් දැන නොසිටියේය.

"මේ කර්නල්වරයා කලක් නිට්ටඹුව, මල්වත්ත යුද හමුදා කඳවුරේ රාජකාරි කරලා තියෙනවා. එතකොට ඔය මධුසංඛ කියන පුද්ගලයා තමයි කර්නල්ගේ බඩියා. කලක් යද්දි මධුසංඛ යන එන තැන්වලදී හම්බවෙලා නිශ්ශංකත්, සංජීවත් මෙයාව දැන හඳුනාගෙන තියෙනවා. මොකද ඒ දෙන්නත් මල්වත්තේ පදිංචි අයනේ. ඔය හිතවත්කම කාලයක් තිස්සේ තිබිලා. ඒ අතරතුර තමයි නිශ්ශංක මේ කට්ටියත් එක්ක එකතුවෙලා තීක්ෂණපාල මුදලාලිව පැහැරගෙන ගිහින් කෝටි ගාණක් ගන්න ප්ලෑන් එක ගහලා තියෙන්නේ."

" මේ ප්ලෑන් එක ගහලා තියෙන්නේ දැනට මාස 08කට විතර කලින්. ඒත් කොරෝනා නිසා 'ගේම' ටිකින් ටික කල් ගියා. පස්සේ දැන් සති දෙකකට කලින් තමයි මෙයාලා ආයෙත් ප්ලෑන් කරලා තිබුණේ. ඔය සිද්ධියට කලින්දා රෑ තමයි මධුසංඛ ගලිගමුවට ගිහින් වෙපන් එක අරගෙන ඇවිත් තියන්නේ."

පොලිසිය පවසන අන්දමට ඉකුත් මස විසිනව වැනිදා රාත්‍රියේ මධුසංඛ ගිනිඅවිය රැගෙන පැමිණ ඇති අතර කොල්ලය සඳහා භාවිත කර ඇත්තේ සංජීවගේ වාහනය බව හෙළිවී ඇත. සංජීවත්, නිශ්ශංකත්, කුජන හා මධුසංඛත් රැගත් වෑන් රිය 30 වැනිදා අලුයම 05.30ට පමණ තීක්ෂණපාල මුදලාලිගේ නිවෙස

කීවේය. ඒ අනුව මේ වනවිට කොල්ලයට පැමිණි නිශ්ශංක, සංජීව හා මධුසංඛ පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. එහෙත් සිද්ධියට සම්බන්ධ කුජන නමැත්තා පොලිසියට කට්ටි පනිමින් සිටින බව ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන මහතා කීවේය.

සැකකරුවන්ගෙන් කළ ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූයේ තීක්ෂණපාල මුදලාලි පැහැරගෙන ගොස් කෝටි ගණනක මුදල් ලබා ගැනීමේ අදහසින් මෙම මංකොල්ලය සිදුකර ඇති බවය. තීක්ෂණපාල මුදලාලිගේ ඥාති පුත්‍රයා වූ නිශ්ශංකගේ අනුදැනුම මත මෙම කොල්ලය සිදුවී ඇති අතර මේ වනවිට නිශ්ශංකගේ පාර්ශ්වය හා තීක්ෂණපාල මුදලාලි අතර විරසකයක් පවතින බවද හෙළිවී ඇත. ඒ ව්‍යාපාරික ආරවුලක් මූලික කරගෙනය.

මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී තීක්ෂණපාල මුදලාලි පැවැසුවේ මෙවැන්නකි.

"ඔය නිශ්ශංක මගේ ඥාති පුතෙක් එයාලට සියලුම දේවල් කළේ මම. ඔය මුළු පවුලටම උදවු කළා"

"ඒ කට්ටිය වැඩ කළේ මගේ ළඟ, වැඩ කර කර ඉන්න ගමන් ඒ කට්ටිය මගේ බාර් දෙකටම බඩු දැම්මා. මෙයාලා මගේ නමින් තමයි ඕඩර් දාලා බඩු බාගෙන රෙස්ටුරන්ට්වලට දාලා ක්ලියර් කර ගෙන තිබුණේ. මගේ නමට තමයි බිල් දාන්නේ"

"අවුරුද්දේ අන්තිමට දේශීය ආදායම් එකෙන් සහතික ගන්න ගියාම එතනින් මට කිව්වා ඔයා හරියට ගෙවලා නැහැ කියලා. මම කිව්වා මම සේරම ගෙවලා කියලා. ඒත් දේශීය ආදායම් එකෙන් කිව්වා ඔයා ගෙවලා නෑ කියලා. පස්සේ හොයලා බලද්දී ඒ බිල්, පොතට දාලා නැහැ."

"මේවා අහුවෙන්නේ අවුරුද්දේ අන්තිමට. ඒ නිසා මට 2017දී දඩයි බදුයි රුපියල් එක්කෝටි අසූලක්ෂයක් ගෙවන්න වුණා. ඉන්පස්සේ මම ඔය කට්ටිය අයින් කළා. ඉන් පස්සේ තමයි එයාලා මට වෛර බැන්දේ"

තීක්ෂණපාල මුදලාලි ආරවුල ඇතිවූ අයුරු කීවේය.

"මේ සිද්ධිය වුණාම මුලින්ම පොලිසිය සැක කළේ මාව. මේක බොරුවක් කියලා පොලිසියටත් ගොඩක් අය කතා කළා. මම ඉන්ෂුවරන්ස් එකෙන් සල්ලි ගන්න කියලා රඟපෑමක් කරනවා කිව්වා.

මාව පැහැරගෙන ගිහින් කෝටි පහක සල්ලි ගන්නයි මෙයාලා හැදුවේ. මාව එහෙම ගෙනිච්චානම් ඒ කට්ටිය තමයි මේ ගෙදර මගේ දේවල් පාලනය කරන්නේ. වාසනාවකට මගේ ජීවිතය බේරුණා. පොලිසියේ මහත්තුරු මට ගොඩක් උදවු කරපු නිසා ඇත්ත හෙළිවුණා."

තීක්ෂණපාල මහතා අවධාරණය කළේය.

පොලිසියේ දක්ෂකමින් කොල්ලය සිදුවී පැය 02ක් යන්නට මත්තෙන් සිද්ධිය අනාවරණය කරගත හැකිවී තිබිණි. එමෙන්ම කෝටිපති ව්‍යාපාරිකයාගෙන් පැහැරගත් මුදල්වලින් ලක්ෂ 16ක මුදලක් මේ වනවිටත් සොයා ගෙන තිබේ. එමෙන්ම මංකොල්ලය සඳහා භාවිත කළ හමුදාවට අයත් ස්වයංක්‍රිය පිස්තෝලයට අමතරව වායු පිස්තෝලයක් හා ව්‍යාජ පිස්තෝලයක්ද කොල්ලකරුවන් කොල්ලය දීම සඳහා හැඳපැලඳගෙන පැමිණි මුහුණ ආවරණ හා ජැකට් ඇතුළු ඇඳුම්ද පොලිසිය සිය භාරයට ගෙන තිබේ.

කොල්ලයට පැමිණි සිවු දෙනාගෙන් තිදෙනකු මේ වනවිට අත්අඩංගුවට පත්ව ඇති අතර 'කුජන' නමැත්තා සොයා විමර්ශන ආරම්භ කර ඇති බව ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණවර්ධන මහතා කියයි.

සැකකරුවන් තිදෙනා අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබන 14 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ අධීක්ෂණය මත ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්ද්‍රික ද සිල්වා මහතාගේ මෙහෙයවීමෙන් ගම්පහ සහකාර පොලිස් අධිකාරී I තුසිත කුමාර, අත්තනගල්ල සහකාර පොලිස් අධිකාරී II එස්.කේ. උපාලි යන මහත්වරුන්ගේ උපදෙස් මත ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමිත් ගුණවර්ධන මහතා ඇතුළු පොලිස් පරීක්ෂක දුෂ්‍යන්ත පෙරේරා, සැරයන්වරුන් වන සෙනෙවිරත්න (55466), ධනපාල (54460), අංජන (13092), ලසන්ත (35084), වීරසූරිය (61971) හා කොස්තාපල්වරුන් වූ වීරතුංග (81544), ලක්මාල් (37801), ජයකොඩි (77076), සේනානායක (25362), උපාලි (87775), පොලිස් සැරයන් රියැදුරු හෙට්ටිගේ (1867) යන නිලධාරීහුද මේ පිළිබඳ විමර්ශනයට එක්ව සිටියහ.

**(පොලිස් විමර්ශන ඇසුරින් ලිපිය සකස් විය.)**

■ **කීර්ති මෙන්ඩිස්**



සොයාගත් මුදල් පරීක්ෂා කරමින්


ව්‍යාපාරිකයාගේ ජීප් රිය



කොල්ලකරුවන් පැමිණි වාහනය

# ඕලු නෙළුම් නෙරිය රඟාලා...




# 66 වසරකට පසු යළි හමු වූ රේඛාවේ ආදරය


මල්ලිකා පිලපිටිය


ආනන්ද වීරකෝන්

**මෙරට සිංහල සිනමා වංශ කතාවේ හැරවුම් ලක්ෂ්‍යය ලෙස සඳහන් වන්නේ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂණය කළ 'රේඛාව' චිත්‍රපටයයි. එය ඔහුගේ පළමු වෘතාන්ත චිත්‍රපටය ලෙසද ඉතිහාසගත වී ඇත.**

1956 වසරේදී තිරගත වූ මෙම චිත්‍රපටය ඉන්දියානු ආභාසයෙන් මිදී, එතෙක් චිත්‍රාගාර තුළට කොටුවී තිබුණු කැමරාව එළිමහනට ගෙනඑමින් සිනමා විප්ලවයක් ඇති කළ බවද කියැවේ.

කෙසේ වෙතත් අද අපි මේ කතා කරන්නට සූදානම් වන්නේ 'රේඛාව' චිත්‍රපටය ගැන නම් නොවේ. මේ චිත්‍රපටයෙන් ජනප්‍රියත්වයට පත්වූ ආනන්ද වීරකෝන් නම් වූ රංගවේදියා සහ මල්ලිකා පිලපිටිය නම් සුවිශේෂී කලා ශිල්පිනිය ගැනය.

ආනන්ද හා මල්ලිකා යුවළ පෙනී සිටි 'රේඛාව' චිත්‍රපටයේ ජවනිකා අතරින් අප කාගේත් මතකයේ රැඳී ඇත්තේ 'ඕලු නෙළුම් නෙරිය රඟාලා' ගීතය ඇතුළත් රූප රාමුය. අපේ රටේ සිටි විශිෂ්ටතම ගායකයකු වූ සිසිර සේනාරත්න ගායනා කළ මේ ගීතයට අදත් ඇත්තේ අසීමිත ජනප්‍රියත්වයකි.

'මම හරි නේද?'

අප ඉදිරියේ ඉන්න ආනන්ද වීරකෝන් ප්‍රවීණ රංගවේදියාගෙන් සහ මල්ලිකා පිලපිටිය නම් විශිෂ්ට රංගවේදිනියගෙන් අප විමසා සිටියේ මේ අතීත කතන්දරය තවදුරටත් ඉදිරියට ගෙන යා යුතු නිසාය.

'ඒ වෙද්දී මම අවුරුදු 16ක ගැහැනු දරුවෙක්. නුවර ගුඩ්ෂෙෆර්ඩ් විද්‍යාලයේ තමයි මම ඉගෙන ගත්තේ.'

'ඉතින් එක දවසක් මම දෙහිවල හිටපු මගේ අයියගේ ගෙදර ආවා. ඇවිත් ඉන්න වෙලාවක ලෙස්ටර් ජේම්ස් පීරිස් මහත්තයා අයියව මුණගැහෙන්න ගෙදරට ඇවිත් දොරට තට්ටු කරද්දී මම තමයි දොර ඇරියේ. මොකද එදා ගෙදර කවුරුත් හිටියේ නැහැ."

මල්ලිකා පිලපිටිය රංගන ශිල්පිනියගේ දෛවය වෙනස් කළ මේ අවස්ථාව අදටත් ඇය සිහිපත් කරන්නේ ඉතාමත් ගෞරවයෙනි. එමෙන්ම දැඩි සතුටකිනි.

'ඒ දවස්වල මගේ ලොකු අයියා (හැරල්ඩ් පිලපිටිය) රැකියාව කළේ රජයේ චිත්‍රපට සංස්ථාවේ. ඉතින් අයියා ලෙස්ටර් මහත්තයාගේ යාළුවෙක්'

'කොහොම හරි දොර ඇරිය හැටියේ මාව දැකලා අයියා ඉන්නවද කියන ප්‍රශ්නය අහලා ඊළඟට ඇහුවේ 'චිත්‍රපටයක රඟපාන්න කැමැති නැද්ද' කියලයි."

මල්ලිකා පිලපිටිය තරුණිය මේ ප්‍රශ්නය හමුවේ නිරුත්තර වුවත් පසුව ඇයට මේ සම්බන්ධව කැමැත්තක් ඇති විය.

'අපි ඔයා වගේ කෙනෙක් තමයි හොය හොයා හිටියේ.' ලෙස්ටර් මහතා හිනැහෙමින් කී ආකාරය ඇයට අදටත් මතකය.

කෙසේ හෝ මේ කතාවෙන් පසුව හැරල්ඩ් අයියාගේත් කැමැත්තද ලැබ මල්ලිකා පිලපිටිය තම මවුපියන්ගෙන් මේ පිළිබඳව විමසා සිටියා. ඊටද අවසරය ලැබිණි.

'අපි ඒ වෙද්දී හිටියේ හඟුරන්කෙත. තාත්තා යුද හමුදාවේ හිටියා. ඒ වගේම තැපැල් ස්ථානාධිපති රැකියාවත් කළා. ඉතින් තාත්තාගේ කැමැත්ත ගන්න තමයි ටිකක් විතර කාලය වෙන් වුණේ.' හැමෝගේම ආශීර්වාදය මැද 'රේඛාව' චිත්‍රපටයට සම්බන්ධ වීමට වරම් ලැබූ මල්ලිකා පිලපිටිය ශිල්පිනිය ඊළඟට මුහුණ දුන්නේ අමුතු අත්දැකීමකටය.

'මම අධ්‍යාපනය ලැබුවේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්. මේ නිසා සිංහල වචන උච්චාරණය තරමක් අමාරු වුණා. ගැමි විදියට කතා කරන එක තමයි මූලිකම ප්‍රශ්නය වුණේ.'

'ඉතින් පුහුණුවීම් තිබුණු කොළඹ ශාන්ත පීතර විදුහල් භූමියේදී මම ඇති තරම් බැනුම් ඇහුවා. වැඩිපුරම බැන්නේ ඩී.ආර්. නානායක්කාර මහතා. ඔහු කිව්වා නැවෙන් බැහැලා දැන්ද ආවේ. මොකද සිංහල බැරි කියලා. ඇය එසේ කියමින් මහ හයියෙන් සිනාසුණාය.

කෙසේ හෝ අවසානයේදී එහි සිටි ආචාර්ය ලෙස්ටර් මහතා මෙන්ම නොයෙල් කෘෂ් පූජකවරයාට පින් සිදු වෙන්නට මේ වැරැද්ද මල්ලිකා තරුණිය මඟහරවා ගන්නට කටයුතු කළාය.

ඊට පස්සේ අපි අලව්ව ප්‍රදේශයේ ඇති හෝටලයක නතර වෙලා ඒ ළඟම තිබුණු මා ඔයේ ලස්සන තැනක 'ඕලු නෙළුම් නෙරිය රඟාලා' ගීතය රූපගත කළා. එතැන ගාමිණී ෆොන්සේකා මහත්තයත් සිටියා. ඒ වෙද්දී ඔහු 'රේඛාව' කණ්ඩායමේ කාර්මික ශිල්පියෙක්. රංගන ශිල්පියෙක් නෙවෙයි. ඒ වගේම විලී බ්ලේක්, ඇලරික් ලයනල් ප්‍රනාන්දු වගේ අයත් එහි සිටියා.

මල්ලිකා පිලපිටිය ප්‍රවීණ රංගන ශිල්පිනිය පවසන්නේ ඒ අතීතය ඉතා සුන්දර බවය. ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ සුහදත්වය හා කාරුණික භාවය, අයිරාංගනී සේරසිංහ මහත්මියගේ හිතවත්කම හා පසුව හිතවත් වූ ඩී.ආර්. නානායක්කාර යන ශිල්පීන් ගැන ඇය අදටත් මතක් කරන්නේ හෘදයාංගමවය.

'හැබැයි මේ කාලයේදී මම විතරක් නෙවෙයි අපි එක්ක හිටපු ගෑනු ළමයි ටිකක් විතර ආනන්දට නම් ගණන් ඉස්සුවා. මොකද ඒ වෙද්දී ආනන්ද ජනප්‍රියයි. ඉතින් අපි මෙයා හරි ආඩම්බර ඇති කියලා හිතලා වැඩිපුර කතාබහට ගියේ නැහැ.

ඒත් දවසක් දෙකක් යද්දී අපි තේරුම් ගත්තා ආනන්දත් බොහොම ප්‍රියමනාප කෙනෙක් කියලා. පස්සේ අපි හුඟක් හිතවත් වුණා."

දැන් අපි අවධානය යොමු කළ යුත්තේ ආනන්ද වීරකෝන් ප්‍රවීණ රංගන ශිල්පියා වෙතටය.

ඒ, මේ කතාවේ ඉදිරියට ඔහු අවශ්‍යම නිසාය.


රේඛාව චිත්‍රපටයෙන්

'මම ඒ වෙද්දී චිත්‍රපට දෙකක විතර රඟපාලා තිබුණා. ඒ, සිරිසේන විමලවීරයන්ගේ 'අසෝකා' චිත්‍රපටයෙයි 'පොඩිපුතා' චිත්‍රපටයෙයි. අසෝකා චිත්‍රපටයේ මම රඟපෑවේ දුෂ්ටයා විදිහට. 'පොඩි පුතා' චිත්‍රපටයේ පෙම්වතා ලෙස රඟපෑවා.'

"මම කොළඹ නාලන්ද විද්‍යාලයේ ඉගෙන ගත් සිසුවෙක්. ඒ කාලයේ එක්තරා දවසක කොළඹ ආනන්ද විද්‍යාලයේ කානිවල් එකක් තිබුණා. මම ඒ කානිවල් එකට ගියා. එතැන තරගයක් තිබුණා පැමිණ සිටි අය අතරින් විජය - කුවේණි යුවළ තෝරන තරගයක් ඒක. මමත් ඉතින් ඉදිරිපත් වුණා. අන්තිමට මාව විජය හැටියට තේරුණා. එතැන තමයි මගේ රංගන ජීවිතයේ ආරම්භය. කානිවල් භූමියේදීම විජය කුමාරයා ලෙස අභිෂේක ලැබූ ආනන්දගේ ඡායාරූප පසුදාම පුවත්පත්වල පළවිය. ඊළඟට ඔහුට ලැබුණේ අදහාගත නොහැකි දුරකථන පණිවුඩයකි ඒ ගුණරත්න ප්‍රින්ටර්ස් ආයතනයෙනි.

"අපි චිත්‍රපටයක් කරනවා. ඒකේ චරිතයකට ඔබව තෝරා ගත්තා. ඒ නිසා ඔබට පුළුවන්ද නව ජීවන ස්ටුඩියෝ එකට එන්න."

ආනන්ද වීරකෝන් තරුණයා මේ ඇරයුම පිළිගෙන එහි ගියේය. ඒ අනුව සිරිසේන විමලවීර මහතා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයකින් පසුව ඔහුට 'අශෝකා' චිත්‍රපටයේ රඟපෑමට අවස්ථාව උදාවිය.

මේ වෙද්දී ඒ චරිතය කරන්න තෝරාගෙන තිබුණේ සේනාධීර කුරුප්පු මහතාය. එහෙත් අවසානයේදී ඒ චරිතය නිරූපණය කිරීම සඳහා ආනන්ද වීරකෝන් තරුණයාට අවස්ථාව ලැබිණි. ඒ පෙර කී ආකාරයට මේ චිත්‍රපටය නිෂ්පාදනය කළ ගුණරත්න ප්‍රින්ටර්ස් ආයතනයේ ඉල්ලීම පිටය.

"ඊට පස්සේ තමයි මට රේඛාවට කතා කළේ. ඒ ලෙස්ටර් මහත්තයා සහ ශේෂා පළිහක්කාර මහත්තුරු. ඔවුන් මාව සොයාගෙන ඇවිත් තමයි කතා කළේ.

ආනන්ද වීරකෝන් හා මල්ලිකා පිලපිටිය රංගන ශිල්පී යුවළ මුල් වරට හමුවූයේ අලව්වේදීය. ඒ පෙර කී ලෙස 'ඕලු නෙළුම් නෙරිය රඟාලා' ගීතය රූපගත කරන මොහොතේය.

"අපි ඒ දර්ශනයෙන් පසුව හුඟක් යාළු වුණා. ඒත් ඒ යාළුකම වැඩි කාලයක් පවත්වාගෙන යන්න බැරි වුණා. මල්ලිකා විවාහ වුණා. රඟපෑමෙන් ඉවත් වෙලා එංගලන්තයට ගියා."

"ඇත්තටම කිව්වොත් ඊට දශක ගණනාවකට පස්සේ තමයි අපි අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සංවිධානය කළ හමුවකදී මුණගැසුණේ. ඊට පස්සේ හමුවුණේ පසුගියදා පැවැති සිල්වර් ස්ක්‍රීන් එවෝර්ඩ්ස් (Silver Screen Awards) උළෙල දවසේ. ඇත්තටම එදා ආපහු සැරයක් අපිට මතක් වුණා දශක කිහිපයකට පෙර කළ ඒ ගීතය හා ඊට පසුබිම් වුණු සිදුවීම්."

මේ සිල්වර් ස්ක්‍රීන් සම්මාන උළෙල සංවිධානය කළේ ස්වාධීන කලා සංවිධානයයි. එහි සුනිල් ටී. ප්‍රනාන්දු සභාපතිත්වය දැරුවේය. සියලු සම්බන්ධීකරණ වැඩකටයුතු සංවිධානය කරමින් අප්‍රමාණ වෙහෙස මහන්සියකින් යුතුව එහි මූලිකත්වය ගෙන ක්‍රියා කළේ ප්‍රවීණ නිළි සනෝජා බිබිලේය.

"ඇත්තටම ඔවුන්ට අපි ස්තුතිවන්ත විය යුතුයි. මේ හමුව සංවිධානය කළාට. 50 දශකයේ දැනට ජීවතුන් අතර ඉන්න ශිල්ප ශිල්පිනියන්ට තමයි එහිදී සම්මාන පුද කළේ. මල්ලිකා පිලපිටිය ප්‍රවීණ රංගන ශිල්පිනිය කීවාය."

50 දශකය අවසන් වීමෙන් පසුව තවත් කෙටි කාලයක් කලා ක්ෂේත්‍රයේ නිරතව සිටි ආනන්ද වීරකෝන් රංගන ශිල්පියා 'ජීවිත සටන, සුකුමලී, මා ආලය කළ තරුණිය හා වනමල' චිත්‍රපටවල රඟපෑවේය. 1960 අවුරුද්දේ ඔහු එංගලන්තය බලා ගොස් එහිදී ජානකී ජයකොඩි මහත්මිය සමඟ විවාහ විය. ඇය ලක්ෂ්මන් ජයකොඩි අමාත්‍යවරයාගේ නැඟණියය. දැන් ඔවුන් සීයලා ආච්චිලාය.

අපිට පුතාලා දෙන්නෙක් ඉන්නවා. ලොකු පුතා ඇමෙරිකාවේ. දෙවැන්නා එංගලන්තයේ. ඇත්තටම කිව්වොත් ලංකාවට ආවට පස්සේ මටත් හිතුණා ආපසු රඟපෑමට එකතු වෙන්න. ඒත් ඊට අවශ්‍ය පරිසරය හරිහැටි ගොඩනැඟුණේ නැහැ. ඒ නිසා රඟපෑම අත්හැරල දැම්මා." 'වීරකෝන් මහතා හිනැහෙමින් කීවේය.

"ඒත් අතීතය මතක් වෙද්දී සතුටක් වගේම දුකක් ඇති වෙනවා. සතුට තමයි ඒ කාලේ අපි කළ කී දේවල්. දුක හිතෙනවා අපිත් එක්ක හිටපු හුඟක් දෙනෙක් අද ජීවත්ව නැති එක ගැන."

මල්ලිකා පිලපිටිය මහත්මියගේ පාර්ශ්වයෙන් අද කලාවට සම්බන්ධ වී සිටින්නේ ඇගේ බාල පුතු රොෂාන් පිලපිටිය පමණි.

"මම 'රේඛාවේ' රඟපෑවට පසුව විවාහ වුණා. ඒ අවුරුදු 19දී. අපේ ගමේම අපි දන්න කියන පවුලකින් තමයි ඒ විවාහය සිදුවුණේ."

"ඊට පස්සේ මම දෙවැනි වතාවට රඟපෑවේ 'ගොළු හදවත' ටෙලි නාට්‍යයේ. ඒ බොහොම කාලෙකට පස්සේ."

"ඇත්තම කියනවා නම් මම මගේ ජීවිතේ හුඟක් වෙලාවට ගෙව්වේ පවුල එක්ක. දැන් මහත්තයා (ආරිය අබේසිංහ) ජීවතුන් අතර නැහැ. මම දැන් හුඟක් වයස මිත්තණියක්නේ."

"ඇත්තටම කිව්වොත් රොෂාන් පුතා මා එක්ක මුලින්ම රඟපෑවෙත් 'ගොළු හදවත' ටෙලි නාට්‍යයේ. ඒ ලෙස්ටර් - සුමිත්‍රා යුවළට තිබුණු හිතවත්කම නිසා. අනෙක් පුතාලා දෙන්නා සහ දුව කලාවට සම්බන්ධ නැහැ."

මේ වන විට මල්ලිකා පිලපිටිය මහත්මිය ජීවත්වන්නේ රොෂාන් ළඟය. ඒ මහරගම නිවෙසේය. "මම දැන් ඉන්නේ හරිම සතුටින්. මොකද මගේ පුතා වගේම ඔහුගේ බිරිය රිද්මා මාව හොඳට බලා ගන්නවා. ඒ දුව මට දුවෙක් වගේ. මගේ පුංචි මුනපුරත් මට හරිම ආදරෙයි" ඇය අවසන් වශයෙන් කීවාය.

ආනන්ද වීරකෝන් මහතා සහ මල්ලිකා පිලපිටිය ප්‍රවීණ රංගන ශිල්පී දෙපොළ එදා ලාංකේය සිනමා රසික රසිකාවියන් අතර ඉතා සුප්‍රසිද්ධ චරිත දෙකක් බවට පත්විය. පුවත්පත් හා සඟරාවල පමණක් ඡායාරූප පළවූ ඒ කාලයේ ඒවා පරිස්සමට කතුරකින් කපා විවිධ ආදර වදන් ලියා තබාගත් සිනමා රසික රසිකාවියන් අතර මේ දෙපොළගේ ආදරය ඉල්ලා එවූ තරුණ තරුණියෝද බෙහෙවින්ම වූහ.

ඔවුහු මේ සිහින තරු තමන්ගේම කරගන්නට වෙහෙසුණහ. ඒ එදාය. අද ඉවක් බවක් නැතිව විවිධ මාධ්‍යවල පෙනී සිටින එමෙන්ම දැනුම් තේරුම් නැතිව විවිධ කාරණා ගැන කතාබහ කරන නිසාම ඔවුන්ගෙන් අති බහුතරය සිහින තරු නොවී නිතර පෙනෙන මුහුණු බවට පත්වී හිඳිති.

■ සමන් ප්‍රියංකර නම්මුනිගේ

# ඩුබායි එක්ස්පෝහිදී ලංකාව බැබළුණු හැටි







**එක්ස්පෝ ප්‍රදර්ශනය 1852දී ලන්ඩනයේදී ආරම්භ විය. මේ වන විට එය ආරම්භ කර වසර එකසිය හැත්තෑඑකක් ගෙවී ගොසිනි.**

ඩුබායිහිදී පැවැත්වෙන එක්ස්පෝ 2020 ප්‍රදර්ශන සඳහා වෙන්කර තිබෙන භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 4.38කි. මෙම ප්‍රදර්ශනයට සමගාමීව එහි ඉදිකර තිබෙන "අල් ෆසල් ප්ලාසා" ගොඩනැඟිල්ල ගෝලාකාරය. මෙම ප්‍රදර්ශන භූමියේ තිබෙන සියලු මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන්නේ මෙම ගෝලාකාර ගොඩනැඟිල්ල තුළිනි.

ඩුබායිහි කාන්තාර භූමියක් තුළ මෙම ප්‍රදර්ශනය පැවැත්වීම විශේෂත්වයකි. ජනතාවට කිසිදු අපහසුවකින් තොරව ප්‍රදර්ශනය නැරඹීමට පහසුකම් සැලසී ඇත.

ප්‍රදර්ශනය ආරක්ෂාව සඳහාද දැඩි ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මකය. ප්‍රදර්ශන භූමියට ඇතුළු වන සෑම පුද්ගලයකු මෙන්ම බඩුබාහිරාදියද නිසි පරීක්ෂාවට ලක් කෙරිණි. කොවිඩ් ආසාදිත නොවන බවට සඳහන් පී.සී. ආර්. වාර්තාවක් නොමැති කිසිවකුට ප්‍රදර්ශන භූමියට ඇතුළු වීමට හැකියාවක්ද නැත. එවන් තත්ත්වයක් යටතේ වුවද ප්‍රදර්ශනය නැරඹීම සඳහා පැමිණි ජනතාව දස දහස් සංඛ්‍යාවකි.

ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 192ක් නව නිර්මාණ ඇතුළු සිය දේශීය නිර්මාණ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කර තිබිණි. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය සෙසු රටවල ප්‍රදර්ශන කුටිවලට නොදෙවැනි ආකාරයට නිර්මාණය කර තිබීමද විශේෂත්වයකි.

ශ්‍රී ලංකාවට ආවේණික මැණික් වර්ග හා ප්‍රධාන අපනයන බෝගයක් වන තේ සඳහා ප්‍රදර්ශන කුටියේ වැඩි ඉඩකඩක් යොමුකර තිබෙන අයුරුද දක්නට ලැබිණි.

ඊට අමතරව ලංකාවේ සාම්ප්‍රදායික කලා ශිල්ප, අත්කම් භාණ්ඩ, වේවැල්, රූකඩ, කුඹල්, කැටයම්, මූර්ති, බීරලු, පිත්තල, වෙස් මුහුණු, පන් කොළ ආදී දේශීය නිර්මාණ රැසක්ද ප්‍රදර්ශනයට එක් කර තිබිණි.

සංචාරක ප්‍රවර්ධන අධිකාරියට මෙම ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා නියෝජනය හිමිව තිබූ අතර මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, තේ මණ්ඩලය, ලක්සල හා ආයෝජන මණ්ඩලය වැනි ආයතනවල පූර්ණ සහායද මේ සඳහා හිමි විය.

මෙම ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා දිනය ඉකුත් 3 දිනට යෙදී තිබිණි. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ විදේශ කටයුතු අමාත්‍ය ජී.එල්. පීරිස්ය. සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග, රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ, පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ස්වදේශ කටයුතු අමාත්‍ය අහමඩ් අලසයික් සංචාරක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ජයසිරි තෙන්නකෝන් හා ඩුබායිහි ශ්‍රී ලංකා තානාපති මල්රාජ් සිල්වා ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

මීළඟ එක්ස්පෝ ප්‍රදර්ශනය තවත් වසර 5කින් ජපානයේ පැවැත්වීමට නියමිතය.

මෙම ප්‍රදර්ශනය සාර්ථක කර ගැනීම සඳහා සංචාරක අමාත්‍යාංශයේ මාධ්‍ය ලේකම් ප්‍රදීප් මෙන්ම ඡායාරූප ශිල්පී සමීර ඇතුළු පිරිස දැක්වූ දායකත්වය අගය කළ යුතුමය. මෙරටින් රැගෙන ගිය මාධ්‍ය කණ්ඩායමට නිසි පහසුකම් සලසාදීමට කටයුතු කිරීමද අගය කළ යුතුය.

■ කුමුදු උපුල් ශාන්ත


මව්බිම 5 Digital ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාව 2021

ලියාපදිංචි වීමට
නම, ශ්‍රේණිය, පාසල whatsapp කරන්න
077 1120162 / 077 0209781

සහභාගිවීම සඳහා ලියාපදිංචි වීමෙන් පසුව ඔබට ලබා දෙන Zoom Link භාවිත කරන්න



සම්මන්ත්‍රණය 08
නොමිලේ
ජාතික පාසල් ආචාර්යණී
මංගලා පද්මිණී බණ්ඩාර
ජනවාරි 15 | පෙ.ව 8.00
සාකච්ඡා කරනු ලබන ප්‍රශ්ණ පත්‍රය සිකුරාදා මව්බිම සමග
ZOOM ONLINE LEARNING | මව්බිම | පහ 5







# ඇත්තු 13ක් වත්තෙ බැඳ සිටි ලංකාවෙ එකම සොල්දර වලව්ව





## අවුරුදු 150ටත් වඩා පැරැණියි

## ඇත්තු නාවන්න හදපු වැව තාම තියෙනවා

## හදන්න ලී ගෙනාවෙ බුරුමයෙන්

## සුද්දගෙ කාලේ නඩුත් ඇහැව්වා

**ඔවුන් තුළ වූ යම්කිසි දෙයක් වෙනස් වී තිබිණි. එහෙව් අදහසක්; බාගදා ඒ මගේ රුචිකත්වයේ දිළිඳු බව වන්නටද පුළුවනි. හැබැයි මම වක්කයටම කියන්නේ ඔවුන් අදදු පවතින්නන් බවට පත්ව සිටින්නේ ඒ වෙනස් වීම් නිසා බවය. ඔවුන් ජීවත්වන්නේ ජීවත්වීමට හොඳම තැනකය. එය සොල්දර වලව්වකි. ඓතිහාසික යුගයකට අයත් බිජු මෙන් වූ, ඔපවැටුණු විසල් ගල්මතින් සුපැහැදිලි ජල කඳක් ගලා යන ඉවුරු කොනක වලව්ව ඉදිව තිබේ. වලව්ව කරා යන මාර්ගය ඉතිහාසයේ එක් යුගයකදී අලි - ඇතුන් විසින් කණින ලද පටු මුත් දීර්ඝ වූවකි. එමඟ ගමන් කිරීම කාව්‍යයමය අනුනාදයක සවන්දීමකි. මගේ හිතට වැදුණු පළමුවැනි දේ වූයේ ඒ මගේ තිබූ නිහඬතාවයි. මාතේ නුගවෙල වලව්වට පමණක්ම හිමි යැයි කිව හැකි එකී නිහඬ බව තුළ රජයන්නේ පරම්පරා පහක ඉතිහාසමය කරුණු කාරණාය.**

නුගවෙල නිලමේ සිය පළමු වලව්ව නාගොල්ලේ පන්සල (වර්තමාන මාතලේ නිග්‍රෝධාරාමය) බවට පත්කර නව සොල්දර වලව්ව ඉදිකිරීම සඳහා ආරම්භය ලබාගන්නේ වර්ෂ 1878දී යැයි ඉතිහාස කතාකරු පවසා සිටී. තම තමන්ගේ පොරොන්දුවල අවංකභාවය තවදුරටත් ප්‍රගුණ කළ නුගවෙල නිලමේ වර්තමාන මාතලේ ජාතික පාසල සඳහාද මුල්ගල තබා ඇත්තේ එම වසරේදීමය.

ආනන්ද, පාලිත, ජයන්ත, සේනක, ප්‍රියන්ත යන අය නුගවෙල පරම්පරාවේ පස් වැනි පරම්පරාව. ඔවුන්ගේ පවුල් වටපිටාව ගැන දැන කියා ගන්නට පටන් ගන්නා විට ලෝකයේ තත්ත්වය බොහෝදුරට වෙනස් ආරක් ගෙන තිබුණු අතර සුවිසල් නිවෙසක හුදෙකලාව තුළ ඇති දුක්ඛ දෝමනස්සයන්, වේදනාවන් සහ අනාගතය පිළිබඳ අවිනිශ්චිතභාවයන් ඔවුන් තුළ නොවුණේ බොහොම සරල ආකාරයට සමාජ වෙනස්වීම් එම පස් වැනි පරම්පරාව විසින් භාරගත් නිසාවෙනි. ඒ නිසාම ඉතිහාසය ඔවුන්ගේ පුනරාවර්තනීය නපුරු සිහිනයක් නම් නොවේ. අනෙක් අතින් ගත් කල එය විචිත්‍රමය මායාවක්ද නොවේ.

"1878දී මේ වලව්ව හදන්න මුල්ගල තියද්දී අපේ පළමුවැනි වලව්ව පන්සලක් සඳහා භාරදෙනවා. ඒ කාල වකවානුවේ පන්සල් භාරව ඉඳලා තියෙන්නේ හාමුදුරුවරු නොවෙයි. ඉඳලා තියෙන්නේ ගණින් වහන්සේලා. අපේ මුත්තා සහ එයාගේ සහෝදරයා තමයි නුගවෙල පරම්පරාවේ ආරම්භක සාමාජිකයෝ. ඒ පරම්පරාවේ එක සහෝදරයෙක් කෑගල්ලේ පදිංචියට යනවා. අදටත් වර්තමාන නිග්‍රෝධාරාමයේ පිවිසුමේ තියෙන්නේ ඒ මුත්තලා දෙන්නගේ ප්‍රතිමා. ඔය කාලේ තමයි වර්තමාන මාතලේ ජාතික පාසල අපේ මුත්තලා විසින් ආරම්භ කරලා තියෙන්නේ. හතරවැනි පරම්පරාව නියෝජනය කරපු මුත්තට කිව්වේ ලේකම් මහත්තයා කියලා. පෙළක් අය ඉංග්‍රීසි මාස්ටර් කියලත් කිව්වා. හතර වැනි පරම්පරාවේ සාමාජිකයෝ පස්දෙනයි. ඒ පස්දෙනා අතරින් තුන්දෙනෙක් ගැහැනු උදවිය. හැබැයි ඒ තුන්දෙනාට මුල් ඉඩකඩම්වලින් පිටමං වෙන්න ඉතිරි පිරිමි සහෝදරයෝ දෙන්නා ඉඩ දීලා නැහැ. දොඩම්වෙල, ඇරැව්වාවල, ලොකුනින්දගම්වල ඒ අය පදිංචි කරලා තියෙනවා. අපේ පරම්පරාව අප්පච්චි සහ ඔහුගේ සහෝදරයා තමයි මේ සොල්දර වලව්ව මේ ආකාරයෙන් නඩත්තු කළේ. අපි ඔක්කෝම පිරිමි සහෝදරයෝ පස්දෙනෙක්. අපේ බිරියන්වරුන් මේ ප්‍රදේශයේ අනෙකුත් වලව්වලට සහසම්බන්ධයක් ඇති උදවිය. ඒ කාලයේ නුගවෙල වලව්වට තිබුණු ඉඩකඩම්වල ප්‍රමාණය වලව්වේ හිටිය අයවත් දැනගෙන නැහැ. ඇත් පන්තියේ විතරක් ඇත්තු දහතුන්දෙනෙක්ගෙන් සෑදුණු එකක්. අන්තිම ඈතා මියැදුණේ 1963දී. ඒ ඇතින්නට නම් නම දීලා තිබුණේ මැණිකේ කියලා. අපි බොහොම කුඩා අවධියේ තමයි ඒ ඇතින්න මියගියේ. සාමාන්‍යයෙන් වලව්වක ඇති දැඩි වන ඇත් පන්තියක් සඳහා වෙනමම භාරකාරයෙක් ඉන්නවා. තොරතුරු දන්න උදවිය කියන විධියට මැණිකේ කියන ඇතින්නිය වලව්වට එන්නේ දර මිටියක් උස්සගෙන.

21>>

■ ප්‍රභාත් අත්තනායක
පින්තූර – රුක්ගහවිල ඒ. දේවේන්ද්‍ර




## කෝටි 5 අද කෝටිපති

බ්‍රහස්පතින්දා
දිනුම් වාරය: 1442
වර්ණය: තද නිල්
දිනය: 2022.01.06

ජයග්‍රාහී අංක: 20 39 58 72 — ඉංග්‍රීසි අක්ෂරය: N

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සහ ඉංග්‍රීසි අක්ෂරය | - | 51,020,150/- | - |
| ඕනෑම අංක 4කට | 1 | 1,000,000/- | 1,000,000/- |
| අංක 3ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 6 | 100,000/- | 600,000/- |
| ඕනෑම අංක 3කට | 113 | 2,000/- | 226,000/- |
| අංක 2ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 265 | 1,000/- | 265,000/- |
| ඕනෑම අංක 2කට | 6,438 | 100/- | 643,800/- |
| අංක 1ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 4,055 | 100/- | 405,500/- |
| ඕනෑම අංක 1කට | 101,256 | 20/- | 2,025,120/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 17,754 | 20/- | 355,080/- |

දිනා ඇති මුළු මුදල රු. 5,520,500/-

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

## ශනිදා

දිනය: 2022.01.06
දිනුම් වාරය: 3777
රතු
බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අංක: 41 42 50 71 — ඉංග්‍රීසි අක්ෂරය: U

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 04 සමග ඉංග්‍රීසි අක්ෂරයට | - | 46,593,333.30 | - |
| ජය අංක 04ට | 1 | 1,000,000/- | 1,000,000/- |
| ජය අංක 03ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 7 | 100,000/- | 700,000/- |
| ජය අංක 03කට | 112 | 2,000/- | 224,000/- |
| ජය අංක 02ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 229 | 1,000/- | 229,000/- |
| ජය අංක 02කට | 5,975 | 100/- | 597,500/- |
| ජය අංක 01ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 3,636 | 100/- | 363,600/- |
| ජය අංක 01කට | 90,974 | 20/- | 1,819,480/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 15,436 | 20/- | 308,720/- |

දිනා ඇති මුළු මුදල රු. 5,242,300/-

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන: 0112 333 546-47
ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SF යොදා 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

## කෝටි 12 කප්රුක

දිනුම් වාරය: 792
වර්ණය: තැඹිලි
දිනය: 2022.01.06
බ්‍රහස්පතින්දා

ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක

T 07 (සුපිරි අංකය) 10 53 59 65

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සමඟ ඉංග්‍රීසි අක්ෂරය සහ සුපිරි අංකය | - | 201,573,493/- | - |
| අංක 4 සහ ඉංග්‍රීසි අක්ෂරය | - | 10,000,000/- | - |
| අංක 4 සහ සුපිරි අංකය | - | 5,000,000/- | - |
| ඕනෑම අංක 4 කට | 01 | 1,000,000/- | 1,000,000/- |
| අංක 3 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 02 | 100,000/- | 200,000/- |
| ඕනෑම අංක 3 කට | 96 | 2,000/- | 192,000/- |
| අංක 2 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 211 | 1,000/- | 211,000/- |
| ඕනෑම අංක 2 කට | 5,090 | 100/- | 509,000/- |
| අංක 1 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 3,228 | 100/- | 322,800/- |
| ඕනෑම අංක 1 කට | 80,313 | 20/- | 1,606,260/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 13,982 | 20/- | 279,640/- |

දිනා ඇති මුළු මුදල රු. 4,320,700/-

මීළඟ සුපිරි ජයමල්ල රු. 201,845,413/-

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47
දුක: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>KK යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

## ලග්න වාසනාව

දිනය : 2022-01-06
දිනුම් වාරය : 3328 | වර්ණය : දුඹුරු
සුපිරි ජයමල්ල
රු. 2,209,758.80/-

දිනුම් අංක: 07 31 52 59 — තුලා

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 ක් සහ ලග්නය | - | 2,209,758/- | - |
| අංක 4 ක් | 2 | 500,000/- | 1,000,000/- |
| අංක 3 ක් සහ ලග්නය | 46 | 10,000/- | 460,000/- |
| අංක 3 ක් | 380 | 1,000/- | 380,000/- |
| අංක 2 ක් සහ ලග්නය | 1,529 | 200/- | 305,800/- |
| අංක 2 ක් | 16,964 | 100/- | 1,696,400/- |
| අංක 1 ක් සහ ලග්නය | 19,199 | 60/- | 1,151,940/- |
| එක් අංකයට | 210,846 | 20/- | 4,216,920/- |
| ලග්නයට | 65,806 | 20/- | 1,316,120/- |
| මුළු එකතුව | 314,772 | | 10,527,180/- |

දිනා ඇති මුළු මුදල රු. 10,527,180/-

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යූනියන් පෙදෙස, කොළඹ 2,
ක්ෂණික ඇමතුම් : 011 4 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම : 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය : 011 4 825 825

## SUPER BALL සුපර් බෝල්

දිනුම් වාරය 1616
දිනය 2022.01.06
වර්ණය කොළ
දවස බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අක්ෂරය සහ අංක: X 28 31 64 70

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් ගණන | ත්‍යාග මුදල (රු.) | මුළු ත්‍යාග මුදල (රු.) |
|---|---|---|---|
| අංක 4 සමග ඉංග්‍රීසි අක්ෂරයට | - | 53,061,455.20 | - |
| අංක 4 කට | 1 | 1,000,000/- | 1,000,000/- |
| ඕනෑම අංක 3 ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 1 | 100,000/- | 100,000/- |
| ඕනෑම අංක 3 කට | 89 | 2,000/- | 178,000/- |
| ඕනෑම අංක 2 ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 197 | 1,000/- | 197,000/- |
| ඕනෑම අංක 2 කට | 4,711 | 100/- | 471,100/- |
| ඕනෑම අංක 1 ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 2,935 | 40/- | 117,400/- |
| ඕනෑම අංක 1 කට | 73,604 | 20/- | 1,472,080/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 12,882 | 20/- | 257,640/- |
| මුළු ගණන | 94,420 | | 3,793,220/- |

දිනා ඇති මුළු මුදල
රු. 3,793,220/-

ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය: www.dlb.lk
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SB යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

## සංවර්ධන වාසනාව

දිනුම් වාරය : 474
පාට : නිල්
දිනය : 2022-01-06

ඉංග්‍රීසි අක්ෂරය: N — ජයග්‍රාහී අංක: 64 13 48 — දෛව අංකය: 4

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 3 සමග දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | - | 11,438,924/- | - |
| ජය අංක 3 සමග දෛව අංකයට | - | 500,000/- | - |
| ජය අංක 3 සමග ඉංග්‍රීසි අක්ෂරයට | - | 100,000/- | - |
| ජය අංක 3ට | 6 | 50,000/- | 300,000/- |
| ජය අංක 2ක් සමග දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 3 | 10,000/- | 30,000/- |
| ජය අංක 2ක් සමග දෛව අංකයට | 114 | 500/- | 57,000/- |
| ජය අංක 2ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 33 | 500/- | 16,500/- |
| ජය අංක 1ක් සමග දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 146 | 200/- | 29,200/- |
| ජය අංක 1ක් සමග දෛව අංකයට | 3,611 | 100/- | 361,100/- |
| ජය අංක 2කට | 880 | 100/- | 88,000/- |
| ජය අංක 1ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 1,212 | 100/- | 121,200/- |
| දෛව අංකයට | 25,890 | 20/- | 517,800/- |
| ජය අංක 1කට | 28,547 | 20/- | 570,940/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 9,270 | 20/- | 185,400/- |
| එකතුව | 69,712 | | 2,277,140/- |

මීළඟ සුපිරි ජයමල්ල රු. 12,422,808/-

2022 ජනවාරි මස 08 වෙනි සෙනසුරාදා
මීළඟ දිනුම් ඇදීමට වලංගු වන්නේ රතු පැහැති ටිකට් පත්‍රය.
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යූනියන් පෙදෙස, කොළඹ 2,
දුරකථන: 011 2 333 546-47 ක්ෂණික ඇමතුම්: 0114 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම: 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය: 011 4 825 825



# බේරගත්තු තෙල් ටැංකි 85 ගැන කවුරුත් කතා නෑ පේන්නේ දුන්නු 14 විතරයි

## බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල

**දැන් ගෙදර යන්න හිත හදාගෙනද ඉන්නේ?**

ඉවත් වෙලා ගෙදර යන්න තරම් අපි වරදක් කරලා නැහැනේ. ඇතැමුන් අපෙන් අසනවා ප්‍රසිද්ධියේම ආණ්ඩුව විවේචනය කළා නේද කියලා. ඔව්. අපි ආණ්ඩුව පිළිබඳ බරපතළ වුත් කර්කශ වුත් විවේචන අමාත්‍ය මණ්ඩලය තුළත් පාර්ලිමේන්තු කණ්ඩායම තුළත් ඉදිරිපත් කළා. නමුත් අපි ඒවා එළියට රැගෙන ආවේ නැහැ.

**නමුත් අපි දැක්කා හවුල්කාර පක්ෂවල නායකයන් අවස්ථා කිහිපයකදීම එළියට ඇවිත් ආණ්ඩුව විවේචනය කරන ආකාරය?**

ඔබ කියන ආකාරයට අපි එළියේ කතා කරලා තිබෙන්නේ අවස්ථා තුනකදී පමණයි. 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැනත්, යුගදනවි ගනුදෙනුව ගැනත්, නැගෙනහිර ජැටිය ගැනත් අපි එළියේ කතා කළා. අපි ඒවා එළියේ කතා කළේ ඇතුළේ කතා කරන්න අවස්ථාවක් නොලැබුණු නිසා. පොහොර ප්‍රශ්නය ගැනත් අපි කතා කළා. හැබැයි ඇතුළේ. මොකද ඒ ගැන කතා කරන්න අපිට ඇතුළතදී අවස්ථාවක් ලැබුණා.

**අභ්‍යන්තර ගැටලු අභ්‍යන්තරයේම විසඳා ගත්තා නම් හොඳ නැද්ද?**

ගාමිණී දිසානායකට එදිරිව කලීල් නඩුවේදී විනිසුරුවරයා විධියට කටයුතු කළ මාර්ක් ප්‍රනාන්දු මහතා පැවැසුවේ ඇමැතිවරුන්ට අමාත්‍ය මණ්ඩලය තුළ අදහස් දැක්වීමට අවස්ථාවක් ලැබෙන්නේ නැත්නම් ඔවුන්ට එම කාරණා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයෙන් බැහැරව අදහස් ප්‍රකාශ කරන්න අයිතියක් තිබෙන බව. අපි භාවිත කළේ අන්න ඒ ශුද්ධ වූ අයිතිය. ඒක වරදක් නොවෙයි.

**ජනාධිපතිවරයා සහ නීතිපතිවරයා පවසන ආකාරයට මෙය සාමූහික වගකීම් කඩකිරීමක්ද?**

අපි සාමූහික වගකීම් කඩකරපු බව ඇත්තක්. නමුත් අපට එසේ කරන්න හේතු තිබුණා. අමාත්‍ය මණ්ඩලය තුළ සාකච්ඡාවට ලක් නොවෙනවා නම් එළියේ කතා කරන්න පුළුවන් කියලා

**සාමූහික වගකීම් කඩකරන්න අපිට හේතු තිබුණා**

**පොහොට්ටුවේ සමහරු අපිටත් වඩා කර්කශ විධියට ආණ්ඩුව විවේචනය කළා**

ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කොට තිබෙනවා. දැන් හොඳම උදාහරණය විධියට යුගදනවි ගනුදෙනුව ගන්න. මේ ගැන අමාත්‍ය මණ්ඩලයේ සාමූහික වගකීම කොතැනද තිබෙන්නේ? ඇමැති මණ්ඩලය කියන්නේ කතා දෙකක්.

සාමූහික වගකීමකින් ඉදිරිපත් නොවුණු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සාමූහික වගකීමකින් ඉදිරිපත් කළා කියලා එක පිරිසක් කියන විට අපි කියනවා අපි එවැනි අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඇහැටවත් දැක්කේ නැහැයි කියලා.

ඇමැතිකම්වලටත් සාමූහික වගකීම්වලටත් වඩා උඩින් අපි අපේ මවුබිම සහ හෘද සාක්ෂිය තැබුවා. ඒ නිසයි අපි මෙවැනි කටයුත්තක් කළේ.

**ඊගාවට ඇමැතිකම නැතිවෙන්නේ ගම්මන්පිලටද? වාසුදේවටද? විමල්ටද?**

ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න මම ඒ ගැන දන්නේ නැහැ. මොකද මම නෙවෙයිනේ ඒ ගැන තීරණ ගන්නේ.

**ඇමැතිකම දාලා ගෙදර යන්න කිව්වොත් මොකද කරන්නේ?**

මොනව කරන්නද? අපි අවදානම ගැන දැනගෙන තමයි ප්‍රකාශ කළේ. ඒ අවදානම අපි ගත්තේ අපේ ඇමැතිකම් ගැන සිතලා නෙවෙයි. අපි සිතුවේ අපේ රට ගැන.

**කොට ඇදපු අලින්ට පෙරහැරේ යන්න වෙන්නේ නැහැ වගේ වැඩක් නේද අන්තිමේ හවුල්කාර පක්ෂවලට වෙලා තිබෙන්නේ?**

අපි කළ කැප කිරීම, අපි කළ පරිත්‍යාග, අපි විඳපු දුක් කාට අමතක වුණත් ජනතාවට අමතක වෙන්නේ නැහැ කියලා අපි දන්නවා. ජනතාව දක්වන ප්‍රතිචාරවලින් අපිට ඒක පේනවා. දේශපාලකයෙක් විධියට මට ඒ හොඳටම ඇති.

**සුසිල් ප්‍රේමජයන්ත ඉවත් කිරීම ගැන මොකක්ද ඔබේ අදහස?**

ඔහු ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක්. අපේ සමීප මිත්‍රයෙක්. කොළඹ දිස්ත්‍රික්කයේ අපත් සමඟ දේශපාලනය කරන සටන් සගයෙක්. ඔහුට ඇමැති ධුරය අහිමි වීම ගැන මම ඇත්තටම කනගාටු වෙනවා. ඇමැති ධුර ගැන තීරණ ගන්නේ අමාත්‍ය මණ්ඩලයවත් වෙන කවුරුවත් නොවෙයි ජනාධිපතිවරයා. ව්‍යවස්ථානුකූලවම ජනාධිපතිවරයාට එම බලතල හිමිවෙනවා. පත්කරන්නත් හේතු දැක්වීමකින් තොරව ඉවත් කරන්නත් ජනාධිපතිවරයාට පුළුවන්. එතුමා මෙතැනදී භාවිත කළේ එම ව්‍යවස්ථානුකූල බලය. එතුමා මේ ඉවත් කිරීම ගැන අපිට තවම හේතු දක්වලත් නැහැ. හේතු දැක්වීමට අවශ්‍යත් නැහැ.

**ඔබට මතකද මා සමඟ මීට පෙර කළ පුවත්පත් සාකච්ඡාවේදී ඔබ පැවැසුවා ඔබේ විශ්වාසභංගය පිටුපස සහ බොහෝ ගැටලු පිටුපස දේශපාලන අභිගුණ්ඨිකයෙක් සිටින බව?**

ඔව්. මට මතකයි.

**එම දේශපාලන අභිගුණ්ඨිකයා මේ මොහොතේත් ආණ්ඩුවේ තීන්දු තීරණවලට බලපෑම් කරනවාද කියලා මම ඇසුවොත්?**

ජාතික න්‍යායපත්‍රය අභිභවා යමින් පෞද්ගලික න්‍යායපත්‍ර මතුකර ගැනීමට වෙර දරන අතළොස්සක් නිසා මේ අර්බුද තීව්‍ර වෙලා කියලා පැහැදිලිව කියන්න පුළුවන්. සමස්ත ජාතියම දැවැන්ත අර්බුදයකට මුහුණදී තිබෙන වෙලාවක සමඟියෙන් එම අර්බුදවලට මුහුණ දෙනවා වෙනුවට පෞද්ගලික න්‍යායපත්‍ර අනුව යමින් අභ්‍යන්තර ප්‍රශ්න ඇති කිරීමට කවුරු හෝ කටයුතු කරනවා නම් ඒ අය පැහැදිලිවම මවුබිමේ සතුරෝ.

**හිටපු ජනාධිපතිවරයා පැවැසුවා සුසිල් ඇමැතිටත් වඩා සැරට ආණ්ඩුව විවේචනය කරපු නිමල් ලන්සට ආණ්ඩුව අතවත් තියන්නේ නෑ කියලා. ඇයි එහෙම වෙන්නේ?**

ඒකම තමයි මටත් තිබෙන ප්‍රශ්නය. අපිව පැත්තකින් තියන්නකෝ. අපිට වඩා ඉතා කර්කශ විධියට ආණ්ඩුව විවේචනය කරපු ඇමැතිවරු, රාජ්‍ය ඇමැතිවරු ගණනාවක්ම පොහොට්ටුව තුළ ඉන්නවා. ඉවත් කරනවා නම් සුසිල් අමාත්‍යවරයාට පෙර ඒ අයව ඉවත් කළ යුතුයිනේ.

**ඒ වගේම හිටපු ජනාධිපතිවරයා පවසනවා ආණ්ඩුව හැදුණොත් පමණයි ආණ්ඩුවේ පිපිරීම වළක්වන්න පුළුවන් වෙන්නේ කියලා?**

ආණ්ඩුවේ හරි තීන්දු ගැනීම් ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

**මොනවද ඔබ කියන හරි තීන්දු?**

එක තමයි ආණ්ඩුව පෞද්ගලික න්‍යාය පත්‍ර වළ දමලා ජාතික න්‍යායපත්‍රයකට එළඹෙන්න ඕනෑ. දෙක, රටේ අර්බුදය ගැන ඇත්තම තත්ත්වය ජනතාවට කියන්න ඕනෑ. තුන, එම අර්බුදයෙන් ගොඩ එන වැඩපිළිවෙළ ගැන රටට කියන්න ඕනා. එහෙම නොකළොත් ජනතාවගේ අසහනය වැඩිවෙලා දේශපාලකයා රත් වෙන්න පටන් ගන්නවා. ඒ රත්වීම නිසා දේශපාලකයාත් තම අසහනය පිටකිරීමට පටන් ගන්නවා. තමන්ම ගෙනා ආණ්ඩුව විවේචනය කිරීම්වලින් පිළිබිඹු වෙන්නේ ජනතා අසහනය නිසා දේශපාලකයා රත්වෙලා කියන එකයි.

**ඔබලා කොයි තරම් රත් වෙලා විවේචන කළත් ආණ්ඩුව ඇහුන්කන් දෙන පාටක් නැහැනේ?**

ඒක තමයි. මම පෙර කිව්වා ආණ්ඩුව අර පියවර තුන කඩිනමින් ගන්න අවශ්‍යයි කියලා.

**පියවර තුන මෙං කිව්වට වැඩක් නැහැනේ ඇමැතිතුමා කවුරුවත් කනකට නොගන්නවා නම්?**

මමත් අහන්නේ ඔය ප්‍රශ්නයම තමයි.

**ප්‍රශ්න අහන එක නෙවෙයි නේද මහජන නියෝජිතයන්ගේ වගකීම. ප්‍රශ්නවලට විසඳුම් තමයි ඔබලගෙන් අපේක්ෂා කරන්නේ?**

මමත් කියන්නේ ඕකම තමයි. රටට ජනතාවට ඇත්ත ඇති සැටියෙන් කියලා, වහාම ආණ්ඩුව හරි තීන්දු තීරණවලට යා යුතුයි.

**ජනාධිපතිවරයා දේශපාලනය කරන්න පටන් ගත්තොත් මේ අර්බුද සමනය වෙයිද?**

මේ සෑම අර්බුදයක්ම එතුමාගේ ගිණුමට දාලා අත සෝදගන්න බැහැ. ජනාධිපතිතුමා ඉන්නේ සුවිශේෂ තත්ත්වයක. ලංකා ඉතිහාසයේ සිටි සෑම ජනාධිපතිවරයෙක්ම දේශපාලන පක්ෂයක නායකයෙක්. ගෝඨාභය ජනාධිපතිතුමාට පක්ෂ නායකත්වයක් තබා පක්ෂයක්වත් නැහැ. ලංකාවේ විධායක බලය තිබෙන්නේ ජනාධිපතිට නෙවෙයි. විධායක බලය හිමිවන්නේ පාර්ලිමේන්තුවේ බහුතර බලය තිබෙන කෙනාට. ඒ කියන්නේ විධායක ජනාධිපතිටමයි බොහෝ විට බහුතර බලය ලැබෙන්නේ.

**හූ කියලා, කෑගහලා විරෝධය පාලා ඔබලාව ප්‍රතික්ෂේප කරන තැනට ජනතාව පත්වෙලා. ආණ්ඩුවට මෙහෙම වෙයි කියලා කවදාවත් හිතුවාද?**

අපි රුපියල් සහ ඩොලර් අර්බුදයකට මුහුණ දෙන්න බලාගෙන සිටි ජාතියක්. අපි දැන සිටියා අපිට මූල්‍ය අර්බුදයකට මුහුණ දෙන්න නියමිත බව. කොවිඩ් - 19 සම්ප්‍රාප්තියත් සමඟ එය තව තවත් ඉක්මන් වුණා. ලෝකයේ සෙසු රටවලට සාපේක්ෂව ලංකාවේ අර්බුදය තීව්‍ර වුණා. මේ අර්බුදය වඩාත් තීව්‍ර වීමට හේතු දෙකක් බලපා තිබෙනවා.

පළමු වැන්න තමයි ආණ්ඩුවේ තිබෙන සන්නිවේදනයේ අසමත් බව. පවතින

**ට්‍රින්කෝ පෙට්‍රෝලියම් අයිති ශ්‍රී ලංකාවට**

**අලුත් ගිවිසුමෙන් ඉන්දියානු භුක්තිය 56%ක් පහළට වැටෙනවා**

තත්ත්වයේ යථාර්ථය ජනතාවට අවබෝධ කරවීමට ආණ්ඩුව සමත් වෙලා නැහැ.

**ඔබ කියන්නේ ආණ්ඩුව ජනතාවට ඇත්ත කියන්නේ නැහැ කියන එක නේද?**

ඔව්. බොරු සුරංගනා කතා නොකිය ආණ්ඩුව ඇත්ත ඇති සැටියෙන් කිව යුතුයි. ඒ ආකාරයට ජන මනස හදන විට ජනතාව එය අවබෝධ කොටගෙන ඕනෑම අභියෝගයකට මුහුණදීමට සූදානම් වෙනවා.

නමුත් ජන මනස සෑදීමට ආණ්ඩුව අසමත්ව සිටිනවා. ජනතාව සූදානම් ඈත ආලෝකයක් තිබෙන බව දන්නවා නම් අඳුරු බිං ගෙයක් දිගේ හෝ ගමන් කිරීමට. නමුත් ඇත්ත කියන්න ඕන. අනෙක් හේතුව තමයි මේ අර්බුදයෙන් ගොඩ එන මාර්ගය ගැන සැලැස්ම කුමක්ද කියලා ජනතාවට කියන්නත් අපි අසමත්. මෙන්න මේ හේතු

**හැම අර්බුදයක්ම ජනාධිපතිගේ ගිණුමට දාලා අත සෝදගන්න බෑ**

**සුරංගනා කතා නොකියා ආණ්ඩුව ජනතාවට ඇත්ත කිව යුතුයි**

**වහාම IMF සමඟ සාකච්ඡා කරලා කොන්දේසි කේවල් කළ යුතුයි**

දෙක නිසා ජනතාව ඉන්නේ අසහනයෙන්.

**ජනතා අසහනය තීව්‍ර කරන්න ආණ්ඩුවේ අදූරදර්ශී තීන්දු තීරණ බලපෑවා නේද? උදාහරණ විධියට පොහොර, ගෑස් ආදී ප්‍රශ්න පෙන්වන්න පුළුවන්?**

මම මුලින්ම කිව්වේ අපිට ඇති වුණු ප්‍රශ්න ගැන. ඊට අමතරව ඒවා මදියි කියලා සිතලා අපි විසින්ම සාදා ගත්තු ප්‍රශ්නත් තිබෙනවා. ඒවා නිසා ජනතාවගේ අසහනය තවත් තීව්‍ර වුණා කියලා මම පිළිගන්නවා.

**ආණ්ඩුවෙන් දුන් සහන පැකේජය ගැන මොකක්ද අදහස?**

මේ රටේ ජනතාව දැවැන්ත උද්ධමනයකට මුහුණ දෙමින් සිටිනවා. එයිනුත් වඩාත්ම පීඩාවට පත්ව සිටින්නේ අඩු ආදායම්ලාභීන්. ඒ නිසා තමයි රටේ මන්දපෝෂණ තත්ත්වය පවා වැඩි වී තිබෙන්නේ. ඔවුන් ගැන සිතා තමයි යම් දීමනාවක් ලබාදීමට ආණ්ඩුව තීරණය කළේ.

**මේ සහන පැකේජය දෙන්න වෙන්නෙත් මුදල් අච්චු ගසලා නම් මොකක්ද ඒකෙ තේරුම?**

දීමනා ලැයිස්තුවේ සමස්තය දෙස බලන විට ආදායම් වැඩි වෙන්නෙත් නැති නම් වෙනත් වියදමක් කපා හැරෙන්නෙත් නැති නම් මේ සහන දෙන්න වෙන්නේ මුදල් අච්චු ගසලා තමයි. මුදල් අච්චු ගහලා සහන දෙන්න යෑමෙන් ඇතිවන උද්ධමනය ගැනත් ආණ්ඩුව සිතන්න ඕනා.

**ප්‍රශ්න සහ පීඩාවන් සියල්ල ජනතාවට. නමුත් රට සවාරි, ප්‍රියසම්භාෂණවලින් ඇමැතිලාට නම් අඩුවක් නැහැ. ආණ්ඩුව කාවද මේ රවටමින් සිටින්නේ?**

අවවාදයට වඩා ආදර්ශය උතුම් කියලා කතාවක් තිබෙනවානේ. ඒක අන් සැමටම වඩා දේශපාලකයන්ට අදාළයි. 1972දී ඉන්දිරා ගාන්ධි අගමැතිවරිය අපේ රටට ආවා. එවක අපේ අගමැතිනිය සිරිමාවෝ මැතිනිය. සිරිමාවෝ මැතිනිය ඉන්දිරා අගමැතිවරියට රාත්‍රි භෝජනයකට ආරාධනා කළා. නමුත් ඇය වතුර වීදුරුවක් පමණයි බිව්වේ. අපේ අගමැතිවරිය ඒ ගැන ඇගෙන් විමසුවා. එවිට ඉන්දියානු අගමැතිනිය මෙහෙම කිව්වා.

"අපේ රටේ මේ වෙලාවේ දැවැන්ත සාගතයක් තිබෙනවා. මිනිස්සු බොහොමයක් ජීවත් වෙන්නේ එක වේලක් කාලා. මිනිස්සු බඩගින්නේ ඉන්න නිසා මමත් දැන් රෑට කන්නේ නැහැ" කියලා. ඒ කතාව අහපු අපේ අගමැතිනිය සිනාසී අහනවා ඔබ අපේ රටට ඇවිත් නොකා සිටියම එහේ සාගතයෙන් ඉන්න ජනතාවගේ බඩ පිරෙනවද කියලා. එවිට ඉන්දිරා අගමැතිනිය කියනවා,

"මම නොකා සිටියට ඔවුන්ගේ බඩ පිරෙන්නේ නැහැ. නමුත් මම නොකා ඉන්න විට මට ඔවුන්ගේ හැඟීම දැනෙනවා. අපි ආධ්‍යාත්මයෙන් බැඳෙනවා. එවිට ඔවුන් තේරුම් ගන්නවා අපේ නායිකාවත් සිටින්නේ අපිත් සමඟ කියලා. ඒක ඔවුන්ට විශාල ශක්තියක් වෙනවා. මේ සාගතයට මුහුණ දීමට" යනුවෙන්.

**ඉන්දියාවේ එහෙම වුණාට ලංකාවේ එහෙම වෙන්නේ නැහැ නේද?**

ජීජ්සීස් නායක සුනිල් පෙරේරා සිටියා නම් කියයි "ඉන්දියාවේ, ඉන්දියාවේ.... ලංකාවේ එහෙම වෙන්නේ නෑ" කියලා. මම සිතනවා අපේ දේශපාලකයොත් අවවාදයට වඩා ආදර්ශය උතුම් කියන පිළිවෙතට ප්‍රවේශ විය යුතුයි කියලා.

**දැන් ඔය මහ විශාල මුදලක් වැය කරලා 800ක් විතර ගෙන්වලා මාරවිල හෝටලයක දුන්නා කියන සාදයට ඔබ ගියේ නැද්ද?**

ඇත්තටම මම ඒ උත්සවය ගැන දැනගෙන සිටියෙත් නැහැ. මෑත කාලයේදී මම කිසිම ප්‍රිය සාදයකට ගිහින් නැහැ. නොයන නිසාදෝ මන්දා කවුරුවත් ආරාධනා කරන්නෙත් නැහැ.

**අලුත් සමාගමක් හරහා තෙල් ටැංකි ටික සංවර්ධනය කරන මුවාවෙන් ඉන්දියාවටම දෙන්නයි හදන්නේ කියලා චෝදනාවක් නැගෙනවා නේද?**

1987 හා 2003 අස්සන් කළ ගිවිසුම් හරහා එවක සිටි එජාප රජයන් තෙල් ටැංකි 99ම ඉන්දියාවට දුන්නා. එය ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර හවුල් ව්‍යාපාරයක් විදිහට කරගෙන යන්නයි එකඟතාවකට ආවේ.

**නමුත් විපක්ෂය කියන්නේ මේ ගිවිසුම ගැන ගම්මන්පිල බොරු කියනවා කියලයි.**

මම මේ ගිවිසුම් අන්තර්ගත කරලා පොතක් මුද්‍රණය කළා. ඒ පොතෙනුත් මේ ගැන බලාගන්න පුළුවන්. ඒ හැර www.udayagammanpila.com කියන වෙබ් අඩවියෙන් සහ අමාත්‍යාංශ වෙබ් අඩවියෙනුත් මේ පොත බලාගන්න ඔබට හැකියාව තිබෙනවා. ඒවා කියවලා මමද විපක්ෂයද ඇත්ත කියන්නේ කියලා ඕනෑම කෙනකුට බලාගන්න පුළුවන්.

**ඉන්දියාවට දෙන්නේ හොඳම 14. තෙල් සංස්ථාවට ලැබෙන්නේ අබලන් සහ අලුත්වැඩියා කළ යුතු නරකම ටික කියලයි වෘත්තීය සමිති කියන්නේ?**

ඉන්දියාව දැනට අලුත්වැඩියාකොට භාවිත කරන්නේ ටැංකි 14යි. ඔවුන් භාවිත කරමින් සිටින ටැංකි 14 ඔවුන්ට ඉතිරි කරලා ඉතිරි තෙල් ටැංකි 85ම මම නැවත ගත්තා. නමුත් බොහෝ අයට පේන්නේ ගත්තු 85 නෙවෙයි. දුන්නු 14. ඇතැම් පුවත්පත් පවා පොල් ගෙඩි අකුරින් දැම්මා ටැංකි 14ක් ඉන්දියාවට දෙයි කියලා. මෙතැන නැද්ද යටි අරමුණක්. ඉන්දියාව තමන් අලුත්වැඩියාකොට භාවිත කරන 14ට අමතරව තවත් 14ක් ගන්න ඉදිරිපත් වෙයිද?

87 ඇති කරගත්තු ගිවිසුමේ තිබෙනවා මේ තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කරන්නේ ඉන්දියාවත් සමඟ පමණයි කියලා. ඒකෙන් ටැංකි 24ක්ම මම බේරගෙන තෙල් සංස්ථාවට දුන්නා. ඇයි ඒක ජයග්‍රහණයක් විදිහට දකින්න බැරිතරම් මේ පිරිස් කුහක වෙන්නේ.

දැනට 100%ම ඉන්දියාව යටතේ තිබෙන තවත් ටැංකි 61ක් ඔවුන්ගෙන් මුදාගෙන තෙල් සංස්ථාව යටතේ තිබෙන ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් කියන රාජ්‍ය සමාගමට දුන්නා. මේකත් ජයග්‍රහණයක් නෙවෙයිද? මේක ජයග්‍රහණයක් විදිහට නොගෙන විරෝධයක් ගෙනහැරපාන්නේ ඉන්දියාව විසින් නටවන බලවේග.

**ඔබ දැන් මෙය ඔබේ ජයග්‍රහණයක් කියලා කිව්වට ඉන්දියානු මාධ්‍ය වාර්තා කළේ මෙය බැසිල් රාජපක්ෂගේ සාකච්ඡාවක සහ සංචාරයක ප්‍රතිඵලයක් කියලයි?**

2020 අගෝස්තු 12 තමයි මම බලශක්ති ඇමැතිකම ගන්නේ. ඊට දින 3කට පෙර ජනාධිපතිවරයා අමාත්‍යවරුන්ගේ විෂය පථ ගැසට් කළා. බලශක්ති ඇමැතිවරයා ප්‍රමුඛතාව ලබාදිය යුතු ව්‍යාපෘති 06න් 04 වැන්න තමයි මේ තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධ ව්‍යාපෘතිය. මම ඉන්පසුව ඉන්දියාවත් සමඟ මේ සම්බන්ධයෙන් කතා කළා. 2020 අගෝස්තුවල ආරම්භ කරපු සාකච්ඡාව තමයි මාස 16කට පසුව මේ ආකාරයට සාර්ථකව නිමා වුණේ.

**ඉවත් වෙලා ගෙදර යන්න අපි වරදක් කරලා නෑ**

**එළියේ කතා කළේ ඇතුළේ කතා කරන්න අවස්ථාවක් නැති නිසයි**

**ඉන්දියාවේ සිටින ලංකාවේ මහකොමසාරිස්වරයා කිව්වෙත් මේක මුදල් ඇමැතිවරයාගේ සංචාරයත් සමඟ සිදුවුණු දෙයක් කියලයි?**

2021 අගෝස්තු 24 මම ඉන්දියාවෙන් ඩොලර් මිලියන 500ක ණයක් ඉල්ලුවා. මීට මාස 03ට පමණ පෙර මහ බැංකු අධිපතිවරයාත් ඉන්දියාවෙන් ඩොලර් මිලියන 400ක විනිමය හුවමාරු ණයක් ඉල්ලුවා. මේ කාරණා සිදුවෙමින් පවතින අතරේ බැසිල් රාජපක්ෂ මහතා ඉන්දියාවට ගියා. ගිහින් ආහාර හා ඖෂධ මිලදී ගැනීමට ඩොලර් මිලියන 1000ක ණය පහසුකමක් ඉල්ලුවා. එතුමාගේ සංචාරය තුළ ලංකාව හා ඉන්දියානු ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධයෙන් කාරණා 4කුත් තිබුණා.

4න් 2ක් මම ආරම්භ කරපු ව්‍යාපෘති. එකක් මහ බැංකුවේ ව්‍යාපෘතියක් සහ අනෙක මුදල් ඇමැතිවරයාගේ ව්‍යාපෘතියක්. ලංකාව නියෝජනය කරමින් එතුමා ඉන්දියාවට ගියාම ඔවුන් මේ හතර ගැනම එතුමා සමඟ සාකච්ඡා කළා. ඉන්දියාවේ සිටින ලංකාවේ මහකොමසාරිස්වරයා ප්‍රකාශයක් නිකුත් කළා මුදල් ඇමැතිවරයා ඉන්දියාවට පැමිණ තෙල් ටැංකි ගැනත් එහිදී සාකච්ඡා කළා කියලා.

ඒ සංචාරය තුළ සිදුවුණු ණය පහසුකම් ඉල්ලීම සහ තෙල් ටැංකි අතර කිසිම සම්බන්ධයක් නැහැ. තෙල් ටැංකි වැඩේ පටන් ගන්නේ මීට මාස 16කට පෙර. මහකොමසාරිස්වරයාගේ ප්‍රකාශය නිසා රට තුළත් අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති වුණා.

**ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් සමාගමේ පරිපාලනමය ව්‍යුහය ගැනත් සැක සංකා මතුවෙමින් තිබෙනවා නේද?**

මේක රාජ්‍ය සමාගමක්. 50%ට වඩා ශ්‍රී ලංකාවට අයිති ඕනෑම සමාගමක් රාජ්‍ය සමාගමක් විදියටයි හඳුන්වන්නේ. මෙහි 51% අයිති තෙල් සංස්ථාවට. 49%ක් අයිති ශ්‍රී ලංකා IOC සමාගමට. අධ්‍යක්ෂ මඬුල්ලෙන් 4ක්ම පත්වෙන්නේ ශ්‍රී ලංකා තෙල් සංස්ථාව තුළින්. සභාපතිවරයාත් තෙල් සංස්ථාවෙන්. එපමණක් නොවෙයි මෙය විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට යටත්. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළදී සහ කෝප් කමිටුව තුළදී විෂයභාර ඇමැතිවරයාව ප්‍රශ්න කරන්නත් පුළුවන්. එනිසා සැක සංකා තියා ගැනීමට අවශ්‍ය නැහැ.

**2003දී අස්සන් කළ ගිවිසුම තව වසර 35න් අවසන් වෙනවා. එවිට 2038දී ගිවිසුම ගැහුවත් නැතත් අපිට යළිත් තෙල් ටැංකි 99 ලැබෙනවා.**

2038 වන විට මේ ටැංකි 99 අපිට ලැබුණත් ඒවා අලුත්වැඩියා කරලා සංවර්ධනය කරලා ලාභ උපයන්න පටන් ගන්නකොට කාලය ගතවෙලා ඉවරයි. ලෝකයේ තෙල් ටැංකි අතිරික්තයක් තිබුණොත් මේවා පාවිච්චි කරන්න බැරි වෙන්නත් පුළුවන්. අනෙක් කාරණය තමයි 2015දී අස්සන් කරපු පැරිස් ගිවිසුමට අනුව අපේ රට ඇතුළු රටවල් 196ක් 2050 වසර වන විට ඛනිජ තෙල් භාවිතය අතහැරීමට ප්‍රතිඥා දී තිබෙනවා. 2038 සිට 2050ට තිබෙන්නේ කෙටි කාලයක් නිසා මේක තමයි කරන්න තිබෙන හොඳම සහ එකම විසඳුම.

අනෙක් කාරණය තමයි 1920 දශකයේ හදපු මේ තෙල් ටැංකි ටික 2038 වන විට අදටත් වඩා දිරාපත් වෙන්න පුළුවන්. දැනටමත් මේ එක් ටැංකියක් විතරක් අලුත්වැඩියා කරන්න රුපියල් මිලියන 200ක් පමණ වැය වෙනවා. 2038 වන විට ඒක තවත් වැඩි වෙන්න පුළුවන්.

**දැනට වසර 35කට තිබෙන බදු ගිවිසුම මේ අලුත් සමාගම නිසා තවත් වසර 50කට දීර්ඝ වෙනවා නේද?**

ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් සමාගමට ලංකා ඉන්දියානු තෙල් සමාගම සහ තෙල් සංස්ථාව අතිවිශාල මුදලක් යොදවනවා. එම මුදල් පියව ගන්න නම් මේ සමාගම ආදායම් උපයලා පෙන්වන්න වෙනවා. දැනට තිබෙන වසර 38ක ගිවිසුම ප්‍රකාරව ඉතිරි වෙලා තිබෙන වසර 16ක කාලය ඒ සඳහා ප්‍රමාණවත් නැහැ.

**තවත් වසර 50කට අස්සන් කරන නව ගිවිසුමෙන් මොකක්ද අපිට අත්වෙන වාසිය?**

නව ගිවිසුමට අනුව වසර 50ට බදු දෙන්නේ ටැංකි 14යි. නමුත් පැරැණි ගිවිසුමට අනුව ටැංකි 99ම තවත් වසර 16කට ඉන්දියාවට අත්වෙනවා. පරණ ගිවිසුමේ තෙල් ටැංකි ගණන වැඩියි. අලුත් ගිවිසුමේ වසර ගණන වැඩියි. මේ දෙක සංසන්දනය කළාම අත්වෙන වාසිය මොකක්ද කියලා වැටහෙන්න ඕනා. මම පොදු සූත්‍රයකින් මේක පෙන්වන්නම්. පැරැණි ගිවිසුම ටැංකි 99 × අවුරුදු 16 = ටැංකි වසර 1584යි. නව ගිවිසුම ටැංකි 14 × වසර 50 = ටැංකි වසර 700යි. මේ සූත්‍රයෙන් පේනවා නේද නව ගිවිසුම නිසා තෙල් ටැංකි පිළිබඳව ඉන්දියානු භුක්තිය 56%ක් පහත වැටෙනවා කියලා.

**නව සමාගමෙන් ආදායම් උපයන්න බලාපොරොත්තු වන විධිය ගැනත් ජනතාවට කියන එක හොඳයි නේද?**

ක්‍රම කිහිපයකට ආදායම් උපයන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ මොහොතේ රටට අවශ්‍ය විදේශ විනිමය උපයන ව්‍යාපෘතියක් බවට මෙය පත්කර ගත යුතුයි. ඒ සඳහා මුලින්ම මේ තෙල් ටැංකි ටික ප්‍රතිසංස්කරණය කරන්න අවශ්‍යයි. ඉන්පසුව අපිට පුළුවන් තෙල් සංචිත ගබඩා කර ගැනීමට අවශ්‍ය රටවලට මේ ටැංකි කුලියට දෙන්න. ඒ වගේම තෙල් සංස්ථාවේ ටැංකි 24 ප්‍රතිසංස්කරණය කළාම කොළඹ සිට උතුරු පළාත, උතුරු මැද පළාත, නැගෙනහිර පළාත සහ බදුල්ල, කුරුණෑගල ආදී දිස්ත්‍රික්කවලට තෙල් ප්‍රවාහනය කිරීම නවත්වලා ත්‍රිකුණාමලයේ සිට ඒ පළාත් සහ දිස්ත්‍රික්කවලට තෙල් ප්‍රවාහනය කරන්න පුළුවන්. ප්‍රවාහනයට වැය වන විශාල මුදලත් ඒ හරහා අපිට ඉතිරි වෙනවා.

ජීව වායු ගබඩා කරන්න, ආහාරමය තෙල් වර්ග රැගෙන එන සමාගම්වලට ගබඩා පහසුකම් දෙන්න, හයිඩ්‍රජන් ගබඩා කිරීමට සහ ජලය ගබඩා කිරීමටත් මේ ටැංකි කුලියට දෙන්න පුළුවන්. එපමණක් නොවෙයි අක්කර 827 පමණ වන මේ භූමි ප්‍රදේශය සූර්ය විදුලි උද්‍යානයක් කරන්නත් අපි කටයුතු කරනවා. ජපන්නු එදා බෝම්බ දාලා කරපු හපන්කම් බලන්න පුළුවන් ආකාරයට සංචාරක කලාපයකුත් හදන්න පුළුවන්.

**සපුගස්කන්ද පිරිපහදුව අරිනවා, වහනවා මොකක්ද ඔබ මේ කරන්නේ?**

සපුගස්කන්ද තෙල් පිරිපහදුව වහන විට මම කිව්වා දින 50කට පමණ වහන්න වෙයි කියලා. නමුත් අපේ තාක්ෂණික නිලධාරීන් මට උපදෙස් දුන්නා මේක ඉතාම පැරැණි පිරිපහදුවක්. ඒ නිසා දින 50ක් වැසුවොත් මේ පැරැණි අබලි යන්ත්‍රසූත්‍ර ක්‍රියාවිරහිත වෙයි කියලා. ඒ නිසා දින 22ට පසුව පසුගිය දෙසැම්බර් 08දා මෙය විවෘත කළා. මාසයක් පමණ පවත්වාගෙනත් ගියා. නමුත් නැවත වතාවක් දින 25කට වහන්න සිදුවුණා.

අතරමැද තෙල් නැවක් ගෙනත් පිරිපහදු ක්‍රියාවලියක් කරන්න වුණා අබලන් වීම වළක්වා ගන්න අවශ්‍ය නිසා. ඒ නිසයි දින 22න් නැවත විවෘත කළේ. නැවතත් අපි මේ මාසේ 25දා මෙය විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද දිගුකාලීන බොර තෙල් කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක වීමට නියමිතයි. ඒ නිසා ඔය කියන අර්බුද නැවත පැන නඟින එකක් නැහැ.

**ඉදිරියේදී රටේ තෙලුත් නැති වෙනවා කියන කතාවේ සත්‍යයක් තිබෙනවාද?**

විපක්ෂ, වෘත්තීය සමිති සහ ඇතැම් මාධ්‍ය ඔය කතාව කියන්න ගත්තේ ජුනි මාසයේ. ඒවා අහපු අහිංසක ජනතාව වසංගතය මැද්දෙත් තෙල් ගන්න පෝලිම්වල සිටියා. නමුත් ඔය කියපු තෙල්

**මුදල් අච්චු ගහලා සහන දීමෙන් වෙන්නේ උද්ධමනය වැඩිවෙන එක**

**තෙල් හිඟයක් එනවා නම් කලින් කියනවා**

**අපි විපක්ෂයෙන් ඉල්ලන්නේ විවේචන නෙමෙයි විකල්ප**

**බැසිල්ගේ ඉන්දියානු සංචාරයයි තෙල් ටැංකියි අතර කිසිම සම්බන්ධයක් නෑ**

හිඟය පසුගිය මාස 06ටම ඇති වුණාද? නැහැනේ. ලොවේ දැවැන්ත රටවල පවා තෙල් හිඟ වුණු අවස්ථාවල අපි අඛණ්ඩව තෙල් සැපැයීම කළා. බැරිවෙලාවක හෝ තෙල් හිඟයක් ඇති වෙනවා නම් ඔය පව ප්‍රචාරය කරලා මිනිස්සු නොමඟ යවන අයට කලින් අපි ඒ බව කියනවා.

**දෙසැම්බර් 27දා වරායට සේන්දු වුණු තෙල් නැව ඩොලර් නැති නිසා දින කිහිපයක් වරායේ තබන්න වුණානේ. මේවාට ප්‍රමාද ගාස්තු ගෙවන්නෙ මිනිස්සුන්ගේ සල්ලිවලින් නේද?**

ඩොලර් නැති ආණ්ඩුව හරියට වලිගය නැති ගොනෙක් වගේ. මේ ඩොලර් අර්බුදය නිසා තෙල් පමණක් නෙවෙයි භාණ්ඩ ගෙනාපු නැවුත් ණයවර ලිපි ඇරගන්න බැරිව වරායේ රැඳුණා. එවිට ප්‍රමාද ගාස්තු ගෙවන්න වෙනවා. ඒත් මොකක්ද කරන්නේ. අපිට චෝදනා කරනවා වෙනුවට ඩොලර් සොයාගන්න ක්‍රමවේදයක් කියාදුන්නා නම්. වෙලාවට LC ඇරලා, වරායේ තියන්නේ නැතිව තෙල් ටික වෙලාවට රට තුළට ගන්න තිබුණා. හැමෝම ප්‍රමාද ගාස්තුව ගැන චෝදනා කරනවා මිසක මෙන්න මේක මඟහරින්නේ මේ නිසයි කියලා තේරුම් කරන්න ඉදිරිපත් වෙන්නේ නැහැ. අපි විපක්ෂයෙන් ඉල්ලන්නේ විවේචන වෙනුවට විකල්පය කියන්න කියලයි.

**එයට විසඳුමක් විධියට IMF යා යුතුයි කියලා රනිල් වික්‍රමසිංහත් පැවැසුවානේ. ඔබලානේ ඒ විසඳුම් භාරනොගන්නේ?**

මම කියන්නේ අපි වහාම IMF සමඟ සාකච්ඡා කරලා ඔවුන් ලබාදෙන කොන්දේසි කේවල් කළ යුතුයි කියලයි. ඒ වගේම ඔවුන් දමන කොන්දේසි අපේ රටට හොඳයි නම් ඒවා පිළිගන්නත් මැළිවෙන්න අවශ්‍ය නැහැ.

■ අරුණි මල්ලවආරච්චි



**ඔඩ්ඩිස කොටුවෙද්දී යක්ෂ සේනාව කම්පා වුණ අයුරු**

**වඩිග සහ සූනියම් ගැන අමුතු කතා**

**ලංකාවේ ප්‍රථම සහ එකම සිද්ධ කඹලෑ මුල් සූනියම් දෙවොලේ හාස්කම් 02 කොටස**

# හයසීයයක් මන්ත්‍ර පොත ජප කරද්දී වඩිග යක්ෂයා කොටු වුණු හැටි



ගොපල්ලව ගල

පසුගිය සතියේ සිද්ධ කඹලෑ මුල් සූනියම් දෙවියන්ගේ කතා පුවත අවසන් වූයේ කාරුණික වඩිග බලගතු යක්ෂයකු බවට පත්වීමේ පුවතත් සමඟය. මෙතැන් සිට දිග හැරෙන්නේ වඩිග යකු අල්ලා ගැනීමට මන්ත්‍රාචාර්යවරුන් ගත් උත්සාහයය.

**බලගතු වඩිග යකු අල්වා ගැනීමට මන්ත්‍රාචාර්යවරු සැරසෙති**

මන්ත්‍රාචාර්යවරුන් වඩිග යක්ෂයා අල්වා ගැනීමට භාවිත කළේ වඩිග කුමරා රචනා කෙරූ බලගතු මන්ත්‍ර පොතයි. එහි මන්ත්‍ර වසර 13ක් මුළුල්ලේ ජප කොට බලගැන්වූ ඉතා බලගතු මන්ත්‍ර පොතක් විය. මේ ජප කිරීමට මන්ත්‍රාචාර්යවරුන් 600 දෙනෙක් සම්බන්ධ වී තිබේ.

මහත්වූ කාලයක් ගෙන මහලු ගවයකු දිය බොන්නාක් මෙන් හත් වතාවක් සූර්යයාගේ ශක්තිය උපයෝගී කොට ගෙන නවග්‍රහයන් බන්ධනය කොට කාල වේලා හා හෝරා ගළපමින් මෙම ජප කිරීම් සිදුකොට තිබේ. මෙම ජප කිරීම් කෙතරම් ප්‍රබල වූවා දැයි කිවහොත් මන්ත්‍ර පොතට මුලින්ම හසුවූයේ වඩිග කුමරුගේ ප්‍රධාන සේනාධිපති වූ ඔඩ්ඩිසයි.

එබැවින් එතැන් සිට මන්ත්‍ර පොත ඔඩ්ඩිස නමින් හඳුන්වා ඇත. ඊළඟට හසුවූයේ සූනියම් යක්ෂයායි. තම හිතෛෂීන් මන්ත්‍ර පොතට හසුවූ බව දුටු වඩිග යකු ඔවුන් දෙදෙනා ගලවා ගැනීමට වෑයම් කළත් බන්ධනයට හසු වූ ඔවුන් දෙදෙනා ඔහුට පැවැසුවේ උගුලින් මිදී පලා යන ලෙසයි. නමුත් තම ප්‍රාණ සම මිතුරන් දෙදෙනා දමා පලා යෑමට අකැමැති වූ වඩිග යකු ස්වකැමැත්තෙන් මන්ත්‍ර පොතේ බන්ධනයට නතු වී තිබේ.

**ඔඩ්ඩිස, වඩිග, සූනියම් ගැන සෙසු යක්කු කම්පා වෙති**

මේ තිදෙනා බන්ධනයට හසුවූ බව දැනගත් යක්ෂ සේනාවෝ මහත් සේ කම්පාවට පත් වූහ.

ඔවුහු මෙම මන්ත්‍ර පොත වටා ඒකරාශීව තම යක් සේනාධිපතීන්ට සිදුවූ ඛේදවාචකය ගැන විලාප තියන්නට වූහ. ඒ දුටු මන්ත්‍රාචාර්යවරු මවිතයට පත් වූහ. එමඟින් තමන් අතින් සිදුවූ දෙය වැරැද්දක් ලෙස තමන්ටම තේරුම් ගිය තැන ඔවුන් රජුන්ගේ ඉල්ලීම නිසා මෙය කළ බවත්, තමන්ට මෙසේ කිරීමට කිසිදු කැමැත්තක් නොතිබූ බවත් පසුව ප්‍රකාශ කර තිබෙන අතර සිදුවූ දෙය අපරාධයක් ලෙස මන්ත්‍රාචාර්යවරුන් සලකා ඇත. පසුව බියට පත් මොවුන් පොත වහාම දඹදිව් තලයෙන් පිට කරන ලෙසත්, එසේ නොවී පොත මෙම දේශයෙන්ම විවර වුවහොත් රජුත්, දේශයත් පූර්ණ වශයෙන් විනාශ වීමේ ඉඩකඩක් පවතින බවත් ප්‍රකාශ කර තිබේ. ඔවුන් මේ පොත රැගෙන පිටත්ව ඇති අතර එම කාලය මෙසේ සඳහන් වේ.

**එක්වා දහසකි එක් රජවරු — සේ**
**දෙසීය අසූ හතරයි බක් මා — සේ**
**පුර පසළොස්වක ගුරු දින දව — සේ**
**රැගෙන මෙ පොත මෙ පුරට ගොඩ බැස් — සේ**

**මන්ත්‍ර පොත ලංකාවට රැගෙන එයි**

මන්ත්‍ර පොත ලක්දිවට පැමිණ ඇත්තේ ශක රාජ වර්ෂ 1284 බක් මස පුර පසළොස්වක ලත් ගුරු දිනකදීය. එනම් ව්‍යවහාරික වර්ෂ 1362 වර්ෂයයි. ඒ ගම්පොළ රාජ්‍ය යුගයයි. ලංකාවෙහි රජකම් කොට ඇත්තේ තුන්වැනි වික්‍රමබාහු රජතුමාය. මෙම රජු වසර 17ක් පමණ රජකම් කොට ඇති බව සඳහන් වේ.

මේ පොත රැගෙන පිටත්ව ඇත්තේ ඉන්දියාවේ වළගම්බාහු නම් රජ රාජ්‍ය කරවන කාලයේ බව සඳහන් වේ.

**එකලට දඹදිව වළගම්බාහු — ව**
**මෙකලට හද්දා කල්පය කිට්ටු — ව**
**සකළ මේ දඹදිව යක්සෙන් කට්ටු — ව**
**එකල යන්ඩ රට ලැබුණයි ඔප්පු — ව**

යක්ෂයන් බන්ධනය කළ මෙම මහානුභාව සම්පන්න මන්ත්‍ර පොත රුවල් නැවක නංවා පිටත් කෙරූ බව සඳහන්ය. ඒ සඳහා කිසිවකුත් සම්බන්ධ වී නොමැත්තේ බියටය. කෙසේ හෝ යකුන් මන්ත්‍ර පොතෙන් නිදහස් වුවහොත් ඔවුන්ට මරණය නියතය. ඉන්පසුව නැව තුළ රිදියෙන් අලංකාර කරන ලද ඇතුළු මාලිගාවක් ඉදිකොට ඇත. කුඹ ගසක් හා රන් කොතක් සිටුවා රන් චාමර හා රුවන් චාමර, රන් සින්නං සහ රිදී සින්නං, කර්ණ කුණ්ඩලප්පු සහ සංඛනාද ද ඇතිව රජකුට පුදන පිදවිලි අන්තර්ගතකොට ඇත. මෙම "ඔඩ්ඩිස" මන්ත්‍ර පොත තුරඟකු පිටින් අලංකාර කරන ලද අසරුවකු අත නැවට වඩම්වා තැන්පත් කොට ඇත. රජ කුමාරයකුගේ ආත්මයක් නිසා ඔහුට කරන ගෞරවයක් ලෙසත්, නැවත මන්ත්‍ර පොතෙන් නිදහස්ව පැමිණියහොත් ඇති වන විනාශයෙන් බේරීමට උපාය මාර්ගයක් ලෙසත් මෙලෙස සරසවා නැව දකුණු සුළඟට රුවල් බැඳ කිසිවකු නොමැතිව කේරළ ප්‍රාන්තයේ වර්තමාන කොචිං වරායෙන් පිටත් කෙරූ බවට බොහෝ දෙනෙක් විශ්වාස කරති.

නැව මාතරට ගොඩගසා තිබේ. එය පළමුවෙන් දැක ඇත්තේ මුහුදු වැද්දෙකි (ධීවරයෙකි). පසුව ඔහු දෙවුන්දර ප්‍රධාන අමාත්‍යවරයා වූද දෙවිනුවර පුද බිමේ භාරකාර බමුණාට දන්වා තිබේ. භාරකරු මන්ත්‍ර පොතෙහි මතුපිට ලියා ඇති අනතුරු ඇඟවීමේ වැකිය නිසා මෙය බරපතළ පුස්තකයක් බව වටහාගෙන තිබේ. පසුව මෙම මන්ත්‍ර පුස්තකය තේජසින් යුතු මන්ත්‍ර ශාස්ත්‍රය පිළිබඳව ප්‍රබලයකු හා එඩිතරයකු වූ මෙම බමුණාගේ භාරයට ගෙන එය දෙවුන්දරට වඩමවා රජුට දන්වා ඔහුගේ තීරණය අපේක්ෂාවෙන් මුරකරුවන් යොදා ආරක්ෂාව සලස්වා තිබේ.

**ගොඩ බැස මාතර — ට**
**වැඩම කර දෙවුන්දරය — ට**
**දැඩි තෙද බමුණු හ — ට**
**කඩ නැතිව මුර සිටිති එ පොත — ට**

දිවයිනේ දකුණු තුඩුවේ පිහිටි දෙවුන්දර ප්‍රදේශය ගැන 07 වැනි සියවසේ සිට ඓතිහාසික මූලාශ්‍රවල දැක්වෙයි. පුරාණ මූලාශ්‍රවල මෙය සඳහන් වන්නේ "දේවනගර" ලෙසයි. 'දෙවි' යන්නෙහි තේරුම 'දෙවියන්' යන්නය. 'නුවර' යන්නෙහි තේරුම 'නගරය' යනුවෙනි. ඒ නිසා දෙවුන්දර 'දෙවිවරුන්ගේ නගරය' ලෙස ව්‍යුත්පන්නව ඇත. මෙනයින් ගත් කල මෙම රටට ආගන්තුක වූ මන්ත්‍ර පොත තාවකාලිකව හෝ රඳවා තැබීමට සුදුසුම ස්ථානය 'දෙවි නුවර' නොහොත් 'දෙවුන්දර' බව රජතුමාට හා බමුණාට සිතෙන්නට ඇත. කෙසේ නමුත් සෑම අවස්ථාවක් තුළදීම යකුන් බැඳි 'ඔඩ්ඩිස' මන්ත්‍ර පොත තනි නොකිරීමට ඔවුන් කටයුතු කර තිබේ.

එකල දෙවුන්දර ඉතා අලංකාර භූමියක්ව පැවැතී ඇත. තෙලිඟු භාෂාව පිළිබඳව අවබෝධයක් ඇති අය සිටි බව සේම දෙවියන්ට වෙන් වූ පරිසරයක් එහි තිබූ බව ක්‍රි:ව: 1380 වන විට පැවැති තත්ත්වය පිරික්සීමෙන් මනාව හඳුනාගත හැකිය. මෙම යුගයේ රජුගේ දෙවුන්දර ප්‍රධාන අනුශාසක බමුණකු සිට තිබේ. එම නිසා දෙවුන්දර ඉතා වැදගත් ස්ථානයක් විය. එම මන්ත්‍ර පොත දෙවුන්දරට වැඩමවා ආ අමාත්‍ය බමුණාට භාරදී මේ බව රජුට දැනුම් දී රජු හෝ ඔහුගේ නියෝජිතයකු පැමිණෙනතුරු දෙවුන්දර රඳවා පහන් දල්වමින් වතාවත් කළ බව කඹලෑ පටුනෙහි සඳහන් වෙයි.

**පුර තෙලිඟු භාසෙ — න්**
**පොත ගෙන මෙපුර ඇවිදි — න්**
**තරව සීමාවෙ — න්**
**මුරලු මේ පොත පහන් ලවමි — න්**

**පොත ගෙන බමුණා — ට**
**සිටිනා පිණිස හිමිකො — ට**
**බලාගෙන එන්න — ට**
**යෙදුණු පනතක් නිරිඳු වැඩ සි — ට**

මෙම පොතෙහි තොරතුරු දැනගත් රජු පුදුමයට පත්ව තිබේ. රජු තව තවත් කරුණු විමසා තිබේ.

**රජු තඹ පොතේ තොරතු — රු**
**ඇසුවයි නිරිඳු වැඩක — රු**
**සිරි ලකට ගිය ගු — රු**
**නියම කර ඇසි පොතේ තොරතු — රු**

ඔහුගේ අදහස වී ඇත්තේ මෙම තඹ මන්ත්‍ර පොත ඉතා සශ්‍රීක භූමියක් වූ දෙවුන්දර නගරය තුළම තබාගෙන වතාවත් පවත්වාගෙන යෑමටයි. එහෙත් පසුව රජුගේ ප්‍රධාන දෙවුන්දර භාර අමාත්‍ය වූ දෙවිනුවර පූජා නගරය භාර බමුණා එහි මතුපිට දන්වා ඇති අනතුරුදායක ප්‍රකාශනය රජුට ප්‍රකාශ කර කෙදිනක හෝ මෙම මන්ත්‍ර පොතින් යකුන් නිදහස් වීම සිදු වුවහොත් සිදුවිය හැකි විනාශයත්, මන්ත්‍ර පොතක් නිසා එය වැරැදි අය අතට පත් වුවහොත් දේශයටම අනතුරුදායක ප්‍රතිඵලවලට මුහුණදීමට සිදුවන බවත් සලකා අනතුරුව එය ජනශූන්‍ය ප්‍රදේශයකට ගෙන යෑමටත් එම ප්‍රදේශය තුළ බිම සන්නස් කර පුදදීමටත් තීරණය කර තිබේ. ඒ බව කඹලෑ පටුනෙහි පහත කවියෙන් මනාව හඳුනාගත හැකිය.

**නැවට නැඟී ඇවිදින් බැස ගොඩත — ර**
**රුවට දෙවුන්දර පියසකි මාත — ර**
**ලොවට උතුම් සීතාවකි එනුව — ර**
**පොතට ලැබුණි ගම් බිම් සන්නස් ක — ර**

**මන්ත්‍ර පොත දකුණු වන්නියට රැගෙන යයි.**

රජුගේ ප්‍රධාන ආරක්ෂකයන් හා මැතිවරුන් සමඟ ජනශූන්‍ය ප්‍රදේශයක් වූ දකුණු වන්නිය කරා රැගෙන යෑමට බමුණුගේ උපදෙස් මත රජු කටයුතු කර තිබේ. දකුණු වන්නියට ගමන් මාර්ගය වූයේ කබලෑව හරහාය. ඔවුන් දෙවුන්දර දකුණු වෙරළේ සිට බස්නාහිර පැත්තට ගොස් වෙරළබඩ මාර්ගය ඔස්සේ මාදම්පා තොට නොහොත් වර්තමාන මාදම්පේ නගරයෙන් දුම්මලසූරියට පැමිණ ඉන්පසුව ගලපලා නුවර නොහොත් වර්තමාන ගල්පොළ ගම්මානයෙන් කබලෑවේ ගොපල්ලව කන්දට පැමිණ ඇත.

මෙම ගොපල්ලව කන්ද යනු ගවයන් අල්ලාගෙන අවුත් බැඳ ගොපල්ලන් විවේක ගන්නා ස්ථානයකි. ඉතිහාසයෙහි මෙම ප්‍රදේශයෙහි මිනිසුන් වන්නි හත්පත්තුවේ මාගුල් ඕතොට කෝරලයට ගවයන් අල්ලාගෙන ඒමට ගිය අතර මෙසේ ගවයන් අල්ලාගෙන නැවත මෙම ප්‍රදේශට පැමිණ ගොපල්ලව වැව අද්දරට රැගෙන ආහ. මෙම ගවයන්ට වතුර දුන් වැව ගොපල්ලව වැවයි. ගවයන්ට තණකොළ කෑමට බැන්ද භූමිය ගොපල්ලව වැව් පිටියයි. ගොපලු මිනිසුන් එසේ ගවයන් බැඳ විවේක ගත් භූමිය ගොපල්ලව ගලයි. මෙම සියලු කරුණුවලට අදාළව අදද ගොපල්ලව යන නම භාවිත වේ. මෙම ප්‍රදේශය කබලෑවටම අයිතිය.

රජුගේ ප්‍රධාන ආරක්ෂකයන් හා මැතිවරුන් සමඟ ඔඩ්ඩිස මන්ත්‍ර පොත රැගෙන ගිය පිරිස විවේක ගැනීමට ගොපල්ලව ගලට සැපත් වී ඇත. ඔවුන්ගේ ගමන් මහන්සිය මඟ හැරීමටත්, පිපාසය සංසිඳුවීමටත් මෙම කන්දෙහි සිටි ගොපලු මිනිසුන් පස්ගෝරස ලබා දී තිබේ. මෙම ක්‍රියාව නිසා ආරක්ෂකයන් හා මැතිවරුන් සමඟ ගොපලු මිනිසුන් ළෙන්ගතු බවක් ගොඩනඟාගෙන තිබේ. ඒ බව කඹලෑ පටුන මෙසේ අදහස් දක්වයි.

**ගොපලු දනන් සැම අයට බලාගෙ — න**
**හාද මිතුරු කබලෑවට ළං වු — ණ**
**ආදරයෙන් පොත මුදා බැලුව තැ — න**
**වාද වෙලා එම පොතෙන් පිටත් වු — ණ**

**ගොඩ බැස කබලෑවට නොම — ලසිනා**
**මුදා බලමු පොත මැතිවරු — කියනා**
**ගොපලු එලනු පොට වට බැමි — ලෙහෙනා**
**එදා පැනපි ගුවනට — එර්දියෙනා**

**මන්ත්‍ර පොත දිග හැරීමට සැරසෙයි**

ගමනාරම්භය වූ අවස්ථාවේ සිටම මැතිවරුන්ගේ අදහස වූයේද මෙම පොත ලෙහා බැලීමය. ගොපල්ලව ගලට සැපත් වී යම් වේලාවක් ගෙවී ගිය පසු මොවුන් මෙම ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට උත්සාහ දරා තිබේ. ගොපලු මිනිසුන්ගේ ඉල්ලීම වූයේද මෙම පොත මුදා බලමු යන්නය. එහෙත් මෙම ක්‍රියාව කරම්දෝ නොකරම්දෝ යනුවෙන් ගොපල්ලන් හා මැතිවරුන් අතර වාදයක් ඇති වූ බවද සඳහන් වේ.

වඩිග යකු ඇතුළු යකුන් බැඳි පොත ගොපල්ලව ගලෙහි දිග හරින අවස්ථාවේදී යකුන් තුන් දෙනාම එයින් එළියට පැන ඇත. බියට පත් වූ ගොපලු මිනිස්සුන් යක්ෂයා බැඳ දමා තබා තිබූ පොත උඩට කඹ දමා ලෑමත් (ඇතිල්ලීමත්) කඹ දා අල්ලපියව් යනුවෙන් ප්‍රකාශ කිරීමත් නිසාද පසු කාලවලදී යකුගෙන් වන හිරිහැර නිසා යක්ෂයා අල්ලා බැන්ද නිසාත් කඹලෑව යන්න උපන් බව දැක්වේ. ඒ බව කඹලෑ පටුනෙහි මෙසේ සඳහන් වේ.

**තුටත් වඩන අණසක කබලෑ — වේ**
**දුටත් වරද ඉවසන්න කමා — වේ**
**මටත් දැනෙන ලෙස පරම්පරා — වේ**
**පිටත් වුණයි පොතකින් කබලෑ — වේ**

**වද කරලා යක් සෙන් අසු — වෙන්නේ**
**තද කර ලා ලණු පොට — ඇදපන්නේ**
**කඹ දම ලා බැඳපන් — විගසින්නේ**
**කඹලෑවේ නම එදයි — උපන්නේ**



ඇඹව ශ්‍රී සුදර්මාරාම කණුකැටිගෙදර ශ්‍රී පුෂ්පාරාම උභය විහාරාධිපති, විද්‍යා විනෝද මහා පිරිවෙනෙහි නියෝජ්‍ය පරිවේණාධිපති, ශාස්ත්‍රපති පණ්ඩිත
පූජ්‍ය ඉරුදෙණියායේ සිරිරතන හිමි



# නගර සභාවට වසර 100ක් සපිරෙනදා කළුතරට මහ නගර සභාවක්

බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුන අතර තම අග නගරයේ තවමත් මහ නගර සභාවක් ස්ථාපිත කර ගැනීමට අසමත් දිස්ත්‍රික්කයක් වේ නම් ඒ කළුතර දිස්ත්‍රික්කයයි. කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කවල ප්‍රධාන නගර අතර කොළඹ නගරයට පසුව දීර්ඝ ඉතිහාසයක් ඇති නගරය වන්නේ කළුතර නගරයයි. ඉන්දීය සාගරයට මායිම්ව තිබීම නිසාම සිංහල රජ දවස සිටම කළුතර භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක්ව පැවති බව ඉතිහාසය පිරික්සන්නකුට දැකගත හැකිවනු ඇත.

මෙරට ඉතිහාසය ලියාතැබූ විදේශීය ලේඛකයකු වූ බ්‍රෝහියර් පවසන පරිදි නිරිතදිග පිහිටි "පුරය" නමින් හැඳින්වීම් ලද එකම නගරය කළුතර නගරයයි. එකල මෙය වේලාපුරය නම් විය.

සිංහල රජ සමයෙන් පසු මෙරට මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගත් පෘතුගීසීන්, ලන්දේසීන් මෙන්ම පසුව ඉංග්‍රීසීන්ද කළුතර තමනට වැදගත් නගරයක් බවට සලකන ලදී. පෘතුගීසීන් වත්මන් බෝධීන් වහන්සේ පිහිටි ස්ථානය කේන්ද්‍රකරමින් කොටු පවුරක් ගොඩනඟන්නේත්, ලන්දේසීන් එම බලකොටුව තව තවත් ශක්තිමත් කරන්නේත්, ඉංග්‍රීසීන් 1923 වැනි ඉතා ඈත කාලයකම කළුතර නගරයේ නගර සභාවක් ස්ථාපිත කරමින් විධිමත් පරිපාලන ක්‍රමයක් ආරම්භ කරන්නේත් කළුතර නගරයේ පැවැති සුවිශේෂතා හේතුවෙනි.

මෙහිදී අපට ප්‍රස්තුත වන්නේ ඉංග්‍රීසීන් 1923දී ස්ථාපිත කර මෙම වසරේ ජනවාරි හයවන දාට වසර අනූනවයක් සම්පූර්ණ වන 2023දී සිය සියවස සැමරීමට බලාපොරොත්තුවෙන් සිටින කළුතර නගර සභාවේ කතාවස්තුවයි.

කළුතර පුරවැසියන් තම නගර සභාව මහ නගර සභාවක් බවට පත්කර ගැනීමේ උත්සාහය විධිමත් ලෙස ආරම්භ කරනුයේ ක්‍රිස්තු වර්ෂ දෙදහ ලබන විටය. එතැන් සිට වසර විසි එකක් ගෙවී ගිය තැනද තවමත් එම උත්සාහය පවතිනුයේ අවසානය සනිටුහන් නොවූ උත්සාහයක් ලෙසමය. මෙම වසර විස්ස තුළ කිසියම් අදෘශ්‍යමාන හස්තයක් මෙම උත්සාහය වළකාලීමට කටයුතු කරමින් සිටින බව පැහැදිලිව පෙනෙන්නට තිබෙන බව බොහෝ දෙනාගේ අදහසයි.

කළුතර පුරවැසියන්ගේ වුවමනාවත්, යථාර්ථයත් වන්නේ පවතින නගර සභා සීමාව පුළුල් කර, මේ වන විට නාගරික ලක්ෂණ සහිත නව ප්‍රදේශ එක්කොට මහ නගර සභාව ස්ථාපිත කිරීමය. දැනට නගර සභාවක්ව පවතින වර්ග කිලෝමීටර හතක පමණ ප්‍රදේශය පමණක් මහ නගර සභාවක් බවට පත් කිරීමෙන් නාගරික ජනතා අපේක්ෂාවන් කෙසේවත් ඉටුනොවන බව සක්සුදක් සේ පැහැදිලි යථාර්ථයකි. වසර විස්සක් පුරා නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත් පට්ටයක් ඉල්ලමින් වළකමින් තිබෙන්නේ මෙම පුළුල්කොට උත්ශ්‍රේණි ගත කිරීමේ ජනතා අභිලාෂයයි.

ඉංග්‍රීසීන් නාගරික වියදම් ස්වදේශීය ජනතාව වෙත පැටවීමේ වුවමනාව සහිතව, නගර සභා ක්‍රමයක් ස්ථාපිත කිරීමට එම හැකියාව සහිත නගර සොයා බැලීමේදී අඳුනාගැනීමෙන් අනතුරුව නගර සභා ස්ථාපිත කළ මුල් නගර අට වන මීගමුව, රත්නපුර, යාපනය, මාතලේ, මාතර, කළුතර, පානදුර, හලාවත යන නගරයන්ගෙන් තවමත් මහ නගර සභා ස්ථාපිතව නොමැත්තේ පානදුර, කළුතර හා හලාවත පමණි.

පසුකලෙක පොළොන්නරුව, අක්කරපත්තුව, දඹුල්ල, කල්මුණේ, මොරටුව, මඩකළපුව, කඩුවෙල, හම්බන්තොට, බණ්ඩාරවෙල, කුරුණෑගල, නුවරඑළිය, කඩුවෙල ආදී බොහෝ නගරවල මහ නගර සභා ස්ථාපිත කරන ලදී. ප්‍රාදේශීය සභා ලෙස පැවති නගර එක්වරම මහ නගර සභා බවට උසස් කළ අවස්ථාද මෙරට ඇත.

එවන් තත්ත්වයක් තුළ කළුතර වසර අනූනවයක් පුරා තවමත් එකතැනය.

පවතින නගර සභාවම එම භූමි ප්‍රමාණය සහිතව මහ නගර සභාවක් බවට පත්කිරීමේ සැලසුම් කිහිපයක්ද මේ අතර ක්‍රියාත්මක වුණි. මේ යට වන පටු අවස්ථාවාදී වුවමනාවන් හඳුනාගත් කළුතර පුරවැසියන් ඒ සෑම අවස්ථාවකම එම කුමන්ත්‍රණ පරාජය කිරීමට සමත් වුණි. භූමි ප්‍රමාණයෙන් පුළුල් නොවන මහ නගර සභාවක් යථාර්ථයක් නොවන්නේ, දියුණු නාගරික ලක්ෂණ සහිත විශාල භූමි ප්‍රදේශයක් එමඟින් අත්හැරෙන නිසා පමණක් නොවේ. මේ වනවිට ගණන් බලා ඇති පරිදි වත්මන් නගර සභා සීමාව යනු ජනගහන වර්ධනයකට වඩා පිරිහීමකට ලක්ව ඇති ප්‍රදේශයකි. සුනාමි ව්‍යසනයෙන් පසු අතිවිශාල ජනගහනයක් දැනට පවතින නාගරික සීමාවෙන් එපිට පදිංචිය සඳහා යොමු වී ඇත. 2030 වනවිට කළුතර නගර සීමාව තුළ ජනගහන පුරෝකථනය සෘණ 1.69කි. එමෙන්ම මුහුදු ඛාදනය විසින් ක්‍රම ක්‍රමයෙන් කළුතර නාගරික භූමි ප්‍රමාණය ක්ෂය කරමින්ද පවතී.

එබැවින් ජාති ආගම් කුල කාටත් සාධාරණ හා ප්‍රයෝජනවත් තීන්දුව වන්නේ නාගරික සීමාව පුළුල් කිරීමයි.

2020 - 2030 දශකය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සකස් කළ කළුතර සංවර්ධන සැලසුමේ දත්තවලට අනුව අධ්‍යාපන, සෞඛ්‍ය, පරිපාලන කටයුතු සඳහා දෛනිකව නගරයට පිවිසෙන ජනගහනය හැටදහසකට අධිකය. කළුතර තිලකය වැනි බෝධීන් වහන්සේ වැඳපුදා ගැනීමට දෛනිකව 2000ක පමණ පිරිසක් පැමිණෙති. නගර මධ්‍යයේ වෙළෙඳ කටයුතු සඳහා සැරිසරන පිරිස අසූ දහසකැයි ගණන් බලා තිබේ.

පොලිස් අභ්‍යාස විද්‍යාලයක්ද, හෙද හෙදි පුහුණු පාසලක්ද, විවෘත විශ්වවිද්‍යාලයද, මූලික රෝහලද, දිස්ත්‍රික් හා මහෙස්ත්‍රාත් උසාවිද, බස් ඩිපෝවක්ද ආදී ලෙස අති විශාල නාගරික ජනතා අවශ්‍යතා ගණනාවක් සම්පූර්ණ වන ආයතන මෙම පවතින හා යෝජිත ප්‍රදේශයේ පිහිටා ඇත.

බස්නාහිර පළාතේ ප්‍රධාන නගර තුනෙන් එකක් කළුතර නගරය නගර සභා තත්ත්වයෙන් තවමත් පැවතියද ඉතා පුළුල් ප්‍රදේශයක විහිදුණ සියලු නාගරික ලක්ෂණ සහිත නගරයක් බව අවිවාදිතය. කිසියම් කණ්ඩායමකගේ සැඟවුණු න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක නොවූයේ නම් කළුතර දැනටද මහ නගර සභාවක් ස්ථාපිත වී අවසානය. එසේ වූයේ නම් කළුතර නාගරික ජනතාවට නව ජවයකින් සංවර්ධනය කරා පියමැනීමේ අවකාශය විවර වන්නේය.

මහ නගර සභාව නගරාධිපතිවරයා ප්‍රධාන විධායකය වේ. නාගරික සංවර්ධනය වෙනුවෙන් විදෙස් ආධාර පවා සෘජුව ලබාගනිමින්, ස්වාධීන තීන්දු තීරණ මත තම සංවර්ධන සැලසුම් ක්‍රියාවේ යෙදවීමේ බලතල ඔහු සතු වේ.

දක්ෂ පුරවැසියන්, ක්‍රියාකාරී දේශපාලකයන් රැසකට නිජබිම සපයා ඇති කළුතරට එවන් අවකාශයක් විවර වුවහොත් කළුතරට සංවර්ධනය නොවේ යැයි කිව හැක්කේ කාටද?

වත්මන් රජය බලයට පත් වූ පසු නව ජවයකින් කළුතර නගර සභා බල ප්‍රදේශය පුළුල් කොට මහ නගර සභාවක් ස්ථාපිත කිරීමේ උත්සාහය නව වටයකින්, නව උනන්දුවකින් යළි ආරම්භ වුණි. එය මන්ත්‍රී ධුර අපේක්ෂකයකු ලෙස අපගේ මැතිවරණ පොරොන්දුවක් ද විය.

කළුතරට මහ නගර සභාවන් ලබාගැනීමේ සටනට අඛණ්ඩ දායක්වය ලබාදෙමින් සිටින කළුතර පුරවැසි සභාව සංවිධානයත්, කළුතර මහ නගර ජනසභාව සංවිධානය ඇතුළු අපත්, මේ සියල්ලේම නියෝජනය වන කළුතර නාගරික සීමාව තුළ වැඩවසන ගෞරවනීය ස්වාමීන් වහන්සේලා හා සෙසු ආගමික පූජකවරුනුත් එක්ව ජනාධිපතිවරයාගේ අවධානය මේ කෙරේ යොමු කරවා ගනිමින්, අදාළ සියලු අංශ සම්බන්ධීකරණය කර ගනිමින් 2023 වසරේදී වසර සියය පිරීමට ප්‍රථම කළුතර පුරවැසියන් හට මහ නගර සභාවක් දිනා දීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරමින් සිටිමු.

එහි ප්‍රතිඵල මේ වනවිට ලැබෙමින් පවතින බව කළුතර ජනතාවට දැනුම් දිය යුතුව තිබේ. ඒ අනුව කළුතර නගර සීමාව පුළුල් කොට මහ නගර සභාවක් ස්ථාපිත කිරීමේ කාර්යය ගැසට් පත්‍රය නිකුත් කිරීමේ අවසන් අදියර කරා මේ වනවිට පැමිණ තිබේ. ඒ අනුව නුදුරේදීම කළුතර නගර සභාව පවතින ග්‍රාම නිලධාරී කොට්ඨාස 16ත් යෝජනා වී ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස 18කුත් සහිතව මහ නගර සභාවක් බවට අභිෂේක ලබනු ඇත.

ඒ අනුව වසර 20කට අධික කළුතරට ආදරය කරන පුරවැසියන්ගේ සිහිනය ඉටුවේ යැයි අප බලාපොරොත්තු වෙමු.



රාජ්‍ය අමාත්‍ය
ජයන්ත සමරවීර



# රත්තරන් බෙදුවත් මිනිස්සු අපිට ඡන්දෙ දෙන්නේ නෑ කියලා ආණ්ඩුවේ ඇමැතිවරු කියනවා

## සමගි ජන බලවේගයේ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර කාවින්ද ජයවර්ධන

**ඔබලා දිගටම ආණ්ඩුවෙන් සහන ඉල්ලුවා. අද ආණ්ඩුව යම් සහන ප්‍රමාණයක් දී තිබෙනවා. උන්නු හැටියට මළා මදැයි වගේ මේකත් සහනයක් නේද?**

මිලියන 1.5ක් ඉන්නවා රාජ්‍ය සේවකයෝ. මිලියන 2.2ක් ඉන්නවා සමෘද්ධිලාභීන්. ලක්ෂ 55ක් ඉන්නවා විශ්‍රාමිකයන්. එතකොට මේ අයට විතරද හම්බවෙන්න ඕනැ. මාධ්‍යවේදීන්ට, කම්කරුවන්ට, ගොවීන්ට, ධීවරයන්ට මේක හම්බ වෙන්න ඕනැ නැද්ද, රුපියල් පන්දාහක් ලබාදුන්නට උද්ධමනය ඊට වඩා තුන් ගුණයකින් වැඩිවෙලා. බොහොම වගකීමෙන් අපට කියන්න පුළුවන් ඉදිරියේදී පරිප්පු කිලෝවක් රුපියල් 300 දක්වා වැඩි වෙන්න පුළුවන්. ඉදිරියේදී හාල් කිලෝවක් රුපියල් 350ක් විතර වෙනවා. කිරිපිටි පැකට් එකක් දෙගුණයකින් වැඩි වෙනවා. ගෑස් දෙගුණයකින් වැඩි වෙනවා. ඩීසල්, පෙට්රල් වැඩි වෙනවා. ඔය රුපියල් 5000න් ජීවිතේ ගැටගහගන්න පුළුවන්ද? රටට ආදායමක් හොයන්න ව්‍යවසායකයන් බිහි නොකර, සල්ලි අච්චු ගහගහ බෙදන ක්‍රමයත් එක්ක රටේ උද්ධමනය වැඩි වෙනවා මිසක් රට බංකොලොත් වෙනවා, දුප්පත් වෙනවා මිසක් රට සංවර්ධනය වෙන්නේ නෑ.

**සහන නොදුන්නමත් කෑගහනවා. සහනයක් දුන්නමත් කෑගහනවා. මොනවද අවම වශයෙන් යෝජනා කරන්නෙ එහෙනම්?**

අපි කියන්නේ රටට ආදායම උපයන ක්‍රියාමාර්ග හදන්න කියලා. ආයෝජන කිරීම් කරන ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර සහන දෙන්න ඕන. ණය සහනාධාර සඳහා අනෙකුත් රටවල් සමඟ කතා කරලා පියවර ගන්න ඕනැ. විශේෂයෙන්ම රටේ ආර්ථිකයට අවශ්‍ය නිෂ්පාදනය වැඩි කරලා අපනයන ආදායම වැඩි කරන්න මූලික සැලැස්මක් ඕනෑ. ගොවිතැනට අවශ්‍ය පොහොර ටික දෙන්න ඕනෑ. එතකොට ගොවියා හිඟා කන්නෙ නෑ. ආධාර ඉල්ලන්නෙ නෑ. දීමනා දීලා වැඩක් නෑ. පඩි වැඩි කරන්න ඕනේ.

**ඔබ කියන්නෙ රාජ්‍ය සේවකයන්ට දුන්නෙ අල්ලසක් කියලද?**

අල්ලසක් නෙමේ. රුපියල් පන්දාහක් දීලා කළේ රැවටීමක්.

**විපක්ෂයකට හෝ ඕනෑම කෙනකුට යෝජනා ඉදිරිපත් කරන්න, විවේචන කරන්න ලේසියි, පහසුයි. හැබැයි ඔබ මොකක්ද මුදල් ඇමැතිවරයාට කරන යෝජනාව?**

මුදල් ඇමැතිට කියන්නෙ එකම දෙයයි. පළමුවැනි දේ රටේ ණය Re-shedule කරන්න ඕනෑ. ලෝකෙ අනෙක් රටවල් එහෙම කරලා තියෙනවා. දෙවැනි කාරණේ රටේ තියෙන අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කරන්න. මිල පාලනයක් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහාවත් ගෙන ආ යුතුයි. ගොවීන්ට වහාම වන්දි ගෙවලා පොහොර ටික ලබාදී ගොවිතැන ශක්තිමත් කරන්න. අත්‍යවශ්‍ය භාණ්ඩ, කිරිපිටි, සීනි, පරිප්පු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ මෙට්‍රික් ටොන් 30,000ක් පමණ වරායෙ හිරවෙලා තියෙනවා. ඒවා වහාම නිදහස් කරන්න.

**ඩොලර් නැත්නම් මොකද කරන්නේ?**

"ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හා පර්යන්තවල අත් හැර දමා ඇති සහ ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර ඇති අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වෙන්දේසි කිරීමකින් තොරව මිල ගණන් සාකච්ඡා කොට ලංකා සතොස ආයතනයට ලබාදීම" කියලා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, ලක් සතොස සමාගම, අතිරේක ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය කියලා ලිපියක් නිකුත් කරලා තියෙනවා. සතොසට ගෙනිච්ච බඩු ටික අරගෙන තුන්වැනි පාර්ශ්වයකට විකුණා තිබෙනවා. මන් ගාව තොරතුරු ඔක්කොම තියෙනවා. අපි සාක්ෂි ඇතිව කියන්නෙ. සීනි වංචාව, කහ වංචාව කොහොමද මේ රටේ ආර්ථිකය හදන්නෙ මෙච්චර වංචා කරද්දී. ඔබ අහනව ඩොලර් නැත්නම් කොහොමද කරන්නෙ කියලා. ඩොලර් නැත්නම් කොහොමද මේවා කරන්නෙ. උඳු හා සුදුලූනු වංචාවට විරුද්ධව අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළා. කවුද ඒ වෙනුවෙන් අත්අඩංගුවට ගත්තෙ. සුදුලූනු කන්ටේනර් 4ක් වරායෙන් නිදහස් කරලා සතොසට ගේන්නෙ නැතිව එදා අතරමැදියෙක්ට වික්කා. උඳුවලට අදාළව ගම්පහ පෞද්ගලික ආයතනයක පුද්ගලයකුට විකුණලා පපඩම් හදන, නූඩ්ල්ස් හදන සමාගමකට මේ ටික දුන්නා. දීලා වැඩි මුදලට ඒවා සතොසට ගත්තා. සීනි වංචාවෙන් කළෙත් ඒක. අනිත් එක රටේ ආරක්ෂාව.

> **සල්ලි අච්චු ගගහා බෙදුවට රට සංවර්ධනය වෙන්නේ නෑ**

**සීනි, සුදුලූනු වංචාව අභිභවා ගෑස් ප්‍රශ්නය රටට බලපා තිබෙනවා. මේවට කවුද අන්තිමට වගකියන්නෙ?**

අපි පැහැදිලිව කියනවා ගෑස් ප්‍රශ්නයට බන්දුල ගුණවර්ධනයි, ලසන්ත අලගියවන්නයි වත්මන් ඇමැතිලා දෙන්නම වගකියන්න ඕනෑ. ඇමැතිලා එකතු වෙලා හොරකම් කරන්නෙ. ලිට්රෝ සහ ලාෆ් සමාගමේ ගැටලුවේදී මේ අය සංයුතිය වෙනස් කළා කියලා. 2021 ජූනි 10 පාරිභෝගික අධිකාරිය කියනවා වහාම මේකට පියවර ගන්න කියලා. මේගොල්ලො පියවර ගත්තද? මේ ඇමැතිලා දෙන්නා මේකට වගකිවයුතු නැද්ද? පාරිභෝගික අධිකාරිය ගෑස් සංයුතිය ගැන වහාම හොයන්න කියද්දි ජනාධිපති, අගමැති, ඇමැතිලා දෙන්නා අහක බලාගෙන හිටියා. ලාෆ් සමාගම අහක බලාගෙන හිටියා. කැබිනට් මණ්ඩලයත් අහක බලාගෙන හිටියා. දැන් ජීවිත අහිමි වෙලා තියෙනවා. අපි දෙන්නා සාකච්ඡා කරන මේ මොහොතේ ගෙවල් ගිනිගන්නවා. මිනිස්සු අබ්බගාත වෙලා. කෝටි ගණන් මුදල් නැති වෙලා තියෙනවා. මිනිස්සු ගෑස් පෝලිම්වල තවම දුක් විඳිනවා. මිනිස්සු රුපියල් 2,800ක් දීලා ගේන ගෑස් සිලින්ඩරය ගෙදර ගෙනත් පත්තු කරන්නෙ හිතේ ගින්නෙන්. තේ එකක් රත් කරගෙන බොන්න බැරි රටක් මේ.

**ගෑස් අර්බුදය ගැන ඔබේ පක්ෂය කළ පැමිණිල්ල ගැන සොයා බලන්න පසුගියදා ඔබත්, සජබ මන්ත්‍රීවරු දෙදෙනෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගියා. මොකද එතැනදී ඇත්තටම සිද්ධ වුණේ?**

ඔව්. අපි පැමිණිල්ල ඉදිරිපත් කරලා මාසෙකට වැඩියි. ඒ හින්දා නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගියා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කියනවා නීතිපතිට ලියුමක් යැව්වා එහෙන් තවම පිළිතුරු නෑ කියලා. පොලිස්පතිතුමාට අපි දැනුම් දුන්නා. තවම ක්‍රියාමාර්ග ගැන දැනුම් දීලා නෑ. ලිට්රෝ සමාගමට අපි ලිපියක් යොමු කළා කටඋත්තර දෙන්න කියලා. ලිට්රෝ සමාගමත් කට උත්තර දෙන්නෙ නෑ.

**සියලු පාර්ශ්ව මඟ හරින්න හේතුව මොකක්ද?**

ඉතා පැහැදිලියි ගෑස් අර්බුදයට දේශපාලන අතපෙවීමක් තියෙනවා. ඒ හින්දායි ඔක්කොම මඟ හරින්නෙ. ලිට්රෝ ගෑස් සමාගම කිව්වා රතු පාට ස්ටිකර් එක ගහලා ප්‍රමිති ආයතනයෙන් ප්‍රමිතිය තහවුරු කරන එකත් එක්ක ගෑස් පුපුරන්නෙ නෑ කියලා. ප්‍රමිති ආයතනය තහවුරු කරන ගෑස් ටැංකිත් පුපුරනවා. වගකියන්නෙ කවුද එතකොට. ලිට්රෝ සමාගමේ සභාපතිට ක්‍රියාමාර්ග නොගෙන ඔහුව ආරක්ෂා කරනවා. ගෑස් සපයන

> **ගෝඨාභයට ජාතික ආරක්ෂාව තියා කුස්සියේ ආරක්ෂාවවත් රැකගන්න බැරි වෙලා**

> **රුපියල් 5000න් ජීවිතේ ගැටගහ ගන්න පුළුවන්ද?**

ආයතනය තියෙනවා. ඒ ආයතන ගෑස් ප්‍රමිතිය ගැන පරීක්ෂා කරනවා කියලා අපිට පේන්නත් නෑ. ප්‍රොපේන්, බියුටේන් සංයුතිය වෙනස් කළා කියලා ජනාධිපති කමිටු වාර්තාවෙන් තහවුරු වෙද්දී ලිට්රෝ සමාගම ඒක පිළිගත්තෙ නෑ. ඒ සංයුතිය වෙනස් කළේ ඕමාන්වලින් ගෑස් ගේන සමාගමද, ලිට්රෝ සමාගමද?

**ඕමාන් සමාගම සමඟ ගිවිසුම්ගත වුණේ ඔබලාගේ ආණ්ඩුව සමයේ නේද?**

ඔව්.

**එහෙනම් යහපාලන ආණ්ඩුව සමයේ වූ ගනුදෙනු ගැන ඔබලාත් වගකිවයුතු පාර්ශ්වයක් විය හැකියි නේද?**

වෙන්න පුළුවන්. ඒ ගැනත් පරීක්ෂණ කළ යුතුයි. හැබැයි අපි වගකිවයුතු නෑ. අත යටින් ගනුදෙනුවක් වෙලා තියෙනවා නම් ඒක සෙවීමේ වගකීම මේ ආණ්ඩුවට තියෙනවා. මම ඔබ කියන එක පිළිගන්නවා. ගෑස් අලෙවිය හා බෙදා හැරීම හා Purchasing කරන්නේ අවුරුද්දකට සැරයක්. හැම අවුරුද්දකටම සැරයක් ටෙන්ඩර් පටිපාටියක් ඔස්සේ ගෑස් මිලදී ගැනීම් සිදු වෙනවා. හැබැයි මෙතැනදී සිදුවුණේ ඒක නෙමෙයි. අපේ රජය තුළ මේක අවුරුදු දෙකකට ටෙන්ඩර් දිගු වුණා. මේ වර්තමාන රජය බලයට ඇවිල්ලා ඕමාන් ගෑස් සැපයුම්කාර කොම්පැනි එකෙන් credit line එකක් ගත්තා මිලියන 35ක. ඒ ටෙන්ඩර් එක ඉවර වෙනවා මේ පෙබරවාරි. අපි කියන්නේ මේ පිළිබඳව ඇයි පරීක්ෂණයක් සිදු නොවෙන්නෙ.

**මේ පෙබරවාරි අහෝසි වන ටෙන්ඩරයට නව ටෙන්ඩර් කැඳවීමක් සිදුකර නෑ නේද?**

නෑ. පෙබරවාරිවල ටෙන්ඩරය කැඳවන්න ඕනේ. ඒ ගැන සාකච්ඡාවක් නෑ. ප්‍රශ්නේ තියෙන්නේ රටේ ඩොලර් නෑ. ඩොලර් නැති වුණාම credit line එකක් තියෙන සමාගමකින් ගන්නවද නව සමාගමකට දෙනවාද. මේ ගෑස් ඇවිල්ලා තියෙන්නෙ මාලදිවයිනෙන්. මාලදිවයිනට කොහෙන්ද ගෑස් ආවෙ. ඒ ගැන පරීක්ෂණයක් කරලා තියෙනවද, එතකොට ප්‍රශ්න දෙකක් තියෙනවා. එක සැපයීම. ඒ තමයි ලංකාවට ගෑස් ගෙන්නන අය. ඒ ගැන පරීක්ෂණයක් වෙලා නෑ. දෙක බෙදාහැරීම. ලිට්රෝ හා ලාෆ්. මේ අය

> **සතොසට ගෙනිච්ච බඩු තුන්වැනි පාර්ශ්වයකට විකුණලා**

> **මිනිසුන්ගේ ඇත්ත ප්‍රශ්නවලට මැදිහත් වෙන්නේ සජිත් විතරයි**

> **මෛත්‍රීගේ තියෙන්නේ ඩීල් එකක්**

මේ සංයුතිය වෙනස් කළාද. ඒ ගැන තවම අපක්ෂපාතී පරීක්ෂණයක් වෙලා නෑ. පරීක්ෂණ සිදු නොවන්නේ ඇයි? දේශපාලන අත ගැසීමක් පෙලඹවීම් තියෙනවා කියලා අපිට අදහසක් තියෙනවා.

> **ගෑස් ප්‍රශ්නය දේශපාලන අතපෙවීමක්**

**ඔබ කියන්නේ දේශපාලන බල අධිකාරියක් විසින් ලිට්රෝ සමාගමේ සභාපතිවරයා හැසිරවීමක් කරන බවද?**

වෙන්න පුළුවන්. 2021 මැයි 5දා පාරිභෝගික අධිකාරිය විසින් අමාත්‍යවරුන් දෙදෙනාම දැනුවත් කරනවා LPG රෙගියුලේටර්වල තියෙන වටිනාකම ගැන. 10 නැවත මතක් කිරීමක් කරනවා. නීතිපතිවරයාටත් දැනුම්දී තියෙනවා. එතකොට මේගොල්ලෝ මේ ප්‍රශ්නෙ දැනගෙන හිටියෙ අප්‍රේල් ඉඳලා. මේගොල්ලො ගෑස් කිලෝග්‍රෑම්වලින් ලීටර් බවට පත් කළානෙ. එසේ කරන කොට තමයි සංයුතිය වෙනස් වුණා කියලා මේගොල්ලෝ දැනුම් දෙන්නේ. අපි අහන ප්‍රශ්නය තමයි මේ සංයුතිය වෙනස් කළා නම් අපිට ප්‍රමිතිය සහිත ගෑස් ලැබුණද. ඒ ගෑස් ආනයනය කරපු සමාගම එක්ක පරීක්ෂණයක් සිදු වුණාද, ලිට්රෝ සහ ලාෆ් සමාගමේ ප්‍රමිතිය සහිත ගෑස් සිලින්ඩර අපිට ලැබුණද, මේ පරීක්ෂණ ටික සිදු වෙන්නේ නෑ. ඔතන තමයි ප්‍රශ්නය.

මේ ගෑස් සම්බන්ධයෙන් නීතිපතිවරයා හමුවන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මොකද එතුමගෙ පැත්තෙන් තවම උත්තරයක් ලැබිලා නෑ. ඇමැතිලා දෙන්නා බෝල පාස් කර කර ඉන්නවා. හරි නම් ලිට්රෝ සමාගමේ සභාපතිගේ වැඩ තහනම් කරන්න ඕනෑ. බන්දුල - අලගියවන්න ඇමැතිලා දෙදෙනා ඉල්ලා අස්වෙන්න ඕනේ. මේ පුද්ගලයන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක විය යුතුයි.

නීතියට අනුව අවුරුදු පහෙන් පහට සිලින්ඩර වෙනස් කරන්න ඕන.

**සුදුලූනු වංචාවට එරෙහිව බන්දුල ගුණවර්ධන ඇමැතිට චෝදනාවක් එල්ල වුණා. ඒ වගේම ඔබ කියන්නේ ගෑස් අර්බුදය සම්බන්ධයෙන් ඔබ සෘජුවම බන්දුල ගුණවර්ධන ඇමැතිට චෝදනාව එල්ල කරනවද?**

ඔහුට එරෙහිව ලොකු ප්‍රශ්නයක් තියෙනවනෙ. ඔය ලාෆ් ගෑස් සමාගමේ සභාපති බන්දුල ගුණවර්ධන මහතාගේ ගුණවර්ධන පදනමේ අධ්‍යක්ෂ කෙනෙක් හැටියට ඉන්නවා.

අපි අනිවාර්යයෙන්ම සජබ ආණ්ඩුවක් බිහි කරනවා. ඒ ආණ්ඩුව තුළ මේ ඇමැතිවරුන්ට විරුද්ධව මේ නිලධාරීන්ට විරුද්ධව මේ සමාගම්වල ඉන්න උසස් පුද්ගලයන්ට විරුද්ධව දැඩි නීති ක්‍රියාත්මක කරනවා විතරක් නෙමෙයි මේ පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කරලා මෙයට දඬුවම් දෙන්නත් කටයුතු කරනවා.

**මේ අර්බුදයේදී සියලු ගෑස් සිලින්ඩර එක් කර නියාමනයක් අවශ්‍යයි කියලා කිව්වා. ඒ ගැන මොකද ඔබට හිතෙන්නේ?**

ඒක සම්පූර්ණයෙන්ම උසාවියට අපහාස කිරීමක්. උසාවිය අපහසුතාවයට පත් කිරීමක් තමයි ලිට්රෝ සහ ලාෆ් ගෑස් සමාගම කරන්නේ. අභියාචනාධිකරණයෙන් නියෝග දුන්නා සියලුම ගෑස් සිලින්ඩර නැවත ආයතනයට එකතු කරන්න කියලා. මාධ්‍ය හරහා පෙන්නුවා ලිට්රෝ සමාගම ඒ සිලින්ඩර භාරගන්නෙ නෑ කියලා. මිනිස්සු භාර දුන්නත් ඒ ගොල්ල භාර ගන්නේ නෑ කියලා. මිනිස්සුන්ගෙ සල්ලි දෙන්නෙ ගෑස් කාන්දු වූ ප්‍රමාණය මැනලා. කොච්චර අසාධාරණද, මම ජනතාවගෙන් ඉල්ලනවා පැහැදිලිවම මේ ගැන අවබෝධයක් ගන්න. මිනිස්සුන්ගෙ සල්ලි හොරකම් කරලා, මිනිස්සුන්ගෙන් හොරා කාලා, ජීවිත දේපොළ විනාශ කරලා මේ මැති ඇමැතිවරු, මේ නිලධාරීන් කරපු විනාශයට එරෙහිව වහාම ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න. මානව හිමිකම් කොමිසමට යන්න. ඊළඟ මැතිවරණයේදී මේ අය ගෙදර යවන්නත් කියලා මං ජනතාවගෙන් ඉල්ලනවා.

**අපි දේශපාලනය ගැන කතා නොකර මිනිස් ජීවිත වෙනුවෙන් නේද මේ මොහොතෙ පෙරට ආ යුත්තේ?**

අපි ඉල්ලීමක් කරලා තියෙනවා ගෑස් ප්‍රශ්නය වෙනුවෙන් දින දෙකක පාර්ලිමේන්තු විවාදයක්. කල් තැබීමේ යෝජනාවක්. ඒක මම ඉදිරිපත් කරන්නෙ. පක්ෂ මහ ලේකම් ඊට අවසර දුන්නා.

> **තේ එකක් රත්කරගෙන බොන්න බැරි රටක් මේක**

**පාර්ලිමේන්තුව කල් දැමීමත් සමඟ සියලු කාරක සභා අහෝසි වී තිබෙනවා. එතකොට ලිට්රෝ සම්බන්ධ ප්‍රශ්නයත් නැවත අලුතින් පටන් ගන්න සිදුවෙනවා නේද?**

ගෑස් පරීක්ෂණ යට ගහන්න තමයි මේ පරිසරය නිර්මාණය කරමින් පවතින්නේ. වෙන මොකුත් නෙමෙයි.

මේක මහා වංචාවක්.

**ආණ්ඩුව තුළ විශාල අර්බුදයක්, පිපිරීමක් පෙනෙන්න තියෙනවා. සමහර ඇමැතිවරු ඉවත් කරනවා. නිලධාරීන්, සභාපතිලා ඉවත් කරනවා. ඔබට කොහොමද මේක දැනෙන්නේ?**

මේ බල්ලා මැරෙන්න යනකොට මැක්කො හැලෙනවා වගේ. ආණ්ඩුවෙන් ඉවත් වෙන්න ඉන්න ඇමැතිවරු මන්ත්‍රීවරු මට කතා කරලා කියනවා මන්ත්‍රීතුමා මේකෙන් ගොඩ ඒමක් නෑ මිනිස්සුන්ට රත්තරන් බෙදුවත් මිනිස්සු අපිට ඡන්දෙ දෙන්නෙ නෑ කියලා. සජබ ගෙනියන මේ වැඩේට සහාය දෙනවා කියලත් ඔවුන් කියනවා.

**ආණ්ඩුවෙන් ඉවත් කළ අය එක් කරගන්න සූදානම්ද?**

මේ රටේ ප්‍රධාන විපක්ෂය පක්ෂය සජබ. ඡන්දෙ ලක්ෂ පනස්අටක් තියෙන්නෙ අපිට. එහි නායකයා සජිත් ප්‍රේමදාස. හොඳ දේශපාලන අනාගතයක් ගැන එතුමා කල්පනා කරනවා. රට ගැන කල්පනා කරනවා. වෙන විකල්පයක් නෑ. ඒ හින්දා ඒ ඉවත් වන අයට සජබ තෝරා ගැනීම හැර වෙන විකල්පයක් නෑ.

**ශ්‍රීලනිපයෙ මහ ලේකම් ධුරය පවා දැරූ**

> **ශ්‍රී ල.නි.ප.ය කියන්නේ බැන බැන ආණ්ඩුවට අත උස්සන කණ්ඩායමක්**

> **ඕමාන් ගෑස් ගිවිසුම ගැන පරීක්ෂණයක් කළ යුතුයි**

**සුසිල් ප්‍රේමජයන්ත් වැනි පුද්ගලයෙක් ඔබලා සමඟ එක් වෙයි කියලා ඔබ හිතනවද?**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ අදටත් ආණ්ඩු පක්ෂයේ ඉඳන් ආණ්ඩුවට බැන බැන ආණ්ඩුවට අත උස්සන කණ්ඩායමක්. අය-වැයට අත ඉස්සුවා. 20ට අත ඉස්සුවා. පෝර්ට් සිටියට අත ඉස්සුවා. මොනවටද ශ්‍රීලනිපය අත ඉස්සුවෙ නැත්තෙ ඒ නිසා සැබෑ විපක්ෂය අපි.

**ඔබ හිතනවාද ඉදිරියේදී ඉවත් වෙච්ච අය සමඟ සාකච්ඡා කරන්න?**

ඔවුන් සමඟ විතරක් නෙමෙයි ආණ්ඩුවෙ අයත් එක්කත් සාකච්ඡා කරනවා.

> **සජබ ආණ්ඩුවක් යටතේ මේ ඇමැතිලාට, නිලධාරීන්ට දැඩි නීති ක්‍රියාත්මක කරනවා**

**රහස් සාකච්ඡා?**

ඔව්. රහස් සාකච්ඡා කරනවා. නමුත් සජිත් ප්‍රේමදාස මහතා මේ රටේ දේශපාලනයට අවශ්‍ය කරන පුද්ගලයන් පමණයි, එතුමා තෝරා පත් කර ගන්නේ. එතුමන් කියලා නෑ කවුද ගන්නෙ කවුද නොගන්නෙ කියලා.

**සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකයා කිව්වා අපි කවදාවත් දූෂිතයෝ ගන්නෙ නැහැ කියලා. ඔබේ හෘද සාක්ෂියට එකඟව කියන්න පුළුවන්ද ඔබේ කඳවුරේ දූෂිතයෝ කිසිවෙක් නෑ කියලා?**

අපේ කඳවුරේ දූෂිතයෝ ඉන්න බෑ කියලා කියන්නේ නෑ. ඉන්න පුළුවන්. හැබැයි එකක් තියෙන්නේ අපේ නායකයා දූෂිතයෙක් නෙමෙයි. අපේ නායකයා අදූෂිත නිසා දූෂිතයන්ට ඔහු එක්ක ගනුදෙනු කරන්න බෑ. සජිත් ප්‍රේමදාස මහතාගේ හොඳ හැකියාව, දක්ෂතාවය එතුමාගෙන් පෙන්වා තිබෙනවා. සජිත් ප්‍රේමදාස මහතා අද තනියෙන් විපක්ෂයක් ගොඩනැඟුවේ. මහින්ද රාජපක්ෂ මහතාට බැසිල් මහත්තයා හිටියා. නාමල් මහත්තයා හිටියා. ගෝඨාභය මහත්තයා හිටියා. තනියෙන් ගොඩනඟපු පක්ෂයක ජන නායකයෙක් සජිත් කියන්නේ. විපක්ෂ නායකකම තනියෙන් ගත්ත පුද්ගලයෙක්. ඊට වඩා මොකක්ද ඕනේ.

**මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයා මේ රටේ යම් පෙරළියක් කරපු පුද්ගලයෙක්. ඔහු මේ වන විට ආණ්ඩුවට එරෙහිව විවිධ චෝදනා එල්ල කරනවා?**

මෛත්‍රීපාල මහත්තයාගෙ තියෙන්නෙ ඩීල් එකක්. එතුමා දන්නවා පාස්කු විමර්ශන කොමිසම කියලා තියෙන දේවල්. මෛත්‍රීපාල සිරිසේනට, නිලන්ත ජයවර්ධනට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා කොමිසමේ වාර්තාවෙ තියෙන බව ඔහු දන්නවා. ආණ්ඩුවට මුක්කු ගහගෙන ඉන්න කොට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නෑ. ඒක එළියෙ ඉඳන් බලන් ඉන්න මට පැහැදිලිව පේනවා. මෛත්‍රීපාල සිරිසේන මහතා ආණ්ඩුවට මුක්කු ගහගෙන ඉඳලා ආණ්ඩුව දුර්වල වෙලා වැටෙන මොහොත වෙද්දි ආණ්ඩුවෙන් අයින් වෙනවා. එතකොට රටම විනාශ වෙලා ඉවරයි. මේ විනාශයේ වගඋත්තරකරුවෙක් තමයි මෛත්‍රීපාල සිරිසේන. රටට තියෙන ආදරේට නෙමෙයි ආණ්ඩුව ඔහු විවේචන කරන්නෙ. තමුන්ට යම් අගතියක් වෙයි කියලා. රටේ මිනිස්සුත් ආණ්ඩුවට විරුද්ධ වුණාම ආණ්ඩුවට දොස් කියනවා.

**ඔබ හිතනවද මෛත්‍රීපාල සිරිසේන මහතාට යම් කඳවුරක් ගොඩනැඟිය හැකියි කියලා?**

කඳවුරු කාටද හදන්න බැරි. හැබැයි බැරි එක දෙයයි. ඒ දිනන්න. දිනන්න පුළුවන් සජිත් ප්‍රේමදාස මහතාට විතරයි. මොකද සජිත් ප්‍රේමදාස මහතා විපක්ෂ තහවුරු කරල තියෙන්නෙ. අද මිනිසුන්ගේ ඇත්ත ප්‍රශ්නවලට කවුද මැදිහත් වෙන්නේ, සජිත් ප්‍රේමදාස.

**ආණ්ඩුවක් මෙපමණ විවේචන අපි මීට පෙර දැකලා නැහැ. මේ වගේ විරෝධතා එද්දී පැහැදිලිව පේනවා ඊළඟට බලයට එන්නේ කවුද කියලා. හැබැයි අපිට තවම ඒක පේන්න නෑ**

මොකෝ ඔබතුමිය අංජනම් බලනවද.

නමුත් මිනිස්සුන්ට දැනෙනවා ඊළඟට පත් කළ යුත්තේ කවුද කියලා?

2015 මෛත්‍රීපාල සිරිසේන මහතා එයි කියලා දැනුණද? නෑනෙ. ජනවාරි 9දා උදේ නැඟිටලා පත්තර බලනකොට තමයි එතුමත් දන්නෙ එතුමා ජනාධිපති කියලා.

> **දූෂිතයන්ට අපේ නායකයා සමඟ ගනුදෙනු කරන්න බෑ**

**මේ වගේ වෙලාවක පක්ෂ සමඟිය ඉතා වැදගත්. නමුත් සමගි ජන බලවේගයේ යම් අසමඟිකම් අපි දකිනවා. උදාහරණයක් විදියට හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා එහෙම මේ වෙනකොට එළියට එන්නේ නෑ, මොකක්ද එකට හේතුව?**

එතුමාගේ සෞඛ්‍යය තත්ත්වය ඒතරම් හොඳ නෑ. ඒ හින්දා වෙන්න ඕනෑ.

**ඒ වගේම මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ අය-වැයේදී නොදුන් සහන අය-වැය සහන ලෙස දැන් දෙමින් තියෙනවා. අපේ රටේ ජනතාව යම් යම් දේවල් ලබාගැනීමේදී ඡන්ද භාවිත වෙනස් කරපු අවස්ථා දිගටම දැකලා තියෙනවා. ඔබ හිතනවද මේ වගේ දැන් තියෙන විරෝධය ඡන්දයක් කිට්ටු වෙනකන් තියෙයි කියලා?**

මං හිතන්නේ නෑ අපේ රටේ ජනතාව විවිධ අල්ලස්වලට තවදුරටත් යට වෙයි කියලා. බහුතරයක් ජනතාව අද යථාර්ථය තේරුම් අරගෙන තියෙනවා. එහෙම නම් අපි 2017දී තිබූ පළාත් පාලන මැතිවරණය අපි දිනන්න එපැයි. රුපියල් දහදාහක් වැඩි කළා, සමෘද්ධි දෙගුණයක් කළා. පෝෂණ මල්ල දුන්නා. රුපියල් ලක්ෂ පහේ වැඩසටහන ගමට ගෙනාවා. ඒත් අපි පළාත් පාලන පැරදුණානේ. මහින්ද රාජපක්ෂ මහතා 2015දී සිල් රෙදි බෙදලා දිනන්න බැරි වුණානේ. මොනාද ඒගොල්ලො නොබෙදුවෙ එදා. මෛත්‍රීපාල සිරිසේන මහතායි රනිල් වික්‍රමසිංහ මහත්තයයි දෙන්නා මේ රටේ හොරුන්ට දඩුවම් දෙයි කියලා පත් කළා. නමුත් දඩුවම් දුන්නේ නෑ. 2019 ගෝඨාභය රාජපක්ෂ මහතාට ඡන්දය දුන්නේත් හොරුන්ට හොරකම් කරන්න දෙන්නෙ නෑ ජාතික ආරක්ෂාව තහවුරු කරයි කියලා. අද ජාතික ආරක්ෂාව තියා කුස්සි ආරක්ෂාව තහවුරු කරන්න බැරි වෙලා තියෙනවා ගෝඨාභය රාජපක්ෂ මහතාට.

**පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ඔබ විශාල සටනක් කළා. එහි විමර්ශන කටයුතු ගැන මොකද හිතෙන්නෙ?**

සම්පූර්ණයෙන් පාස්කු විමර්ශන අඩපණ වෙලා. මේක මන්දගාමී විදිහට ගෙනියමින් තියෙනවා. එදා ජනාධිපතිවරයා ඡන්දෙ ගද්දි තිබුණ උද්‍යෝගය අද කෝ. පාස්කු ප්‍රහාරයෙන් පීඩාවට පත් ජනතාව තමයි මේගොල්ලෝ එදා උකසට තිබ්බේ. අද පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට ලක්වූ ජනතාවත් අමතක කරලා. අද වෛද්‍ය සාෆි, නැගෙනහිර විශ්වවිද්‍යාල, වඳ කොත්තු කෝ අද. ඔක්කොම පැත්තකින් තියලා. මේ ඔක්කොම පුස්සක් බවට පත් කරලා. කරපු මේ රැවටීමට නම් මේ ආණ්ඩුවට වැඩිකල් යන්න බෑ.

**ඔබ ඇතුළු මන්ත්‍රීවරුන් කිහිප දෙනා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා මේක යම්කිසි කණ්ඩායමක් බලයට එන්න කරපු ප්‍රහාරයක්ද කියලා. ඇයි මේක සෘජුවම එළියෙ කියන්නේ නැත්තේ?**

මේ ආණ්ඩුවට වගකීම තියෙනවා මේ ප්‍රහාරයට සම්බන්ධ අය නීතිය ඉදිරියට ගේන්න. එහෙම නීතිය ඉදිරියට ගේන්නෙ නෑ කියන්නේ චූදිතයන් ආරක්ෂා කරනවා කියන එක එහෙම ආරක්ෂා කරනවා කියන්නේ යම් ආකාරයකින් ඔවුන් සම්බන්ධ අයද කියලා සැකයක් මතු වෙනවා. මේවා අපි ඕනෑම වේදිකාවක කියන්න සූදානම්.

■ සංවාදය - අනුරාධා හේරත්

# මව්බිම නෙළුම්විල

නෙළුම් සුවඳය. එහෙත් පිපෙන්නේ මඩෙහිය. සත්පුරුෂයන්ද එබඳුය. සමාජය නමැති මඩෙන් මතුවන ඔවුහු මිනිස්කම නමැති සුවඳින් ලෝකය සුවඳවත් කරන්නෝය.

නෙළුම්විල සැකසෙන්නේ එබඳු උතුම් මිනිසුන් පිළිබඳ සත්‍ය කතාවලිනි. මෙය ඔබට විවෘතය, තැපැල් මඟින් ඔබ එවන කතා ප්‍රතිනිර්මාණය වී එහි පළවනු ඇත. ඔබ කැමැති නම් පමණක් ඔබේ නම, ගම පළවනු ඇත. ඔබට අවශ්‍ය නම් ඔබේ අනන්‍යතාව සඟවා සිටිය හැකිය. එහෙත් ඔබ එවන ආවරණ ලිපියේ ඔබේ නම, ගම, දුරකථන අංකය ලියා එවිය යුතුය.

ලිපිනය -
'මව්බිම' නෙළුම්විල
ඉරිදා මව්බිම කර්තෘ මණ්ඩලය
අංක 101, රොස්මිඩ් පෙදෙස
කොළඹ 07.

ගුණසිංහ හෙට්ටිආරච්චි

## "ආදරණීය අප්පච්චි"

ඒ අපේ සීයාය. ඔහු නව දෙනකුගෙන් යුත් පවුලක වැඩිමලා විය. සීයලා බාල කාලයේ පියා මියගිය බැවින් තම බාල සහෝදර සහෝදරියන්ට පියා වී ඇත්තේ සීයාය. ඒ හැමදෙනාම සීයා ඇමැතුවේ 'අප්පච්චි' කියාය.

පවුලේ බර කරට ගෙන නංගිලා මල්ලිලාගේ ආවාහ - විවාහ කටයුතුද නිසි කලට කරදී ඉඩම් කොටස්ද සාධාරණව බෙදා දීමෙන් පවා නොනැවතී අහිංසක නෑදෑයන්ගේ දරුවන්ද ගෙදර නවත්වාගෙන උගන්වා ඔවුන්ගේ ආවාහ - විවාහ කටයුතුද කරදුන් අපේ සීයා ඒ හැමෝගේම 'ආදරණීය අප්පච්චි' වීම අරුමයක් නොවේ.

සීයාට රබර් ඉඩමක් තිබිණි. රබර් ෂීට් විකුණන්නට නගරයට ගිය සීයා ආපසු ආවේ අපට රසකැවිලි, පලතුරු මෙන්ම සෙල්ලම් බඩුද රැගෙනය. අපට දී ඉතිරි වූ දේවල් ඔහු අවට පොඩි උන් අතරද බෙදා දුන්නේය.

සීයාගේ සහෝදරියක් මුදල් හදිස්සියකට ඉඩම උකස්කර ඇති වග සීයා දැනගත්තේ උකස සින්න වීමට තිබියදීය. සීයා මුදල ගෙවා උකස බේරා දුන්නේය. මාස ගණනාවකට පසු අදාළ මුදල සොයාගත් සොහොයුරිය එය ආපසු ගෙවන්නට සීයා සොයා ආවාය.

"මම ණයට සල්ලි දුන්නේ නෑනේ. ඔන්න ඕක තියාගෙන ලොකු කෙල්ලගෙන් නිදහස් වෙන්න බලපන්!" සීයාගේ ඒ උත්තරය හමුවේ සොහොයුරියගේ දෑස ළෙන්ගතු කඳුළකින් පිරී ගියේය.

සීයා සිය ගෙමිදුලේ මල් සිටුවා තිබුණේය. ඒ විශාල මිදුලේ පිච්ච ජාති, ඇට්ටේරියා, බංගලි රෝස ආදිය පිපී තිබූ හැටි මට මතකය. ගෙදරට ආ කාටත් හොඳින් සැලකූ සීයා මිදුලට කෙළ ගැසීම නම් නොරිස්සුවේය.

"මිදුලේ කෙළ ගැසීම් තහනම්" යනුවෙන් කාටත් පෙනෙන්නට දැන්වීමක් ලියා තැබූ ඔහු පඩික්කම් දෙකක්ද තැබුවේය.

සීයා සෑම පසළොස්වක පෝයකටම සිල් සමාදන් විය. අපද ඔහු හා සිල් සමාදන් වීමට යා යුතු විය. ඔහු පෝයට පෙර දින දානයට පලතුරු, කිරිපැණි වැනි දේවල් ගෙනැවිත් තැබුවේ ඒ කාලයේ සිල් ගත් අයට අද කාලයේ මෙන් පන්සලේදී දානය නොලැබුණු බැවිනි.

අප කුඩා කාලයේ පන්සලේ ධර්ම ශාලාවක් නොවීය. අප බණ ඇසුවේ පොල් අතු මඩුවකය. දැන් පන්සලේ ඇති සුවිසල් ධර්ම ශාලාව තැනුණේ සීයලාගේ ධනයෙන් සහ ශ්‍රමයෙනි.

එකල ගම්මු බොහොමයක් හොල්මන්ද, යකුන්ද විශ්වාස කළහ. සිත සසල වී ලෙඩ වූහ. සීයා ශාන්තිකර්ම කර ඔවුන් සුවපත් කළේය. සුවය ලැබූ ඔවුන් සීයා හමුවීමට ආවේ ගෙදර වත්තේ හැදුණු පලදාවක්ද උස්සාගෙනය.

"පුංචි අෑයින්ට කන්න තිබිච්ච දේ මොකට උස්සන් ආවැයි? මීට පස්සේ කිසි දෙයක් ගේන්න එපා!" එසේ කියන ඔහු ඔවුන් ආපසු පිටත් කර හරින්නේ හාල්, පොල් වැනි දෙයක්ද සමඟිනි.

ලෝක යුද්ධ කාලයේ ගෙදරට වුවමනා බඩු ගෙන ඒමට සීයා සැතපුම් ගණන් පයින් ගිය හැටි ආච්චිලා අපට කියා ඇත. කොළඹ සිටි සහෝදරියකගේ පවුලක් ගෙදරට ගෙන්වාගෙන සැලකූ සීයා ඔවුන් ආපසු පිටත් කරවා ඇත්තේ රට සන්සුන් වූ පසුය.

සීයාගේ බාල සහෝදරයෙක් මහණ වී සිටියේය. උන්වහන්සේ පිරිවෙනක්ද පවත්වාගෙන ගියහ. සීයා මසකට වරක් උන්වහන්සේ බැහැදැකීමට ගියේ අපද කැටුවය. මේ ගමනට තිරික්කල් කිහිපයක් යොදා ගැනිණි. හාල්, පැණි හකුරු, පිච්චූ කජු, වත්තෙන් ගලවා ගත් අල, බතල වැනි නොයෙක් දේ තිරික්කලවල පටවා තිබිණි. මසකට වරක් පිරිවෙනට ගිය මේ ගමන අපට විනෝද චාරිකාවක් මෙන් විය.

අපේ අම්මා සීයාගේ වැඩිමහලු දියණිය වූවාය. සීයාගේ පුත්තු දෙදෙනෙක් මහ ගේ කිට්ටුව පදිංචිව සිටියහ. සීයා කළේ ඈත ගමකට විවාහ කර දී සිටි අපේ අම්මාට මහ ගෙදරට කිට්ටුවෙන් ගෙයක් හදා දී අප පවුලම එහි පදිංචි කරවීමය.

වියපත් වෙමින් සිටි සීයාටත්, අත්තම්මාටත් හොඳින් සැලකීමට අපට අවස්ථාව ලැබුණේ ඒ නිසාය.

සීයා වයස අනූ ගණන්වලදී පවා බිම හිඳගෙන වත්ත පිටිය සුද්ධ කළ හැටි මට මතකය. අපේ සීයා සියක් ආයු ලැබීමට තරම් වාසනාවන්ත විය.

***අක්මීමණ, ඉහළගොඩ, දෙහිදුවේ එස්. කලංසූරිය මහත්මිය විසින් යොමු කරන ලද ලිපියක් ඇසුරෙනි.***

## සිසු හපන්කම්

රෑ දන්සල් නිසා, පාර අවහිර වී තිබුණෙන් අප රියට එක දිගට යා නොහැකි විය.

මොකක්දෝ එකකට රියෙන් බැස ගිය මා සොහොයුරා ටිකකින් යළි එහි නැඟුණේය.

"හරි වැඩේනෙ. මගෙ පර්ස් එක වැටිල!" ඔහු කලබලයෙන් කීවේය. අප ද තැවුලට පත්වූයේ ඔහුගේ ජාතික හැඳුනුම්පත, රියැදුරු බලපත මෙන්ම බැංකු කාඩ් පත්ද එහි වූ බැවිනුත්, ඒවා නැවත ලබාගැනීම සඳහා මහත් දුකක් විඳින්නට සිදුවන බව දන්නා බැවිනුත්ය.

මුදල් ටික ගෙන හිස් පසුම්බිය පාර අයිනකට විසිකර ඇද්දැයි අපට සැක සිතිණි. එබැවින් අපි විදුලි පන්දම අල්ල අල්ලා මඟ දෙපසද පිරික්සිමු.

ගෙදරින් ඇමැතුමක් ආවේ ඔය අතරය.

"ඔය ගොල්ලන්ගේ පර්ස් එකක් නැති වුණාද?"

"ඔව්"

"ඒක ඇහින්ද කෙනා කෝල් කරල කිව්ව ඒක ගන්න ජ'පුර කැම්පස් පාරෙන් හැරෙන පන්සල පාරෙ පන්සල ළඟට එන්න කියලා. කෝල් කෙරුවේ ජපුර කැම්පස් එකේ ඉගෙන ගන්න ළමයෙක්. පර්ස් එකේ ටෙලිෆෝන් නොම්මරේ තිබ්බෙ හොඳ වෙලාවට නේද?"

ඒ ඇමැතුමත් සමඟ අපේ හිත් අමාරුව පහව ගියේය. අපි ඒ කී තැනට ගියෙමු.

සරසවි සිසුන් දෙදෙනෙක් රිය ළඟට පැමිණ මුදල් පසුම්බිය අපට දුන්හ. එහි මුදල්ද, තිබූ සෙසු සියලු දේද එලෙසින්ම තිබිණ.

"පුතාලට බොහොම ස්තුතියි!" ලද අස්වැසිල්ල නිසාම අපි ඔවුනට මුදල් තෑග්ගක් දීමට හැදුවෙමු.

"එපා අංකල්" කී ඔවුහු අපෙන් සමුගත්හ.

ජ'පුර සරසවියේ මේ සිසුන් දෙදෙනා දුන් ආදර්ශය හරි අපූරුය.

මේ සිද්ධිය කිසිදා මට අමතක නොවේ. එපමණක් නොව ඊට පසු අවස්ථාවක අප මුහුණ දුන් මෙහි පහත කියැවෙන සිද්ධියද එසේ මා සිතින් බැහැර නොයන්නකි.

එදින අපි යාල්දේවි දුම්රියෙන් යාපනය බලා යමින් සිටියෙමු.

අප ගියේ කිලිනොච්චියේ පිහිටි ඉන්ජිනේරු පීඨයේ ඉගෙනුම ලබමින් සිටි අප දියණිය බැලීමටය.

දුම්රිය මැදිරියේ අපට ඉදිරි අසුනක වියපත් දෙමළ මවක්ද පියෙක්ද සිටියහ. රාක්කයක තිබූ විශාල බෑගයක් එකවරම පියාගේ හිස මත ඇද වැටුණේය. වියපත් පියා වේදනාවෙන් දැඟලුවේය.

කවුරුත් විමතියෙන් බලා සිටියදී ඈත අසුනක හිඳ සිටි සිංහල සිසුවියක් තම බෑගය හැර එහි වූ බෙහෙත් ටියුබය ද රැගෙන වේදනාවෙන් මිරිකෙමින් සිටි අර වියපත් පියා ළඟට ආවාය.

ඔහුගේ හිසෙහි බෙහෙත් ගැල්වූ ඇය හිස පිරිමදින්නට වූවාය. ටිකකින් වියපත් පියාට සහනයක් ලැබිණි.

මෙය අප කාටත් සතුට ගෙන දුන් කාරණයක් විය. වියපත් දෙමළ මව මේ සිසුවිය බදාගෙන සෙනෙහසින් ඇගේ හිස පිරිමැද්දාය. "ඔන්ද දුව! ඔන්ද දුව!

ඇය කැඩුණු සිංහල බසින් සිසුවියව පැසසුවාය.

යාපනය සරසවියේ වවුනියාව මණ්ඩපයේ අධ්‍යාපනය ලබමින් සිටි මේ සිසුවිය එහි යමින් සිටියේ සිය මවුපියන්ද සමඟිනි.

ඇය වවුනියාවෙන් බැසීමට පෙර මේ වියපත් දෙමළ යුවළගෙන්ද සමුගත්තාය. ඔවුන් ඇයට සමුදුන්නේ කඳුළු පිරී ගිය දෑසිනි. ඇය බැස ගත් පසුද මේ යුවළ දුම්රිය කඳුළුවෙන් ඈ දෙස බලා සිටියහ.

අප දියණිය අධ්‍යාපනය ලද කිලිනොච්චිය ඉන්ජිනේරු පීඨය ගැනද යමක් ලියනු වටී.

එය බොහෝ විශ්වවිද්‍යාලවලට වඩා වෙනස්ය. කථිකාචාර්යවරුන් සියලුදෙනා දෙමළය. මුළු අධ්‍යාපන කාලයටම නේවාසිකාගාර පහසුකම් ලැබේ. වර්ජන නැත. මුළු කාලයම ගත කෙරෙන්නේ ඉගෙනීම වෙනුවෙනි.

ඇතැම් සති අන්තවලදී කථිකාචාර්යවරු සිය කැමැත්තෙන්ම පැමිණ, සිසුන් රසායනාගාර පිරික්සුම්වලට යොමු කරති. එහි ඇති තාප හෝ සූර්ය බලාගාර විදුලිය බෙදාහැරෙන මධ්‍යස්ථාන, ආගමික ස්ථාන, දූපත් ආදියට කැඳවාගෙන යති.

එහි ඉන්ජිනේරු පීඨයේ දෙමළ, මුස්ලිම් සිසු බහුතරය හා සිංහල සිසු සුළුතරය පුදුමාකාර සහෝදර බැම්මකින් බැඳී සිටිති. නවක වධය හැටියට තිබුණේ සිංහල සිසුවියන්ද දෙමළ සිසුවියන් මෙන් පතුල දක්වාම දිගු ගවුම් ඇඳීමය. ඒවාද දෙමළ සිසුවියන් විසින් සපයන ලද බැවින් ගැටලුවක් නොවීය.

නිවාඩු දිනවලදී දෙමළ සිසුවියෝ සිංහල මිතුරියන් සිය නිවෙස්වලට කැඳවාගෙන ගොස් තම මවුපියන්ද සමඟ ප්‍රදේශයේ ඒ ඒ තැන් නැරඹීමට කැඳවාගෙන යති. ආහාර පානාදියෙන් සංග්‍රහ කරති.

මේ පවුල්වල විවාහ උත්සවවලට පවා සිංහල මිතුරියන් සහභාගි කරවා ගනිති. මේ සහජීවනය රටේ සිංහල බහුතරයේ ප්‍රසාදයට හේතු වනවා ඇත.

***බොරලැස්ගමුවේ, රත්තණපිටියේ, ගොවිකම් පෙදෙසේ සුනිල් ශාන්ත ජයකොඩි මහතා විසින් යොමු කරන ලද ලිපියක් ඇසුරෙනි.***

## සතුටක අසිරිය

වල්පිටමුල්ල වඩාත් කතාබහට ලක්වීමට පටන් ගත්තේ කලින් මාරපොළ තිබූ ප්‍රාථමික විදුහල එහි ගෙනගිය පසුය. තරමක හුදෙකලාවේ පසුවූ වල්පිටමුල්ලට මේ නිසා යෑම් - ඊම් බහුල විය.

ප්‍රධාන පාරෙන් උඩ පැත්තේ ප්‍රාථමිකය ඉදිවුණු පසු එතෙක් වැඩි අවධානයට හසු වී නොතිබූ පාරෙන් මෙපිට බිමේ කඩ පෙළක්ද හැදුණේය.

කඩ පෙළෙහි මුලින්ම ඇත්තේ පොත්හලෙකි. ඊට අල්ලපු කඩ කාමරය සුරතල් මසුන් අලෙවි කරන්නකි. ඊටත් අල්ලපු කාමරයේ ඇඹැරුම්හලකි. කෙළවර කඩ කාමරය විදුලි උපකරණ අලුත්වැඩියා කරන්නකි.

පොත්හල ඇරැඹුණේ අලුතෙනි. එහෙයින් වෙළෙඳාම සරුවන තෙක් එහි දිනපතා රැඳී සිටීමට මට සිදුවිය.

පොත්හල ඉදිරිපිටින් නිතර එහා - මෙහා ගිය බැළලියක් වූවාය. ඇය ඇඹැරුම්හලෙහි ඇති දැඩි කෙරෙන්නියක් විය. ඇය එහි සුරතල් වූ හැටි මා දැක තිබිණි. යාබද නිවෙසක ගෘහණියක්ද බැළලිය ගැන විපරමින් පසුවූවාය. කෑම බීමද ගෙනැවිත් දුන්නාය. කඩපෙළ හිමිකරුද ඇයට කිරි බීමට දෙනු මා දැක ඇත.

මෙවැනි සත්කාර ලැබීමට තරම් වාසනාවන්තියක වූ බැළලිය කුලුඳුලේ පැටවුන් හය දෙනකු බිහි කළාය. එහෙත් වැඩි දවසක් යන්නට පෙර ඒ හය දෙනාම මියගියහ.

ඉන් පසු ඇය පරණ පුරුදු විදියටම වෙළෙඳසල ඉදිරියෙන් එහා මෙහා යන්නට පටන් ගත්තාය. ඇය නැවතත් ගැබ්බරව ඇති බව අපට පෙනිණි. ඉන් පසු කවුරුත් ඇයට සත්කාර කරන්නට උනන්දු වූහ.

දෙවැනි මුරයේ ඇය පැටවුන් පස් දෙනකු බිහි කළාය. ඇයට රැකවරණ සැලසුණේ ඇඹරුම්හල පිටුපස කුටියකය. මසක් පමණ යනවිට පැටවි පස් දෙනා මව සමඟ සුරතල් වීමට පටන් ගත්හ.

දිනක් ඇඹැරුම්හලට ආ තරුණ යුවළක් මේ පූස් පැටවුන්ට වශී වූහ.

"අනේ අපිට එක පැටියෙක් දෙන්ඩ!" ඔවුහු කාරුණිකව ආයාචනාවක් කළහ.

පසුදා ඔවුන්ගේ ඉල්ලීම ඉටු විය.

ඒ පැටවා නැති වූ පසු බළල් මවගේ හැසිරීමේ ලොකු වෙනසක් දිස්විය. ඇය ඉවක් බවක් නැතිව ඒ පැටවා සොයන්නට වූවාය.

දෙදිනකට පසු එළැඹි ඊළඟ දිනයේ යුවළ ඇඹැරුම්හලට ආවේ දුක්ගැනවිල්ලක් කියමිනි.

"හරි වැඩේනේ වුණේ! මේ පූස් පැටියගේ වැඩේම අඬන එක. මෙයාගේ ඇඬිල්ල හින්දා අපිට රෑ දෙකක් නින්දක් නෑ. තරහ නැතුව මෙයාව ආපහු බාරගන්ඩ බැරිද?"

පැටවා සතුටින් ආපසු බාර ගැනිණි. මවගේ තුරුලට වැදුණු ඌ කිරි උරා බොන්නට වූවාය. මවද පැටවා ලෙවකන්නට පටන් ගත්තාය.

ඉන් පසු පැටවි කෙළිදෙළෙන් ගත කළහ. මවද දරු සෙනෙහස විඳිමින් ප්‍රබෝධයෙන් කල් යැව්වාය.

බළල් පවුලේ සතුට හා විනෝදය අපේ සතුටද විනෝදයද විය. අපට උන් විඳින සෙනෙහස දැනෙන්නාක් මෙන් විය.

ඒ ඒ වුවමනාකම් පස්සේ දුව ගිය බොහෝ මිනිස් පවුල්වල සතුට අහිමිව ගොසිනි. එහෙත් මූලික වුවමනාකම්වලින් පමණක් සෑහීමට පත්වන මේ බළල් පවුල උන් දකින සිසු දරුවන්ගේ සිත් පවා සතුටින් පුරවයි.

***වල්පිටමුල්ලේ, ලයනල් පීරිස් මහතා විසින් යොමු කරන ලද ලිපියක් ඇසුරෙනි.***



# ගෑස් පිපිරෙන අමන රටක භූමිතෙලෙන් උයන්න ගිහින් දැවී මැරෙන්නට වුණු සොයුරියන්ගේ විලාපය

**ගෙවුණු දෙසැම්බර් පළමුවැනිදාවේ මඩකළපුව පාලමුණේ වන්නියාර් පාරේ අංක 11 නිවසේ පදිංචිව සිටි කාදර් සායිබු පාතිමා සකියා වෙනදා මෙන්ම සැමියාට රාත්‍රි ආහාරය පිළියෙල කරන්නට සූදානම් වූවාය.**

සකසුරුවම් කළ ව්‍යාංජන බඳුන් ගෑස් ළිප මත තබා ළිප දැල්වීමට මෙතෙක් හුරුපුරුදු වී සිටි නමුත් තව දුරටත් එසේ කරන්නට පාතිමා බිය වූවාය. ගෑස් ළිප බෝම්බයක අනුරුවක් තරමට භයානක උපකරණයක් බව රටේ හතර වටෙන්ම ලැබෙන ආරංචි එයට හේතුව විය. පාතිමා ආහාර පිසින්නට තෝරාගෙන තිබුණේ භූමිතෙල් ළිපකි.

මාරයාට සැඟවී ඉන්නට හැකි පුපුරණ ගෑස් ළිප්වල පමණක් නොවේ. ඒ බව තහවුරු කරමින් දැල්වූ භූමිතෙල් ළිප පෙරළී ගවුමට ගිනි ඇවිළුණු විසි නව හැවිරිදි පාතිමා දැඩි පිළිස්සුම් තුවාල ලැබුවාය. ඇවිළුණු ගිනි නිවා ගැනීමට බිම පෙරළෙමින් සිටි ඇය බේරා ගන්නට නිවෙසේ සිටියේ ඇගේ කුඩා පුතු පමණි. දරුවා වතුර දමමින් ගින්න නිවන්නට වෙහෙසුණේ අම්මා බේරා ගැනීමේ අදිටනෙනි.

අනතුර සිදුවන විටදී තෙමස් ගැබිනියක් වූ ඇයව ගලවා ගන්නට වෙහෙසුණු එකම පුතු එකොළොස් හැවිරිදි දරුවකු විය.

මඩකළපුව රෝහලෙන් කොළඹ ජාතික රෝහල කරා රැගෙන ආ ඇය විසි එක් දිනකට පසු සිය ජීවිතය හැර ගියේ උද්ගතව ඇති අවාසනාවන්ත තත්ත්වයට ලඝු කොට ලියා තැබූ තවත් කඳුළු කතාන්දරයක් ඉතිරි කර තබමිනි.

පසුගිය දශක ගණනාවක් පුරා තාක්ෂණය සහ නවෝත්පාදන දියුණුවෙමින් මිනිස් ජීවිතය පහසු කරන නව මෙවලම් බිහිවිය. අතීතයට වඩා වර්තමානයේ වඩාත් සුවදායක ජීවිතයක් ගත කරන්නට මිනිස්සුන්ට අවශ්‍ය වටපිටාව සකස් විය. දෙවසරකට පෙර ලෝකයේ එක් කොනකින් ඇරඹුණු වසංගතයත් සමඟ සෑම රටකම ආර්ථිකයට වැදුණේ මරු පහරකි. දියුණු යැයි සම්මත රටවල්වලට ද තත්ත්වය වඩා අසීරු වන විට සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට ඒ පහර දරාගන්නට කිසිසේත්ම හැකි වූයේ නැත. අවසානයේ කිසි ලෙසකින්වත් බලාපොරොත්තු නොවූ ලෙස මිනිස් ජීවිත උඩු යටිකුරු වෙමින් තිබේ.

ආහාර වේල සකසා ගත යුතුම බැවින් පෝලිමේ සිට රැගෙන යන ගෑස් සිලින්ඩරය දෙස භීතිකාව පිරුණු දෑසකින් බලන මිනිසුන් ජීවත් වෙන්නේ නිරන්තර බියකින් පීඩිත වූ හදවතකිනි. කවුරුත් වෙනත් ආදේශක සොයන්නේ තවත් එක මොහොතක් හෝ ජීවත් වෙන්නට තිබෙන ආශාව හේතුවෙනි. එක් මාරයකුගෙන් ගැලවෙන්නට සිතා තෝරා ගන්නා මාර්ගයෙහි තවත් මරුවකු සැඟවී සිටීම තරම් ඛේදාන්තයක් තවත් නොවේ.

මරණයේ සෙවණැලි සෑම තැනකම සැඟවී තිබෙන කාලයක ජීවත් වීමට තරම් වර්තමාන මිනිසුන් අවාසනාවන්ත වී තිබේ. වසංගතයත් සමඟ නිමා වූ වසන්තය යළිත් ජීවිතවලට කැන්දාගෙන එන්නට; කොතැන හෝ වැරදුණු තැන් සකස් කර ගනිමින් යළිත් සුපුරුදු ජීවිතවලට අවතීර්ණ වන්නට ඉතා ඉක්මනින්ම මඟ පාදා ගත යුතුය. පුපුරා යන ගෑස් සිලින්ඩරයක් මෙන් මිනිස් ජීවිත මත තුළ සිරව ඇති පීඩනය පුපුරා යන්නට ඉඩ නොදිය යුතුය.

■ **දිල්රූ ජයසේකර**

17>> ඇත්තු 13ක්...

ඒ තරමටම හීලෑ ඇතින්නියක් තමයි මැණිකේ කියන්නේ. මැණිකේ අන්තිමට මිය ගිහින් තියෙන්නේ වර්තමානයේ නිග්‍රෝධාරාමයේ තියෙන පන්සල් බිමේ. මගේ අප්පච්චි හොඳ උගත් කෙනෙක්. වලව් එහෙමත් නැත්නම් රදල පරම්පරාව පවතින්නේ අධ්‍යාපනය එක්ක කියලා අප්පච්චි දැනගෙන හිටියා. ඒ නිසා අපි පස්දෙනාටම ඉතාමත් හොඳින් අධ්‍යාපනය ලබාගන්න අවස්ථාව ලබලා දුන්නා.

අප්පච්චි වෘත්තියෙන් තැපැල් ස්ථානාධිපතිවරයෙක්. උකුවෙල, නාවුල, කටුගස්තොට වගේ ප්‍රදේශවල තමයි අප්පච්චි සේවය කළේ. ඒ හැම අවස්ථාවකදීම අපිට කිව්වේ ඉගෙන ගත්තේ නැත්නම් අනාගතයක් නැහැ කියලා. ඉඩකඩම් තිබුණට ඒ ඉඩකඩම් පවත්වාගෙන යන්න අවශ්‍ය දැනුම සාමාජයෙන් ලබාගන්න ඕන කියන අදහසක් අප්පච්චි ළඟ තිබුණා. ඒ කාලේ ඇත් පන්තිය නාවන්නට හදපු වැව තවමත් එහෙමම තියෙනවා. විශාල සියඹලා ගහක් පාමුල තමයි ඒ වැව කෘත්‍රිමව හදලා තියෙන්නේ. පානබොක්ක වලව්ව, නුගවෙල වලව්ව කියන්නේ ළඟ සම්බන්ධයක් තිබුණු වලව් දෙකක්. නමුත් අද වෙද්දී මේ පරම්පරා දෙකේම සාමාජිකයෝ ඔවුනොවුන් හඳුනන්නේ නැහැ. පෙළක් අය විදේශගත වෙලා. අපේ පරම්පරාව මේ විධියට පවතින්නේ අපි අතර ඇති සහෝදරත්වය නිසයි. මේ මුළු ඉඩමම සමාන කොටස් පහකට බෙදලා අපි පදිංචිවෙලා සිටිනවා. බාලම මල්ලි ප්‍රියන්තට තමයි සොල්දර වලව්ව අයිති වුණේ. ඒක අපි පස්දෙනාගේම තීරණයක්. තාමත් පවුලේ සාමාජිකයෝ දානමාන කටයුතු සඳහා භාවිත කරන්නේ සොල්දර වලව්වේ පහළ කොටස. එය අදටත් විශාල ශාලාවක් ලෙසයි අපි පවත්වාගෙන යන්නේ. කාලයකදී මේ වලව්වට ලේකම් වලව්ව කිව්වා. තවත් කාලයකදී නඩුකාර වලව්ව කියලා කිව්වා. ඒ අපේ පරම්පරාවේ දෙවැනි හා තුන්වැනි මුල් පුරුක් නඩු ඇහැව්ව නිසා සහ ඉන්පසුව ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ පරිපාලන රාජකාරි සිදුකළ නිසා. මේ ඉතිහාස කතාව මේ තරම් සරල නැහැ. විශාල වලව් සංඛ්‍යාවක් එක්ක ආවාහ විවාහ සිදුකළ නිසා අපේ පරම්පරාව ලංකාව පුරා විහිදිලා ගිහින් හමාරයි. වලව්වේ කොටස් තුනක් තිබෙනවා. වී බිස්ස, සොල්දර වලව්ව, මුළුතැන්ගෙය ඒ කොටස් තුනට අයිතියි. ඊට අමතරව කරුංකා ගබඩා කරන්න, කොකෝවා වැනි මේ පැත්තට ආවේණික බවබෝග ගබඩා කරන්න හදපු ගබඩාවකුත් වලව්ව සතුයි. වී බිස්ස ඉදි කරලා තියෙන්නේ වී බුසල් 20-30ක් වුණත් ගබඩා කරන්න හැකි ආකාරයට. පොළොවත් එක්ක තියෙන සම්බන්ධය අහවර වුණාම වී කල්තබා ගන්න පුළුවන් යැයි අපේ පැරැන්නෝ විශ්වාස කරලා තිබෙනවා. විවිධ වී වර්ග ඒවාට ආවේණික ආකාරයෙන් ගබඩා කරන්න හැකි ආකාරයටයි වී බිස්ස ඉදි කරලා තියෙන්නේ. දැනට කුඹුරු අපි සතු වුණත් ඒවාගෙන් ලොකු ආදායමක් අපි බලාපොරොත්තු වන්නේ නැහැ. ඒත් වී බිස්ස ඉතාමත් හොඳින් නඩත්තු කරනවා. ඉදිරි පරම්පරාවටත් දැන කියා ගත හැකි වන ලෙස සොල්දර වලව්වේ පහළ කොටස ඒ ඒ වකවානුවලදී වලව්වේ හිමිකාරිත්වය දැරූ පිරිස් විසින් භාවිත කර තිබෙන්නේ ඔවුන්ගේ රාජකාරිමය කටයුතු සඳහා. ඒ රාජකාරිවලට අදාළ ව විශාල සේවක පිරිසක් වලව්වේ කටයුතුවලට සම්බන්ධ වී තිබෙනවා. ඉංග්‍රීසි පාලන යුගයේදී එම සේවකයන්ට දීමනාවක් ලබා දී තිබෙන්නේ රජයෙන්. වලව්වේ සොල්දර කොටස ඒ කාලයේ ඉඳලා ගන රෙදිවලට සුදු හුනු පිරියම් කළ කොටස්වලට වෙන් කර තිබෙනවා. අපි පස්දෙනා සඳහාත් වලව්වේ සොල්දර කොටස කාමරවලට වෙන් කළේ ඒ ආකාරයට. අපේ ඉදිරි පරම්පරාවට අවශ්‍ය විධියට මේ වෙද්දී වලව්වේ සොල්දර කොටසේ සැකැස්ම සැකසී තිබෙනවා.

මේ වලව්වේ විශේෂත්වය තමයි ලංකාවේ තිබෙන එකම සොල්දර වලව්ව වීම. වලව්ව ඉදි කර සියවසක් ගත වුණත් සොල්දර කොටස කිසිම දවසක ප්‍රතිසංස්කරණය කර නැහැ. ලංකාවේ තිබෙන හොඳම ලී වර්ග, බුරුමයෙන් ආනයනය කර ලී වර්ගය යොදාගෙන තමයි වලව්වේ සොල්දර කොටස සකසා තිබෙන්නේ. ඒ ආකාරයෙන් ගත්තම ලංකාවේ වලව් නාමාවලිය තුළ ඇති එකම සොල්දර වලව්ව මේ නුගවෙල වලව්ව."

එලෙස පවසා සිටින්නේ නුගවෙල වලව්වේ පස් වැනි පරම්පරාවේ නියෝජනය කරන සොල්දර වලව්වේ වලව් හිමියා ප්‍රියන්ත නුගපිටිය මහතාය. සිය සහෝදරයන් මැද්දෑවේ සොල්දර වලව්වේ වර්තමාන හිමිකාරීත්වය දරන ප්‍රියන්ත නුගපිටිය මේ වනවිට වෘත්තීයමය වැවිලිකරුවෙකි.

ආනන්ද නුගපිටිය එක් කාලසීමාවකදී මාධ්‍ය විෂයට සහසම්බන්ධයක් ඇති රැකියාවක නිරත වූ අයකි. ඔහුද අද වනවිට සොල්දර වලව්ව ආසන්නයේ නිවෙසක් ඉදි කර එහි ස්ථිර පදිංචිකරුවකු වී හමාරය. නුගවෙල පරම්පරාව පවතින්නේ පෙර සඳහන් කළ ආකාරයට මේ අපූරු සහෝදරත්වය ඉතාමත් ගිජු ලෙස නඩත්තු කරගන්නා නිසා යැයි කිව හැකිය.

# පරණ යකඩ සොයා ටිකිරි මොළෙන් හිතා අමුතු කාර් එකක් හැදූ පුංචි අයියා-මලෝ












වනයේ පිපි මල් වනයේම මිලින වන්නට නොදී විකසිත කරන්නට තරම් නිදහසින් පසු මෙරට පාලකයන් සමත්වූයේ දැයි සොයා බලන්නට කාලය එළැඹ තිබේ. පිටරටින් රැගෙන එන භෞතික සම්පත් තුළින් මෙරට සංවර්ධන කිරීම පමණක් අරමුණු කරගත් හැත්තෑ වසරක පාලනය අප රටේ මානව සම්පත් නිසි පරිදි කළමනාකරණය කළේදැයි ප්‍රශ්නයකි. පෙර රජ දවස වාරි කර්මාන්තයෙන් ලොවක් විස්මිත කළ රටේ බුද්ධි මහිමය මොට කරන්නට තරම් මිථ්‍යාව සමාජගත කළ පාලකයන් සමත් විය. රටේ අනාගතය භාර ගන්නට සිටින දරු පරපුර කාර්මික විප්ලවයට මුහුණ දී හමාරය. එහෙත් ඔවුන්ට අතදීමට සමත් පාලක පන්තියක් එදා මෙදා තුර බිහි වී නැත. අප රටේ දරු පරපුර අනාගතයට සරිලන පරිදි හැඩගස්වා ගැනීමට ඔවුනට මේ සියවසට ගැළපෙන පරිදි අධ්‍යාපන රටාව මෙන්ම මානව සංවර්ධනයද නිසි ලෙස පෙළ ගැස්විය යුතුය.

තවත් එවන් දිරිය දරු සම්පතක් හමුවූයේ මාතර විදුහලේ අටවන ශ්‍රේණියෙන්ය.

මව පියා අන්ත අසරණය. එළවළු ටිකක් හක්මණ - මාතර ප්‍රධාන මාර්ගයට යාබද කුඩා කඩ කාමරයේ තබාගෙන එය අලෙවි කර ලබා ගන්නා සොච්චම් මුදලෙන් පාසල් යන දරුවන් දෙදෙනකු ඉතා අභිමානයෙන් යුතුව අනෙකුත් දරුවන් සමඟ මාතර නගරයේ ජාතික පාසල්වලට යවන්නට තරම් ධෛර්ය සම්පන්න විය. අධ්‍යාපනයෙන් තොර අනාගතයක් තම දරුවන් දෙදෙනාට නැති බව අවබෝධ කරගත් මේ මවුපියන් දෙපළ ඔවුන්ට ලබාදිය හැකි උතුම්ම ධනය ලෙස අධ්‍යාපනය ලබාදෙමින් පෝෂණය කරයි. ඒ මාතර රාහුල විද්‍යාලයේ අටවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන නිල්මිත් යෙහන්ස ගමපතිරණ සිසුවා සහ මාතර බෞද්ධ විද්‍යාලයේ තෙවන වසරේ ඉගෙනුම ලබන ඔකිදු යෙහන්ස ගමපතිරණ යන දරුවන්ය.

එළවළු ටිකක් විකුණා තමන් පාසල් යවන්නත්, කිසිදු අඩුපාඩුවක් නොකර තමන්ට ආහාරපාන ලබා දෙන මවට, පියාට කිසි දවසක රෝද හතරක වාහනයක් ගන්න තරම් ආර්ථික ශක්තියක් නැති බව හොඳින් තේරුම් ගත් මේ කුඩා දරුවන් දෙදෙනා පසුගියදා පාසල් නිවාඩු සමයේ කතිකාවකට යොමු විය. ඒ අවුරුදු 13ක නිල්මිත් යෙහන්ස ගමපතිරණ අයියා සහ අවුරුදු 9ක් වයස ඔකිදු යෙහන්ස ගමපතිරණ මල්ලී යන දෙදෙනාය. ඔවුන්ගේ කතාව තුළ ඇත්තෙන්ම ඇත්තේ ඉහවහාගිය අසරණකමය. අනෙක් පැත්තෙන් බැලූවිට අධිෂ්ඨානය සහ උත්සාහයයි. ඔවුන් දෙදෙනා කතා කර ඇත්තේ තම පාසලට එන තමන්ගේම වයසේ යහළුවන් ඉතා ඉහළ මිල ගණන්වල වාහනවලින් එන බවත් එහෙත් තමන්ට වාහනයක යෑමට පවා අවස්ථාව නොලැබෙන බවත්ය. එහිදී "මල්ලී අපි වාහනයක් හදමු" යනුවෙන් අයියා යෝජනා කළ අතර මල්ලී එකවරම එම යෝජනාවට කැමැති විය.එහෙත් අපිට වාහනයක් හදා ගන්න ඕන කරන දේවල් කොහොමද සොයා ගන්නේ. අපි තාත්තට කියලා බලමු යැයි දෙදෙනා යෝජනා කර ඇති අතර තමන් තම පියාවන ෂෙල්ටන් ගමපතිරණ (43) මහතා නිවෙසට පැමිණි අවස්ථාවේ මේ බව පවසා තිබේ. තම දරුවන්ට ඔවුන්ගේ ඉල්ලීම ඉවත දමා ඔවුන් අධෛර්යට පත් කිරීමට කිසිසේත්ම නොසිතූ දරුවන්ගේ පියා ඊට එකඟව දෛනිකව හරි හම්බ කර ගත් මුදලින් එම වාහනය සෑදීමට අවශ්‍ය මුදල් ලබාදී තිබේ. ඒ අනුව තම බාප්පාගේ වෑල්ඩින් වැඩපළට ගොස් වෑල්ඩින් උපකරණය මෙන්ම අවශ්‍ය උපකරණ ඉල්ලාගත් මෙම කුඩා දරුවන් දෙදෙනා මාතර නගරයේ අබලි යකඩ එකතු කරන ස්ථානයට ගොස් වාහනවලින් ඉවත් කර දමා ඇති කොටස් යකඩ බරට මිලදී ගෙන තිබේ. පසුව අයියයි මල්ලියි තම බාප්පාගේ උදවු ඇතිව නිවෙසට ගෙන එන මෙම අබලි ද්‍රව්‍ය ගලවා තමන්ගේ වාහනය සෑදීමට අවශ්‍ය දෑ තෝරාගෙන තිබේ. පසුව ඔවුන් පැයට කිලෝ මීටර් 80ක වේගයෙන් යා හැකි රෝද හතරක වාහනය නිර්මාණය කර ඇති අතර එයට නැඟගත් අයියා-මලෝ දෙන්නා රටක් රාජ්‍යයක් ජය ගත්තා ලෙස ඉතා ආඩම්බරයෙන් වාහනය පදින්නට විය. එම වාහනය පසුපස "මව්බිම" ඉරිදා සංග්‍රහය, කැමරාවට හසුකර ගැනීමට පැයට කිලෝමීටර් 60ක් 70ක් වේගයෙන් යෑමට සිදුවූ නිසා එම වාහනයේ වේගය පිළිබඳ කිසිදු සැකයක් නැත.

තම පාසල වන රාහුල විද්‍යාලයේ තරගයට ඉදිරිපත් කළ නිල්මින් යෙහෙන්ස දරුවා "මව්බිම ඉරිදා" සංග්‍රහයට මෙසේ අදහස් පැවැසීය.

"මම ඉගෙනුම ලබන්නේ මාතර රාහුල විදුහලේ 8 වැනි ශ්‍රේණියේ. මමත් මගේ මල්ලිත් වාහනයක් හදන්න තොරතුරු සොයා ගත්තේ ෆෝන් එකෙන්. මම ආසයි වාහනයක් පදින්න, ඉතිං මම තාත්තාට කිව්වා පරණ යකඩ කඩවල එන්ජින්, රෝද, යකඩ තහඩු අඩුවට තියෙනවා. මට ඒවා අරගෙන දෙනවා නම් මටයි මල්ලිටයි පදින්න වාහනයක් හදන්න පුළුවන් කියලා. තාත්තා සල්ලි දුන්නා. මමයි මල්ලියි අපේ බාප්පයි මාතර පරණ යකඩ කඩවලට ගිහින් ඕන දේවල් සොයා ගත්තා. බාප්පට තියෙනවා වෙල්ඩින් වැඩපළක්. මම එම උපකරණ අරගෙන බාප්පගේ උපකරණවලින් තමයි මේ කාර් එක හැදුවේ. මේක පැයට කිලෝමීටර් 80ක් වේගයෙන් යන්න පුළුවන්. මමයි මල්ලියි එහෙම ගිහින් තියෙනවා. මේ වාහනය මම රාහුල විදුහලේ තරගයකටත් ඉදිරිපත් කරලා තියෙන්නේ. මේකේ තියෙනවා සිකියුරිටි සිස්ටම් එකක්. මේක හොරු අරගෙන ගියොත් ගෙදර එලාම් එකක් වදිනවා. ඒ විතරක් නොවෙයි වැඩිදුර යන්න බැහැ නතර වෙනවා. ඒ වගේම වාහනේ සයිරන් එකත් වදිනවා. මම මේ වාහනේට වහලක් ගහන්න තමයි හිතාගෙන ඉන්නේ. ඒත් තාත්තට මේ දවස්වල සල්ලි එච්චර නැහැ. මගේ අනාගත බලාපොරොත්තුව ඉන්ජිනේරුවෙක් වෙන්න. ඒ වගේම ලංකාවේ වාහන කර්මාන්ත ශාලාවක් දාන්න තමයි බලාපොරොත්තුව. අපේ රටේ වාහන පදිනවා නම් ගොඩක් අඩු මුදලට හැමෝටම ගන්න පුළුවන් වාහනයක් අල්ලලා නැති මමයි මල්ලියි මේ වාහනයෙන් ගොඩක් දේවල් ඉගෙන ගත්තා. අපි දෙන්නටම වාහනය පදින්නත් පුළුවන්. මම විදුලි බලයෙන් යන වාහනයක් හදන්න තමයි කල්පනා කරලා තියෙන්නේ. කෝ ඉතිං අප්පච්චිට සල්ලි නැහැනේ." යනුවෙන් ඔහු පැවසුවේ තරමක් බලාපොරොත්තු තබා ගනිමින්ය.

දරුවන් දෙදෙනාගේ මව වන ඒ. වික්‍රමරත්න මහත්මිය පැවසුවේ දරුවන්ට ඉන්න හරිහැටි නිවෙසක් වත් නැති බවයි. ඒත් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර දීමට නොගන්නා උත්සාහයක් නැති තරම්ය යනුවෙනි.

■ මාතර - උදර කුමාර රණවීර

## බිම් අඟලක් නැති මිනිසුන් හූල්ලනා රටක

# පෙනී පෙනී මහ කොල්ලයකි

# මිහින්තලේ ජන දුකකි

ලෝකයේ පළමුවැනි අභයභූමිය, සිරිලක බුදු දහමේ කේන්ද්‍රස්ථානය හා සරසවියක් සමඟ ශීඝ්‍රයෙන් දියුණු වන ඓතිහාසික නගරයක් වන මිහින්තලේ දශක තුනක් පුරා ඉඩම් කොල්ලකරුවන්ගේ තිප්පොළකි. පසෙකින් නඩු පැවරෙයි. නෙරපීමේ නියෝග ගැනෙයි. බලධාරීන් රාජ්‍ය දේපළ වැය කරමින් කමිටු පිට කමිටු විමර්ශන ආදිය පවත්වා තීරණ ගනී. ඒ තීරණ සියල්ල මුල්ලේ තබා නිලධාරීන්ගේ ආශීර්වාදයෙන්ම මිහින්තලේ ඉඩම් කොල්ලය ජයටම සිදුවෙයි. මේ කොල්ලය ගැන තොරතුරු විමසන විට නිලධාරීන් තොරතුරු පනත පවා සාවද්‍ය භාවිතයට ගැනීම වර්තමානයේ මෙහි කනගාටුදායකම අවස්ථාවයි.

අනූව දශකය වන විටත් මිහින්තලේ යනු පදිංචියට හෝ ව්‍යාපාර සඳහා කිසිවෙක් කැමති වූ තැනක් නොවේ. එවක එම පෙදෙස ජනාකීර්ණ වන්නේ පොසොන් සමයට පමණි. 1993 'ගම් උදාව' වැඩසටහන ක්‍රියාත්මක වන විට රජය බලෙන් ලබාදෙන ඉඩම්කට්ටි පවා භාරගන්නට කෙනෙක් නොවීමෙන් මේ බව පැහැදිලිය.

අනූතුනේදී 578 රුවන්ගම තුලානට අයත් අඹතලාගම ආදර්ශ ගම්මානය ගොඩනැඟීමට කටයුතු කළ රජය ඉඩම් කට්ටි 78ක් බෙදා දුන්නේය. එයින් යම් ප්‍රමාණයක් පොලිසියේ සාමාජිකයන්ටය. අවුරුද්දක් ඇතුළත රුපියල් ලක්ෂයකට නොඅඩු වටිනාකමින් යුත් ඉදිකිරීමක් කර තිබිය යුතු බව රජයේ කොන්දේසිය විය. වසර 2000 වන විටත් රජයේ කොන්දේසිය ප්‍රකාරව කටයුතු කර තිබුණේ 17 දෙනකු පමණි.


ජනපති ප්‍රේමදාස මිය යෑමෙන් පසු මිහින්තලේ ගම් උදාව වැඩසටහන ක්‍රියාත්මක වූයේ නැත. එහෙත් මිහින්තලා ප්‍රධාන මාර්ගය නවීකරණයෙන් හා 1995න් පසු රජරට විශ්වවිද්‍යාලයට ගම් උදාව භූමිය පවරා ගැනීමෙන් පසු මිහින්තලේ ඉඩම් වෙත ඉල්ලුමක් ඇති වන්නට පටන් ගත්තේය. 2000 වසර වන විට මේ හේතුවෙන් ඇති වූ ඉඩම් ආරවුල් සියල්ල විමර්ශනය කිරීම සඳහා මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ග්‍රාම නිලධාරීන් කණ්ඩායමක් යොදවා සමීක්ෂණයක් සිදුකෙරිණි. ඒ වන විට නීත්‍යනුකූලව පදිංචිව සිටින හෝ අත්තිවාරමක් තරම්වත් ඉදිකිරීමක් කර ඇති පිරිස 17 දෙනකු බව එම සමීක්ෂණයෙන් හඳුනා ගැනිණි. ඒ අනුව එවක සිටි ප්‍රාදේශීය ලේකම් එම පදිංචිකරුවන් 17 දෙනාගේ ඉඩම් පමණක් නීත්‍යනුකූල කර අනෙක් සියලු ඉඩම් කට්ටිවල අයිතීන් අවලංගු කරන ලෙස නියෝගයක් නිකුත් කළේය. පසුව ඇතැම් ඉඩම් කට්ටිවලට විවිධ අයිතිවාසිකම් තනාගෙන සිටි ඇතැම්හු එහිදී ප්‍රාදේශීය ලේකම්ට විරුද්ධව උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස්ට අභියාචනා කළහ. පළාත් ඉඩම් කොමසාරිස් එම අභියාචනය ප්‍රතික්ෂේප කළේය. ඒ අනුව පොලිස් සාමාජිකයන් වෙනුවෙන් හිමි නීත්‍යනුකූල ඉඩම් කට්ටි සංඛ්‍යාව 17ම විය.

2002 වසරේ "දින 100" වැඩසටහන යටතේ අවිධිමත්ව ඉඩම් බෙදීම නිසා මිහින්තලා ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනිල් පුෂ්පානන්ද මහතා පළාත් ඉඩම් කොමසාරිස්ට යැවූ පැමිණිල්ලකට අනුව කරන ලද විමර්ශනයක් පරිදි පළාත් ඉඩම් කොමසාරිස් එම අල්ලා ගැනීම්ද තහනම් කළේය.

ඒ අනුව 2003 වසරේදී නැවත සමීක්ෂණයක් සිදුකෙරුණේය. දිනයක් නියම කර උදේ 9 සිට සවස 5 දක්වා රැඳී සිටින ලෙස ප්‍රාදේශීය ලේකම් කර තිබූ දැනුම් දීමට අනුව එදින රැඳී සිටියේද පෙර කී 17 දෙනාම පමණි. ඒ අනුව අන් සියලු දෙනා අල්ලා සිටින ඉඩම් කට්ටි අවලංගු කර රජයට පවරාගත් බවට ප්‍රාදේශීය ලේකම් ලිපියක් නිකුත් කළේය.

එසේ තිබියදී බොහෝ අය සිදුකළේ තමන් සතුව තබාගෙන සිටි ඉඩම් වෙනත් අයට විකිණීමය. තවත් සමහර අය අනවසරෙන් අල්ලාගෙන විකුණා දැමීම සිදුකළහ. තවත් අය ඉඩම් මිලට ගෙන විකිණීම කළහ. පුළුවන් අය ඒ අනවසර ඉඩම් තුළ විශාල ගොඩනැඟිලි ඉදිකළහ. රජයේ නිලධාරීන් කළේ ඒවාට විවිධ ක්‍රමෝපායන් යොදාගෙන අනුබල දීමය. මේ වනවිට අදහා ගන්නට බැරි තරම් ජනගහනයක් එම කොටසේ සිටී. ප්‍රසිද්ධියේ ඉඩම් විකුණන දැන්වීම්ද යොදා තිබෙනු දක්නා ලැබේ.







මේ සියලු ඉඩම් අල්ලා ගැනීම් හා අවශ්‍ය පරිදි නඩු දැමීම් නිලධාරීන්ගේ අවශ්‍යතාව පරිදි සිදුවන බවට පසුගියදා හෙළිවිය. ඒ ජල පිරිපහදු ව්‍යාපෘතියක් සඳහා ප්‍රාදේශීය සභාව මඟින් බිම් කොටසක් ඉල්ලූ අවස්ථාවේය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අනවසරකරුවන් වෙනුවෙන් පෙනී සිටින බව තොරතුරු දැන ගැනීමේ අයදුම්පතකට ලබාදුන් පිළිතුරකින් පෙනී ගියේය.

ජල පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත පෙරේරා මහතා වෙත් කළ ප්‍රතිපාදනයන්ට අදාළව මිහින්තලා ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බිම් කොටසක් ඉල්ලුවේ 2021 අප්‍රේල් මාසයේ දීය. ඒ සඳහා සභාව පෙන්වා දුන්නේ 578 තුලානේ අංක 43 බිම් කොටස ඉදිරිපිට ඇති නළ ළිඳ සහිත භූමියයි.

එම භූමිය 43 ඉඩම් කට්ටිය අල්ලාගත් පුද්ගලයා විසින් සංවර්ධනය කර ඇති බවත් නළ ළිඳ ගලවා ඇති බවත් ප්‍රාදේශීය ලේකම් මැයි මාසයේදී සභාපතිට දැනුම් දුන්නේය. ඒ අනුව අංක 43 ඉඩම් කට්ටිය කුමන පදනමක් යටතේ පුද්ගලයකුට ලබාදුන්නේ දැයි අඹතලාගම ලලිතා සේනානායක මහත්මිය තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ප්‍රශ්න කර ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් කරුණු විමසුවාය.

ඊට තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන ප්‍රාදේශීය ලේකම් සිරිමෙවන් ධර්මසේන මහතා කියා සිටින්නේ රුවන්ගම තුලානේ අඹතලාගම් පොලිස් ගම්මාන කට්ටි අංක 3 දරන ඉඩම ආරක්ෂක අමාත්‍යාංශයට අයත් පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන් සඳහා නිවාස ව්‍යාපාතියක් ඉදිකිරීමට 1993දී වෙන්කර ඇති බැවින් තොරතුරු දැන ගැනීමේ පනතේ 2 කොටසේ 5 (1) (2) උප වගන්තියේ විධිවිධානවලට යටත්ව රාජ්‍ය ආරක්ෂාවට බරපතළ ලෙස අගතිදායක වන අවස්ථාවක් ලෙස සලකා තොරතුරු ලබාදිය නොහැකි බවයි.

ප්‍රාදේශීය ලේකම්ගේ පිළිතුර හාස්‍යජනක බැවින් ජුනි මාසයේදී ඇය නැවත

**මේ අනවසර ඉඩම්වල මේ වන විට තට්ටු ගොඩනැඟිලි හා නොයෙක් ඉදිකිරීම් කරමින් තවදුරටත් අනවසර අල්ලා ගැනීම්, විකිණීම් හා ඉදිකිරීම් සිදුවෙමින් පවතී. මේවාට එරෙහිව රාජකාරි කරන්නේ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ස්වරූපයෙන් බවද ප්‍රදේශවාසීහු කියති.**

අභියාචනාවක් මඟින් නිවැරදි තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලයි. එයද ප්‍රතික්ෂේප කරන ප්‍රාදේශීය ලේකම්වරයා නැවත 2021-07-15 දිනැති පිළිතුරු ලිපියකින් කියා සිටින්නේ රාජ්‍ය ආරක්ෂාවට භෞමික අඛණ්ඩතාවට හෝ ජාතික ආරක්ෂාවට බරපතළ ලෙස අගතිදායක වන අවස්ථාවක තොරතුරු ප්‍රතික්ෂේප වන බැවින් තොරතුරු කොමිෂන් සභාවේ උපදෙස් ඉල්ලා ලිපිය යොමුකර ඇති බවයි.

පොලිසියේම සේවය කළ නිලධාරීන් විසින් අනවසරෙන් අල්ලාගෙන සිටින එම ඉඩමට ජාතික ආරක්ෂාවක් බලපාන්නේ කෙසේ දැයි අඹතලාගම වැසියෝ ප්‍රශ්න කරති. එක අතකින් ජාතික ආරක්ෂාව යැයි කියමින් අනෙක් පසින් අනවසර අල්ලා ගැනීම් තහවුරු කරදීමට නිලධාරීන් මෙසේ කටයුතු කරන ඉඩම් ආරවුල් අවස්ථාවන් සිය ගණනකි. මේ අනවසර ඉඩම්වල මේ වන විට තට්ටු ගොඩනැඟිලි හා නොයෙක් ඉදිකිරීම් කරමින් තවදුරටත් අනවසර අල්ලා ගැනීම්, විකිණීම් හා ඉදිකිරීම් සිදුවෙමින් පවතී. මේවාට එරෙහිව රාජකාරි කරන්නේ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ස්වරූපයෙන් බවද ප්‍රදේශවාසීහු කියති.

මේ සම්බන්ධයෙන් වන මහජන පැමිණිලිවලට අනුව මේ වන විට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයද අඹතලාගම ඉඩම් ගැටලු සම්බන්ධයෙන් විමර්ශනයක් අරඹා තිබේ. වර්තමාන ප්‍රාදේශීය ලේකම් සිරිමෙවන් ධර්මසේන මහතා පවසන්නේ 93 වසරේ සිට ගොඩගැසී ඇති මිහින්තලේ ඉඩම් ගැටලු කෙළවරක් නොමැති බවකි. ඉඩම් කට්ටි 53ක් සම්බන්ධයෙන් නඩු පවරා ඇති බව එම කාර්යාලයේ තොරතුරුවල සඳහන්වේ.

එහෙත් ලේකම්වරයා පවසන්නේ එම සංඛ්‍යාවන් දිනපතා වෙනස් විය හැකි බැවින් නිශ්චිතව කිව නොහැකි බවය. තවත් කොටසකට ඉවත් කිරීමේ නියෝග නිකුත් කර තිබේ. 7 දෙනකුට එරෙහිව නෙරපීමේ නියෝග ලබාදී ඇතත් ඒ කිසිවක් ක්‍රියාත්මක නොවේ. නිලධාරීන් සිදුකරන්නේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුලපුරා ඉදිකිරීම් කරගෙන යෑමට ඉඩහැර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කිරීම බව අඹතලාගම අනිල් පුෂ්පානන්ද මහතා පවසයි.

මිහින්තලේ ප්‍රාදේශීය සභා සභාපති ලාල් තිලකරත්න මහතා පවසන්නේ, එම ඉඩම් සම්බන්ධයෙන් පවත්වන පරීක්ෂණවලින් අනතුරුව ඉඩම් ඇමැතිවරයා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට නියමිත බවකි.

මේ සම්බන්ධයෙන් කළ විමසීමේදී ප්‍රාදේශීය ලේකම්වරයා "ඉඩම් ප්‍රශ්න කෙළවරක් නෑ. මේවාට අපි නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා. මේ වන විට තත්ත්වාකාර මැනුමක් සිදුකරමින් පවතිනවා. මේ සම්බන්ධයෙන් මිනින්දෝරුවන් ලබාදෙන වාර්තාවන්ට අනුව අපි කටයුතු කරනවා. පොලිස් ගම්මානය ඇතුළු කොටස් තුනකම මේ සමීක්ෂණය කරනවා. අපි පොලිස් ගම්මානය කියන වචනය දැන් පාවිච්චි කරන්නෙත් නෑ. එහෙම එකක් නෑ. ඔබ අසන නඩුදාන සංඛ්‍යාව නිශ්චිතව කියන්න බැරි දිනපතා වෙනස් වන නිසායි" කීවේය. අංක 43 නමැති ඉඩම අල්ලාගෙන සිටින පුද්ගලයා නළ ළිඳ තිබූ කොටසද අල්ලාගෙන සිටින බැවින් ජල පිරිපහදුවක් සඳහා එම ස්ථානය ලබාදීමට නුසුදුසු බවට තමා තීරණය කළ බවත් ඒ මහතා පිළිගනී. 2021 මුදල් වර්ෂය අවසන් වන තුරුම අඹතලාගමට ජල පිරිපහදුවක් ලබාදීමට රජය වෙන්කළ මුදලින් වැඩක් ගත නොහැකිවීම කනගාටුවට කරුණකි.

පසුව තවදුරටත් කරන ලද කරුණු සෙවීමේදී හෙළි වූයේ පොලිස් ගම්මානය නමින් කොටසක් නොමැති බවත් අනුරාධපුර පොලිස් අධිකාරි කාර්යාලය මඟින් එවැනි අයිතියක් තමන්ට නැති බව වසර 15කට පෙර මිහින්තලා ප්‍රදේශවාසීන්ට දන්වා ඇති බවත්ය. එසේ තිබියදී රාජ්‍ය ආරක්ෂාවට, භෞමික අඛණ්ඩතාවට හෝ ජාතික ආරක්ෂාවට බරපතළ ලෙස අගතිදායක වන අවස්ථාවක් යනුවෙන් පවසා කල්මරමින් තොරතුරු ප්‍රමාද කර තොරතුරු පනත අවභාවිත කිරීම නිලධාරීහු කරති. එම පනතට අනුවම එය බරපතළ දඬුවම් ලැබිය හැකි වරදකි. මේ සියල්ල තුළම සිදුවන්නේ මිහින්තලේ ඉඩම් කොල්ලයන් ජයටම පවත්වාගෙන යෑම හා නිලධාරීවාදයේ ජයමඟුල් කෑමය.

■ අනුරාධපුර-සරත් මනුල වික්‍රම

# පහන් වැට

පහන් වැට සටහන

**පදරුත් ඇති, සිත මුමුනන යමක් වේ නම් සිත් පත්ලේ ඔබ හෙමිහිට මුමුනනු මැන හද සනසා සිත් සතොසේ. ඒ හැඟුමන් හද තුළ රැඳි අමුතු කතාවක් මවද්දී එය කවි කළ යුතුය සොඳින් සිත්සේ අකුරට එක්කොට. එවන් කාව්‍යමය සිතිවිල්ලක් අපතේ නොයවන්න. එය අකුරු කරන්න. යළි කියවන්න. යළි සකසන්න. එවිට කපා ඔප දැමූ මැණිකක් මෙන් රස කවි පදයක් මැවෙනු ඇත.**

සංස්කාරක
සජිත් රෝහිත ලියනගේ
101. රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07



## නිකිණි සඳ යට

නිකිණි සඳට
තුරුලු වෙවී
වලා පටක් ඇදේ ඇදේ
සීතල මඳ නල සැතපී
පවන් රොදේ එතේ එතේ

කුරව් කූජනය දසතේ
රෑ නොනිදා ඇසූ සැණේ
මන්දස්මිතියක්ය අනේ
නිදියහනේ නිදි වැරුණේ

අඳුරු සෙවණ තුරු යායේ
බිම් පලසකි යහනාවේ
ඔබ එනතුරු හිස ළඟදී
මම වැතිරෙමි සඳපානේ

■ **නෙතුනි විහංගා දිසානායක**

## ඉල්මහ මතක සුවඳ

අඳුරින් මුදාලන්නට
ලක් ජන පිරිස
නව මාවතක් එළිපෙහෙළි කළ
විරුවනි වීරවරියනි
අසීමිත කැපවීම් කළ
ඔබේ අරමුණු හැඳිනගත්
බොහෝ දනන් මේ සීතල ඉල්මහේ
ඔබව එළිපෙහෙළි කළ
නව අරුණෝදයේ මාවතට
පිවිසෙමින්
ඉල්මහේ විරු මතක
සිහිපත් කරමින්
පෙරගමන් අරඹමින්
පෙළගැසෙනයුරු
ඉල්මහේ මතකයන්
විකසිතව පිපෙන යුරු

■ **දි.ම. තිහවබැද්ද**

## දික්කසාදය

රෑ නෙවෙයි මහ දහවලයි මේ
ඒ වුණත් මට සීතලයි
පිච්චි පිච්චී ඇවිද යනමුත්
අනෝරා වැහි නෙත් තෙමයි

දෙනෝදාහක් මඟ සිටිනමුත්
තනියි මාවත පාළුවයි
සියක් වර සිත දිරිය ගත්තද
අසරණයි මා සිත පෙළයි

ළඟින් උන් කාලය නිමා වී
ආයෙමත් දුර ඈදී යයි
සසර සැමදා එක්ව වෙන්වී
ගියත් හද තව උණුසුමයි

■ **තක්ෂිලා සෙනවිරත්න**
**වාරියපොළ**

## බොඳ වූ සිහින

රෝසමල් යහනා මතුවේ හිඳ
සීත මිහිදුම් සලුව පොරවා
උණුසුමක් මා පැතූ මුත්
සිහිනයක් පමණක්ම වූවා

පිපුණ හද මිල මලින වී ඇත
නැවත පෙති දිග නොහැරෙනා ලෙස
සුවඳ කස්තුරි සුවඳ මුසු වූ
හදෙහි හටගත් පැතුම් ගොන්නක්

සුනු විසුනු වූ නිසාවෙන් මයි
මෙවන් දුක් ගී ගයන්නේ මා

**විශ්‍රාමලත් තැපැල් ස්ථානාධිපතිනි**
■ **එස්.ඩී.ආර්. ප්‍රේමලතා**
**අංකුඹුර**

## මුව ආවරණ

ඔබ සිතන බව දනිමි
සහරා කතර අස මැඳුරක
සුදු මුතු පබළුයෙන් සැදි
දුහුල් දූ පට මතින් මතුවන
අරාබියානු කුමරියක
අඳුන් තැවරූ දෑස බඳු බව
දේදුනු දෙබැම පාමුල
සිනාසෙන
මා දෑස් යුග
මමද හඟිමි
සතුරු සේනා අබියස
අඩක් මුව වසාගත්
ඊජිප්තියානු රණ ශූරයකු
තියුණු නෙතු බැල්ම බව
ගනැති නිල් දෙබැම යට
නිල් මිණෙක රශ්මිය රැගෙන
නොසැලෙන
ඔබ දෑස
ජීවිත නිකාන්තියෙන් දිදුලන

■ **චමිලා සමරසේකර**
**බදුල්ල**

## කට නළියයි

අන්දන්නට ඇන්ද දරුවන් කැලේයා
පද්දන්නට රේස් මැති දරුවන් අගේයා
සොලවන්නට ගෙජ්ජි අත වට දිලේයා
කියවන්නට යමක් කට නළියා තියේයා

■ **එස්. මහගෙදර**
**දිගාමඬුල්ල**

## සසල සිත්

නිලුපුල් දෙනුවන් - දේදුනු ඇහි බැම්
මුව රත කමලයි ළය රණ තිසරුය
පිරිපුන් ළමැදයි රතැඟිලි සියුමැලි
රන් පැහැ මා දුටු නළඟන ඇයමය
එදා දොඩපු ඒ මියුරු තෙපුල් අද
හිරු දුටු පිනි මෙන් වියැකී ගොස් ඇත
කිසිම හේතුවක් වත් නොමැතිව
කඩාපනින අරුමය අපුලය
දරුණු වූ අදහස් කොයිබින් ආවද
අදහනු කෙලෙසද මේ නම් ඈමද

■ **අමරා අලහකෝන්**
**බෙලිගොල්ලවත්ත**
**කිරිඳිවැල**

## වස්සානයේ දවස උදාවී

ඔලොක්කුවට පුපුරා හැලේ සැර අකුණු
කළුවර තෙතබරිත වලාපට ඉරාගෙන
ප්‍රචණ්ඩය සරෙන් හමනා පවන
උදාවී අඳුරු වස්සානයේ දවස

දෑත් අහසට නඟා සිනාවේ තුරු මුදුන්
හඬත් වැහි කුරුල්ලෝ වඩා අභිනික්මන
සිහිතලෙන් වෙවුලාය නිසොල්මන් කඳු සිරස
මිහිතලය සිපගනී අහස හඬනා කඳුළ

නිසොල්මන් ගීතයෙහි ගලාගිය ගං දෑල
මියරු වී පසුරු ගා සපයි නිති තෙත ඉවුරු
හාමතේ හඬනා ළමා වසු පැටවුනේ
නෑ බුරුල්ලට කිරි එරෙන්නේ අම්මාට

වැසී දොර පියන්පත් නිදිගත් සේ ගෙපැල
කෝ මිහිරි හිනා හඬ අනේ මගෙ දරුවනේ
මවු ඇකයෙ උණුහුම් තොටිල්ලේ නැළවී
කිරි සිහින දකිමින් ම'පුතුන් නිදන්නේ

■ **දෙල්ගල්ලේ සෝමසිරි පල්ලාවල**

## උවසුන්

මානය කුහක සිතිවිලි හද තුළ පුරවා
තුටු වේ දනන් කුලියට මිනිසුන් මරවා
නැති බැරි එකා දුටුවිට බලමින් ඔරවා
උවසුන් ලෙසට වැජඹේ සිල්රෙදි පොරවා

දෙවොලේ පන්සලේ මතුරන බොරු සිල්ය
දිය යට ගිනි අරන් අමුණන මරු වැල්ය
රුපියල් සත සොයන මංපෙත් පිළිකුල්ය
හේඩා ගැසුණු සිත ගිනිගත් අකුසල්ය

■ **වෛද්‍ය එම්.එම්.ඩී. මනම්පේරි**
**රජයේ රෝහල**
**පින්නවල**
**බළන්ගොඩ**



# ෆේස්බුකිය

■ **සංස්කරණය - සවනි ශේශාධි**







































# නෙත් වගේ පොත්

සජිත් රෝහිත ලියනගේ

## සමන් පුෂ්ප ලියනගේ ගේ "දිවි පරදුව"




මෙය Harold Robbins ගේ "Never Love a Stranger" කෘතියේ පරිවර්තනයකි. තෙල්මා, අඳුරු කුටිය, රිදී අසිපත, සේද නිම්නය, සුරංගනාවි, විරු වියරුව වැනි පරිවර්තන කෘති ලියූ කතුවරයාගේ අලුත්ම කෘතියය.

මීට පෙරද කතුවරයා හැරල්ඩ් රොබින්සන්ගේ "විරු වියරුව" කෘතිය පරිවර්තනය කර ඇති අතර මෙය ඊට වෙනස් ආරේ කෘතියකි. ජීවන අත්දැකීම් එක් කළ, සරල වූ ශෛලියකින් පෙළ ගැස්වෙන, මානුෂීය විවරණයක යෙදෙන නවකතාකරුවකු ලෙස ප්‍රකට හැරල්ඩ් රොබින්සන්ගේ මෙහිද ඇත්තේ එම දෘෂ්ටියමය.

කතාවට පසුබිම් වී තිබෙන්නේ විසිවැනි සියවසේ මුල් භාගයේ නිව්යෝර්ක් නගරය ඇතුළු ඇමෙරිකා එක්සත් ජනපද නගරවල පැවැති සමාජ වාතාවරණයය. එම කාලයේ යුදෙව්වන්ට හා කළු ජාතිකයන්ට එරෙහිව එල්ලවී තිබුණු වර්ගවාදී සමාජ පීඩනය හදාරන්නට අවැසි කෙනෙක් වෙත්නම් මින් ඊට එළියක් වැටෙන බැව් කිව හැකිය.

**මිල රු. 575**
**සුරස ප්‍රකාශනයකි.**

## තිස්ස ජයවර්ධනගේ "යළි ඉපදී හමුවන පෙරභව නෑයෝ"





කතුවරයා පුනර්භවය පිළිබඳව කාලයක පටන් පර්යේෂණ සිදු කරන්නෙකි. වසර පනහක් තරම් වූ එම කාලය තුළ පතපොතද බොහොමයකි. මෙම කෘතියද මෙම විෂයෙහි වඩාත් උනන්දුවක් දක්වන පාඨකයාගේ කුතුහලය මතු කරවන්නකි.

මෙම කෘතියට ඇතුළත් සිදුවීම් පිළිබඳව කියද්දී පෙරභවය හෙළි කළ එම දරුවන් බහතෝරන වියේදී කළ ප්‍රකාශ අනුව මෙම පර්යේෂණ සිදුකර ඇත. මෙහි කියැවෙන ආකාරයට මෙම දරුවන්ගෙන් ඇතැමුන් මේ වෙද්දී විවාහකයෝ බැව් පෙන්වයි. ඔවුන් හෙළි කළ පෙරභව තොරතුරු සනාථ වීමෙන් පසු පෙරභව නෑ පිරිස සමඟ නොනවත්වා සබඳතා පවත්වාගෙන යෑම් වැනි සිදුවීම්ද කිහිපයකි. මෙහි ඇති විශේෂය නම් පෙරභවය ගැන කියන දරුවන්ගේ අද ජීවිතත්, එදා ජීවිතත් පිළිබඳව දැක්වෙන ඇතැම් කතා කුතුහලයෙන් පිරී යන නිසාය. කෙසේ වෙතත් මේ විෂයයෙහි පර්යේෂණ කරන්නවුන්ට එම කෘතිය මහත් පිටුවහලක් වන බැව් පෙනෙයි.

**මිල රු. 500**
**නාගානන්ද බෞද්ධ මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි**

## ගුණරත්න ඒකනායකගේ "සසල මැදුර"

ගත් කතුවරයකු වන ගුණරත්න ඒකනායකගේ 104 වැනි කෘතිය ලෙස මෙය එළි දක්වා ඇත. නවකතාවක් ලෙස පෙළ ගස්වන මෙහි පළමු භාගයට කොටස් 6ක් එකතු කරන කතුවරයා අනතුරුව අතුරු කතාවකැයි පටන්ගෙන ඊට පරිච්ඡේද 6ක් එකතු කොට වෙනස් ආරේ ආකෘතියක පිහිටා කතාව ඉදිරිපත් කරයි.





කෘතියට අන්තර්ගත වන අනුභූතීන් මෙරට ජන සමාජය තුළ විවිධ තලයන් ඔස්සේ අපට හමුවී තිබෙන, හමුවිය හැකි චරිත බැව් දැනෙයි. ඔවුන් අපට නිතර හමුවී තිබෙන්නටද පුළුවන. කතාව කියවාගෙන යද්දී මෙය අපේ කතාවද විය හැකි යැයි පාඨකයාට දැනෙන පරිදි පෙළ ගස්වන්නට කතුවරයා උත්සාහයක් ගෙන තිබේ.

දෙබස් එක් කිරීම, කතාවේ ගලා යෑමට බාධාවක් නොකොට ගැට ගසා ගන්නට වෙහෙසී ඇත. මෙම කතාවට පසුබිම් වන කාල වකවානුව පිළිබඳව මීටත් වඩා හැඟීමක් ඇති කිරීමට උත්සාහ කළේ නම් කතා රසය තවත් මතු වීමට ඉඩ තිබිණැයි සිතෙයි.

**මිල රු. 560**
**නිපුන් පොතක්**

## පැට්‍රික් ප්‍රනාන්දුගේ 'නව මාවතක, නව මාවතක් සෙවූ සටන්කාමියා'

71 කැරැල්ල වරපත්‍රයක් ලෙසින් ගෙන බල දේශපාලනයෙහි ඉහළට නැගීමට ක්‍රියා නොකළ ඒ වෙනුවට බහුජන අරගලයන්ට නායකත්වය දුන් බිම් මට්ටමේ දේශපාලනය තෝරාගත් ක්‍රියාදරයකුගේ ජීවන අන්දරයයි. එය ශ්‍රී ලංකාවේ තීරණාත්මක කාල පරිච්ඡේදයක සමාජ ඉතිහාසය පිළිබඳ පුද්ගල කථන ලියැවිල්ලකි.




**මිල රු. 300**
**අගහස් ප්‍රකාශන**

කොළඹ 07, රොස්මිඩ් පෙදෙසේ, අංක 101 හි පිහිටි සීමාසහිත සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මිනුවන්ගොඩ පාරේ, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.

